# 2010 වර්ෂය සඳහා
# පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලන වාර්තාව

සෙනරත් බණ්ඩාර දිසානායක
MSc, PhD.

2024

**2010 වර්ෂය සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලන වාර්තාව**

ආචාර්ය සෙනරත් බණ්ඩාර දිසානායක

© පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ISBN 978-624-5840-28-1

# ගවේෂණ අංශය

## ප්‍රධාන කාර්යාලය විසින් සිදුකරන ලද කටයුතු

**වාකරේ කදිරවේලි ආශ්‍රිත ප්‍රදේශයේ පුරාවිද්‍යා ගවේෂණය**

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් එහි උතුරු සීමාවේ පිහිටි කදිරවේලි ප්‍රදේශය තුළ මෙම පුරාවිද්‍යා ගවේෂණය සිදු කරන ලදි. කදිරවේලි, සින්නකායන්කර්ණි, කිරිමිච්චෙයි, කුන්තිඩිකුලම්, වෙරුගල් යන ග්‍රාම නිලධාරි වසම් තුළ හමු වූ පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක එමගින් වාර්තා ගත කර ඇත. උතුරු නැගෙනහිර ප්‍රදේශවල දශක ගණනාවකට වඩා වැඩි කලක් පැවති ජනවාර්ගික අර්බුදය, ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් මෙම ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනාගැනීමත් වාර්තා කිරීම හා අධ්‍යයනය කිරීමට හැකියාවක් නො තිබුණි. ත්‍රස්ත ක්‍රියා මෙන් ම පශ්චාත් යුද වාතාවරණය තුළ ශීඝ්‍ර වශයෙන් නිධන් සෙවීමේ අරමුණින් සිදු කළ අනවසර කැණීම් හේතුවෙන් ද පුරාවිද්‍යාත්මක උරුමයට නිරන්තරයෙන් තර්ජන එල්ල වෙමින් පැවැතිණි. එබැවින් මෙම ප්‍රදේශවල පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම හා වාර්තා කිරීම අරමුණු කරගෙන මෙම ගවේෂණය සිදු කරන ලදි.

ගවේෂණය සිදු කරන ලද ප්‍රදේශය තුළ ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ සිට යටත්විජිත යුගය දක්වා ම සාධක අනාවරණය විය. ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් බ්‍රාහ්මී ලෙන් ලිපි සහිත හා රහිත කටාරම් ලෙන් හමු ව ඇති අතර අනුරාධපුර යුගයට අයත් පුරාවිද්‍යාත්මක සාධක බහුලව හමුවේ. ඊට අමතර ව ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස හා අටවන සියවසට අයත් සාධක ද අනාවරණය විය.

**පෙරියමුනේ පුරාවිද්‍යා නටබුන්**

සින්න කායන්කර්ණි ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි නටබුන් විහිදුණු අනවසර කැණීම් භූමියකි. කායන්කර්ණි මංසන්ධිය පසුකොට කිලෝමීටර් 1.5 ක් පමණ ගොස් දකුණට හැරී කිලෝමීටර් 1 ක් පමණ නැවත කැලය තුළට ගිය විට නිදන් හොරුන් විසින් හාරා ඇති මෙම ස්ථානය හමුවේ. බොහෝවිට පිළිම ගෙයක සාධක ලෙස හඳුනාගත හැකි මෙය අනුරාධපුර යුගයට අයත් ගල්කණු අවශේෂ රාශියක් ගඩොල් හා උළු අවශේෂ භූමිය පුරා විසිර ඇත. මෙහි දිගින් මීටර් 5 ක් පළලින් මීටර් 3ක් හා ගැඹුරින් මීටර් 1.5 ක් පමණ වන ලෙසට ගඩොල් ඇතුළු අවශේෂ ගොඩ දමා තිබෙනු දැකිය හැකි ය. මෙම ස්ථානයට තවත් කිලෝමීටර් 1.5 ක් පමණ දුරින් ප්‍රාකාරයක හා ගොඩනැගිල්ලක අවශේෂ හමුවේ. දකුණු හා බටහිර දිගට මීටර් 23.7 ක් පමණ විහිද ඇති මෙම අවශේෂවලට දකුණින් ඊට ආසන්නව කෙටි ගල් කණු හතරක් සිටුවන ලද ගොඩනැගිල්ලක සාධකත් ඒ ආසන්න තවත් ගල්කණු සහිත නටබුන් ගොඩනැගිල්ලක් ද හඳුනාගත හැකි ය. ඉහත ප්‍රාකාරයට බටහිර දෙසින් හා මීටර් විසි පහක් පමණ දුරින් පියගැට පෙළක් සහිත නටබුන් වූ ගොඩනැගිල්ලකි. මෙහි පියගැට සහිත ස්ථානය නිධන් හොරුන් විසින් හාරා ඇත. එම ස්ථානයේ පියගැට පෙළෙහි ගල් පුවරු අවශේෂ, කැටයම් රහිත සඳකඩ පහනක්, ගඩොල්, උළු හා මැටි බඳුන් අවශේෂ ද හමුවේ. ගොඩනැගිලි නටබුන් සහිත කොටස

දිග පුළුලින් මීටර් 18.7 X 18.3 ක් පමණ වේ. මේ ආසන්නයෙන් ම තවත් ගල්කණු සහිත ගොඩැලි හතරක් පමණ හඳුනාගත හැකි විය.

**පෙරියමුනේ අනවසර කැණීම් භූමිය**

පෙරියමුනේ කායන්කර්ණි සිට සේරුවාවිල මාර්ගයේ කිලෝමීටර් 2 ක් ගමන් කර දකුණට ඇති මාර්ගයේ මීටර් 400 ක් පමණ ගිය පසු මෙම ස්ථානයට ලගාවිය හැකි ය. මෙම බැම්ම චතුරස්‍රාකාරව ඉදිකර ඇත. උතුරු දකුණු දිශානුගත එක් පාදයක් දිගින් මීටර් 58.7 ක් වන අතර ඊට සමාන්තර පාදයෙහි දිග මීටර් 58 කි. නැගෙනහිර බටහිර දිශානුගත වම් පාදයක් දිගින් මීටර් 67.5 ක සහ ඊට සමාන්තර අනෙක් පාදය දිගින් මීටර් 69 කි. මෙම බැම්මේ දික් අතට අසුරන ලද ශිලා පුවරුවක සමාන්‍ය ප්‍රමාණය දිග, පළල සෙන්ටිමීටර් 160 X 23 පමණ වන අතර බැම්ම අවට ගඩොල් අවශේෂ විසිරි ඇත. මෙම චතුරස්‍රාකාර බැම්ම මධ්‍යය මීටර් 18 X 16 ප්‍රමාණයේ කොටස නටබුන් වූ ගොඩනැගිල්ලකි. එහි පොළොවෙන් උඩට ඉතිරි වූ කෙටි ගල්කණු 12 ක් පමණ ඇත. එමෙන් ම චතුරස්‍රාකාර ප්‍රාකාර බැම්මේ ගිණිකොණ ආසනය තුළ ගල්කණු 9 ක් පමණ ඉතිරි වූ තවත් ගොඩනැගිල්ලකි. ඉහත චතුරශ්‍රයේ බටහිර දෙසින් තවත් එවැනි ම නටබුන් වූ ගොඩනැගිලි සාධක හමුවේ.

**පෙරියමුනේ අනවසර කැණීම් භූමිය**

කායන්කර්ණි පාලම අසලින් සේරුවාවිල දෙසට කිලෝමීටර් 2 ක් පමණ ගොස් දකුණට ඇති ගුරු පාරේ මීටර් 400 පමණ ගමන් කළවිට හමුවන පෙරියමුනේ ප්‍රාකාරයේ සිට මීටර් 35 පමණ ගිණිකොණ දෙසින් හමුවන නිදන් හොරුන් විසින් දැඩි ලෙස හානි පැමිණ වූ ස්ථානයකි. මෙහි මැද දිගින් මීටර් 2.3, පළල මීටර් 1.7 හා ගැඹුර මීටර් 2.2 පමණ වූ අනවසර කැණීමකි. මෙහි පියගැට සඳහා යෙදූ පුවරුවක සාධක, ගොඩදමා ඇති ගල්කණු 4 ක් සාධක දක්නට ලැබේ. අනවසර කැණීමෙහි පාංශු සහිත මෙහි පහළ හුණුගල් නැවත ගඩොල් හා උළු කැබලි සහිත ස්ථරයක් සහ ඉහළ ගල් කුට්ටි සහිත ව හමුවේ.

**කායන්කර්ණි පස් කපන ස්ථානීය නටබුන්**

කායන්කර්ණි හන්දියේ සිට වාකරේ දෙසට ගමන් කරන ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් 1.5 ක් පමණ ගිය විට වමට ඇති පස්යොදා සකසන ලද මාර්ගයේ මීටර් 100 ක් පමණ ගිය විට ඇක්සස් ඉංජිනේරු ආයතන විසින් මහා පරිමාණ වශයෙන් පස් කපන ස්ථානය පුරාවිද්‍යාත්මක සාධක සුලභ භූමියක් ලෙස හඳුනාගන්නා ලදි. මෙම භූමියේ ගල්කණු අවශේෂ විසිරී පවතින අතර පස් කැණීම හේතුවෙන් මෙම සාධක විනාශ ව ඇත. මෙම කොටසට වයඹ දිශානුගතව මීටර් 25 ක් පමණ දුරින් කැලෑව තුළ පිහිටි නටබුන් ගොඩනැගිල්ල මීටර් 10X6 ක වපසරියක පැතිරී ඇත. මෙහි ගල්පුවරු හා ගල්කණු අවශේෂ දක්නට ලැබේ. මෙම අවශේෂවලට මීටර් 10 ක් පමණ ඊසාන දිශාවෙන් ඊට ආසන්නව ගල්කණුවක පාදම් කොටසක් හමු වේ. ඉහත අවශේෂ සහිත භූමියේ සිට මීටර් 600 ක් පමණ ගිණිකොණ දෙසින් ගල්කණු 5 ක් සහිත නටබුන් ගොඩනැගිල්ලකි. එය මීටර් 3.5 x 1.8 ක ප්‍රමාණයකින් සමන්විත අතර ගල්කණු සහිත කොටසේ මැද අනවසර කැණීමක් සිදුකර ඇත.

**කායන්කර්ණි විදුහල අසල නටබුන්**

කායන්කර්ණි මංසන්ධිය අසලින් මුහුද දෙසට දිවෙන මාර්ගයේ හමුවන කායන්කර්ණි විදුහල අසලින් මීටර් දෙසීයක් පමණ ගිය පසු විද්‍යාලයට නැගෙනහිර දෙසින් නටබුන් ගොඩනැගිල්ලක් හමුවේ. ගල්කණු හයක් සහිත ගොඩනැගිල්ල දිග පළලින් මීටර් 7.5 X 5 ක් පමණ වේ. මෙම ගොඩනැගිල්ලේ උතුරු පාර්ශ්වයේ කවාකාර අනවසර කැණීමකි. එහි විෂ්කම්භය මීටර් 1.4 ක් හා ගැඹුර සෙන්ටිමීටර් 90 කි. එයට  බටහිරින් මීටර් 40 ක් පමණ දුරින් අනුරාධපුර මුල් යුගයට අයත් මුරගලක් දක්නට ලැබේ.

**ක්වාලම්පුරම් නටබුන්**

කායන්කර්ණි හන්දියෙන් විදුහල පාරේ මීටර් 500ක් පමණ ගොස් වම් පසට ඇති මාර්ගයේ කිලෝමීටර් 1.5 ක් පමණ ගමන් කර කැලෑව තුළට මීටර් 250 ක් පමණ ගිය විට ගල්කණු සහිත නටබුන් ගොඩනැගිල්ල හමු වේ. මෙහි ගල් කණු හතරක් හා පෙරලුන ගල් කණුවක සාධක ද ගඩොල් අවශේෂ ද සුළු වශයෙන් හමුවේ. මෙම ස්මාරකයට මීටර් 15 ක් බටහිරින් මීටර් 5 ක් පමණ විෂ්කම්භයකින් යුත් ගොඩැල්ල පැරණි දාගැබක සාධක ලෙස හඳුනාගත හැකි ය. අනුරාධපුර මුල් යුගයට අයත් ගඩොල් අවශේෂ හමු වේ. මෙම ගොඩනැගිල්ලට මීටර් 10 ක් පමණ නිරිත දිශාවෙන් කෙටි ගල්කණු අටකින් පමණ යුතු මීටර් 8 X 8 පමණ වපසරියක පැතිරෙන ගොඩනැගිල්ලක නටබුන් හමුවේ.

**කලපුව අසල නටබුන්**

කායන්කර්ණි මංසන්ධියේ සිට සේරුවාවිල දෙසට කිලෝමීටර් 1.5 ක් පමණ ගමන් කළවිට ප්‍රධාන මාර්ගයට වම් පසින් හමුවන මීටර් 150 ක් පමණ කැලෑව තුළ පිහිටි නටබුන් වූ ගොඩනැගිල්ලකි. දිගින් මීටර් 8 ක් හා පළලින් මීටර් 6.8 ක් පමණ ප්‍රමාණයක මෙම නටබුන් පැතිරී පවතින අතර එහි කෙටි ගල්කණු හයක් පමණ දක්නට ලැබේ. මෙම ස්මාරකයේ සිට මීටර් 100 ක් පමණ බටහිර දිශානුගතව පැරණි ගල් පාලමක අවශේෂ හමුවේ. ගොඩබිම් කොටසේ බිම් මට්ටමේ ගල් කණු 4 ක අවශේෂ ද කඩොලාන ශාක සහිත පරිසරය තුළ තවත් ගල් කණු 8ක් ද හමුවේ. මේවා පේළි දෙකක් ලෙස දක්නට ලැබෙන අතර මීටර් 200 ක පමණ දුරකට මෙම කණු පෙළ පැතිරී ඇත.

**කිරිමිච්චෙයි නටබුන්**

වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිරිමිච්චිය ග්‍රාම නිලධාරී වසමේ උස් කඳු සහිත භූමියක විසිරී පවතින පැරණි දාගැබක නටබුන් හමු වේ. මෙය මීටර් 8 ක පමණ විෂ්කම්භයකින් යුතු ගල් කුට්ටි සහිත ගොඩැල්ලක් ලෙස දිස්වේ. ගොඩැල්ලේ ඇතැම් තැනක පේසාවන් දෙකක් පැවති බවට සාධක හමුවේ. මෙම දාගැබ් ගොඩැල්ලේ සිට ගිණිකොන දෙසින් ඊට සම්බන්ධ කර ඉදිකරන ලද ශිලා බැම්මක් සහිත ස්මාරකයක සාධක ඇත. මෙහි මීටර් 3 ක් හා 5 ක් පමණ දිගු වන කොටස් දෙකක් ද කණු පාදම් ගල් ද හමුවේ.

කිරිමිච්චිය ග්‍රාම නිලධාරී වසමේ කුනාඩි මංසන්ධියෙන් වමට ඇති කිරිමිච්චිය යුධ හමුදා කඳවුරේ සිට නැවත වමට ඇති මාර්ගයේ කිලෝමීටර් 2ක් පමණ ගොස් දකුණු පසට හමුවන

කඳු වැටියේ ගල් කුට්ටි යොදා කළ ප්‍රාකාරයක නටබුන් ද නටබුන් වූ ගොඩනැගිලි 3 ක් ද පිහිටි ගලේ ඇති ක්ෂේත්‍රකාවාටයක් ද පනා බැම් සාධක ද දාගැබ් ගොඩැලි 3 ක සාධක ද ශිලා පුවරුවක හා ප්‍රවේශ මාර්ගයක සාධක ද තවත් වෘතාකාර පාෂාණ භාවිතයෙන් කළ ගොඩනැගිල්ලක සාධක ද එකිනෙකට ආසන්නව එකම භූමි වපසරියක් තුළ පිහිටා ඇත. කිරිමිච්චිය ප්‍රදේශය තුළ ස්මාරක 14 ක් පමණ හඳුනාගෙන වාර්තාගත කරන ලදි.

**කුණ්ඩික්කුලම නටබුන්**

වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුණ්ඩික්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ දාගැබක නටබුන් අනාවරණය වේ. මෙම දාගැබ් ගොඩැල්ල නිදන් හොරුන් විසින් හාරා පාදම ද මතුකරගෙන ඇති අතර දාගැබට ආසන්නව ම පර්වතයේ බටහිර අන්තයේ පිහිටි ගලේ කෙටූ පියගැට පෙළක සාධක හා තවත් ඉදිකිරීම් සාධක හඳුනාගත හැකි ය. ඊට අමතරව තවත් දාගැබ් ගොඩැලි 03, නටබුන් ගොඩනැගිලි 2ක් හා ක්ෂේත්‍රකාවාටයක සාධක ද හාත්පස ප්‍රදේශයේ හමු වේ.

**මදුරන්කුලම් නටබුන්**

කණ්ඩක්කුළම් හන්දියෙන් දකුණට ගමන්කොට හමුවන මදුරන්කුලම් ග්‍රාමයේ පිහිටි වැවේ බැම්මෙහි කෙළවර ආසන්නයේ වනය තුළ හමුවන නටබුන් වූ දාගැබ් ගොඩනැගිල්ලකි. මෙම දාගැබ නිදන් හොරුන් විසින් කැණීම්කර ඇත. මෙම දාගැබ පවතින වපසරිය ආශ්‍රිතව ඊට ගිණිකොණ දෙසින් නටබුන් වූ ගොඩනැගිල්ලක් ද ඒ ආශ්‍රිතව ක්ෂේත්‍රකාවාටයක්, ගොඩනැගිලි පාදමක් හා පොකුණක සාධක ද අනාවරණය වේ. මදුරන්කුලම් වැවට අයත් බැම්මෙහි දකුණු පසින් මීටර් 300 ක් පමණ වෙල්යාය තුළට ගමන් කළ විට හමුවන ගල්කණු 17 ක් පමණ ශේෂව ඇත. ගොඩනැගිලි නටබුන් අනුව එය ටැම්පිට ඉදිකරන ලද ගොඩනැගිල්ලක් විය හැකි බවට අනුමාන කළ හැකි වේ.

**රෝහල් කඳවුර අසල නටබුන්**

වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වෙරුගල් ග්‍රාම නිලධාරී වසම තුළ ත්‍රස්තවාදී සංවිධානය විසින් ස්වර්ණම් බේස් ලෙස හඳුන්වනු ලබන ස්ථානය පසුව යුද හමුදාව විසින් වහල් කඳවුරක් ලෙස භාවිත කරන ලද අතර එම ස්ථානයේ සිට මීටර් 80 ක් පමණ නැගෙනහිර දිශාවට ගමන් කළ විට නටබුන් සහිත ස්ථානයක් හමු වන අතර එම ස්ථානය ද නිදන් හොරුන්ගේ ග්‍රහණයට හසුව විනාශව ඇත.

එම ස්ථානයේ අනුරාධපුර මුල් යුගය නියෝජනය කරන කොරවක් ගල් කැබැල්ලක්, සඳකඩපහණක්, ගල් කණු රාශියක් සහ උළු ගඩොල් හා මැටි බඳුන් අවශේෂ විසිරී පවතී. මේ අනුව ඉහත ගවේෂණ ව්‍යාපෘතිය මගින් පුරාවිද්‍යා ස්ථාන 15 ක පමණ ස්මාරක ප්‍රමාණයක් හඳුනාගෙන ලේඛනගත කර ඇති අතර එහි දී නිරීක්ෂණ වූ ප්‍රධාන කාරණය වූයේ මෙම බොහෝ ස්ථාන නිදන් හැරීම, අයථා මානව ක්‍රියාකාරකම් හා සංවර්ධන කටයුතු හේතුවෙන් විනාශයට පත්ව තිබෙන බවයි.

**කදිරවේලි ගල්කොරිය අසල නටබුන්**

කදිරවේලි ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ස්වභාවික ගල් පර්වතයක පිහිටා ඇති බ්‍රාහ්මී ලෙන් ලිපියක් සහිත කටාරම් ලෙනකි. මෙම ලෙන උසින් මීටර් 3.3 ක් ද, පළලින් මීටර් 9 ක් ද ගැඹුර මීටර් 5.1 ක් ද වේ. ලෙන් විවරය වටාම විසිරුණු කටාරම මෙහි දක්නට ලැබේ. මෙම ලෙනට මීටර් 150 ක් උතුරු දෙසින් පිහිටි පර්වතයේ ක්ෂේත්‍රකාවාටයක් ද හඳුනාගත හැකි ය. මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ම කදිරවේලි සිට සේරුවාවිල මාර්ගයේ මාර්ගයට යාබඳව පිහිටි ගල්තලාවක හමුවන තවත් කටාරම් ලෙනකි. මෙම ලෙන උසින් මීටර් 3 ක් ද, පළලින් මීටර් 6.5 ක් ද ගැඹුරින් මීටර් 4 ක් ද වේ. ලෙන් විවරයට උතුරු දෙසින් කණු පාදම් ගල් කොටස් දෙකක් හමුවේ. එයට යාබදව නැගෙනහිර දෙසින් පිහිටි තවත් කටාරම් ලෙනකි. එය ප්‍රමාණයෙන් උස මීටර් 16 ක් හා පළල මීටර් 16.9 ක් පමණ වේ. කටාරමට පහළින් ලෙන් ලිපියක සාධක හමු වන අතර ලෙන් පියස්සේ තුනී බදාමයක් මත රතු වර්ණය බහුලව ශේෂ වී ඇති සිතුවම් සාධක හමුවේ. මෙම ලෙනට නැගෙනහිර දෙසින් හා ඊට යාබදව පිහිටි කටාරම් ලෙන උසින් මීටර් 1.8 ක් ද පළල මීටර් 6 ක් ද ගැඹුර මීටර් 3.4 ක් ද වේ. මෙම ලෙන අවට ගඩොල් කැබලි විසිරී ඇත.

**වෙරුගල් පුරාවිද්‍යා නටබුන්**

මුතූර් මඩකලපු මාර්ගයේ හමුවන චීන වරාය ගල් කැඩීමේ ව්‍යාපෘතිය පැවති භූමියේ නටබුන් ස්තූපයක සාධක හමුවේ. මෙම ස්තූපය පවතින කොටසේ විෂ්කම්භය මීටර් 10 ක් පමණ වේ. එහි මධ්‍යයේ නිදන් හොරුන් විසින් හාරන ලද විශාල වලක් ඇති අතර කැණීම් හේතුවෙන් ස්මාරකයට හානි සිදුව ඇත.

**කුරුණෑගල වීරඹුගෙදර තම්මිටවත්ත ඉඩමෙහි කළුගල් කැඩීමේ ව්‍යාපෘතියෙහි පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි අංක 85 ජී තම්මිට ග්‍රාම නිලධාරී වසමෙහි මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යනු ලැබේ.

පෞද්ගලික හිමිකමක් සහිත තම්මිටවත්ත නම් ඉඩමෙහි මේ වන විට ද පවත්වාගෙන යනු ලබන කළුගල් කැඩීමේ ව්‍යාපෘතියෙහි කාලය තව වසරකින් දීර්ඝ කිරීමට අවසර ගැනීමට ඒ සඳහා වන පුරාවිද්‍යාත්මක බලපෑම් ඇගයීම සිදුකිරීම මෙම සමීක්ෂණයෙහි අරමුණ වී ඇත.

කලුගල් කැඩීමේ ව්‍යාපෘතියෙහි පුරාවිද්‍යාත්මක හානි ඇගයුමට අනුව මෙහි ඉතා සුළු වශයෙන් ගඩොල් අවශේෂ පැවතිය ද ඒවායේ ප්‍රාථමික පිහිටුම හඳුනා ගැනීමට හැකි වී නොමැති බැවින් මෙම කළුගල් කැඩීමේ ව්‍යාපෘතිය ඉදිරි වසරක කාලයක පවත්වාගෙන යාමට අවසර ලබා දීමට පුරාවිද්‍යාත්මක බලපෑම් ඇගයීම් වාර්තාවෙන් යෝජනා වී ඇත.

**වැලිඋල්ල - හාල්ඔය කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතියෙහි පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ව්‍යාපෘතිය**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ලුනුවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිඋල්ල ග්‍රාම නිලධාරී වසමේ යෝජිත කුඩා ජල විදුලි බලාගාරය ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙම කුඩා

ජල විදුලි බලාගාරය ඉදිකිරීමට නියමිත භූමියේ සහ ඒ අවට ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ හානියකින් තොරව ආරක්ෂා කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණ වී ඇත.

මෙම භූමියෙහි ගලෙහි කුඩුම්බි සිදුරු සහිත යම් ඉදිකිරීමක සාධක ඇති නමුත් මෙම යෝජිත ව්‍යාපෘතියෙන් එම ස්ථානයට හානියක් නොවන බැවින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කොන්දේසිවලට යටත්ව ව්‍යාපෘතිය සිදුකිරීමට හැකි බව අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත.

**මත්තල ගුවන්තොටුපල ඉදිකිරීම සඳහා යෝජිත කලුගල් කැඩීමේ ව්‍යාපෘතියට අදාළ වූ පුරාවිද්‍යා හානි ඇගයුම් ව්‍යාපෘතිය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බඳගිරිය ග්‍රාම නිලධාරී වසමේ බඳගිරිය වන සංරක්ෂිතය තුළ පිහිටා ඇත.

මෙම අධ්‍යයනයෙහි අරමුණට අනුව යෝජිත කලුගල් කැඩීමේ ව්‍යාපෘතිය මගින් පුරාවිද්‍යා ස්මාරකවලට හා ස්ථානයන්ට සිදුවන හානිය හා බලපෑම අධ්‍යයනය කරන ලදි. මෙම අධ්‍යයනයේ දී කලුගල් කැඩීමට යෝජිත ගල්තලාව හා ඒ අවට පිහිටි කුඩා ගල්තලා ආශ්‍රිතව ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ශිලා මෙවලම්, පැරණි මැටි බඳුන් කැබලි සහ යබොර කොටස් හමු වී ඇත. එසේ ම යෝජිත ගල් තලාවට කිලෝමීටර් 03 ක් පමණ දුරින් බඳගිරිය ස්තූපය හා ස්මාරක පිහිටා ඇත. මතුපිටින් පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන මෙම ස්ථානය මෙන් ම ගල්තලාව මතුපිට හමුවන පුරාවිද්‍යාත්මක සාධක අනුව ඒ අවට ප්‍රදේශය පැරණි ජනාවාස සාධක හමුවිය හැකි බවට පෙන්වා දී ඇත.

යෝජිත ගල්තලාවට කේන්ද්‍රියව දළ වශයෙන් මීටර් 100 පමණ අර්ධයකින් යුත් වපසරිය තුළ ප්‍රාග් ඓතිහාසික වටිනාකමින් යුතු ජනාවාස පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අයත් සාධක මතුපිටින් හමුවීම සැලකිය යුතු මට්ටමින් ප්‍රබලව වාර්තා කර ඇත. ඒ අනුව අධ්‍යයන වාර්තාවෙහි

1. ඉල්ලුම්කර තිබෙන භූමි ප්‍රමාණය කිසිසේත් නො ඉක්මවීම.
2. උක්ත භූමි ප්‍රමාණය නො ඉක්මවා කිසිදු ආකාරයක මතුපිට භූමිය යන්ත්‍රසූත්‍ර භාවිතයෙන් පස් හැරීම් හෝ පස් ඉවත් කිරීම නො කිරීම.
3. යෝජිත ගල් තලාවෙන් කලුගල් කඩා ඉවත් කර ගත් පසු කැණීමට ලක් වූ වළ භූ දර්ශනයට හානි වීම වැලැක්වීම සඳහා නැවත පස් දමා පිරවීම.
4. මෙය විශේෂ සංවර්ධන කටයුත්තක් බැවින් යෝජිත ගලෙන් ගල් කඩා ඉවත් කර ගැනීම ඉහත සංවර්ධන කාර්ය සඳහා පමණක් ම සිදු කළ යුතු වීම යනාදිය යෝජනා වශයෙන් ඉදිරිපත් කර ඇත.

**ඔඩ්ඩුසුඩාන් කලුගල් කැඩීමේ ව්‍යාපෘතියෙහි පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ව්‍යාපෘතිය - තඩ්ඩමලෙයි**

උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 61 ඔඩ්ඩුසුඩාන් මුල්ලෙයි ග්‍රාම නිලධාරී වසමේ කන්කොරි ඉඩමේ පිඹුරු අංක

DS/ODNL/SU/2010/2/2010/18 ලෙස සඳහන් කැබලි අංක "එල් සිට එන්" දක්වා වු කොටස් අධ්‍යයනයට ලක් කොට ඇත.

ඉහත ස්ථානයෙහි පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්මාරක/ස්ථාන හෝ පුරාවිද්‍යාත්මක සාධක විනාශ වීම වැලැක්වීමත්, එම ස්ථාන හා අවට පරිසරය ආරක්ෂා කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණු වී ඇත.

පුරාවිද්‍යා බලපෑම් ඇගයීමට ලක් වු භූමියෙහි කටාරම් සහිත ලෙනක් හමු වී ඇත. ඒ අවට ගඩොල් කොටස් විසිරී පැවතිණි. මෙම ලෙනෙහි සිට මීටර 100 ක පමණ දුරින් නිදන් හොරුන්ගේ ග්‍රහනයට ලක් වු බවට සාධක ඇති ස්තූප ගොඩැල්ල අවට සිරිපතුල් ගලක්, ගල් බැම් කොටස්, ගල්කණු කොටස් හමු වී ඇත. මේ දාගැබ් ගොඩැල්ලට මීටර් 30 ක් පමණ දුරින් කුඩා ගල්තලාවක් මත ඉදිකිරීම් සාධක දැකිය හැකි ය. පැරණි ගඩොල්, උළුකොටස්, ගල් කණු කැබලි, ගල් තලාව මත වු කණු සිටුවීමට යොදන ලද සිදුරු හඳුනාගත හැකි වී ඇත. මෙම පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් සාධක හමුවන භූමියෙහි,

1. DS/ODN/L/SU/2010/2/2010/18 පිඹුරට අයත් "එල්" කොටසෙහි පුරාවිද්‍යා අවශේෂ, ගොඩැලි බහුලව පැවතිය ද බොහෝ සේ විනාශ වී ඇත.
2. ඉහත පුරාවිද්‍යා අවශේෂ ආරක්ෂා කර ගැනීම පිණිස පිඹුරෙහි "එල්" සහ "එම්" යන කොටස් පූර්ණ වශයෙන් පුරාවිද්‍යා ආරක්ෂිත භූමියක් වශයෙන් වෙන් කිරීමට යෝජනා කිරීමත් තාවකාලිකව එම ප්‍රදේශ ආවරණය වන පරිදි මායිම් සලකුණු කර ඇත.
3. ඉහත තාවකාලිකව ආවරණය කළ කොටස හැර එනම් පිඹුරෙහි "එල්" සහ "එම්" යන කොටස් හැර ඉතිරි බිම් කොටස ඇති කලුගල් කැඩීම සඳහා නිදහස් කිරීමට යෝජනා කර ඇත.
4. තාවකාලිකව ආවරණය කළ පුරාවිද්‍යා සාධක විසිරී පැවති භූමියෙහි ස්ථිර මායිම් කණු යෙදීමට ද මෙම අධ්‍යයනයෙන් යෝජනා කරයි.

මෙම අධ්‍යයනයෙන් ඉහත යෝජනා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමකින් සිදු කිරීමට උචිත බව ද පෙන්වා දී තිබේ.

**බදුලුදෙන හල්දුම්මුල්ල කුඩා ජල විදුලිබලාගාර ව්‍යාපෘතියෙහි පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ව්‍යාපෘතිය**

බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොස්ගම ග්‍රාමනිලධාරී වසමේ බදුලුදෙන නැමැති ස්ථානයේ කුඩා ජල විදුලි බලාගාරය ඇරඹීමට සුදුසු භූමිය ලෙස තෝරා ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීමෙන් එම භූමියෙහි පැවැතිය හැකි පුරාවිද්‍යාත්මක සාධක විනාශ වීම වැලැක්වීමත් ඒ සඳහා විකල්පයන් යෝජනා කිරීමත් මෙම අධ්‍යයනයෙහි අරමුණ වී ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් ඉදිකරනු ලබන කැළඹුම් ලිඳ (ෆෝබේ ටැංක්) විදුලි උත්පාදන මධ්‍යස්ථානය, වේල්ල ඉදිවන ස්ථානය යන ස්ථාන ඉදිකිරීමට යෝජනා වු ප්‍රදේශවල මතුපිටින්

කිසිදු පුරාවිද්‍යා සාධකයක් හමු නොවන බැවින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොදු කොන්දේසිවලට යටත්ව අදාළ ව්‍යාපෘතිය සඳහා අවසර ලබා දීමට මෙම අධ්‍යයනයෙන් යෝජනා වී ඇත.

**පන්නල මාළිගාකන්ද කළුගල් කැඩීමේ ව්‍යාපෘතියේ පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ව්‍යාපෘතිය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එළිබිච්චිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාළිගාකන්ද නම් ඉඩමෙහි ගල්කොරි පවත්වාගෙන යනු ලබයි. මෙම කළු ගල් කැඩීමේ කර්තව්‍ය සිදුවන සමස්ථ ගල් තලාව ම ආවරණය වන පරිදි සිදු කළ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතුවලින් මෙම ස්ථානයෙහි පිහිටා ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ ආරක්ෂා කිරීමට කටයුතු කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණ වී ඇත.

අධ්‍යයනයට ලක් වූ මෙම ගල් තලාවෙහි සක්කගල් බැම්ම සහිත කොටස සීමා සළකුණු කොට එම ගල් බැම්ම විනාශ නොවන ආකාරයෙන් කළුගල් කැඩීමේ කටයුතු පවත්වාගෙන යාමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කොන්දේසිවලට යටත් ව අවසර දීම සුදුසු බවට මෙම අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත.

**මොරගොල්ල ජලවිදුලි බලාගාර ව්‍යාපෘතියෙහි පුරාවිද්‍යා හානි ඇගයීම් ව්‍යාපෘතිය**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහළ කොරළේ සහ උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් වැලගඟ, උලපනේ, උඩගම, සිංහපුර, ගම්පොළවෙල, ගලාත හා නවදෙවිට යන ග්‍රාම නිලධාරී වසම්වලට අයත් ප්‍රදේශ ආවරණය වන සේ මොරගොල්ල ජලාශය ඉදිකිරීමට යෝජනා වූ අතර එම භූමියේ පිහිටි පුරාවිද්‍යා ස්මාරක හානි වීම වැළැක්වීමත් පුරාවිද්‍යාත්මක අවශේෂ ආරක්ෂා කර ගැනීමත් මෙම අධ්‍යයනයෙහි අරමුණ වී ඇත.

ඉතා කඩිනමින් සිදු කළ මෙම පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණය මඟින් වැලගඟ, මාවතුරෙහි පිහිටි මෑත කාලීන බෞද්ධ විහාරස්ථානයක් වූ ශ්‍රී ගංගාරාම විහාරය පිහිටි භූමිය අවට අධ්‍යයනයෙන් කිසිදු පුරාවිද්‍යාත්මක සාධකයන් හමු වී නොමැත. මෙම ගංගාරාම විහාරයට  කිලෝමීටර් 4 ක් පමණ දුරින් පිහිටි පුරාණ ගල් විහාරය නම් විහාරස්ථානයෙහි කළුගල් කුට්ටිවලින් නිර්මිත ප්‍රදක්ෂිණා පථයක් සහිත පිළිම ගෙයක්, බොරදමින් යුතු ගල්කුට්ටි, ගල් කුට්ටි යෙදූ පියගැට, නව විහාර මන්දිරය අධ්‍යයනයට ලක්ව ඇත.

අත්‍යවශ්‍ය සංවර්ධන කටයුත්තක් වන මොරගොල්ල ජලාශයට අයත් වන භූමියෙහි පුරාවිද්‍යාත්මක සාධක අවම බැවින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත මෙම භූමිය නිදහස් කිරීමට මෙම අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත.

**මිල්ලඹය කුඩා ජලවිදුලි බලාගාර ව්‍යාපෘතියෙහි පුරාවිද්‍යා බලපෑම් ඇගයීමේ ව්‍යාපෘතිය**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුවත්ත ග්‍රාම නිලධාරි වසමෙහි ගොනාවැටුණු ඇළ, මඩුවත්ත පතන නම් ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමට යෝජනා වී ඇති අතර එම භූමි ප්‍රදේශයෙහි හමුවිය හැකි පුරාවිද්‍යාත්මක අවශේෂ ආරක්ෂා කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණ වී ඇත.

යෝජිත ව්‍යාපෘති භූමියෙහි පුරාවිද්‍යාත්මක සාධක මතුපිට හමු නොවන බැවින් සහ ව්‍යාපෘති භූමියේ සිට කිලෝමීටර් 1 ක් පමණ වපසරියෙහි පිහිටි යටත්විජිත යුගයේ පැරණි ජලටැංකියක්, පැරණි බෝක්කුවක්, ගොඩනැගිල්ලක කළුගල් පාදමක් හමු වුව ද යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් එම පුරාවිද්‍යාත්මක සාධකවලට බලපෑමක් සිදු නොවන බැවින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ කොන්දේසි සහිත එකඟතා මත ව්‍යාපෘතියෙහි කටයුතු සිදුකිරීමට සුදුසු බව මෙම අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත.

**සීගිරිය සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණය**

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීගිරිය ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටා ඇත.

ලෝක උරුමයක් වූ සීගිරියෙහි සිතුවම් කරා ප්‍රවේශවන දඟරාකාර පියගැට පෙළ සඳහා කෘමි ආවරණ දැලක් යෙදීම, යටිතල පහසුකම් සඳහා වැසිකිළි ඉදිකිරීම හේතුවෙන් ලෝක උරුමයක් වන සීගිරියෙහි භූමි දර්ශනයට හානි නොකොට එමෙන් ම පුරාවිද්‍යාත්මක අවශේෂයන්ට හානි නොවන ලෙසට පුරාවිද්‍යා අවශේෂ ආරක්ෂා කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වී ඇත.

සීගිරි චිත්‍ර විනාශ වීම වැලකීමට කෘමීන්ට සහ කුඩා සතුන්ට ඇතුල්වීමට නො හැකි ආවරණයක් යෙදීමේ දී කිසිදු හිඩසක් ඉතිරි නොවන සේ පෞරාණික අවකාශයට, පරිසරයට, ස්වභාවික පෙනුමට අනුගත වන ලෙස පැරණි දිරාගිය දැල් ආවරණය ඉවත් කර ඉක්මනින් දිරා නො යන ලෙස තෝරාගත් දැලක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ යෙදීමට අවසර දීම සුදුසු බව මෙම අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත.

යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ දී වැසිකිලි වැනි දෑ ඉදිකිරිමේ දී ද දේශීය විදේශීය සංචාරකයන්ට සුදුසු වන ලෙසත් පෞරාණික අවකාශයට බාධා නොවන පරිදිත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමත සැලසුමකට අනුව දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඉදිකිරීමට සුදුසු බව අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත.

**තිරුක්කෝවිල් ගිලුණු නැව් ඉවත් කිරීමට පූර්වයෙහි සිදු කළ පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණය**

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ තිරුක්කෝවිල් ආසන්නයේ මෙම ගිලීගිය නෞකාව පිහිටා ඇත. මෙම ගිලුණු නැව ඉවත් කිරීමට ප්‍රථම එහි පුරාවිද්‍යාත්මක සාධක විනාශ වීම වැළැක්වීම අරමුණු කොටගෙන මෙම අධ්‍යයනය සිදු කර ඇත.

පළමු ගිලුණු නැවට අයත් බිඳී ගිය සුන්බුන් අතර නැංගුරම් තඹ, නැව් පට්ටම්, bollard සහ fume pipe bow කොටස්, Ship huli හඳුනා ගැනුණි.

දෙවන ගිලුණු වාෂ්ප නැවෙහි බොයිලේරු දෙකක් Riveted යකඩ පතුරු කොටස් Furíce doors, Connecting rod සහ එංජින් කොටස්, ඉනිමං කොටස්, භාණ්ඩ ප්‍රවාහන කොටසට අයත් අවශේෂ, Spare propeller hub ආදිය පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු අවශේෂ ලෙස වාර්තා කරනු ලැබිණි.

පළමු ගිලුණු නැවෙහි පුරාවිද්‍යාත්මක හෝ සංචාරකමය ආකර්ශනයක් ගතහැකි මට්ටමේ වටිනාකමක් නොමැති බැවින් එය ඉවත් කිරිමට හැකි බව අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත. ගිලී තිබූ දෙවන වාෂ්ප නැව සුවිශේෂී සංස්කෘතිකමය මෙන් ම සංචාරකමය වශයෙන් වටිනාකමක් පවතින බැවින් එය ඉවත් කිරීම නුසුදුසු බව අධ්‍යයනයෙන් තවදුරටත් පෙන්වා දී ඇත.

**පුරාවස්තු විනාශය වැළැක්වීමේ ඒකකය**

2010 වර්ෂයේ පුරාවස්තු විනාශය වැළැක්වීමේ ඒකකයට වාර්තා වී ඇති සිද්ධි පිළිබඳ වාර්තාව

| අනු අංකය | දිස්ත්‍රික්කය | සොරකම | පුරාවස්තු විනාශය | අනවසර කැණීම් | වෙනත් |
|---|---|---|---|---|---|
| 01 | අනුරාධපුර | 02 | 05 | 28 | 04 |
| 02 | පොළොන්නරුව | 01 | 07 | 31 | 02 |
| 03 | පුත්තලම |  |  | 04 | 02 |
| 04 | කුරුණෑගල | 02 | 10 | 28 |  |
| 05 | කළුතර | 01 |  | 04 | 02 |
| 06 | කොළඹ |  | 02 | 03 | 03 |
| 07 | ගම්පහ |  | 05 | 04 | 03 |
| 08 | මන්නාරම |  | 02 |  |  |
| 09 | වව්නියාව |  | 01 | 04 |  |
| 10 | යාපනය | 01 |  |  |  |
| 11 | කිලිනොච්චිය |  |  |  |  |
| 12 | මුලතිව් |  |  | 01 |  |
| 13 | මාතර |  | 03 | 05 |  |
| 14 | ගාල්ල |  |  | 02 | 01 |
| 15 | හම්බන්තොට | 02 | 04 | 05 | 02 |
| 16 | රත්නපුර |  | 01 | 07 | 01 |
| 17 | කෑගල්ල |  | 04 | 05 |  |
| 18 | අම්පාර |  |  | 11 |  |
| 19 | ත්‍රිකුණාමලය |  | 04 | 15 | 04 |
| 20 | මඩකලපුව |  | 01 | 07 |  |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21 | මහනුවර | | 05 | 03 | 02 |
| 22 | මාතලේ | | 04 | 05 | 01 |
| 23 | නුවරඑළිය | | 01 | | 02 |
| 24 | මොණරාගල | 01 | 04 | 05 | 02 |
| 25 | බදුල්ල | 02 | 01 | 06 | 04 |
| | **එකතුව** | **12** | **64** | **183** | **35** |

## 2010 වර්ෂයේ දී පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ස්මාරක

| දිස්ත්‍රික්කය | ස්මාරක | ස්මාරකය පිහිටි ස්ථානය | ගැසට් අංකය/දිනය |
|---|---|---|---|
| කෑගල්ල | ශිලාලිපිය සහිත කටාරම් කෙටු ලෙන | බොඳුරැල්ල හේනවත්ත ඉඩම් | 2010.10.21 1677 |
| | ප්‍රාග් ඓතිහාසික සංකේත සහිත ලෙන සහ කටාරම් කෙටු ලෙන | අස්මඩල ගල්ගොඩ හේනවත් ඉඩම | 2010.10.21 1677 |
| | කටාරම් කෙටු ලෙන | අස්මඩල ලුණුමිදිඇල්ල රක්ෂිතය | 2010.10.21 1677 |
| | කටාරම් කෙටු ලෙන | ඉහළකඩේ අස්මඩල | 2010.10.21 1677 |
| | කටාරම් කෙටු ලෙන | දෙගලකිරිය ගලඋඩතැන්න විහාර භූමිය | 2010.10.21 1677 |
| කළුතර | පැරණි ධර්ම ශාලාව | හොරේතුඩුව ගංගාරාම විහාර භූමිය | 2010.10.21 1677 |
| ගාල්ල | පැරණි සිතුවම් හා මූර්ති සහිත ප්‍රතිමා ගෘහය | තෙලිකඩ ශ්‍රී සුනන්දාරාම පුරාණ විහාර භූමිය | 2010.10.21 1677 |
| | පැරණි සිතුවම් හා මූර්ති සහිත ප්‍රතිමා ගෘහය | පනංගල ගංගාරාම විහාර භූමිය | 2010.10.21 1677 |
| | පැරණි සිතුවම් හා මූර්ති සහිත ප්‍රතිමා ගෘහය සහ ස්ථූපය | වාඩුවැලිවිටිය ගංගාරාම විහාර භූමිය | 2010.10.21 1677 |
| | පැරණි ගල්කුළුණු | අංපිටිය දේවාල භූමිය | 2010.10.21 1677 |
| | පැරණි ධර්ම ශාලාව | නාගොඩ ජයසිංහාරාම පුරාණ විහාර භූමිය | 2010.10.21 1677 |
| | පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය | ඉහළගොඩ සිරිවිජයාරාම විහාර භූමිය | 2010.10.21 1677 |
| මාතර | පැරණි ප්‍රතිමා ගෘහය | කොලවෙනිගම රජමහා විහාර භූමිය | 2010.10.21 1677 |
| මහනුවර | රැස්වීම් ශාලාව | ශාන්ත අන්තෝනි දේවස්ථාන භූමිය | 2010.10.21 1677 |
| | මුලාදෑනි මන්දිරය | දේව විදිය | 2010.10.21 1677 |
| | පැරණි උසාවි ගොඩනැගිල්ල හා ඊට උතුරු දෙසින් ඇති පැරණි ගොඩනැගිලි 04 | බූවැලිකඩ | 2010.10.21 1677 |
| | ප්‍රතිමා ගෘහය | තල්වත්ත ගංගාරාම විහාර භූමිය | 2010.10.21 1677 |
| | ප්‍රතිමා ගෘහය | සුදුහුම්පොල රජමහා විහාර භූමිය | 2010.10.21 1677 |
| | කටාරම් කෙටු ලෙන සහ ප්‍රතිමා ගෘහය | වට්ටාරන්තැන්න පුරාණ රජමහා විහාර භූමිය | 2010.10.21 1677 |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිමා ගෘහය සහිත පෝයගෙය | මල්වත්ත පෝයමළු විහාර භූමිය | 2010.10.21 1677 |
| | පැරණි ප්‍රතිමා ගෘහය | නාගවිමාන කන්දේ විහාර භූමිය | 2010.10.21 1677 |
| | චෛත්‍ය සහිත කටාරම් කෙටූ ලෙන් විහාරය සහ පියගැට පෙළ | උරුලෑවත්ත පුරාණ විහාර භූමිය සහ පත්තිනි දේවාල භූමිය | 2010.10.21 1677 |
| | ටැම්පිට ප්‍රතිමා ගෘහය සහ පැරණි ආවාස ගෙය | දංකුඹුර පුරාණ විහාර භූමිය | 2010.10.21 1677 |
| | පැරණි චෛත්‍යය | වෙහෙරගල | 2010.10.21 1677 |
| මාතලේ | පැරණි ප්‍රතිමා ගෘහය සහ ආවාස ගෙය | පල්ලෙගෙනේ පොත්ගුල් විහාර භූමිය | 2010.10.21 1677 |
| | වතුබංගලාව | රෙඩ්බානාගම වරකන්ද ගෘප් | 2010.10.21 1677 |
| නුවරඑළිය | පැරණි සංඝාවාසය | හගුරන්කෙත පොත්ගුල් විහාර භූමිය | 2010.10.21 1677 |
| කුරුණෑගල | කටාරම් කෙටු ලෙන | කුරුණෑගල නගරය ශ්‍රී ශෛලතලාරාම විහාර භූමිය | 2010.10.21 1677 |
| | කටාරම් කෙටු ලෙන | හඳමාගල බිසෝගල | 2010.10.21 1677 |
| | මහදුරයාගේ සොහොන | පහළ ගැට්ටුවාන | 2010.10.21 1677 |
| | බ්‍රාහ්මී ශිලාලේඛණ සහ කටාරම් කෙටු ලෙන | විල්බාව රජමහා විහාරය | 2010.10.21 1677 |
| | කටාරම් සහිත ලෙන් විහාරය | ගිණිකරාව රජමහා විහාරය | 2010.10.21 1677 |
| | කටාරම් සහිත ලෙන් | හඳමාගම විහාර භූමිය | 2010.10.21 1677 |
| | පෞරාණික ගොඩනැගිලි නටබුන් සංකීර්ණ | බන්නැග්ගම බණමඩුව නැමැති ස්ථානය | 2010.10.21 1677 |
| | ටැම්පිට විහාරය | උඩුබඩගම පුරාණ විහාර භූමිය | 2010.10.21 1677 |
| | පැරණි ප්‍රතිමා ගෘහය | ගනේවැව පුරාණ විහාර භූමිය | 2010.10.21 1677 |
| | කටාරම් කෙටූ ගල්ලෙන සහ පැරණි චිත්‍ර මූර්ති සහිත ලෙන් විහාරය | ගලදෙණිකඩ පුරාණ විහාර භූමිය | 2010.10.21 1677 |
| | ටැම්පිට දේවාල ගෘහය | ගොතටුවේගෙදර පත්තිනි දේවාල භූමිය | 2010.10.21 1677 |
| | ගල් කණු සහිත නටබුන් ස්ථානය | නාගහමුල දේවාල නටබුන් ස්ථානය | 2010.10.21 1677 |
| | කටාරම් කෙටූ ගල් ලෙන් දෙක | කුරුණෑගල නගර සීමාව තුළ ඇති ජේතවන පිරිවෙන් භූමිය | 2010.10.21 1677 |

**උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක හඳුනාගෙන සිතියම්ගත කිරීමේ මූලික ගවේෂණය**

වසර ගණනාවක් පැවති යුධමය වතාවරණය හමු වේ උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක කෙරෙහි දශක තුනකට අධික කාලයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වූයේ අවම මට්ටමකිනි. සාමකාමී වාතාවරණයක් ඇති වීමෙන් අනතුරුව එම ප්‍රදේශයේ සිදු වූ කඩිනම් සංවර්ධනයට අනුව විවිධ ආයතන එක්කොට පොදු සංවර්ධන සැලසුමකට අවශ්‍ය තොරතුරු එක්රැස් කර සිතියම් සැකසීමේ වැඩපිළිවෙළ යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පරිසර අමාත්‍යාංශය, සොබාදහම් සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (IUCN) හරහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ (UNDP) ආධාරය මත ගවේෂණ හා ලේඛනගත කිරීමේ අංශයේ භූගෝලීය තොරතුරු ඒකකය මගින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාවට ලද ආධාර මුදල මත (රු.1,330,000.00) මෙම ගවේෂණය ආරම්භ කරන ලදි. අදියර වශයෙන් සිදු කිරීමට එකඟ වූ අතර අදියරෙන් අදියර වාර්තාවන් ලබා දීම මත, ආධාර මුදල කොටස් වශයෙන් ගෙවීම් සිදු කරනු ලැබීය. 2010 වසරේ දී අදියර දෙකක් කණ්ඩායම් දෙකක් මූලික ගවේෂණ කාර්යයෙහි යෙදුණි.

උතුරු ප්‍රදේශයේ මුදවාගත් ප්‍රදේශයන්හි අනාරක්ෂිතභාවය හේතුවෙන් ගවේෂණ කාර්යයන් සිදු කරනුයේ යුධ හමුදාවේ අධීක්ෂණය යටතේ ඔවුන්ගේ කඳවුරු බලප්‍රදේශ අනුව ය. මේ අයුරින් පුරාවිද්‍යාත්මක ගවේෂණයක යෙදුණු ප්‍රථම අවස්ථාව මෙය වේ. යුද්ධය අවසන් වූ වහාම ප්‍රදේශයේ පයින් ඇවිදිමින් ගවේෂණ කටයුතු සිදු කළ දෙපාර්තමේන්තු අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හිමි වූයේ සුවිශේෂී ස්ථානයකි. යුද්ධය නිසා අවතැන්ව සිටි ජනතාව පදිංචිව නොසිටි අතර රජය විසින් නැවත පදිංචි කිරීමේ කාර්යය ආරම්භ කර තිබුණි. බිම් බෝම්බ ඉවත් කර නො තිබුණ බැවින් සියලු ම ප්‍රදේශවල පයින් ගමන්කර ගවේෂණය කළ නො හැකි විය. ප්‍රදේශයේ යුධ හමුදාව අනුමත කළ භූමිය පමණක් ගවේෂණයට ලක්විය. මෙහි දී හඳුනාගන්නාලද පුරාවිද්‍යා ස්ථානයන්හී "යෝජිත පුරාවිද්‍යා රක්ෂිත භූමියකි" යන්න භාෂා ත්‍රිත්වයෙන් ම යෙදු පුවරුවක් යෙදීම හා හැකි අවස්ථාවන්හි තාවකාලික මායිම් කණු යෙදීම ද සිදු කරනු ලැබීය.

ගවේෂණයට යාමට ප්‍රථමයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අඟලේ සිතියම භාවිතයට ගනු ලැබීය. එහි පුරාවිද්‍යා ස්ථාන ලෙස ලකුණු කර ඇති ස්ථානයන් පිළිබඳ ප්‍රමුඛ අවධානය යොමු කරන ලදී. එසේ ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තු පාලන වාර්තා සහ සිරිල් මැතිව් මහතාගේ An appeal to UNESCO to safeguard and preserve the cultural property in Sri Lanka endangered by racial prejudice, unlawful occupation or wilful destruction ග්‍රන්ථයන් ද පරිශීලනය කරනු ලැබීය.

**ආලන්කුලම් නටබුන් ගොඩනැගිලි**

තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආලන්කුලම ග්‍රාම නිලධාරී වසමේ, ආලන්කුලම ග්‍රාමයේ අනුරාධපුර යුගයට අයත් මේ නටබුන් ගොඩැල්ල පිහිටා ඇත. පැරණි ස්තූප ගොඩැල්ලක් මධ්‍යයේ නිවස ඉදිකර ඇති බව පෙනී යන අතර එහි යූප ගල දැක ගත හැකි ය. එසේම කඩා දමන ලද පිළිමයක කොටස් අසල පිහිටි ගසක් මුල දක්නට ලැබිණි. ගඩොල්, උළු, ශිලා ස්ථම්භ සහිත ගොඩනැගිලි අවශේෂ, ද දක්නට ලැබේ.



කඩා දමන ලද පිළිමයක කොටස්



යූපස්ථම්භය

**ආලන්කුලම් ස්තූප නටබුන් (65 හමුදා සේනාංක මූලස්ථානය අසල නටබුන්)**

පැරණි ගඩොල්, පැරණි උළු හා ශිලා ස්ථම්භ සහිත ගොඩනැගිල්ලක අවශේෂ දැකිය හැකි ය. අනුරාධපුර අවධියේ ගල්කටු ලක්ෂණ සහිත ගල් කොරියක් හා පැරණි සිරිපතුලක් මේ ආශ්‍රිතව දක්නා ලැබේ. සිරිපතුල් ගල අසල පිහිටි කුඩා දේවාලයක් තුළ තැන්පත් කර ඇත. නටබුන් ස්ථානයේ පිහිටි ස්තූප ගොඩැල්ල යුධමය අවශ්‍යතා සඳහා බංකරයක් ලෙස එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් හාරා සකස් කර තිබුණි. පැරණි ගඩොල්, උළු, ශිලා ස්ථම්භ සහිත ගොඩනැගිලි අවශේෂ ආදිය ද දක්නට ලැබේ.



ගල්කටු ලක්ෂණ සහිත ගලකොරිය



ස්තූප ගොඩැල්ල



පැරණි මෝල්ඩින් ගඩොල්



සිරිපතුල් ගල

**කල්විලාන් අංක 43 කුඹුරු ඉඩමේ නටබුන් හා අවට නිවාසයන්හි නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ, තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක එම් 17 කල්විලාන් ග්‍රාම නිලධාරී වසමේ කල්විලාන් ග්‍රාමයේ අනුරාධපුර යුගයට නටබුන් දක්නට ලැබේ.

පැරණි උළු, ගඩොල්, ශිලා ස්ථම්භ, සඳකඩ පහණ, කොරවක් ගල් දෙකක් දක්නට ලැබේ. මෙම භූමියේ හිමිකරු වගාකටයුතු සිදුකිරීම සඳහා භූමිය සකස් කිරීමේ දී ගොඩනැගිලි අවශේෂ තිබූ ස්ථානයෙන් වෙනත් ස්ථානයකට ඉවත් කර ඇති බව පැහැදිලි ය. එබැවින් ගොඩනැගිල්ල කුමක්දැයි නිවැරදිව හඳුනාගැනීම අපහසු ය. තවද වැව්ලිකරු දැනට පදිංචි නිවස ද යම් පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ගොඩනැගිලි පාදමක් මත ඉදිකර ඇති බවක් පෙනෙන්නට තිබේ. අනුරාධපුර යුගයට අයත් පැතිරුණ ආරාම සංකීර්ණයක් මෙම භූමියේ පැවති බවට අවට පෞද්ගලික ඉඩම් කිහිපයක ම විතැන්වූ නටබුන් ගොඩනැගිලි අවශේෂ දක්නා මගින් නිගමනය කළ හැකි ය. මේ වන විට අවට ප්‍රදේශයේ නිවාස ඉදිකර ඇත. ඔවුන් ආරාමික නටබුන් හි කොටස් තම ඉදිකිරීම් සඳහා භාවිත කර ඇති අයුරු දැක ගත හැකි ය.



කොරවක්ගල් හා ගල්කණු විසිර පවත්නා ආකාරය





නිවසේ ඇතුල්වන දොරටුව සඳහා සඳකඩ පහණක් යොදා ඇති අයුරු



ඇතුල්වන දොරටුව සඳහා සඳකඩ පහණක් යොදා ඇති අයුරු




ළිඳෙහි මෝටරය තැබීමට සිරිපතුල් ගලක් යොදා ඇති අයුරු



වැසිකිලියක ඇතුල්වීමේ පඩිය සඳහා කැටයම් සහිත මුරගලක් භාවිත කර ඇති ආකාරය



ගලවන ලද මුරගලක්





නිවාස ඉදිකර ඇත්තේ පැරණි ගොඩනැගිලි පාදම් උපයෝගී කොට ගෙනය



සිරිපතුල් ගල රෙදි සෝදන ගලක් ලෙස භාවිතයට ගෙන ඇති අයුරු





සිරිපතුල් ගල්

**කල්විලාන් ස්ථූප නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ, තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක එම් 17 කල්විලාන් ග්‍රාම නිලධාරී වසමේ කල්විලාන් ග්‍රාමයේ දක්නට ලැබේ.

අනුරාධපුර යුගයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණය නියෝජනය කරන මෙය ගඩොල් භාවිතයෙන් නිර්මාණය කරන ලද ස්තූපයක් බව පෙනී යයි. මෙම නටබුන් ගොඩැල්ල විනාශ කරන්නන්ගේ ග්‍රහණයට හසු නොවී ඇති බැවින් විධිමත් කැණීමක් සිදු කිරීමෙන් ස්තූපයේ හැඩය අනාවරණය කරගත හැකි ය. ස්වභාවික හේතු මත ස්ථූප ගොඩැල්ල ගරා වැටී ඇතත් මූලික හැඩයට ප්‍රබල හානියක් සිදුවී නැත. මෙය දැනට නව ඉදිකිරීම් නිසා හුදෙකලාව පැවතිය ද කල්විලාන්හී ඉහත විස්තර කරනු ලැබූ නටබුන් හා එක්ව තිබූ පැරණි සුවිශාල ආරාමික සංකීර්ණයක කොටස් බව නිරීක්ෂණය වේ



නටබුන් ස්තූපය

**කල්විලාන් ගල්කණු ගොඩැල්ල**

තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කල්විලාන් ග්‍රාම නිලධාරී වසමේ ඇති කල්විලාන් නම් ග්‍රාමයේ අනුරාධපුර යුගයට අයත් නටබුන්, ගල්කණු, ගල්බිඳුම් ලක්ෂණ සහිත ශිලා ස්ථම්භයන් දක්නට ලැබේ.



නටබුන් ගොඩැල්ල

**උදියකුරුප්පුකුලම් වැව අසල නටබුන් (අම්බකාමම් නටබුන්)**



මෙම නටබුන් ස්ථානය ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය කොට්ඨාසයේ, චන්‍යාඅඩම්පන් ග්‍රාම නිලධාරී වසමේ අම්බකාමම් ග්‍රාමයේ පිහිටා ඇත. රැළි සහිත ඒකාංශ පාරුපනය සහිත චීවරධාරී ශිලාමය හිටි බුද්ධ ප්‍රතිමාවක් මෙම නටබුන් භූමියේ බෝධි වෘක්ෂයට ආසන්නව දැකිය හැකි ය. මෙය එම භූමියේ ළිඳක් තුළ තිබී හමුවූවක් බව එවකට මෙම ස්ථානයේ සිටි පුද්ගලයෙකු ගවේෂණ කණ්ඩායමට පැවසීය. ප්‍රතිමාවේ ශීර්ෂය බෙහෙවින් ඛාදනයට ලක්වීම නිසා අංග ලක්ෂණ හඳුනාගත නො හැකි ය. මෙම තත්වය ස්වභාවික හේතූන් මත වූයේ ද මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවූයේ ද යන්න නිශ්චිතව කිව නො හැකි ය. ප්‍රතිමාවේ දෙඅත් කැඩී ඇති බැවින් මුද්‍රාව හඳුනාගත නො හැකි ය.

මෙම ප්‍රතිමාවට ආසන්නයෙන් ගඩොල් භාවිතයෙන් ඉදිකරන ලද පැරණි ස්ථූපයකි. මෙම ස්ථූපය එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරීන් විසින් බංකරයක් සඳහා යොදා ගැනීම හේතුවෙන් සම්පූර්ණයෙන් ස්වරූපය වෙනස් වී ඇත. විශාල අගල් කැපීම නිසා ස්ථූප වපසරියෙන් 1/4 කට වඩා වැඩි කොටසක් විනාශ වී ඇත.



බංකරයක් සඳහා යොදා ගෙන ඇති ස්ථූපය

ස්ථූපයට ආසන්නව විශාල ශිලාමය ස්ථම්භ යොදාගෙන සිදුකළ ඉදිකිරීම් කිහිපයක නටබුන් දක්නා ලැබේ. මෙහි ඇති නටබුන් අනුව ආරාම සංකීර්ණයක් බව පෙනී යයි. මෙහි ඇති එක් ගොඩනැගිල්ලක් පොහොය ගෙයක් ලෙස අනුමාන කළ හැකි ය. සමහර ශිලා ස්ථම්භ කැඩී ගොස් ඇත. මෙම ගොඩනැගිල්ලට ගිණිකොන දෙසින් තවත් නටබුන් ගොඩනැගිලි කිහිපයක ශේෂිත සාධක හඳුනාගත හැකිය. ඒ අතර පාදම් කණු කොටස් හා ශිලා ස්ථම්භ කොටස් දක්නා ලැබේ. පැවති ආරක්ෂක තත්වය මත කැලෑ ප්‍රදේශය ගවේෂණයට ලක් නො කරන ලදි.

**කුලාමෝට්ටෙයි නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 72 අම්බකාමම් ග්‍රාම නිලධාරී වසමේ අම්බකාමම් කුලාමෝට්ටෙයි ග්‍රාමයේ මෙම ස්ථානය පිහිටා ඇත. පැරණි නුවර පාරට ආසන්නව පෞද්ගලික ඉඩමක් හා මාර්ගයක් අතර පිහිටි ගඩොල් බැම්මක් හා ගඩොල් අවශේෂ, මැටි බඳුන් කැබලි මෙහි දක්නට ලැබේ.



ගඩොල් බැම්ම



පැරණි උළු

**වඩ්ඩකාලිකුලම් වැවට නැගෙනහිරින් නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අම්බකාමම් ග්‍රාම නිලධාරී වසමේ ඉරණමඩු ග්‍රාමයේ නටබුන් සාධක සහිත ස්ථානයකි. වඩ්ඩකාලිකුලම් වැවට නැගෙනහිරින් පිහිටි මෙම නටබුන් ගොඩනැගිල්ල නිශ්චිතව හඳුනාගත නො හැකි ය.



නටබුන් ගොඩැල්ල

**මුතියංකට්ටු නටබුන් (තඩ්ඩයමලෙයි)**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුතියංකට්ටුකුලම් ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මෙම ස්ථානය මුතියංකට්ටුව වැවට ඉතා ආසන්නව පිහිටා ඇත.

මුතියංකට්ටුව වැවට ඉතා ආසන්නව පිහිටි මෙම නටබුන් අතර ප්‍රාකාර බැම්මක් ලෙස හඳුනාගත හැකි ගඩොලු හා ශිලා භාවිතයෙන් කළ බැම්මක සාධක වේ. මීට අමතර ව මෙම ස්ථානයේ නිධන් හොරුන්ගේ ග්‍රහණයට ලක්වූ ගඩොල් හා ශිලාමය අවශේෂ සහිත ගොඩැල්ලකි. එම ගොඩැල්ලේ කොරවක් ගල් 2 ක්, ආසනයක ස්වරූපය ගන්නා නිශ්චිතව හඳුනාගත නො හැකි සකස්කළ ශිලාමය පුවරුවක් හා ශිලාස්ථම්භ කිහිපයක කොටස් දැකිය

හැකි ය. මෙම ගොඩැල්ලට මීටර් 8 ක් පමණ දුරින් ගරා වැටුණු පියගැටපෙළක ශේෂවූ කොරවක් ගල් 2 ක් හා විශාල ශිලාමය පුවරුවකි. මෙය දිගින් මීටර් 4.45 ක් ද පළලින් මීටර් 2 ක් ද ඝනකමින් සෙ.මී 57 ක් ද වේ. මෙම ශිලා පුවරුව ඇති භූමියේ යම් ඉදිකිරීමක සාධක හා ශිලා බැම්මක සාධක තැනින් තැන හඳුනාගත හැකි ය. මෙම ගොඩැල්ලේ දැනට පුරාවස්තූන් විසිරී ඇති ස්වරූපය හා ශේෂිත සාධක මත මෙය පධානඝරයක් යැයි අනුමාන කල හැකිය. ලූවිස් විසින් 1895 වර්ෂයේ දී තඩ්ඩයමලෙයි ලෙස හඳුන්වන ස්ථානය මෙම ස්ථානය ලෙස හඳුනාගත හැකිය. ලූවිස්ගේ මැනුවල් ඔෆ් වන්නි දිස්ත්‍රික් (a Manual of the Aanni Districts, Ceylon) කෘතියෙහි වාර්තා කිරීමට අනුව තඩ්ඩයමලෙයි පර්වතයෙහි වූ විවිධ ඉදිකිරීම් සඳහා භාවිත ගල් හා ගඩොල් ගලවාගෙන ගොස් ඔඩ්ඩුසුඩාන් හින්දු කෝවිල සඳහා භාවිත කර තිබූ බව වාර්තා වෙයි. එසේ ම කෝවිලෙහි ඉදිකිරීම් සඳහා ඒවා භාවිත කළ බවත් සනාථ වන අතර එම ගොඩනැගිලිවලට අයත් සාධක ලෙස හඳුනාගත හැකි ගල් කණු කොටස් කිහිපයක් එහි ඇති බව පෙනේ. ගලවා ඉවත් කරන්නට ඇතැයි හෝ භාවිතයට නොගන්නා ලද ගල් කණු කොටස් කිහිපයක් කෝවිල් භූමියෙහි වේ. මේවායෙහි අනුරාධපුර අවධියෙහි දී ගල් කණු සැකසීමේ දී ගල් වෙන් කර ගැනීමට යොදන ලද ඕවලාකාර ගල් කටු සිදුරු ද වේ (Lewis 1993 : 310).



කොරවක් ගල් දෙක



විනාශ වී ඇති පුරාවස්තූ



ශිලා පුවරුව

**කොකාවිල් රූපවාහිනි සම්ප්‍රේෂණ කුළුණ අසල නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 75 තිරුමුරුකණ්ඩි 75 ග්‍රාම නිලධාරී වසමේ, කොකාවිල් ග්‍රාමයේ පිහිටා ඇත. මෙම ස්ථානය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රධාන සම්ප්‍රේශණ කුළුණ ලෙස යොදාගත් ස්ථානයයි. මෙහි කුළුණ ඉදිකර ඇත්තේ නටබුන් ගොඩැල්ලක් මධ්‍යයේ ය. අවට ප්‍රදේශයේ ශිලා ස්ථම්භ කොටස්, මැටිනළ කැබලි දක්නට ලැබේ, උළු, ගඩොල් ආදිය විසිර පවතී. පිළිම පාදමක්, කණු පාදම් ගල් ආදිය ද දක්නට ඇත. කොකාවිල් සම්ප්‍රේශණ කුළුණ නැවත ඉදිවෙමින් පැවති අතර පුරාවස්තු උපයෝගී කරගෙන විනාශකාරී ක්‍රියාකාරකම් සිදු වෙමින් පැවතිණ. ගවේෂණය කරන අතරවාරයේ දී පොළොව මතුපිටට යන්තම් දිස්වූ ගල් පුවරුවක්, මුරගලක් විය හැකි බව හඳුනාගත් ගවේෂණ කණ්ඩායම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ වාචික අවසරය මත එය පාදා ගෙන එම ස්ථානයේ ස්ථාපිත කරනු ලැබීය.







මුරගල පාදාගැනීම සිදු කළ ආකාරය



නටබුන් ගොඩැල්ලක්



නටබුන් කොටස් අවභාවිතයට ගෙන ඇති අයුරු



පෙරළා දමා ඇති කණුපාදම් ගලක්

**කච්චිලාමඩු නටබුන් (පේර්ආරු)**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කච්චිලාමඩු ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත.

පේරාරු කොකාවිල් ග්‍රාමයේ පිහිටි මෙම නටබුන් ස්ථානය මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වෙනස්වීම්වලට ලක්ව ඇත. පැරණි ශිලා ස්ථම්භ කිහිපයක් ස්ථානයේ තිබී ඇති බවට සාධක ඇතත් දැනට ඇති වැඩි ප්‍රමාණයක් වූ ශිලා ස්ථම්භ අවට වෙනත් පුරාවිද්‍යා ස්ථානවලින් ගෙනවිත් මෙම ස්ථානයේ පිහිටුවා ඇති බව පැහැදිලි ය. නටබුන් අතර සඳකඩපහන, සිරිපතුල් හා ආසනයක්, අෂ්ඨමංගල ලකුණු සහිත ශිලා පුවරුවක්, මුරගලක් මෙම ස්ථානයට පිටතින් ගෙන ආ බව දැනගන්නට ලැබිණි. මෙම තත්වය මත ස්මාරකය පිළිබඳ අදහසක් ලබා ගැනීමට අපහසු ය. තවද කෙරුඩමඩු නම් ස්ථානයෙන් ගෙන එන ලද බුද්ධ ප්‍රතිමාවක් හා බෝධිසත්ව ප්‍රතිමාවක කොටසක් මෙහි තබා ඇත. භූමිය පුරා ම තැනින් තැන ගඩොල්, උළු අවශේෂ හා වළංකටු විසිර පවතී. දැනට මෙම භූමියේ ඇති යුධහමුදා තාවකාලික කඳවුරට නැගෙනහිරින් වූ පැරණි ළිඳ පතුල හා පතුල කොටස්, ගලින් කර ඇති අතර පැරණි ගඩොල් බැම් වරි 25 ක් පමණ ඉහළට බැඳ ඇත. මෙම ගඩොලු ළිඳෙහි හැඩය ගැනීමට උචිත ආකාරයට සකසා ඇති බව ද පෙනේ. මෙම ළිඳ වසර 100 වඩා පැරණි බව පැහැදිලි ය.



මුරගල



ගල් කණු



ශිලාමය පුවරුව


**කොඩ්ඩියාමලෙයි නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොඩ්ඩියාමලෙයි ග්‍රාම නිලධාරී වසමේ, කොඩිකච්චි කොඩ්ඩියාමලෙයි ග්‍රාමයේ පිහිටා ඇත.

ඔඩ්ඩුසුඩාන් ගල් කොරිය පවත්වාගෙන යනු ලබන භූමියට සමීපව පිහිටි මෙම නටබුන් අතර අනුරාධපුර අවධියට අයත් කටාරම් ලක්ෂණ සහිත ලෙනක් හඳුනාගත හැකි ය. මෙම ලෙනට ඉතාමත් සමීපව කටාරම් සහිත තවත් ලෙන් 03 ක් පමණ කඩාදමා ඇති බවට සාධක වේ. මෙම විනාශයන් සිදු කළ කාලය පිළිබඳ ව දැනගන්නට නො ලැබේ. ලෙන් ගෙබිමේ ගඩොල් හා පැරණි මැටි බඳුන් කොටස් සාධක වේ. මෙම ලෙන්වලට ආසන්නව පැරණි අනුරාධපුර අවධියට අයත් ගඩොල් භාවිත කර ඇති ගරාවැටුණු ස්ථූප ගොඩැල්ලකි. ස්ථූප ගොඩැල්ලේ ඉහල කොටසේ සිරිපතුල් ගල් 2 ක් දැකිය හැකි ය. ස්ථූප ගොඩැල්ලට සමීපව දිගෙලි වූ ශිලා ස්ථම්භ 03 ක් වේ. මේ අසල වූ ගල්තලාවක යම් ඉදිකිරීමක් වූ බවට සාධක පෙන්වන කණුවලවල් 4 ක සාධක දැකිය හැකි ය.



කටාරම් කොටන ලද ලෙන



විනාශ කර ඇති ලෙනක්



ස්තූප ගොඩැල්ල හා සිරිපතුල් ගලක්

**කන්නියාර් කෝවිල් නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුදුකුඩිරිප්පු ග්‍රාම නිලධාරී වසමේ, මන්නකඩාල් ග්‍රාමයේ පිහිටා ඇත.

නිශ්චිතව සන්දර්භය හඳුනාගත නො හැකි ශිලා ස්ථම්භ සහිත ගොඩැලි 06 ක් පමණ හඳුනා ගත හැකිය. එක් ගොඩැල්ලක් මත ශ්‍රී ලංකා යුධ හමුදාවේ සිංහ රෙජිමේන්තුවේ 14 වන බලසේනාංකය විසින් බුදු මැදුරක් ඉදිකර ඇත. එම ස්ථානයේ තිබූ අනුරාධපුර අවධියට අයත් කොරවක් ගල් 2, සඳකඩ පහණ හා මුරගල් මතුකොට පියගැටපෙළ අලුතින් ඉදිකර ඇත. භූමියේ වූ ගඩොලින් නිර්මාණය කළ ස්තූපය මෙහි මධ්‍යය යුධ සමයේ එල්.ටී.ටී.ඊ. සංවිධානය මගින් බංකරයක් සඳහා භාවිත කර ඇත. මෙය කඩිනමින් සංරක්ෂණය කළ යුතු මට්ටමක පවතී. හඳුනාගත් පුරාවිද්‍යා භූමියේ ගොඩනැගිලි සාධක ගිණිකොන දිශාව වෙත පැතිරීම වැඩියෙන් සිදුවී ඇති බව පැහැදිලි වේ. මෙතෙක් හඳුනාගත් ගොඩැලිවලින් 02 ක් හැර අනෙක් ස්මාරක හා නටබුන් ගොඩැලි වටා ගඩොල් ප්‍රාකාර බැම්මක් වූ බව දැනට තැනින් තැන දැක ගත

හැකි මතුපිට සාධක අනුව පැහැදිලි වේ. මෙම ස්ථානයේ ඇති ශිලා ස්ථම්භවල ඇති ගල්කටු ලක්ෂණ අනුව පැහැදිලි ව අනුරාධපුර අවධියේ ලක්ෂණ විද්‍යමාන වන අතර එක් නටබුන් ගොඩැල්ලකට සමීපව කැටයම් රහිත වැසිකිලි ගලක සාධකයක් ද හමුවේ.



ස්තූප ගොඩැල්ල



යුධ හමුදාව විසින් පාදා සකස් කර ඇති පැරණි පියගැටපෙළ

**මුලතිව් පැරණි පල්ලිය**

වෙරළබඩපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කල්ලපඩු දකුණ ග්‍රාම නිලධාරී වසමේ, මුලතිව් නගරයේ මෙම පල්ලිය පිහිටා ඇත. 1898 දී ඉදිකර ඇති මෙම ගොඩනැගිල්ල සුනාමි හා ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් විනාශ වී ඇත. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් මෙය යටත් විජිත යුගයේ වාස්තු විද්‍යා ලක්ෂණ සහිත ය.



පැරණි පල්ලිය

**මුලතිව් නගරයේ ඇති මුස්ලිම් පල්ලිය**

වෙරළබඩපත්තුව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කල්ලපඩු දකුණ ග්‍රාම නිලධාරී වසමේ, මුලතිව් නගර සීමාවෙහි පිහිටි මෙය මුස්ලිම් පල්ලියක් ලෙස භාවිත වුව ද ලන්දේසි යුගයේ දේවස්ථානයක් වශයෙන් භාවිත වූවකි.



මුස්ලිම් පල්ලියේ පැති පෙනුම

**අලම්පිල් ලන්දේසි අවධියට අයත් නටබුන්**

මුහුදුබඩපත්තුව අලම්පිල් උතුර ග්‍රාම නිලධාරී වසමේ අලම්පිල් ග්‍රාමයේ ලන්දේසි යුගයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් යුත් නටබුන් වූ ගොඩනැගිල්ලක අවශේෂ දක්නට ලැබේ.



ගොඩනැගිලි අවශේෂ

**තන්නිමුරුප්පුකුලම් නටබුන් (කොමළමුනේ නටබුන්, කුරුදුමලෙයි නටබුන්)**

මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොමළමුනේ මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ, කොමළමුනේ ග්‍රාමයේ වනගත භූමියක පිහිටා ඇත.

වනගත භූමියක පිහිටි මෙම නටබුන් අතර විසිරුණු ශිලා ස්ථම්භ කිහිපයක් වැව මාර්ගයට මීටර් 150 ක සීමාවේ දී දැකිය හැකි ය. එම නටබුන් ද්විතික සන්දර්භයට අයත් සාධක ලෙස හඳුනාගත හැකි ය. මෙම නටබුන්වල සිට කිලෝමීටර් 1 සීමාව තුළ දි නටබුන් ගොඩැල්ලක සාධක හමුවේ. ශිලා ස්ථම්භ, කබොක් ගල් කොටස් ආධාරයෙන් වැටි සකස් කර ඇති මෙම ගොඩැල්ල දැනට වනගතව ගරාවැටී ඇතත් ස්ථූප ගොඩැල්ලක් සේ හඳුනා ගැනීමට හැකියාව ඇත. ගොඩැල්ල දැනට පවතින ස්වරූපය මත එය මළු දෙකක ආකාරයට පවතින අතර පළමු මළුව ලෙස දැනට හඳුනාගත හැකි බිමේ ශිලා ස්ථම්භ කිහිපයක් හා ගල්තලාව මත කණුවලවල් කිහිපයක් හඳුනාගත හැකි ය.  ස්තූප මධ්‍යය හාරා ඇත. ආරාමික ගොඩනැගිලි රාශියක නටබුන් දක්නට ලැබෙන අතර ඒවා නිදන් සොරුන්ගේ ග්‍රහනයට හසු වී ඇත. මීට අමතර ව පිළිම පාදමක සාධක ද වේ.




විසිරුණු ශිලා ස්ථම්භ



ස්තූප ගොඩැල්ල



නටබුන් ගොඩැල්ල

**පණ්ඩාරවන්නි නිධන් පිටියේ නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පණ්ඩාරවන්නි ග්‍රාම නිලධාරී වසමේ නිධන්පිටිය නමින් හැඳින්වෙන භූමියේ කණු පාදම්ගල් 7 ක් සහ ශිලා ස්ථම්භ යන ගඩොල් දක්නට ලැබේ.



ගල්කණු ගොඩැල්ල



කණු පාදම් ගලක්

**කච්චිලමඩු නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කච්චිලමඩු ග්‍රාම නිලධාරී වසමෙහි කච්චිලමඩු වැවේ ආර් බී ඇළ අසල ශිලා පුවරු රැසක් දක්නට ලැබේ.

ආර් බී ඇළ භූමියේ නුග ගසක් යට දැනට ද ප්‍රදේශවාසීන් කිසියම් අභිචාර ක්‍රමයක් සඳහා භාවිත කරන මෙම නටබුන්, මෙකී ස්ථානයට වෙනත් තැනකින් ගෙන ආවේ ද යන්න පිළිබඳ ව වැඩි දුරටත් අධ්‍යයනය කළ යුතුව ඇත. මනාව සකස් කරන ලද ශිලා පුවරුවක් මත මධ්‍යයේ ඉඩ තිබෙන ලෙස දෙපසින් වාමන රූප දෙකක් නිර්මාණය කර තිබූ බවට සාධක වේ. වාමන රූපවල පාද කොටස් හැර අනෙක් කොටස් දැනට විනාශ කර ඇත. මේ සමීපයේ ම පිළිම පාදමක සාධක සහ ගඩොලුමය අවශේෂ හඳුනාගත හැකි ය.



වාමන රූප සහිත ශිලා පුවරුව

**කච්චිලමඩු කෝවිල අසල ඇති ශිලාමය නටබුන්**



ශිලාමය නටබුන්

ගවේෂණය කරන අවස්ථාවේ කච්චිලාමඩු කෝවිල භූමියේ මෙම ශිලාමය නටබුන් දක්නට ලැබිණි. මේවා වෙනත් ස්ථානයකින් මෙම ස්ථානයට ගෙනවිත් ඇති බව පැහැදිලි ය. ඒ සම්බන්ධ ව නිශ්චිත ව දැන ගැනීමට හැකියාවක් නොවිය. සඳකඩපහණ, කොරවක් ගල් 2 ක්, ශිලා ස්ථම්භ කිහිපයක් දැකිය හැකි ය. කොරවක් ගල්, පස් හා ගඩොල් කැබලි සමඟ ගෙනවිත් දමා ඇති නිසා මෑතක දී ගෙනෙන ලද බවක් අනුමාන කළ හැකි ය.

**ඔඩ්ඩුසුඩාන් තාන්තෝණ්ඩීර්ශ්වරම් කෝවිල**

තාන්තෝණ්ඩීර්ශ්වරම් හින්දු කෝවිල ඉදිරිපස නැගෙනහිරින් අනුරාධපුර යුගයට අයත් සේ සැලකිය හැකි ශිලා ස්ථම්භ කිහිපයක් දැකිය හැකි ය. මෙම ස්ථානයේ තිබූ ශිලා ස්ථම්භ මේ වන විට ද මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශයට ලක්ව ඇති බව පෙනේ. මීට අමතර ව හිංදු කෝවිල ද ඕලන්ද වාස්තුවිද්‍යා ලක්ෂණවලින් යුක්ත, ඉංග්‍රීසි පාලන සමයට අයත් ගොඩනැගිල්ලකි. ජේ.පී. ලුවිස් විසින් 1895 වර්ෂයේ දී සිදුකරන ලද වාර්තා කිරීම් අනුව තඩ්ඩයමලෙයි නම් ස්ථානයේ වූ විවිධ ඉදිකිරීම් සඳහා භාවිත ගල් කණු ගලවාගෙන ගොස් ඔඩ්ඩුසුඩාන් හින්දු කෝවිල සඳහා යොදා ගත් බව මැනුවල් ඔෆ් වන්නි දිස්ත්‍රික් (a Manual of the Aanni Districts, Ceylon) කෘතිය මගින් දක්වා ඇත. කෝවිල තුළ වූ ළිං දෙකෙන් එක් ළිඳක් සඳහා මෙසේ ගෙන එන ලද ගල් කණුවක්, පඩිගලක් භාවිතා කර ඇති අතර, එම ළිඳ ද ඉංග්‍රීසි පාලන සමයට අයත් බව පෙනේ. කෝවිලේ ගර්භගෘහය පරීක්ෂා කිරීමට ආගමික හේතුන් මත අවස්ථාවක් නො ලැබිණි.



කෝවිලෙහි අන්තරාලය හා ඇතුල් ගෘහය

**කනගරත්නපුරම් නටබුන්**



නටබුන් ගොඩැල්ල

කුඹුරු යායට සමීපව පිහිටි මෙම නටබුන් ගොඩැල්ලේ ඇති වෘක්ෂයක් යට දැනට ද ප්‍රදේශවාසීන් වන්දනාමාන කරන ස්ථානයේ පැරණි මැටි පහණක කොටසක් ද වේ. නටබුන් ගොඩැල්ලේ දැනට සිටවූ ශිලා ස්ථම්භ කිහිපයක් ද වේ. ස්මාරකයේ ව්‍යුහය පිළිබඳ ව නිශ්චිතව කිව නො හැකි නමුත් ස්ථානගතවීම හා වර්තමාන භාවිතය අනුව ආගමික කටයුතු සඳහා භාවිත වූ භූමියක් බවට අනුමාන කළ හැකි ය.

**පේරාරු පැරණි අමුණ**

මුතියංකට්ටු ග්‍රාමයේ පිහිටි මෙම පැරණි අමුණ එහි නිර්මාණ ලක්ෂණ හා ශිලාපුවරුවල ඇති කටු ලක්ෂණ අනුව අනුරාධපුර යුගයේ නිර්මාණයක් බව පැහැදිලි ය. අමුණේ ඉවුරු දෙකෙන් එක් ඉවුරක් ක්‍රමාණුකූලව සකස්කර බොරදම් ගල් හා ගල් කුට්ටි භාවිතයෙන් සකස් කර ඇත. අනෙක් ඉවුර ස්වාභාවික ගල් තලයම උපයෝගීකරගෙන අවශ්‍ය ස්ථානවල පමණක් සකස් කර නිමවා ඇත. දිය පහර හරහා බැඳි අමුණේ ගල් රූරා වැටී ඇත මෙම ස්ථානයේ දී දියපහර ස්වාභාවික ගල් තලය හේතුවෙන් ඉතාම පටු බවක් ගන්නා බැවින් මෙම ස්ථානය ඒ සඳහා යොදා ගැනීමට පැරැන්නන් කටයුතු කර ඇති බව මනාව පැහැදිලි වේ.



පැරණි අමුණ

**කුමාරපුරම් ශ්‍රී චිත්‍රවේලායුධම් මුරුගන් කෝවිල අසල නටබුන්**

මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුමාරපුරම් අංක 72 ග්‍රාම නිලධාරී වසමෙහි කුමාරපුරම් ගමෙහි පිහිටා ඇති මෙම කෝවිල් භූමියෙහි වූ පුරාවිද්‍යාත්මක සාධක මානව මැදිහත්වීම හේතුවෙන් පුරාවිද්‍යා සංදර්භය බෙහෙවින් විකෘති වී ඇත. දැනට විසිරී ඇති ශිලා ස්ථම්භ අනුව පැහැදිලිව ම ගොඩනැගිල්ල හඳුනා ගැනීමට අපහසු වුවත් ගල්කටු ලක්ෂණ අනුව අනුරාධපුර අවධියට අයත් බවට සාධක වේ. ඇතැම් ශිලා ස්ථම්භ කෝවිල් භූමිය හෑරීමේ දී හමු වූ බව ප්‍රධාන පූජකතුමා පැවසීය. ඇතැම් ස්ථාන ගොඩැලි ස්වරූපයෙන් දැකිය හැකි අතර ඊට සම්බන්ධව ශිලා ස්ථම්භ කොටස් ද වේ. මෙම බිමෙන් හමුවන සුවිශේෂි පුරාසාධක ලෙස පැරණි උළුවස්සක දොරබාවක් ලෙස හඳුනාගත හැකි කැටයම් සහිත ශිලා පුවරු කොටස

දක්විය හැකි ය. මේ සමීපයේ ම ශිලා ආසනයක සාධක ඇතත් මේවා විතැන් වූ පුරාවස්තු ලෙස හඳුනාගත හැකි ය.



ගල් කණු හා ගොඩැලි



ගල් පුවරු



කැටයම් සහිත උඩලිපත

**උදයන්කට්ටු පැරණි බෝධි වෘක්ෂය**

පුදුකුඩුරිප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උදයන්කට්ටු දකුණ ග්‍රාම නිලධාරී වසමේ, වසර 200කට වඩා පැරණි බෝධි වෘක්ෂයක් දක්නට ලැබේ.

මෙම ස්ථානයෙන් හමුවී ඇති පැරණි ගඩොලක් බෝධි වෘක්ෂය සමීපයේ දූනට තබා ඇත. එය එම ස්ථානයෙන් හමුවූවක් බව පැවසේ. එම ගඩොල අනුරාධපුර අවධියේ නිර්මාණ ලක්ෂණ හෙළිකරනු ලබන අතර, මුල් සන්දර්භය පිළිබඳ ව නිශ්චිත සාධක නොමැති බැවින් කුමන නිර්මාණයක් සඳහා යොදා ගත්තේ ද යන්න නිශ්චිත ව කිව නො හැකි ය. මෙම ස්ථානයේ වෙනත් කිසිදු පුරාවිද්‍යාත්මක සාධකයක් දක්නට නොමැති අතර, හමුදා කඳවුරෙන් ලැබුණු තොරතුරු අනුව මෙම ස්ථානයට ආසන්නයෙන් (මීටර් 500-750 ක් පමණ දුරින්) නටබුන් වූ ගොඩනැගිල්ලක් තිබෙන බවත්, එම ප්‍රදේශයේ බිම් බෝම්බ සහිත බැවින් අනාරක්ෂිත බවත් පවසන ලදි.



බෝධි වෘක්ෂය

**මණ්ඩකන්නාර් පුරාවිද්‍යා නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මන්ඩකන්නාර් ග්‍රාමයේ පිහිටි මෙහි සිදුව ඇති මානව මැදිහත්වීම් හේතුවෙන් පුරාවිද්‍යා සන්දර්භය හඳුනා ගැනීමට අපහසුය. නමුත් දැනට මතුපිට විද්‍යමාන සාධක අනුව ස්ථූප ගොඩැල්ලක් යැයි අනුමාන කිරීමට හැකියාව ඇති ස්ථානයක් ද ඊට ආසන්නව කණු පාදම් ගල් 04 ක් ද දැකිය හැකි ය. නටබුන් ගොඩැල්ලෙන් විතැන් වූ ගඩොල් සේ සැලකිය හැකි ගඩොල් භූමියේ තැනින් තැන බහුලව විසිරී ඇත. ඉතා මෑතක දී කණුපාදම් ගල් 02 ක් පුරාවස්තු විනාශ කරන්නන් විසින් විනාශ කර ඇත.



හාරා ඇති ස්තූප ගොඩැල්ල



කණුපාදම් ගලක්

**තොලිච්චිමොටෙයි පුරාවිද්‍යා නටබුන්**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 125 කණ්ඩුවාන් ග්‍රාම නිලධාරී වසමේ කොලිච්චිමොටෙයි ග්‍රාමයේ නටබුන් ගොඩැල්ල පිහිටා ඇත.

ගල්කණු යොදා ඉදිකරන ලද ගොඩනැගිල්ලක නටබුන් දැකිය හැකි අතර, මෙය කුමන කාර්යයක් සඳහා භාවිත කරන ලද්දක්දැයි හඳුනාගත නො හැකි ය. මෙම ගල්කණු සියල්ල දෙකඩ වී ඇත. මීට අමතරව කණු පාදම් ගල් භූමියේ විසිරී ඇත.



කණු පාදම් ගලක්



ගල් කණු ගොඩැල්ල

**ඔටියමලෙයි පුරාවිද්‍යා නටබුන්**


ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔටියමලෙයි ග්‍රාමයේ පර්වතයක් ආශ්‍රිතව කටාරම් සහිත ලෙන් සංකීර්ණයකි.

ගල් පර්වත රාශියකින් යුක්ත උස් බිමක මෙම කටාරම් සහිත ලෙන් සංකීර්ණය පිහිටා තිබේ. මෙහි ප්‍රධාන ගල් පර්වතයේ නැගෙනහිර දෙසට මුහුණලා කටාරම් සහිත කොටස පසුකාලීනව විනාශ කර ඇත. මෙම පර්වතයේ ම බටහිර අර්ධයේ කටාරම් සහිත ලෙනක් නිරුපද්‍රිත ව පවතී. ප්‍රධාන ලෙන් දෙකට වම්පසින් ආසන්නයේ කටාරම් සහිත ලෙන් දෙකක් මානව ක්‍රියකාරකම් මගින් විනාශ වී ඇති බව දක්නට ලැබේ. අනුරාධපුර යුගය නියෝජනය කරන මෙම ස්ථානයෙහි කණු පාදම්, උළු හා ගඩොල් විසිරී ඇත. මෙම භූමියේ බුදු පිළිමයක් තිබූ බවට අගලේ සිතියමේ සඳහන් වුව ද භූමිය පරීක්ෂාවේ දී එහි සාධක කිසිවක් සොයා ගැනීමට නො හැකි විය. බිම් බෝම්බ හේතුවෙන් අවට පරිසරය පරීක්ෂා නො කරන ලදි.


කටාරම් කොටන ලද ලෙනක්


කටාරම් කොටන ලද ලෙනක්


කණුපාදම් ගලක්


කටාරම් කොටන ලද ලෙනක්

**ජනකපුර පන්සල්කන්ද පුරාවිද්‍යා නටබුන්**

සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 05 ජනකපුර ග්‍රාම නිලධාරී වසමේ, ජනකපුර ග්‍රාමයේ උස් භූමියක් පුරා නටබුන් විසිර තිබේ.

උස් වූ භූමියක් මත පිහිටා ඇති ස්මාරක අතරින් මීටර් 20 විෂ්කම්භයක් සහිත ස්තූපය ප්‍රධාන වේ. මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එහි ගර්භය විනාශ වී ඇත. මීට අමතර ව උළු, ගඩොල් හා යබොර භූමියේ බහුල වශයෙන් දක්නට ඇත. බොරදම් සහිත ශිලා පුවරු හා ගල් කණු කොටස් ද මේ අතර වේ. අනාරක්ෂිත බැවින් අවට ප්‍රදේශය පරීක්ෂා නො කරන ලදි.



නටබුන් ගොඩැල්ල





ස්තූප ගොඩැල්ල හාරා ඇති අයුරු

### ජනකපුර ගම හා අභයභූමි අතර පුරාවිද්‍යා නටබුන්



නටබුන් ගොඩැල්ල

විනාශ කරන ලද ස්තූප ගොඩැල්ල හා ගඩොලින් නිමකරන ලද නටබුන් ගොඩැල්ලක් ද විසිරි ඇති ශිලාමය කණු පාදම් ද භූමියේ දක්නට ඇත. මීට අමතර ව උළු, ගඩොල් භූමිය පුරා විසිරී පවතී.

**ජනකපුර අභයභූමිය (නිධන් භූමිය) තුළ ඇති පුරාවිද්‍යා නටබුන්**

විශාල භූමි ප්‍රදේශයක් පුරා පැතිරී යන සේ ස්මාරකයන් පිහිටා ඇති අතර ඉන් විනාශ කරන ලද ස්තූප ගොඩැල්ල ප්‍රධාන තැනක් ගනී. ගල් කණු සහිත ගොඩනැගිලි නටබුන් කිහිපයක් දක්නට ඇති අතර, ඒවා ද නිධන් හොරුන්ගේ ග්‍රහණයට හසු වී ඇත. කැටයම් රහිත සඳකඩපහණ හා ශිලාමය කණුපාදම් ද මේ අතර වේ. මෙම ස්ථානයට මීටර් 50 ක් පමණ උතුරු දෙසින් පොකුණක සාධක හමුවේ. මෙම භූමිය ද ආරක්ෂක හේතූන් මත වැඩිදුර පරීක්ෂණ නො කරන ලදි.



ස්තූප ගොඩැල්ල



ස්තූප ගොඩැල්ල හාරා ඇති ආකාරය



නටබුන් ගොඩැලි විනාශ කර ඇති ආකාරය



නටබුන් ගොඩැලි විනාශ කර ඇති

**කෝකිලායි කලපුව මහපිටිය පුරාවිද්‍යා නටබුන්**

විශාල භූමි ප්‍රදේශයක් පුරා පැතිරී යන සේ ස්මාරකයන් පිහිටා ඇති අතර ඉන් විනාශ කරන ලද ස්තූප ගොඩැල්ල ප්‍රධාන තැනක් ගනී. ඒවා ද නිධන් හොරුන්ගේ ග්‍රහණයට හසු වූ ගල්කණු සහිත ගොඩනැගිලි රාශියක් වන අතර ඒවායේ කැටයම් රහිත සඳකඩපහණ ද වේ. ආරක්ෂක හේතූන් මත ස්තූපය සහ ගොඩනැගිලි පහක් පමණක් මෙම භූමියෙන් අනාවරණය කර ගැනීමට හැකි වූ අතර පසුකාලීනව බෝම්බ ඉවත් කිරීමෙන් පසු ගවේෂණයකින් තවදුරටත් ස්මාරක සොයාගත හැකි බවට අනුමාන කළ හැකි ය. ඉතා අලංකාර බොරදම් සහිත ගොඩනැගිලි මෙම භූමියේ දක්නට ඇති අතර, ඒවා මෑත කාලීනව නිධන් හොරුන් විසින් හාරා විනාශ කොට ඇත. මෙහි වන නටබුන් අනුව මෙය විශාල ආරාම සංකීර්ණයක් බව පෙනී යයි.



පැරණි ගොඩනැගිලි හාරා ඇති ආකාරය



හාරා ඇති ගොඩනැගිල්ලක සදකඩ පහනක්



හාරා ඇති ගොඩනැගිල්ලක දොරබාවක්

**කොමළමුනේ කෝවිල අසළ පුරාවිද්‍යා නටබුන්**

මුලතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුල්ලෙආර්ගම ග්‍රාමයේ පිහිටි කඳු ගැටයක් මත නටබුන් ගොඩැල්ලක් දක්නට ලැබේ.

කුඩා කඳු ගැටයක් මත මෙම ස්මාරක භූමිය පිහිටා ඇති අතර නටබුන් ගොඩැල්ල බොහෝ දුරට විනාශකොට ඇත. මෙහි ඇති ගඩොල්, උළු ආදිය අනුරාධපුර යුගයේ නිර්මාණයන්ට යෙදූ ඒවා බව පරීක්ෂා කිරීමේ දී සනාථ වේ. මෙම භූමියේ තිබූ ශිලාමය කණු පාදම් හා ශිලා පුවරු ආසන්නයේ පිහිටි කෝවිල් භූමියට ගෙන ගොස් ඇත.





නටබුන් ගොඩැල්ල



කණු පාදම් ගලක්



කණු පාදම් ගලක්

**නෙදුන්කේනි අණ්ණ දේවමඩු පුරාවිද්‍යා නටබුන්**

වව්නියාව දිස්ත්‍රික්කයේ නෙදුන්කේනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරාඉලුප්ප 22 ග්‍රාම නිලධාරි වසමේ පනෙයිනින්ඩ්‍රාන් ගමෙහි පිහිටා ඇත.

කුඩා ගල්තලයක් මත විවිධ ප්‍රමාණයේ කෙම් කිහිපයක් දක්නට ඇත අතර ඊට නැගෙනහිර දෙසින් තැනිතලා භූමියේ ශිලාමය කණු පාදම් කිහිපයක් හා ගඩොල් කැබලි කිහිපයක් භූමියේ විසිරී තිබෙනු දක්නට ඇත. මේ ආසන්නයේ ගල් බැම්මක ආකාරයේ පිහිටි ගල් වැටියක් විහිදී යයි. ගල් තලයේ ගල් කේතුකාවාට ලක්ෂණ දෙකක් ද මීට අමතර ව ප්‍රධාන මාර්ගය දෙසට වන්නට අනුරාධපුර යුගයට අයත් ගල් කටු ලක්ෂණ සහිත ගල්තලාවක් ද දක්නට ඇත.



කණු පාදම් ගල්



ගල්තලයේ පිහිටි කෙමියක්





කේතුකාවාට



ගඩොල් සහිත ගොඩැල්ල

**පරම ශ්‍රී කාන්දම්ගේ ඉඩමේ නටබුන්**

වව්නියාව දිස්ත්‍රික්කයේ නොදුන්කේනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරාඉලුප්ප 22 ග්‍රාම නිලධාරි වසමේ පනෙයිනින්ඩ්‍රාන් ගමෙහි පිහිටා ඇත.

බොරදම් සහිත ගඩොල් අත්තිවාරම ශේෂව ඇති අතර, ගල් කණු තැනින් තැන විසිරී ඇත. මේ අතර ශිව ලිංගයක් ගලවා ඉවත් කර ඇත. මෙම ස්ථානය මානව ක්‍රියාකාරකම් හේතුවෙන් නටබුන් ගොඩනැගිල්ලේ ගල්කණු විතැන් ව ඇත.




විතැන් වී ඇති ගල් කණු

**වෙඩික්කිනාරිමලෙයි නටබුන්**

වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඕලුමඩු ග්‍රාම නිලධාරි වසමේ ඕලුමඩු වන රක්ෂිතයෙහි පිහිටා ඇත.

මෙම ස්ථානයට ඇතුළුවන ස්ථානයේ පිහිටි ගලෙහි සෙ.මී. 340X180 දිගු පුළුලින් යුත් ක්ෂේත්‍රකාවාටයකි. මීට බටහිරින් පර්වත රාශියක් පිහිටා ඇති අතර ඉන් ප්‍රථමයෙන් හමුවන පර්වතයේ කටාරම් සහිත ලෙනක් දක්නට ඇත. එම කටාරමේ දිග මීටර් 4 ක් වන අතර ගැඹුර මීටර් 3 ක් ද උස මීටර් 2.2 ක් පමණ ද වේ. මෙම කටාරම් ලෙනට පිටුපසින් තවත් කටාරම් සහිත ලෙනක් පිහිටා ඇති අතර, එහි කටාරමේ දිග මීටර් 8.5 ක් ද කටාරමට උස මීටර් 5 ක් ද කටාරමේ ගැඹුර මීටර් 3.5 ක් පමණ ද වේ. මේ ආසන්නයේ ඇති ගල් පර්වතය මත වර්ගමීටර් 8 ක වපසරියකින් යුක්ත ව පැතිරී ඇති ගොඩැල්ලක් දක්නට ඇත. එය ස්තූපයක අවශේෂ යැයි අනුමාන කළ හැකි අතර එය බොහෝදුරට විනාශ වී ඇත.

මෙම ස්ථානයට ඉදිරිපසින් මීටර් 50 ක් පමණ දුරින් තවත් කටාරම් සහිත ලෙන් දෙකක් හමුවූ අතර එහි ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් අක්ෂරයන්ගෙන් ලෙන් ලිපි කොට ඇත. ඉන් ප්‍රධාන ලෙන් ගුහාවට ඇතුළුවීමට පියස්සක් තිබෙන්නට ඇතැයි ශේෂව ඇති සාධක මඟින් අනුමාන කළ හැකි ය. මෙහි ගැඹුර මීටර් 10 ක් වන අතර උස මීටර් 5 කි. මෙම පර්වතයේ ම නැගෙනහිර දිශානුගත ව තවත් කටාරම් සහිත ලෙනක් පිහිටා ඇති අතර එහි ද පූර්වෝක්ත අක්ෂරයන්ගෙන් යුත් ලෙන් ලිපියක් දක්නට ඇත. එහි ගැඹුර මීටර මීටර් 4.6 ක් හා උස මීටර් 2.5 ක් වේ. මෙම ලෙන් සහිත භූමිය ඝන කැළෑව මධ්‍යයේ පිහිටා අතර ආරක්ෂක හේතූන් මත අවට පරිසරය පරීක්ෂණයට භාජනය නො කරන ලදි.





කටාරම් සහිත ලෙන්



කටාරම් සහිත ලෙනෙහි ඇති ලෙන් ලිපිය



ගල් කෙමියක්



කටාරම් සහිත ලෙනක්



පර්වත මස්තකයේ වන ස්තූප ගොඩැල්ල

### නිකවැව පුරාවිද්‍යා නටබුන්

වව්නියාව දිස්ත්‍රික්කයේ සම්පත් නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිකවැව ග්‍රාම නිලධාරි වසමේ නිකවැව ගමෙහි පිහිටා ඇත.

අනුරාධපුර අවධියට අයත් පුරාවිද්‍යාත්මක සාධක බවට හඳුනාගත හැකි ය. ප්‍රමාණ 2 කින් යුත් පැරණි ගඩොල් භාවිතයෙන් නිර්මාණය කළ ස්තූප ගොඩැල්ලේ විශ්කම්භය මීටර් 10.70 ක් පමණ වේ. ස්තූපයට නිරිත දිගින් සිරිපතුල් ගලකි. ස්තූපයට මීටර් 75 නැගෙනහිරින් නටබුන් ගොඩනැගිල්ලක සාධක වේ. ප්‍රමාණයෙන් විශාල ශිලා ස්ථම්භ 8 කින් යුක්ත ය. ඊට අමතර ව

ශිලා ස්ථම්භ කොටස් ද කිහිපයකි. නිශ්චිත ව ම හඳුනා ගැනීම අපහසු වුව ද මෙම ගොඩනැගිල්ල පැරණි පොහොය ගෙයක් ලෙස අනුමාන කිරීමට හැකියාව ඇත. ගොඩනැගිල්ල මීටර් 9.10 x 7.60 ප්‍රමාණයේ වුවකි. කණු පාදම් ගලක් මේ ආසන්නයේ දැකගත හැකි ය.



ස්තූප ගොඩැල්ල



සිරිපතුල් ගල



පොහොය ගෙයට අයත් ගල් කණුවක්



කණු පාදම් ගලක්

**වෙඩිවච්චුකල්ලු පුරාවිද්‍යා නටබුන් අංක 01**

වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙඩිවච්චුකල්ලු ග්‍රාම නිලධාරි වසමේ වෙඩිවච්චුකල්ලු ගමෙහි පිහිටා ඇත.

ශිලා ස්ථම්භ 15 කින් යුක්ත නටබුන් ගොඩැල්ලකි. පස් කැපීම නිසා භූ දර්ශණය සම්පූර්ණයෙන් ම වියවුල්ව ඇත. ශිලා පුවරුවක් හා පැරණි ගඩොල් ද දැකිය හැකි ය. දැනට ශේෂිත සාධක අනුව ස්මාරකය කුමක්ද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට අපහසු ය. නමුත් පැරණි ගඩොල් හා ගල්කටු ලක්ෂණ අනුව අනුරාධපුර අවධියට අයත් නටබුන් සේ හඳුනාගත හැකි ය.



පස් කැපීම නිසා හානියට පත්ව ඇති ගොඩනැගිල්ල

**කච්චිලමොටෙයිකුලම් පුරාවිද්‍යා නටබුන්**

වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මරතෝඩි ග්‍රාම නිලධාරි වසමේ මරතෝඩි ගමෙහි පිහිටා ඇත.

පැරණි ගඩොල් සාධක අනුව අනුරාධපුර අවධියට අයත් ස්ථූප ගොඩැල්ලක්සේ හඳුනාගත හැකි ය. ප්‍රමාණ කිහිපයක ගඩොල් මේ සඳහා භාවිත කර ඇති බවට සාධක වේ. දැනට ස්ථූප ගොඩැල්ලේ මධ්‍යය නිදන් හොරුන්ගේ ග්‍රහණයට ලක්ව ඇත. මීට අමතර ව පැරණි වළංකටු ද භූමියේ බහුල ව හමුවේ. කණු පාදම් ගල් 03 ක් ද මෙම භූමියෙන් හඳුනාගත හැකි ය.



මධ්‍යය හාරා ඇති ස්තූප ගොඩැල්ල





කණුපාදම් ගල්

**වෙඩිවඩ්ඩුකල්ලු පුරාවිද්‍යා නටබුන් අංක 02**

වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙඩිවඩ්ඩුකල්ලු ග්‍රාම නිලධාරි වසමේ වෙඩිවඩ්ඩුකල්ලු ගමෙහි පිහිටා ඇත.

ප්‍රමාණයෙන් කුඩා නටබුන් ස්ථූප ගොඩැල්ලක සාධක හඳුනා ගැනීමට ඇති නමුත් මානව මැදිහත්වීම නිසා බෙහෙවින් විනාශයට පත්ව ඇත. අවට භූමියේ පැරණි ගඩොල් හා වළංකටු බහුල ව හමුවේ. මෙයට ආසන්නව කණු පාදම් ගල් 02 ක් ද වේ. ස්ථූප මලුවට පිටතින් ගඩොල් ප්‍රකාරයක පාදමක ශේෂ හඳුනා ගැනීමට හැකි ය. මෙම ස්ථූප ගොඩැල්ලට මීටර් 75 ක් පමණ දුරින් පෙරකී ස්ථූප ගොඩැල්ලට වඩා ප්‍රමාණයෙන් විශාල ස්ථූප ගොඩැල්ලකි. මෙය ද ගරා වැටීමට බෙහෙවින් ලක්ව ඇත. මෙම ස්ථූප ගොඩැල්ලට බටහිරින් ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස්වලට අයත් අක්ෂර සහිත පර්වත ලිපියකි. නිශ්චිත ව ම මෙතෙක් කියවා නැතත් විහාරයකට කරන ලද පූජාවක් පිළිබඳ ව සඳහන් වන බව දැනට කියවිය හැකි කොටසින් පැහැදිලි වේ.



පර්වත ලිපිය



මධ්‍යය හාරා ඇති ස්තූප ගොඩැල්ල

**වෙඩිවඩ්ඩුකුලම් පුරාවිද්‍යා නටබුන්**

වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙඩිවඩ්ඩුකල්ලු ග්‍රාම නිලධාරි වසමේ වෙඩිවඩ්ඩුකල්ලු ගමෙහි පිහිටා ඇත.

දැනට ඉතිරිව ඇති ශිලා ස්ථම්භ සාධක මත මෙම ගොඩනැගිල්ල පිළිබඳ ව නිශ්චිත අදහසක් ඉදිරිපත් කිරීම අපහසු වුව ද මෙය චක්‍රාකාර ගොඩනැගිල්ලක් විය හැකි බවට අනුමාන කළ හැකි වේ. දැනට ශිලා ස්ථම්භ 17 ක් ශේෂිතව ඇති පොළවෙන් ඉහලට මතුව ඇත්තේ අඩි 2 ක් පමණ උසක් පමණි. ශිලා ස්ථම්භවල හඳුනාගත හැකි ගල් කටු ලක්ෂණ මත අනුරාධපුර අවධියට අයත් බව පෙනේ.



ගොඩනැගිලි නටබුන්

**සපුමල්ගස්කඩ පුරාවිද්‍යා නටබුන්**

වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙඩිවඩ්ඩුකල්ලු ග්‍රාම නිලධාරි වසමේ වෙඩිවඩ්ඩුකල්ලු ගමෙහි පිහිටා ඇත.

මෙම භූමියේ ඇති පබ්බතාරාම විහාර සම්ප්‍රධායට අයත් ආරාමික සංකීර්ණයේ මූලික අංග ඉතා හොඳින් හඳුනාගත හැකි මට්ටමක පවතී. ස්ථූප ගොඩැල්ල, පිළිම ගෙය, බෝධිඝරය, පොහොය ගෙය හා විහාර අංග මධ්‍යම මළුවේ දැකිය හැකි ය. ඉන් පිටත වට ප්‍රාකාරය ද සිව් දිශාවට ප්‍රවේශවන ප්‍රවේශ මාර්ග ද වේ. මධ්‍යම මළුවෙන් පිටත නිශ්චිත ව හඳුනාගත නො හැකි ගොඩනැගිලි නටබුන් රැසකි. ප්‍රවේශයේ ප්‍රධාන පෙත්මඟ දෙපස ගල් වැටකි. මධ්‍ය මළුවේ ප්‍රවේශයේ දකුණු පස ස්තූප ද ස්තූපයට නැගෙනහිර පිළිමගෙය ද හඳුනාගත හැකි අතර මෙම ස්ථානයේ ශිලා ලිපියක කොටසක් ද වේ. පිළිමගෙයට පිට දකුණින් පොහොයගෙය ද, ප්‍රධාන ප්‍රවේශයේ වම්පසින් බෝධිඝරය ද වේ. මෙම පුරාවිද්‍යා සාධකයන්හි කැටයම් ලක්ෂණ හා ශෛලීය අනුව අනුරාධපුර යුගයට අයත් බව පැහැදිලි වේ.



ස්තූප ගොඩැල්ල



පිළිමගෙය



නටබුන් ගොඩැල්ල



නටබුන් ගොඩැල්ල

**තන්නිපුරුප්පුකුලම් වැව හා නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුල්ලියාවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තන්නිමුරුප්පුකුලම් ග්‍රාමයේ පිහිටා ඇත.

වැව් බැම්ම මතින් කිලෝමීටර් 3 ක් පමණ උතුරු දෙසට ගමන් කළ පසු වර්තමානයේ ඉදිකරන ලද සොරොව්ව දැකිය හැකි ය. මේ අසල කිසියම් ක්‍රමවත් බවකින් යුක්තව පෙරළී ගිය ගල් පුවරු හා ගඩොල් දක්නට ඇත. කැපුම් ලක්ෂණ අනුව මෙම ගල් පුවරු අනුරාධපුර යුගයට අයත් බව පැහැදිලි වේ. මෙම ස්ථානයේ පැරණි සොරොව්ව ඉදිකර තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. මීට අමතර ව වැවෙහි නැගෙනහිර දිශානුගත ව තවත් සොරොව්වක් දක්නට ඇති අතර එහි ගලෙන් නිමවන ලද නයිපෙන පහක් සහිත නාග රුවක් දක්නට ඇත. එය මෑත යුගයේ සිමෙන්ති බදාමයෙන් පිළිසකර කර ඇති බව පෙනේ.



පැරණි සොරොව්ව



නාග මුරගල



ගල් පුවරු



කණු පාදම් ගලක් සහ ගල් කණුවක්

**කුම්භකරණ මලෙයි නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිඉබ්බන්වැව ග්‍රාම නිලධාරී වසමේ කිරිඉබ්බන්වැව ග්‍රාමයේ මෙම නටබුන් පිහිටා ඇත.


කුම්භකරණ ගල ලෙසින් හැඳින්වෙන ස්ථානයේ ගල මුදුනේ පැරණි ස්තූපයක් තිබූ බවට සාධක වේ. ඉහළ ම භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන අසල අනුරාධපුර අවධියේ ගල් කටු ලක්ෂණ සහිත ශිලා ස්ථම්භ 07 ක් පැහැදිලි ව හඳුනාගත හැකි ය. ශිලා ස්ථම්භවල කුඩුම්බි ලක්ෂණ දැකිය හැකි ය. මේ ලෙන අසලින් පැරණි උළු හා වළං කටු දැකිය හැකි ය. මෙම ලෙන එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සන්නිවේදන උපකරණ සහිත මධ්‍යස්ථානයක් ලෙස පාවිච්චි කර

ඇති අතර යුධ ජයග්‍රහනයෙන් අනතුරුව යුධ හමුදාව විසින් ද මෙම ස්ථානය සන්නිවේදන මධ්‍යස්ථානයක් ලෙස යොදා ගනිමින් පැවතින.

කුම්භකරණ ගලට උතුරින් පහළ භූමියේත්, මෝල්ඩින් ගඩොල් හා පැරණි ගඩොලු බහුලව හමුවන අතර ඊට ආසන්නව යූප ගලක කොටසක් ද වේ. මෙම ස්ථානයේ ඇති ශිලා ඡත්‍රයක කොටසක් සේ අනුමාන කළ හැකි කොටසක් ද දැකිය හැක. ඒ අනුව මෙම ස්ථානයේ ද ස්තූපයක් තිබූ බවට අනුමාන කළ හැකි වේ. මෙම ස්ථානයට ආසන්නයෙන් මාර්ගයේ වම්පස ගරා වැටුණු පැරණි පොකුණකි. එහි ගල් පුවරු කිහිපයක් දැකිය හැකි අතර, බෝල ගල් ද වැටිය සකස් කිරීමට බහුලව භාවිත කර ඇත. මෙම පර්වතයට පහළ ඊසාන දිශාවට මුහුණලා කටාරම් සහිත ලෙනකි. පැරණි පොකුණට ඉදිරියෙන් වන වගා බිම් හි උළු, ගඩොල් කැබලි දක්නට ඇත.




ඉහළින් දාගැබ සහිත කුම්භකර්ණ ගල ඈතට දිස්වන ආකාරය



ඉහළ මාලයෙහි ඇති කටාරම් කොටන ලද ලෙන



ඉහළ මාලයෙහි ඇති කටාරම් කොටන ලද ලෙනෙහි සන්නිවේදන
උපකරණ තැන්පත් කිරීමට සකසා ඇති තාවකාලික කුටිය



පහළ පිහිටි කටාරම් කෙටු ලෙන



පහළ පිහිටි යූප ගල් කොටස





පර්වතය පාමුල දක්නට
ලැබෙන උළු හා
ගඩොල් කැබලි

පහළ පිහිටි කලුගලින් කළ පොකුණ

**වෙට්ටමලෛ නටබුන් (නයාරු නටබුන් - ගුරුකන්ද)**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙට්ටමලෛ බටහිර ග්‍රාමයේ පිහිටා ඇත.

නයාරු කලපුවට සමීප මෙම භූමියේ මාර්ගය දෙපසට පුරාවිද්‍යාත්මක සාධක හඳුනාගත හැකි ය. මාර්ගයේ දකුණු පස දැනට අණදෙන නිලධාරි නිවස්නය පිහිටා ඇත්තේ පැරණි ස්තූප ගොඩැල්ල හෝ නො එසේ නම් වෙනත් ගඩොලුමය ඉදිකිරිමක් මත බවට පැහැදිලි සාධක වේ. මෙම ඉදිකිරීමට සමීපව ම කණු පාදම් ගලක් ද වේ. භූමියේ තැනින් තැන බහුලව රක්ත වර්ණ, වර්ණාලිප්ත හා සාමාන්‍ය වළං කැබලි විසිරි ඇත. මානව ක්‍රියකාරකම් හේතුවෙන් විතැන් වූ ගඩොලු අවශේෂ ද බහුල ව දැකිය හැකි ය. මාර්ගයේ වම්පස ඇති ගඩොලුමය ඉදිකිරීම් සහිත ගොඩැල්ල ද දැනට මානව මැදිහත්වීම් හේතුවෙන් විශාල වශයෙන් විනාශයට පත්ව ඇත. මෙම පුරාවිද්‍යාත්මක සාධක අනුරාධපුර අවධියට අයත් බවට සාධක වේ.



කණු පාදම් ගලක්



මැටි බඳුන් කොටස්



උළු කොටසක්



ස්තූප ගොඩැල්ල



නටබුන් ගොඩැල්ලක්

**ආන්දම්කුලම් පුරාවිද්‍යා නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොමලමුනෛ බටහිර ග්‍රාමයේ පිහිටා ඇත.

පැරණි ස්තූප ගොඩැල්ලක් පැහැදිලි ව හඳුනාගත හැකි අතර දැනට ගොඩැල්ල මධ්‍යය නිධන් හොරුන්ගේ ගහණයට ලක්ව ඇත. ගඩොළුවල ස්වභාවය මත අනුරාධපුර අවධියට අයත් බව පැහැදිලි වන අතර දැනට ඇති සාධක මත ස්තූපයේ විෂ්කම්භය මීටර් 20 කි. ස්තූප ගොඩැල්ලේ විෂ්කම්භය මීටර් 3.80 ක් හා ගැඹුර මීටර් 4 ක් වූ වලක් හාරා ඇත. දැනට ස්තූප ගොඩැල්ලේ දෘශ්‍යමය සාධක අනුව ගල් වරි 33 ක් පමණ හඳුනාගත හැකි ය. ස්තූපයට ආසන්නව ශිලා ස්ථම්භ 06 සහිත නටබුන් ගොඩැල්ලක සාධක හඳුනාගත හැකි අතර ඒ අතර ගඩොල් බහුලව හමුවේ. ඒ අනුව මෙම දිස්ත්‍රික්කයෙන් හමුවන විශාලත ම ස්තූපය මෙය බවට අනුමාන කළ හැකි ය. ස්පටික හුණු ගලෙන් කළ හිඳි පිළිමයක් කොටස් 04 කට කැඩී ඇති අතර, ඒ අතර ශිලාමය පාදෝවනයක සාධක ද ඇත. පැවති අනාරක්ෂිත හේතුව මත අවට ප්‍රදේශය පරීක්ෂාවට බඳුන් නොකරන ලදි.



ස්තූපය



ගල්කණු සහිත නටබුන් ගොඩැල්ලක්



කැඩී ඇති බුදු පිළිමයේ කොටස්

**නෛත්තික්කායිකුලම් නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොමළමුනේ මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ, නෛත්තික්තායිකුලම් ග්‍රාමයේ පිහිටා ඇත.

පැරණි ගඩොලු සහිත ස්ථූප ගොඩැල්ලකි. අඩි 8 ක් පමණ උසින් යුත් මෙහි ගඩොල් වරි 12 පමණ පැහැදිලි ව හඳුනාගත හැකි ය. ස්ථූප ගොඩැල්ල නිධන් හොරුන් හෑරීමට උත්සාහ කර ඇතත් ගඩොල් වරි දෙකකට වඩා හාරා නැත. ගඩොලුවල ලක්ෂණ අනුව අනුරාධපුර අවධිය නියෝජනය කරන බව පැහැදිලි වේ. ස්ථූප ගොඩැල්ලට ආසන්නව කණුපාදම් ගල් දෙකක සාධක දැකිය හැකි ය.



ස්තූප ගොඩැල්ල



පැරණි ගඩොල් විසිර පවතින ආකාරය



කණු පාදම් ගලක්

**තට්ටන්කොටුව පුරාවිද්‍යා නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොක්කුතුඩුවායි ග්‍රාම නිලධාරී වසමේ, තට්ටන්කොටුව ග්‍රාමයේ, පිහිටා ඇත.

තට්ටන්කොටුව ග්‍රාමයේ ගල් තලාවක් මත විසිරී පැවති විනාශ වූ ස්තූප ගොඩැල්ලක නටබුන් දක්නට ලැබේ. අනවසර කැණීම් හේතුවෙන් ස්මාරකයේ සන්දර්භය නිශ්චිත ව ම හඳුනා ගැනීමට අපහසු ය. නමුත් දැනට ඉතිරිව ඇති සාධක මත පධානඝර සම්ප්‍රදායේ ආරාමයක් විය හැකි බවට අනුමාන කළ හැකි ය. සම්පූර්ණයෙන් ම විනාශයට පත්ව ගල් කණු පමණක් දක්නට ලැබෙන්නේ නේවාසික ගෘහය විය යුතුය. දාරයේ කැටයම් සහිත ශිලා පුවරු හා දැනට හඳුනාගත හැකි වට ප්‍රාකාර 2 සාධක වේ. මානව මැදිහත්වීම්වලට සෘජුව ම ලක්ව නැති නටබුන් ස්ථානයෙහි සෙ.මී. 10 X සෙ.මී. 10 තරම් කුඩා ප්‍රමාණයේ කුඩුම්බි සහිත කණු පාදම් කිහිපයකි. වට ප්‍රාකාරය සඳහා ශිලාමය පුවරු යොදාගෙන ඇති අතර මෙම පුවරුවල දාරයේ කැටයම් සහිත ය. පුවරු එකිනෙක පුරුද්දා සම්බන්ධකරන ලද ඒවා වන අතර, මේවායේ කුඩුම්බි සිදුරු පැහැදිලිව හඳුනාගත හැකි ය. මෙම කුඩා කණුවලවල් සහිත පාදම් ගල් ඇති කොටසේ මෙම ස්ථානයට ප්‍රවේශ මාර්ගය ලෙස අනුමාන කළ හැකි ය. අනුරාධපුර අවධියට අයත් පෙති උළු හා පැරණි වළංකටු භූමියේ විසිරී ඇත.









ගොඩනැගිලි නටබුන්

### තට්ටන්කොටුව පුරාවිද්‍යා නටබුන් අංක 02

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොක්කුතුඩුවායි ග්‍රාම නිලධාරී වසමේ, තට්ටන්කොටුව ග්‍රාමයේ, පිහිටා ඇත.

ගල්තලාව මත බෙහෙවින් බාදනයට ලක්වූ ස්ථූප ගොඩැල්ලක සාධක හමුවේ. අනුරාධපුර අවධියට අයත් ගඩොලු අවට භූමියෙහි දැකිය හැකි ය. මීට අමතරව හාරන ලද ගොඩැල්ලක සාධක ද විද්‍යමාන වේ. නමුත් සන්දර්භය විකෘති වී ඇති බැවින් ඉදිකිරීම් සම්බන්ධව නිශ්චිත ව කිව නො හැකි ය. කණුපාදම් ගලක සාධක භූමියෙන් හඳුනාගත හැකි අතර, ගල්තලාවේ කේතුකාවාටයක් ද දක්නා ලැබේ. භූමියේ පැරණි ගඩොල් කැබලි බෙහෙවින් විසිරී ඇත.



කණු පාදමක්



නටබුන් ගොඩැල්ල

### සිවිල් ආරක්ෂක බලකායේ කර්මාන්ත ව්‍යාපෘති භූමියේ ඇති සිරිපතුල් ගල

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොක්කුතුඩුවායි ග්‍රාම නිලධාරී වසමේ, තට්ටන්කොටුව ග්‍රාමයේ පිහිටා ඇත.

දැනට කිරිඉබ්බන්වැව සිවිල් ආරක්ෂක බලකායේ කර්මාන්ත භූමියේ ඉදිකරමින් පවතින බුදු මැඳුරේ ආසනය ලෙස මෙම පැරණි සිරිපතුල් ගල් භාවිත කර ඇත. මෙම ප්‍රදේශයේ ම වාසය කරන එල්.පී. පියදාස නම් අය මෙම ස්ථානයට මෙය ලබා දී ඇත. සිරිපතුල් ගල දැනට බෙහෙවින් බාදනයට ලක් වී ඇති අතර පසු කාලයක දී ඇඹරුම් කටයුතු සඳහා භාවිතයට ගෙන ඇති බවට ද සාධක වේ.



සිරිපතුල් ගල

### හැලඹවැව රක්ෂිතයේ වෙල්යාය අසල නටබුන්

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිඉබ්බන්වැව ග්‍රාම නිලධාරී වසමේ, කිරිඉබ්බන්වැව ග්‍රාමයේ, පිහිටා ඇත.

අනුරාධපුර අවධියට අයත් මෙම නටබුන් ස්ථානය මානව මැදිහත්වීම හා නිධන් සොරුන්ගේ ග්‍රහණයට ලක්වීම හේතුවෙන් නිශ්චිත ව ම සන්දර්භය හඳුනාගත නො හැකි තත්වයට පත්ව ඇත. පුරාවස්තූන් අතර ශිලා ස්ථම්භ 04 ක්, කොරවක් ගල් 02 ක් හා පඩිගල් කිහිපයක් සාධක වේ. මීට අමතර ව පැරණි ගඩොල් හා වළං කටු බහුල ව භූමිය පුරා විසිරී ඇත. ස්ථූප ගොඩැල්ලක් සේ හඳුනාගත හැකි සාධක ද මෙම භූමියෙන් හමුවේ. මෙම ගොඩැල්ල මීටර් 4 X 3.80 ප්‍රමාණයෙන් මතුපිට සාධක මත හඳුනාගත හැකි ය.


කොරවක්ගල්


නටබුන් ගොඩැල්ලක්

**9 වන ගජබා රෙජිමේන්තු මූලස්ථානයේ ඇති නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිඉබ්බන්වැව වම ග්‍රාම නිලධාරී වසමේ, නෙළුම්වැව ග්‍රාමයේ පිහිටා ඇත.

බෝධි වෘක්ෂය අසල ඇති ශිලාමය හිඳි පිළිමය කොටස්වලට කැඩී තිබී පසුව සිමෙන්තියෙන් පිළිසකර කර ඇත. මෙම ප්‍රතිමාව පැහැදිලි ව ම අනුරාධපුර අවධියේ නිර්මාණ ලක්ෂණ හෙළි කරයි. වර්තමාන බෝධිඝරය වටා ශිලා ස්ථම්භ කිහිපයක් සිටුවා ඇති අතර, මේවායෙන් කිහිපයක් වෙනත් ස්ථානයකින් ගෙන එන්නට ඇති බවට සාධක වේ. බෝධිඝරයෙන් පිටත ද ශිලා ස්ථම්භ හා කොරවක්ගලක් හා ගරාවැටුණු පියගැටපෙළක ලක්ෂණ දැකිය හැකි ය. නිර්මාණ ලක්ෂණ අනුව මෙම පුරාවිද්‍යා සාධක අනුරාධපුර අවධියට අයත්සේ සැලකිය හැකි ය. පැරණි ගඩොල් හා උළු කැට කැබලි හා මැටි බඳුන් කොටස් මෙම භූමියෙන් හඳුනාගත හැකි ය. මෙම ස්ථානයට අක්කරවල්ලි නැමැති ස්ථානයෙන්


බුදු පිළිමය

ඉහත කී පිළිමය ගෙන ආ බව ප්‍රදේශවාසීන් පවසයි. මෙම භූමියේම තරමක් දුරින් පිහිටි ගලක ඇති අනුරාධපුර අවධියට අයත් ගල් කටු ලක්ෂණ ද මෙම භූමියේ ඇති වැදගත් පුරාවිද්‍යාත්මක සාධකයකි.




ගල් කණු හා කොරවක්ගලක්

**කිරිඉබ්බන්වැව අංක 407 ඉඩමේ පිහිටි නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිඉබ්බන්වැව අංක 6 ග්‍රාම නිලධාරී වසමේ, කිරිඉබ්බන්වැව ග්‍රාමයේ, පිහිටා ඇත.

දැනට ඉඩමේ පාරට ආසන්නව මෙම නටබුන් ඇති නමුත් මාර්ගය සකස් කිරීමේ දී පුරාවිද්‍යාත්මක සන්දර්භය සම්පූර්ණයෙන් ම වෙනස් වී ඇත. දැනට ඉඩමේ ඇති ශිලා ස්ථම්භවල ඇති ගල්කටු ලක්ෂණ අනුව ඒවා අනුරාධපුර අවධියට අයත් බව සනාථ වේ. පැරණි වළං කටු අවශේෂ හා උළුකැට අවශේෂ බහුල ව හමුවේ. පාරෙන් දකුණු පස ඇති ඉඩමේ ද ඇති ශිලා පුවරු මෙම ස්ථානයෙන් ම ගෙනගිය ඒවා බව නිවැසියන් පවසයි. එමෙන් ම මීට වසර 25 කට පමණ පෙර දී භූමියේ ශිලා ස්ථම්භ දැනට තිබෙන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් තිබූ බවත් ඒවා විටින් විට විවිධ පුද්ගලයන් රැගෙන ගිය බවත් ඉඩම් හිමියා පවසයි.




ඉඩමේ දක්නට ඇති ශිලා පුවරු

**වනඩ්ඩිපාලම හා අමුණ**

උතුරු පළාත හා නැගෙනහිර පළාත අතර සීමාවේ පළාත් දෙකට ම අයත් වන ලෙස හා මුලතිව් දිස්ත්‍රික්කයට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය යන දිස්ත්‍රික් දෙකට ම අයත් වන සේ හා කොක්කුතුඩුවායි දකුණ, සේවා ජනපදය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලටත් යන පරිපාලනමය පිහිටීම්වලට අයත්ව වැලිඔය ග්‍රාමයේ පිහිටා ඇත.

වර්තමානයේ වැලිඔය ලෙස හැඳින්වෙන ප්‍රදේශයෙන් ගලායන ඔය හරස්කර මෙම අමුණ ඉදිකර ඇත. විශාල ගල් කුට්ටි භාවිත කර ඇති මෙම අමුණ දිගින් මීටර් 200 ක් ද පළල මීටර් 9 ක් ද උස මීටර් 2.5 ක් පමණ ද වේ. අමුණේ ඇතැම් ගල් දැනට රුරා වැටී ඇත. ප්‍රධාන ඔය හරහා ඉදිකර ඇති අමුණ මතුපිට විශාල ගල් පුවරු අතුරා පාලමක් සේ භාවිතයට ගත් බවට සාධක වේ. දැනට අමුණ ඇති ආකාරයට ඔය හරස් කිරීමට මෙන් ම හැරවූ දිය කඳ දිශා දෙකකට බෙදා හැරීමට ද මෙකී අමුණ භාවිත කළ බවට සාධක වේ. ශිලා කුට්ටි හා පතුරුවල ඇති ගල්කටු ලක්ෂණ අනුව අනුරාධපුර අවධියට අයත් බව පැහැදිලි වේ. මෙම පාලම අඟලේ සිතියමෙහි ද සළකුණු කර ඇත.



පාලමේ ගල් ඇතුරුම



අමුණේ ගල් ඇතුරුමක්





අමුණේ ගල් ඇතුරුම

**වැලිඔය මහාසෑය භූමියේ ඇති පුරාවිද්‍යා නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොකුතුඩුවායි දකුණ ග්‍රාම නිලධාරී වසමේ, වැලිඔය ග්‍රාමයේ පිහිටා ඇත.

අනුරාධපුර අවධියට අයත් ගල්කටු ලක්ෂණ සහිත විශාල ගල් කුට්ටි කිරීමට යොදාගත් ගල්කොරි කිහිපයක් දැකිය හැකි අතර, මෙම ස්ථානයේ මෙසේ කුට්ටිකර භාවිතයට නොගත් ගල් කුට්ටි කිහිපයක් ද දැකිය හැකි ය. වානඩ්ඩි පාලම සහ අමුණ යන ස්ථානයේ දක්නට ලැබෙන ගල් කුට්ටි හා මෙම ස්ථාන දැනට පරිහරණය නො කරන ලද ගල් කුට්ටි අතර සමානකමක් දැකිය හැකි බැවින් මෙම ස්ථානයෙන් අමුණ සැකසීම සඳහා ගල් ගෙනයන්නට ඇති බවට අනුමාන කළ හැකි ය. වයඹ දිශාවට මුහුණලා ඇති කටාරම් ලෙනක් ද දැකිය හැකි ය. ලෙන අවට පැරණි වළංකටු කැබලි හා ගඩොල් ශේෂව දක්නා ලැබේ. මෙම ස්ථානයේ ඇති මැටි මෙවලම් කොටස් අතර කාල රක්ත වර්ණ මෙවලම් සහ කාලවර්ණ මෙවලම් කොටස් ද දැකිය හැකි ය. තවද ස්ථානයේ දක්නට ඇති සාධක අනුව මෙම ස්ථානය අනුරාධපුර අවධිය හා සබඳතා පෙන්වන බව නිගමනය කළ හැකි වේ.



කටාරම් ලෙන



ගල් කටු කැපුම් ලක්ෂණ ඇති ගල් කුට්ටි

**කන්නතිකුලම් නටබුන්**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝකිලායි ග්‍රාම නිලධාරී වසමේ කන්නතිකුලම් ග්‍රාමයේ පිහිටා ඇත.

නිදන් සොරුන්ගේ ග්‍රහණයට ලක්වීම හේතුවෙන් ස්මාරකය පිළිබඳ ව නිශ්චිතව හඳුනාගැනීමට හැකියාවක් නැත. නමුත් අඩි 7 ක පමණ විශ්කම්භයක් තුළ පසින් යටවූ ශිලා ස්ථම්භයක් සහ දිගෙලි වූ ශිලා ස්ථම්භ 04 ක සාධක හඳුනාගත හැකි ය. මීට අමතර ව ගල් කණු කැබලි කිහිපයක් ද හඳුනාගත හැකි ය. සන්දර්භයේ වෙනස්වීම හේතුවෙන් ස්මාරකය පිළිබඳ ව නිශ්චිතව තීරණය කිරීමට හැකියාවක් නැත.





නිදන් සොරුන්ගේ ග්‍රහනයට ලක්ව ඇති නටබුන් ගොඩැලි

**පුංචි කිරිඉබ්බන්වැව කටාරම් ලෙන් සහිත පුරාවිද්‍යා භූමිය**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගජබාපුර ග්‍රාම නිලධාරී වසමේ නව මොරවැව ග්‍රාමයේ පිහිටා ඇත.


මෙම භූමියේ මෑතකාලීනව විහාරස්ථානයක් ලෙස භාවිතයට ගෙන වර්තමානයේ අතහැරදමා ඇත. කටාරම් සහිත ලෙන් 03 ක් හඳුනාගත හැකි අතර ලෙන් දෙකක පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපි 02 කි. මෙම ලිපි විධිමත්ව අරුත්ගන්වා නැතත් පරුමකවරුන් (ප්‍රධානීන්) විසින් ලෙන් පූජකළ බවට සරල අදහසක් ගත හැකි ය. මින් එක් ලෙනක බිත්ති බැඳ මෑතකාලයේ දී පරිහරණයට ගෙන ඇති බවට ද සාධක වේ. අනෙක් ලෙන් දෙක මහල් දෙකක ලෙසින් දර්ශනය වනසේ සකසා ඇත. මෙහි ඉහල මහලෙහි පිහිටි ලෙනෙහි අභ්‍යන්තරයේ ගල් ඇඳක් ලෙස අනුමාන කළ හැකි ගලෙහි කැපුමකි. ලෙන අවට පැරණි උළු, වළංකටු හා ගඩොල් හඳුනාගත හැකි ය. මෙම භූමියේ ස්ථූප ගොඩැලි 02 සාධක හමුවුව ද එම ස්ථාන 02 ම නිධන් හොරුන්ගේ ග්‍රහණයට ලක්ව ඇත. ස්ථූප ගොඩැලි දෙකෙහි ශේෂිත ගඩොල් සාධක මත ඒවා අනුරාධපුර අවධියට අයත් බව පැහැදිලි ය. මෙම භූමියේ කණු පාදම් ගල් 06 ක් දැකගත හැකි වූ අතර මේවා අයත් ගොඩනැගිල්ල කුමක්දැයි හඳුනාගැනීම අපහසු ය. තවද මෙම භූමියේ මීටර් 2.5 ක් පමණ උසැති කුඩා පර්වතයක් දැකිය හැකි අතර මෙහි පර්වතය මතුපිට කිසියම් කාර්යයකට සකසා ඇති බවක් පෙනේ. තවද පර්වතයේ සිව්කොනේ කුඩා කාණු කපා ඇති බවක් ද දක්නා ලැබිණි.



කටාරම් කෙටූ ලෙන



තට්ටු දෙකකින් යුතු කටාරම් කොටන ලද ලෙනෙහි පහළ ලෙන හා එහි වන ලෙන් ලිපිය



කටාරම සහිත ඉහළ ලෙන හා එහි ලෙන් ලිපිය

**ජනකපුර කොක්කුතුඩුවායි පාරේ යබොර ස්ථානය**

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගජබාපුර ග්‍රාම නිලධාරී වසමේ නව මොරවැව ග්‍රාමයේ පිහිටා ඇත.

යබොර කොටස් බහුල වශයෙන් මාර්ගයේ සහ මාර්ගය දෙපස භූමියෙත් මීටර් 200-300 ක පමණ වපසරියක් පුරා ව්‍යාප්තව පවතී. යබොර ව්‍යාප්තිය අනුව බහුල වශයෙන් මෙම ප්‍රදේශය ආශ්‍රිතව යකඩ නිස්සාරණය සිදු වී ඇති බව පැහැදිලි ය.



පාරෙහි යබොර විසිර පවතින ආකාරය

### කිරිඉබ්බන්වැව දකුණු ඉවුරේ රජයේ රක්ෂිතයේ නටබුන්

මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිඉබ්බන්වැව ග්‍රාම නිලධාරී වසමේ කිරිඉබ්බන්වැව ග්‍රාමයේ, පිහිටා ඇත.

ශිලා ස්ථම්භ 12 ක් පමණ පැහැදිලි හඳුනාගත හැකි මෙම නටබුන් භූමියේ ශිලා ස්ථම්භ 03 බැගින් වූ පොකුරු 04 ක් ලෙස දැනට හඳුනාගත හැකි ය. මෙම පිහිටීම අනුව ස්මාරකය කුමක්ද යන්න නිශ්චිත ව කිව නො හැකි ය. දැනට දැකිය හැකි ශිලා ස්ථම්භවල සාමාන්‍යය උස සෙන්ටිමීටර් 45 නො අඩු ය. කණු පාදම් ගලක සාධක ද මෙම භූමියෙන් හමුවන අතර පෙති උළු ද හමුවේ. මෙම අවශේෂවල සාධක මත අනුරාධපුර අවධියට අයත් සේ අනුමාන කළ හැකි ය.



ගොඩනැගිලි නටබුන්



### සිවපුරම් ශ්‍රී මලේ කෝවිල, වවුනිකුලම්

මුලතිව් දිස්ත්‍රික්කයේ මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාලිනගර් අංක 35 ග්‍රාම නිලධාරී වසමේ මල්ලාවි ග්‍රාමයේ පිහිටා ඇත.

කණු පාදම්ගල් 9ක්, පැරණි ගොඩැල්ලකට අයත් ශිලාමය උඩලිපත හා යටලිපත, ක්‍රිස්තු වර්ෂ 8 - 10 සියවස්වලට අයත් ටැම් ලිපියක්, පැරණි ගඩොල් සහ සිරිපතුල් ගලක් සහිත ස්ථානයකි. මෙම ස්ථානය පිළිබඳ ව 1964-65 පුරාවිද්‍යා කොමසාරිස්ගේ පාලන වාර්තාවේ ද 1967-68 පුරාවිද්‍යා කොමසාරිස්ගේ පාලන වාර්තාවේ ද තොරතුරු දක්නට ඇත. ඒවායෙහි සඳහන් වන පරිදි මෙම ස්ථානය තුළ බෞද්ධාගමික ගොඩනැගිලි රාශියක් දක්නට ලැබී ඇත. මෙම ස්ථානයෙන් හමු වූ හිඳි බුද්ධ ප්‍රතිමාව මේ වන විට වව්නියාව පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇත. හිටි බුද්ධ ප්‍රතිමාව අනුරාධපුර කෞතුකාගාරයේ තැන්පත් කර ඇත. ගවේෂණ කාර්යය සිදු කරන අවස්ථාව වන විට මෙහි සුවිශාල හින්දු කෝවිලක් ඉදිවෙමින් පැවතිණි.



දේවාල ගොඩනැගිල්ලට ඉදිරිපසින් පිහිටි පැරණි ගොඩනැගිල්ලකට
අයත් කණු පාදම්ගල්



හිඳි බුද්ධ ප්‍රතිමාව



වවුනිකුලම් පුරාවිද්‍යා ස්ථානයෙන් හමුවී ඇති අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති හිටි බුද්ධ ප්‍රතිමාව (උස සෙ.මී. 165)

පැරණි නටබුන් ගොඩනැගිලිවල ගල් කණු ආදිය තල්ලුකර එක තැනකට ගොඩගසා ඇත. මෙහි ටැම් ලිපියක් දක්නට ඇත එහි ඉහළ කපුටෙකුගේ රුවක් ද පහළ බල්ලෙකුගේ රුවක් ද කොටා ඇත. අක්ෂර පේළි 10 කින් යුත් ශිලාලේඛනයෙහි අක්ෂර කිහිපයක් ගෙවී ගොස් ඇති බැවින් සම්පූර්ණ අර්ථයක් ලබා ගැනීම අපහසු ය. අර්ථය - ශ්‍රී මි(හිඳු) ඈපා..... මහ විහාරයේ කාර්මිකයන් ......... වැසිව් මෙහෙය සඳහා දීම ද ඒ මෙහෙයේ නොයෙදෙන අය කවුඩු, බල්ලන් වන බව ද සඳහන් ය. ගවේෂණ කණ්ඩායම මෙම ස්ථානය පරීක්ෂාවට යන විට කෝවිලෙහි නව ඉදි කිරීම් සිදු කරමින් සිටි අතර කෝවිලෙහි දේව රූප අඹමින් සිටි ශිල්පියා අසල පිහිටි

පැරණි නටබුන් ගොඩැල්ලෙන් ගඩොල් ගලවා පිළිම තැනීම සඳහා භාවිත කරමින් සිටියේය. එසේ ගඩොල් ඉවත් නො කරන ලෙස ඔහුව දැනුවත් කරනු ලැබීය.

මෙම ස්ථානය ඉතා වැදගත් ස්ථානයක් බවට ලැබී ඇති පුරාවිද්‍යාත්මක සාධක මගින් නිගමනය කළ හැකි ය.



පැරණි ගඩොල් කුඩු කර ඇති ආකාරය



පැරණි ගඩොල් ගලවා ඇති ආකාරය



පැරණි ගඩොල් භාවිතයෙන් පිළිම සකස් කරන ආකාරය



පැරණි ගඩොල් භාවිතයෙන් පිළිම සකස් කරන ආකාරය



ටැම් ලිපිය



ගල කණු ගොඩගසා ඇති ආකාරය



සිරිපතුල් ගල



කණු පාදම් ගල

**කර්නාටුකේනි කෝවිල් නටබුන්**

ගඩොලින් නිමවන ලද ගොඩනැගිල්ලක අත්තිවාරමෙහි කොටසක් පමණක් අනාවරණය වී ඇති අතර එහි ඉතිරි කොටස මෑත භාගයේ ගොඩනැගිල්ල මත ඉදිකරන ලද පුල්ලෙයාර් කෝවිල නිසා හඳුනා ගැනීමට නො හැකි ය. මෙයට යොදා ඇති ගඩොල් අනුරාධපුර යුගයේ භාවිත කරන ලද ගඩොල්වලට සමාන ය.



පැරණි ගඩොල් ඇතුරුම්



පැරණි ගඩොල් ගොඩැල්ලක් මත
ඉදිකළ කෝවිල

**ජනකපුර අලුත් පාසල පිටුපස නටබුන්**

මෙම ස්ථානයේ පෙරළී ගිය ගල්කණු කිහිපයක් දක්නට ඇති අතර ගඩොල් අක්‍රමවත් ව විසිරී ඇත. එමෙන් ම මැටි බඳුන් කොටස් සහ යබොර බහුල වශයෙන් භූමිය පුරා විසිරී පවතී.



පෙරළී ගිය ගල්කණුව

**ජනකපුර පැරණි ගල් කටු ලක්ෂණ සහිත ගල් කුට්ටිය**

කුඩා ප්‍රමාණයේ ගල් පර්වතය අනුරාධපුර අවධියට අයත් ගල්කටු පහරවල් 39 ක සලකුණු සහිත දැකිය හැකි ය.



ගල් කටු ලක්ෂණ සහිත ගල් පර්වතය

**නෙලුම්වැව ඉස්මත්තේ නටබුන්**

ගඩොල් අත්තිවාරම මත ගල්කණුවලින් නිමවන ලද නටබුන් ගොඩැල්ලක් මෙහි දක්නට ඇත. කණු කිහිපයක් ශේෂ වී ඇති අතර බොහෝ කණු කැඩී ගොස් ඇත. නිදන් හොරුන් විසින් මීටර් 1 ක් පමණ ගැඹුරට ගොඩනැගිල්ල හාරා විනාශකොට ඇත. මීට අමතරව ගොඩනැගිල්ලෙහි පියස්ස සඳහා භාවිත කරනලද උළු මෙම භූමියේ විසිරී ඇත.



නටබුන් ගොඩැල්ල

## දකුණු පළාත

**කසාගල පුරාවිද්‍යා ස්ථානයට නියමු සැලැස්මක් සකස් කිරීම**

පුරාවිද්‍යාත්මක වශයෙන් හා ඓතිහාසික වශයෙන් වැදගත් කසාගල පුරාවිද්‍යා ස්ථානයේ නූතන සංවර්ධන ව්‍යාපෘති මඟින් තදාසන්න පුරාවිද්‍යා ස්මාරකවලට හානි නොවන ආකාරයට සිදු කිරීම සඳහා නියමු සැලැස්මක් සකස් කිරීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩයාල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මෙම ස්ථානය වෙත රන්න වීරකැටිය මාර්ගයේ කිලෝමීටර් 9 ක් පමණ ගමන් කිරීමෙන් පැමිණිය හැකි ය.

ජනප්‍රවාදගත තොරතුරුවලට අනුව ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස වන විට රහතන්වහන්සේලා වස් විසූ තැනක් වූ බැවින් කසාවතින් බැබලූ නිසා "කචගල" ලෙසින් මෙම ස්ථානය හඳුන්වා ඇත. කාවන්තිස්ස රජ සමයට අයත් ශිලාලේඛනයක "කචගල විහාර" නමින් විහාරයක් ප්‍රතිසංස්කරණය කරන ලද බව සඳහන් වේ. බ්‍රාහ්මීය අක්ෂරවලින් යුතු පර්වත ලිපි දෙකකින් මෙම ස්ථානය පිළිබඳ තොරතුරු අනාවරණය වේ. අනුරාධපුරය, පොළොන්නරුව හා මහනුවර යන යුගවලට අයත් පුරාවිද්‍යා සාධක දක්නට ලැබෙන මෙහි පර්වත මස්තකය මත ඇති දාගැබ අනුරාධපුර යුගයට අයත් බව හඳුනාගත හැකි ය. නැගෙනහිරින් බෝධිඝරයක් දක්නට ලැබෙන අතර එහි පිහිටි ස්තූපය සඳහා සද්ධාතිස්ස රජු විසින් වටදාගෙයක් කරවා ඇති බව සඳහන් ය.

මෙහි ප්‍රතිමා ගෘහය හා එහි අන්තර්ගත සිතුවම් සංඝාවාසයේ, නිර්මාණ ලක්ෂණ අනුව මහනුවර යුගයට අයත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙන්නුම් කරයි. සංරක්ෂණ හා නඩත්තු කාර්යය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත සිදුකරගෙන යනු ලබන අතර විහාරාධිපති හිමිගේ මූලිකත්වයෙන් සංවර්ධන කටයුතු සිදු කිරීම අපේක්ෂා කරන බැවින් තදාසන්න ස්මාරක සඳහා බලපෑම් නොවන ආකාරයට සංවර්ධනය කිරීමට අවශ්‍ය වේ. ඒ සඳහා නියමානුකූල සැලසුම් ලබාදීම සිදුකර ඇත. එහි දී කැණීම් කිරීමට අවශ්‍ය භූමි හඳුනාගෙන ඇති අතර සංඝාවාසය ගොඩනංවා නඩත්තු කිරීම්වල දි ස්ථානයේ දෛනික උද්‍යාන කටයුතු නඩත්තු කිරීම කළ යුතු බව හඳුනාගෙන ඇත. පැරණි භූ දර්ශනයට හානිවන ලෙස ඉදිකර ඇති ගොඩනැගිලි කඩා ඉවත් කිරීමටත් යෝජනා ඉදිරිපත් කර ඇති අතර, ප්‍රාකාර බැම්මෙන් ඇතුළත මළුව සකස් කිරීම සඳහා යෝජනා කර ඇත. ඒ අනුව පෙත් මං සෑදීම හා පෙරහැර මාවත සකස් කිරීම, පියගැටපෙළ සකස් කිරීම, විහාරගෙයි වහල නඩත්තු කිරීමත්, ප්‍රාකාරය ශුද්ධ පවිත්‍ර කිරීම හා බැම් පොයින්ට් කිරීමටත් එහි සැලසුම් සකස් කර ඇත.

එමෙන් ම ස්මාරක ආරක්ෂා කර ගැනීම සඳහා නඩත්තු සංරක්ෂණ සැලසුමක් සකස් කිරීම සඳහා ද යෝජනා ඉදිරිපත් කරන ලදි

## ඌව පළාත

ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු - 2010 ඇස්තමේන්තුවට අනුව බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක පුරා ව්‍යාප්ත වන පරිදි පහත කාර්යයන් ඉදිකරන ලදි.

- ගල් බිඳුම් හා ඛනිජ කැණීම් නිර්දේශ ලබාදීම
- පුරාවිද්‍යා හානි ඇගයුම් නිරීක්ෂණය
- අනවසර කැණීම් හා පුරාවස්තු විනාශය පිළිබඳ පරීක්ෂාවන් හා වාර්තා සම්පාදනය
- පුරාවිද්‍යා ක්ෂේත්‍ර පරීක්ෂණ සහ වාර්තා සම්පාදනය

ස්ථාන පරීක්ෂා හා ක්ෂේත්‍ර කටයුතු - 2010 ඇස්තමේන්තුවට අනුව බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක පුරා ව්‍යාප්ත වන පරිදි ස්ථාන පරීක්ෂා කිරීම් 133ක් සිදුකරන ලදි.

- ගල් බිඳුම් හා ඛනිජ කැණීම් නිර්දේශ ලබාදීම - 72
- පුරාවිද්‍යා හානි ඇගයුම් නිරීක්ෂණ - 20
- අනවසර කැණීම් හා පුරාවස්තු මංකොල්ලකෑම් පිළිබඳ පරීක්ෂාකර වාර්තා සැපයීම - 21
- පුරාවිද්‍යා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම - 20ක් සඳහා නිර්දේශ ලබා දෙන ලදි. මේ සඳහා රු. 130,000.00ක ඇස්තමේන්තුගත මුදලක් වෙන් විය.

**කණුල්වෙල ගවේෂණය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 99 කණුල්වෙල ග්‍රාම නිලධාරී වසමේ, කණුල්වෙල ගමේ මෙම ස්ථානය පිහිටා ඇත.

බදුල්ලේ සිට බිබිල නගරය පසුකර මොණරාගල මාර්ගයේ කිලෝමීටර් 7ක් පමණ ගියවිට කණුල්වෙල කඩමණ්ඩිය හමු වේ. කඩමණ්ඩියෙන් වම්පසට ඇති පොදු සුසාන මාර්ගයේ ගියවිට මෙම ස්ථානයට ළඟා විය හැකි ය.

භූමිය ගවේෂණයේ දී පියවර දෙකක් යටතේ මූලික දත්ත ගවේෂණය සිදුකරන ලදි

I. පුරාවිද්‍යා රක්ෂිත භූමිය ගවේෂණය

II. රක්ෂිතය අවට විස්තෘත භූමිය ගවේෂණය

**ගවේෂණ අරමුණු**

1) දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භාරයේ පවතින භූමිය තුළ පවතින පුරාවස්තු හඳුනාගැනීම සහ වාර්තා කිරීම.
2) අවට භූමියේ පුරාවස්තු තිබේදැයි හඳුනාගෙන වාර්තා කිරීම.
3) අවට පදිංචිකරුවන්ගෙන් භූමියට පවතින මැදිහත්වීම හඳුනාගෙන ආරක්ෂිත යෝජනාවලිය සකස් කිරීම.
4) අවට පදිංචිකරුවන්ගේ සංවර්ධන ක්‍රියාවලියේ දී නිරන්තර මැදිහත්වීම්වලට ලක්වන පුරාවිද්‍යා රක්ෂිතයේ ආරක්ෂාව සඳහා කටයුතු කිරීම.

ලග්ගලබැද්ද නමින් හැඳින්වෙන භූමිය තුළ කණුල්වෙල පුරාවිද්‍යා භූමිය පිහිටා ඇත.

- සීමා ප්‍රාකාරයෙන් වට වූ අභ්‍යන්තර පුරාවිද්‍යා භූමිය
- සීමා ප්‍රාකාරයෙන් බාහිර පුරාවිද්‍යා භූමිය ලෙසින් හඳුනාගත් කණුල්වෙල පුරාවිද්‍යා භූමිය තුළ පැරණි මැටි බඳුන් කැබලි, ගඩොල් කැබලි, උළු කැබලි මෙන් ම ආසනගල සහ ගල් පුවරු ආදී පුරාවස්තු මෙම භූමිය මතුපිටින් වාර්තා වේ.

කණුල්වෙල පුරාවිද්‍යා භූමියේ සතර දිශාවෙන් වූ සීමා පවුර පස්වලින් හා ලඳු කැලෑවෙන් ආවරණය වී පවතී. බටහිර පැති සීමා පවුරත්, දකුණු පැති සීමා පවුරත්, තැන් කීපයකින් අනවසර මාර්ග පරිහරණය තුළින් විනාශ වී ඇත. එම විනාශ වූ ස්ථාන අනුසාරයෙන් පවුර ගල් පුවරු හා ගඩොල් අනුසාරයෙන් ඉදිකර ඇති බවත්, දෙපස ගල් පුවරු යොදා මැද කොටස ගඩොල්වලින් පිරවීම් කර ඉදිකර ඇති බව පැහැදිලි වේ. භූමිය මතුපිට වාර්තාවන මැටි බඳුන් රක්තවර්ණ මැටි බඳුන් ය.

පුරාවිද්‍යා රක්ෂිත භූමියට බටහිර ඊට ආසන්න භූමියෙන් ද ගල් පුවරු, ආසන ගල්, මැටි බඳුන් කැබලි, උළු හා ගඩොල් කැබලි වාර්තා වේ. කණුල්වෙල පුරාවිද්‍යා භූමියට ඒ අවට පදිංචිකරුවන්ගේ මැදිහත්වීම් අයහපත් බලපෑමකි. අවට පදිංචිකරුවන්ගේ කුණුකසළ බැහැරීමේ ස්ථානය, ගවගාල් ලෙස පරිහරණය, අනවසර මාර්ග පරිහරණය මගින් විශාල හානියක් සිදු වේ.

මෙසේ වුව ද ගවේෂණය සිදුකරන කාලසීමා වන විට ද පුරාවිද්‍යා භූමිය අනවසර කැණීමකට ලක් නොවූ භූමි ස්ථරායනය අවුල් නොවූ පැහැදිලි භූමියක් ලෙස නම් කළ හැකිය.

මේ සඳහා ක්‍රියාත්මක වීමට අපේක්ෂිත යෝජනා වශයෙන්

1) භූමිය මැදින් ඇති අනවසර මාර්ග ඉවත් කර එය භූමියේ කෙළවරින් පිහිටුවීම.
2) දැනට අවට පදිංචිකරුවන්ගේ කුණු සහ මළ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයක් ලෙස පරිහරණය කිරීම වැළැක්වීමට භූමිය වටා ආරක්ෂිත වැට ඉදිකිරීම.
3) යටි කැළය කපා ස්ථානීය නඩත්තුව සිදුකිරීම.
4) දීමනා රැකවල්කරුවෙකු පත්කිරීම මගින් භූමියේ ආරක්ෂාව සහ පිරිසිදු කිරීමේ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම.
5) ස්ථානයේ ඇති ආරක්ෂිත පවුර හඳුනාගැනීම සඳහා තෝරාගත් ස්ථානයක පුරාවිද්‍යා පර්යේෂණ කැණීමක් සිදුකිරීම ඉදිරිපත් කර ඇත.

**තිඹිරිය පුරාණ විහාර ගවේෂණය**

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදගම බී ග්‍රාම නිලධාරි වසමේ තිඹිරිය ග්‍රාමයේ මෙම ස්ථානය පිහිටා ඇත.

බදුල්ල පස්සර ලුණුගල නගර පසුකර බිබිල නගරයට පැමිණ බිබිල - මොණරාගල මාර්ගයේ මැදගම නගරයට පැමිණ කොටබෝව දේවාලය මාර්ගයේ මීටර් 500 ක් පමණ ගිය විට වෙල්යාය මැද්දෙන් වූ මාර්ගයේ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ප්‍රවේශ විය හැකි ය.

අනුරාධපුර යුගය, මහනුවර යුගය වැනි ලංකා ඉතිහාසයේ යුගයන් කිහිපයක ක්‍රියාකාරීත්වය සනිටුහන් කරන ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අනුසාරයෙන් තිඹිරිය රජමහ විහාර ඉතිහාසය ගොඩනැගී ඇත. ඓතිහාසික මූලාශ්‍රවලට අනුව ගිරිකුම්භීල විහාරය නමින් හඳුන්වන්නේ තිඹිරිය රජමහ විහාරය බව විශ්වාස කෙරේ. මහාවංශයට අනුව සද්ධාතිස්ස රජු පුත් ලජ්ජතිස්ස කුමරු මෙම විහාරය කළ බව සඳහන් වේ (මහාවංශය 33 පරිච්ඡේදය 14, 15 ගාථා). දුටුගැමුණු එළාර යුද්ධය සඳහා රුහුණේ සිට අනුරාධපුරය වෙත ගමන් ගත් මාර්ගයේ මාගම, බුත්තල, මැදගම, බිබිල, මහියංගණය, පොලොන්නරුව ඔස්සේ අනුරාධපුරයට ප්‍රවේශ වූ බව වංශකථාවේ සඳහන් වේ. එම ගමන් මාර්ගයේ මැදගම තිඹිරිය රජමහ විහාරය අසල දින හතක් කඳවුරු බැඳගෙන සිටි බවත් එම ස්ථානය වර්තමානයේ මාලිගාතැන්න නමින් හඳුන්වන බවත් ජනවහරේ පවතී. මැදගම උයන්තොට සුළු මැදගම දාගැබක් කරවා මැදගම වෙල් යායේ හැටපස් අමුණක කුඹුරු තිඹිරිය විහාරයේ බුද්ධ පූජාව හා භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය සඳහා පූජා කළ බව ථූප වංශයේ සඳහන් වේ. සද්ධර්මාලංකාරයේ සඳහන් විස්තර අනුව ධම්මා උපාසිකාවගේ කතා වස්තුවට සම්බන්ධ ගිරිකුම්බිල තිස්ස පබ්බතාරාමය නමින් හඳුන්වන්නේ ද තිඹිරිය විහාරය බවයි.

2010.8.5 දින සිට 2010.8.8 දක්වා දින 4 ක කාලයක් මෙම ගවේෂණය සිදු කරන ලදි. මෙම ගවේෂණයේ අරමුණ වූයේ අක්කර දොළහක ප්‍රමාණයක පුරාවස්තු ව්‍යාප්තව ඇති තිඹිරිය රජමහ විහාර භූමියේ සීමා මායිම් හඳුනා ගැනීමත් නවීකරණය කරමින් පවතින විහාර භූමියේ පිරිවෙන සඳහා අවශ්‍ය ඉදිකිරීම්වල දී පුරාවස්තුවලට, පුරාවිද්‍යා භූමියට සිදුවන හානිය අවම කර නව ඉදිකිරීම් සඳහා සුදුසු භූමිය වෙන්කර ගැනීමත් විහාර භූමිය වෙත ඒ වටා පදිංචිකරුවන්ගේ අනවසර මැදිහත්වීම් අවම කිරීමත් 2008.10.24 දින අංක 1573 දරණ ගැසට් පත්‍රයේ පුද්ගල සන්තක ස්මාරකයක් ලෙස ලියාපදිංචි කළ විහාරයේ ස්තූපය සහ නටබුන් ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු නියමු සැලසුමක් සකස් කර ගැනීමත් ය.

ගල් කණු සහිත ගොඩනැගිලි නටබුන් පිවිසුමේ සිට මීටර් 20ක් පමණ ගිනිකොන දිශාවට වන්නට ගල්කණු කොටස් 13 කින් යුක්ත නටබුන් ගොඩනැගිල්ලක් හමුවේ. මෙහි සිරස් අතට හා සිරස්ව පෙරළී ගිය ගල්කණු කොටස් දක්නට ලැබේ. ගල් කණු අතර පරතරය මීටර් 1.40 ක් පමණ වන ආකාරයෙන් ගල්කණු පිහිටා ඇති අතර ගොඩනැගිල්ලේ පළල මීටර් 5 ක් ද දිග මීටර් 10 ක් ද වේ. ගල් කණුවක් මීටර් 24 ක් පමණ උසින් යුක්ත වන අතර සංඝාවාස ගොඩනැගිල්ලක් ලෙස සැලකිය හැකි ය. දෙවන මාලකයේ සිට තුන්වන මාලකයට ප්‍රවේශ වන පිවිසුමක් වශයෙන් හඳුනාගත හැකි ය. සඳකඩ පහණ, කොරවක්ගල්, පියගැට පෙළ සහ මුරගල් ආදී අංගවලින් මෙය සම්පූර්ණ ආරක්ෂිතව පවතී. ඉතා මනරම් කලා කෘතියක් වන මෙය ගලින් කළ අංග සම්පූර්ණ පියගැටපෙළක් ලෙස හැඳින්විය හැකි ය.

විහාර භූමියේ ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්මාරක අතර විහාර මලුවේ දකුණු පස බෑවුමෙහි පියගැට පෙළ පියගැට අටකින් සමන්විත වන අතර එහි ඉහළ අර්ධය දෙපස ගල් කණු දෙකකි. පියගැටපෙළ දෙපස ගලින් කළ බැම්මක් විහිදී ඇති අතර වම් පස බැම්මේ දිග

මීටර් 3.5 ක් ද දකුණු පස ගල් බැම්ම මීටර් 18 ක් ද දිගට විහිද යයි. විහාර මලුවෙහි ඇති පැරණි ධර්ම ශාලාවේ වහලය සඳහා පැරණි සිංහල උළු සෙවිලි කර ඇත. ධර්මශාලාව පළලින් මීටර් 9 ක් ද දිග මීටර් 13.10 ක් ද වේ. මෙය කොටස් දෙකකින් යුක්ත වන අතර මධ්‍යයේ ඇති කණු හතරක් මගින් වහලය ඔසවා වෙන ම වහලයක් සාදා ඇත. මෙය ද පසුකාලීනව සංරක්ෂණය වූ ගොඩනැගිල්ලකි. ධර්ම ශාලාවේ සිට ගිනිකොන දිශාවෙන් මීටර් 45 ක් පමණ දුරින් තවත් නටබුන් ගොඩනැගිල්ලක් දක්නට ලැබේ.

තිඹිරිය විහාරස්ථානයේ ඇති පිළිම ගෙය සුවිශේෂ වාස්තුවිද්‍යාත්මක සහ කලාත්මක ලක්ෂණවලින් යුක්ත ය. මෙහි ප්‍රතිමා ගෘහයේ කැටයම්, මූර්ති, චිත්‍ර සියල්ලම මහනුවර සම්ප්‍රදාය නියෝජනය කරයි. පසුකාලීනව සිදු කළ අලුත්වැඩියා කටයුතු හේතුවෙන් තරමක හානියක් සිදු වුව ද සම්ප්‍රදාය හඳුනාගත හැකි පරිදි තොරතුරු ශේෂව පවතී. විහාර මන්දිරය කොටස් දෙකකින් යුක්ත ය. ප්‍රතිමා සහ සිතුවම් සහිත විවෘත මණ්ඩපය, විහාර මන්දිරයේ ප්‍රවේශ මණ්ඩපයට සම්බන්ධව ගර්භගෘහය වටා පැදකුණු කළ හැකි පරිදි ඉදි කර ඇත. ප්‍රවේශ මණ්ඩපයට අයත් කොටස දැව කණු සහිත ව කළ ඉදිකිරීමකි. ප්‍රවේශ දොරටුව ඉදිරිපසින් අලංකාර මකර තොරණකි. මෙම විහාරයට සමකාලීන ප්‍රතිමා ගෘහවල මකර තොරණට සමාන වන අලංකාර අංගවලින් යුක්ත ය. මේවායේ සුදු හුණු ආලේප කර ඇත. දොරටුව ඉදිරිපස සූර්ය වංකය ආකාරයට ද ඇතුල් පැත්තෙන් චන්ද්‍රවංක ආකාරයට නිර්මාණය කර ඇත. ගෘහය මීටර් 6.50 x 3.35 ප්‍රමාණයෙන් යුක්ත ය. මෙහි බිත්ති අලංකාර සිතුවමින් වර්ණ ගන්වා ඇත. පනේල ක්‍රමයට සිතුවම් කර ඇති මෙහි දොරටුව දෙපස කින්නර හා කින්නරාවියගේ රූව සිතුවම් කර තිබේ. මලක් අතින් ගත් රහත් රුව සිටගෙන සිටින අයුරු නිරූපණය කර ඇත. සූවිසි විවරණය, සත් සතිය සිතුවම් සඳහා වස්තු විෂය වී ඇත. ප්‍රතිමා ගෘහය තුළ දැවමය බුදු පිළිමයක්, හිඳි බුද්ධ ප්‍රතිමාවක් දෙපස හිටි බුද්ධ ප්‍රතිමා දෙකක් තැන්පත් කර ඇත.

**සංරක්ෂණය කරන ලද දාගැබ**

පැරණි දාගැබක් වටා අළුතින් ඉදිකර ඇති කංචුකයක් ආකාරයේ ආරක්ෂිත ගඩොල් ආවරණයක් දක්නට ලැබෙන මෙහි මුල් පේසාව ආවරණය කර ඇති අයුරු දක්නට ලැබේ. ගඩොල් ආවරණයෙන් ඉහළ කොටස චෛත්‍යය සංරක්ෂණය කර ඇති අතර අටපට්ටම් හැඩයක අළුතින් ගඩොල් ආවරණය ඉදිකර ඇත. මෙහි එක් පැත්තක දිග මීටර් 6.20 ක් ද, මෙහි උස මීටර් 1.86 ක් ද වේ. සංරක්ෂණය කර ඇති පැරණි දාගැබේ විෂ්කම්භය මීටර් 5.60 කි. මෙහි උස (ඉදිකර ඇති බැම්ම මත සිට) මීටර් 3 කි. විහාරගෙයි බිත්තියේ සිට මීටර් 2.30 ක් උතුරු දිශාවට වන්නට දාගැබ පිහිටා ඇත. මෙම දාගැබ වටා ද්විතීය සන්දර්භය ලෙස තැම්පත් කර ඇති ගල්කණු කොටස් ඡත්‍රගල් හා සිරිපතුල් ගල් දක්නට ලැබේ. සිරිපතුල් ගලක් දිග මීටර් 120 ක් හා පළල මීටර් 70 ක් වන අතර එහි ඝනකම සෙන්ටිමීටර් 18 කි. එමෙන් ම දාගැබ් මළුවේ විසිරී අති ගල්කණු කොටස් බහුල ව දක්නට ලැබුණි.

තිඹිරිය විහාර භූමියේ නටබුන් ගොඩනැගිලි, නටබුන් ස්තූපය, පවුරු කොටස්, කොරවක්ගල, සඳකඩ පහණ, පියගැට සහිත දොරටු අවශේෂ මහනුවර යුගයේ සිතුවම් මූර්ති සහිත පිළිම ගෙය ආදී වශයෙන් වූ අනුරාධපුර සහ මහනුවර යුගයන් නියෝජනය කරන පුරාවස්තුවලින්

සමන්විත වේ. විහාර භූමිය නිර්මිත පරිසරයට අනුගත වෙමින් මාලක ක්‍රමයට අනුගත වී ආරාමික අංග ඉදිකිරීම් සිදු කර ඇත. මෙම මාලක අතර ගොඩනැගිලි අවශේෂ දැනට ශේෂ ව ඇත්තේ දෙවන සහ තෙවන මාලකවල පමණි. හතරවන මාලකය නිදහස් පරිසරයක් ලෙස ශේෂව පවතී.

කඳු බෑවුමේ වූ පුරාවස්තු අතර ස්තූපය, පිළිම ගෙය වැනි පූජනීය ගොඩනැගිලි දෙවන මාලකය තුළ පවතී. මෙම පූජනීය ගොඩනැගිලවලට අමතරව නටබුන් ගොඩනැගිලි කීපයක අවශේෂ දක්නට ලැබේ. මෙම පුරාවස්තු පිහිටි කඳු ගැටයේ බෑවුමෙහි ගිණිකොන දකුණ දිශානුගතව ඇළ මාර්ගයක් පිහිටා ඇති අතර මෙම සියලු පාරිසරික තත්වයන්ට අනුගත වන පරිදි ආරාමය නිර්මාණය ඉදිකර ඇත. කඳු බෑවුම් පරිසරයක ඇති විහාර භූමියේ බොහෝ පුරාවස්තු කඳු මුදුන ඛාදනයවීමෙන් කඳු පාමුල තැන්පත්ව පසින් යට වී පොළොව අභ්‍යන්තරයේ පුරාවස්තු තැන්පත්ව ඇත. නමුත් විහාර භූමියේ නව ඉදිකිරීම් මෙම පුරාවස්තු අතර සිදුකළ හොත් එයට බලපෑමක් විය හැකි ය. තිඹිරිය විහාරයේ නටබුන්වලට අමතර ව මෑතකාලීනව ඉදිකළ ඉදිකිරීම් ද පවතී. මෙම නව ඉදිකිරීම් පුරාවස්තුවල ආරක්ෂාවට බලපෑමක් විය හැකි ය.

**යෝජනා**

පුරාවස්තුවල ආරක්ෂාව සඳහා හඳුනාගත් පුරාවිද්‍යා භූමියේ මායිම් කණු දැමීම.
නටබුන් පිහිටි භූමිය තුළ සිදුකරන නව ඉදිකිරීම් සඳහා නටබුන් රහිත කලාපය වෙන්කිරීම.
තිඹිරිය ආරාම භූමිය සජීවී විහාර භූමියක් බැවින් මාර්ග සංඥා පුවරුවක් හා නාම පුවරු දීමට යෝජනා කිරීම.

**හම්බෙගමුව විහාරය ගවේෂණය**

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හම්බෙගමුව ග්‍රාම නිලධාරී වසමේ හම්බෙගමුව ග්‍රාමයේ මෙම ස්ථානය පිහිටා ඇත.

මුලාශ්‍රගත තොරතුරුවල "මුතුමාල රජමහා විහාරය, සම්ඹේගමු පශ්චිමාරාමය'' ආදී විවිධ නම් වලින් මුලාශ්‍රවල හැඳින්වෙන්නේ ද මෙම හම්බෙගමුව විහාරස්ථානයයි. මුලාශ්‍රගත තොරතුරු වලට අනුව,

I. අනුරාධපුර සමයේ දපුළු රජු (දප්පුල රජු) විසින් සබේගමු නමින් විහාරයක් කරවූ බව පූජාවලියේ සඳහන් වේ.
II. පොළොන්නරු යුගයේ දී පාත්‍රාධාතුව රැගෙන අනුරාධපුරයේ සිට සුගලා දේවිය පලා යනවිට දී පරාක්‍රමබාහු රජුට සුගලා දේවිය මෙම ස්ථානයේ දී හමුවූ බවත් ඒ හමුවීම පසුබිම කරගනිමින් හම්බේගමුව යන ස්ථාන නාමය පටබැඳී ඇති බවත් ජන විශ්වාසයකි.

III. පරාක්‍රමබාහු රජුගේ සහ සුගලා දේවියගේ සුවිශේෂී හමුවීම සිහිගැන්වීමෙහිලා සුගලා දේවිය ගෙල පැලඳි මුතු මාලය තැම්පත් කර ස්තූපයක් ඉදිකළ බව ද ජන විශ්වාසයක් පවතී. ඒ අනුව විහාරයේ නම මුතුමාල රජමහා විහාරය ලෙසින් නම් කර ඇත.

සමස්ථයක් වශයෙන් මෙම විහාර භූමි දෙකේම සිදුවන අනවසර ක්‍රියාවන් ගත්විට අනවසර කැණීම්, විහාර භූමියේ විවිධ සංවර්ධන කටයුතු, අනවසර ඉදිකිරීම් හා පුරාවස්තුවලට හානිවන පරිදි සිදුකරන පෙරහැර මාවත ස්ථාපිත කිරීම, පුරාවිද්‍යා භූමිය මැදින් ඇති අවිධිමත් අනවසර මාර්ගය ආදිය හඳුනාගත හැකි ය.

**නිකේවෙහෙර භූමිය ගවේෂණය**

හම්බෙගමුව රජමහා විහාරයට බටහිර දෙසින් නිකේවෙහෙර නටබුන් ස්ථානය පිහිටා තිබේ. සීමා ප්‍රාකාර ගොඩනැගිලි නටබුන් අවශේෂ, ස්තූපයක් ආදිය මෙම ස්ථානය ආශ්‍රිතව දක්නට ලැබේ.

රතබලාගම මාර්ගයට සමාන්තරව දකුණු දෙසින් පිහිටි සීමා පවුර ගිනිකොණ සිට වයඹ දිශාවට විහිදේ. අනවසර කැණීම් මගින් ප්‍රාකාරයේ කොටස් විනාශ වී තිබේ. මෙය විහාරස්ථානයේ දකුණු සීමා ප්‍රාකාරය විය හැකි ය. එමෙන් ම ප්‍රාකාරයේ නටබුන්, අවස්ථා 6 ක දී පමණ ස්ථාන කිහිපයකින් හමු වේ. ටැම්පිට ගොනැගිල්ලකට අයත් නටබුන්, කණු පාදම් ගල් සහිත ස්ථානයක්, ස්ඵටික හුණුගලින් නිර්මිත බුද්ධ ප්‍රතිමා සහිත ස්ථානයක් (ප්‍රතිමා ගෘහයක් විය හැකි ය) නටබුන් ස්ථූප ගොඩැල්ලක් ආදිය මෙම ස්ථානය ආශ්‍රිතව දක්නට ලැබේ. අනවසර කැණීම් මගින් ස්තූප ගොඩැල්ල විනාශ වී ඇත. ගල් පුවරුවලින් සකස් කළ ප්‍රාකාරය ස්තූප මළුව වටා විහිදේ.

මැටි බඳුන් සාධක බහුල වශයෙන් හමුවන ස්ථාන දෙකක් ද ගවේෂණයට ලක්විය. කාලරක්ත මැටි බඳුන්, මොස්තර කැටයම් සහිත මැටි බඳුන්, බරණි, පාත්තර වැනි විවිධ භාවිතයන් සහිත මැටි බඳුන් මෙම ස්ථානයෙන් හමු වේ. මෙම ස්ථානයට උතුරු දෙසින් පිහිටි භූමියෙහි ද මැටි බඳුන් කැබලි, යබොර ඇමතේස්ත පාෂාණ කැබලි, තිරුවානා පාෂාණ සහිත ස්ථානයක් දක්නට ලැබේ.

හම්බෙගමුව ස්ථානයේ නටබුන් ගොඩනැගිලි සාධක සහිත ස්ථාන 03 ක් ප්‍රතිමා ගෘහයක්, නටබුන් ස්තූපයක්, ප්‍රාකාර බැම්මක අවශේෂත් දක්නට ලැබේ. එයින් එක් නටබුන් ගොඩනැගිල්ලක් මෙම විහාරස්ථානයේ ප්‍රවේශ මණ්ඩපය ලෙසින් භාවිත වූ ගොඩනැගිල්ල විය හැකි බව හඳුනා ගැනුණි.

නව ධර්ම ශාලාවට බටහිර දෙසින් ප්‍රතිමා ගෘහයක නටබුන් දක්නට ලැබේ. ගෘහය මධ්‍යයේ බුද්ධ ප්‍රතිමාවකට අයත් කැබලි තැන්පත් ව ඇත. හුණුගලින් නිර්මිත මෙම කවන්ධ බුද්ධ ප්‍රතිමාවට ආසන්නව එවැනි ම ප්‍රතිමාවක අවශේෂ දක්නට ලැබේ. උතුරු දෙසට පිහිටුවා ඇති මෙම ගොඩනැගිල්ලට අයත් ගඩොල්, උළුකැට අවට විසිරී තිබේ.

නටබුන් ස්තූප ගොඩැල්ල උස මීටර් 5 ක් පමණ උසැතිව කොටසක් ශේෂව ඇති අතර ස්තූපයේ ප්‍රවේශ දොරටුවට අයත් පිටගැටපෙළ, සඳකඩපහන් වැනි සාධක ශේෂව තිබේ. ස්තූප මළුවේ නිරිත දෙසින් ගල් පුවරු කිහිපයක් සහ ආසන ගලක අවශේෂ දක්නට ලැබේ.

ස්තූපයට නිරිත දෙසින් මීටර් 2 ක් පමණ දකුණු දෙසින් ප්‍රාකාර බැම්මක අවශේෂ දක්නට ලැබේ. ගඩොලින් කළ මෙම ප්‍රාකාර බැම්ම මීටර් 11 ක් පමණ දිගට විහිදේ. විහාර භූමියෙන් පිටත රෝහල් භූමිය සහ තැපැල් කාර්යාලය අසලින් ද නටබුන් දක්නට ලැබේ.

එමෙන් ම පන්සල් භූමියේ සතර දෙසින් පිහිටි නිකේවෙහෙර, වලහාගොඩ, බිංපොකුණ කන්ද අරඹේකෙම වැනි පැරණි නටබුන් සහිත ස්ථාන දක්නට ලැබේ.

## බස්නාහිර පළාත

**මාලදෙණිය ශෛලකාන්තාරාම පුරාණ විහාරය ගවේෂණය**

2010 වර්ෂයේ දී බස්නාහිර පළාත් පුරාවිද්‍යා කාර්යාලයේ ගවේෂණ අංශය විසින් බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 4 ඒ මාලදෙණිය ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක හඳුනාගෙන විධිමත් ලෙස ලේඛනගත කිරීම් සිදුකර ඇත.

උතුරින් දෙල්වල ග්‍රාම නිලධාරි වසමත්, නැගෙනහිරින් හේනගම ග්‍රාම නිලධාරි වසමත්, දකුණින් කහඳව ග්‍රාම නිලධාරි වසමත්, බටහිරින් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද මායිම්ව පිහිටා ඇත.

ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි මෙම ප්‍රදේශය නිවර්තන තෙත් කලාපයට අයත් වන අතර මෙම භූමිය මීටර් 100-150 අතර උස් බිම් හා පර්වත සහිත භූමියකි. ස්වභාවික ජල මූලාශ්‍ර හා මා ඔයේ අතු ගංගාවක් වන කුඩා ඔය ප්‍රධාන ජල මූලාශ්‍ර වේ.

මෙම මාලදෙණිය ග්‍රාම නිලධාරි වසම සහ අවට ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මහනුවර යුගය දක්වා අඛණ්ඩ ඉතිහාසයක් පැවති බවට සාධක පුරාවිද්‍යාත්මක තොරතුරුවලින් අනාවරණය වේ. වලගම්බා රජුගේ භාර්යාවගේ මාලය දෙනියේ අමතකව යෑමෙන් මාලදෙනිය යන්න ප්‍රචලිත වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

මෙම භූමියේ පිහිටි ලෙන් කිහිපයක ම ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මානවයාගේ වාසභූමි බවට සාධක හමුවේ. එම ලෙන්වල මධ්‍ය ශිලා යුගයට අයත් ඇඹරුම් ගල්, ශිලා මෙවලම්, රත් හිරියල් යනාදීය ලෙන් තැන්පතුවල මඳ වශයෙන් දක්නට ලැබේ.

ක්‍රි.පු. 3 වන සියවසේ සිට ක්‍රි.ව පළමු වන ශත වර්ෂය දක්වා අනුරාධපුර යුගයේ මුල්භාගයේ දී මෙම ප්‍රදේශය ආගමික හා ඓතිහාසික වශයෙන් වැදගත් වන අතර කටාරම් කොටන ලද ගල්ලෙන්, පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපිය හා අනුරාධපුර යුගයට අයත් පර්වත ලිපිය ද මෙයට සාක්ෂි දරයි. මෙය පර්වතය මස්තකයේ පසු කාලීනව ඉදිකළ ස්තූපයකි. මෙම ලෙන් පසුව ලෙන් විහාරයක් ලෙස සංවර්ධනය වී ඇති අතර විහාරය තුළ එම යුගයට අයත් චිත්‍ර හා මූර්ති ද කුඩා ප්‍රමාණයේ මැටි ස්ථූපයක් ද දක්නට ලැබේ.

මෙහි දි සුවිශේෂි අවධානයට යොමු වු ශෛලකාන්තාරාම විහාරස්ථානය තුළ ඉහළ මළුවේ හා පහළ මළුවේ පුරා ස්මාරක රාශියක් දක්නට ලැබේ. ඒවා නම් පැරණි ප්‍රවේශ මාර්ගය, ස්වාභාවික ගුහාවරණය, පැරණි ගල්ලෙන් 04ක්, ලෙන් විහාරය, පැරණි ප්‍රවේශ මාර්ගය, පැරණි ස්ථූප ගොඩනැගිල්ල, ස්වාභාවික ගල් කෙමිය, පැරණි ඉදිකිරිම් අවශේෂ, ගිරි ලිපිය යනාදියයි.

මෙම ගිරි ලිපියේ පේළි දෙකකට කොටන ලද බ්‍රාහ්මී අක්ෂර දක්නට ලැබෙන අතර එය ඛාදනයට ලක්ව ඇති බව දක්නට ලැබේ. පිටත අක්ෂර පේළියක දිග සෙන්ටිමීටර් 35කි. මෙහි අක්ෂර අනුව මෙය අනුරාධපුර පසුකාලයට අයත් වන ලිපියකි.

මාලදෙණිය පුරාණ පත්තිනි දේවාලය, මිරිගම ගිරිඋල්ල මාර්ගයේ පැරණි නිවස, පානදුරාවත්ත ශ්‍රි සුදර්ශනාරාම පුරාණ ගල්ලෙන් විහාරය, දෙනිය ලඟ ළිඳ, ස්වාභාවික ගුහාවරණය ආදි ස්ථාන කිහිපයක් ද මේ යටතේ ගවේෂණය කර තොරතුරු වාර්තාගත කර ඇත.

## වයඹ පළාත

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව සිදු කරනු ලබන ගවේෂණ වැඩපිළිවෙළ යටතේ 2010 වර්ෂයේ පනිරෙන්ඩාව යබොර සහිත භූමි ප්‍රදේශය ගවේෂණයට ලක් කරන ලදි.

ඒ අනුව ගවේෂණයේ මූලික අවධානය පුත්තලම දිස්ත්‍රික්කයේ පනිරෙන්ඩාව රක්ෂිතයේ ඇති යබොර සහිත භූමිය වෙත යොමු විය. ඉන් අනතුරුව මෙහි ව්‍යාප්තිය අනුව පුත්තලම දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 08 ක් හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 07 ක තොරතුරු වාර්තා ගත කරන ලදි.

එමෙන් ම මෙම ප්‍රදේශය ආශ්‍රිත ව යකඩ කර්මාන්තය හා සම්බන්ධ වූවන් පිළිබඳ මානව වංශ අධ්‍යයනයක් ද සිදු කරන ලදි. වර්තමානයේ මෙම කර්මාන්තය හා සම්බන්ධ වූවන්ගේ සංස්කෘතික, සාමාජීය හා ආර්ථික පසුබිම අධ්‍යයනය විය. මේ තුළින් මෙම කර්මාන්තය හා සම්බන්ධ පරම්පරා ඇසුරින් අතීතයේ මෙම කර්මාන්තවල නියලුණු අයගේ ජීවන චර්යාවන් පිළිබඳ උපකල්පනයකට එළඹිණ.

පනිරෙන්ඩාව සහ ඒ ආශ්‍රිත අධ්‍යයන කලාපයට අයත් වූ ප්‍රදේශයේ භූ සැකැස්ම ගත් විට තැනිතලා බිමක් වන අතර තැන තැන පැන නගින හුදෙකලා සහ කුඩා කඳුවැටි දක්නට ලැබේ.

සමස්තයක් ලෙස ගත් විට මෙම ප්‍රදේශය රතු සහ පොඩ්සෝල් පස සහ දියළු පස් සැකැස්මකින් යුතු වේ. පනිරෙන්ඩාවට නුදුරු රත්මල්අගාර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි "කොටකන්ද" ලැටරයිට් පාෂාණ සංයුතියකින් සමන්විත වේ. මෙය කබොක් හා බොරළුවලින් නිර්මාණය වී ඇත. විශේෂයෙන් ම මෙම ප්‍රදේශයේ බොහෝ ස්ථානවලින් යපස් සහිත කබොක් ගල් තැන් තැන්වල විසිරී තිබෙනු දක්නට ලැබේ.

එමෙන් ම ගවේෂිත භූමියට අයත් පනිරෙන්ඩාව, වීරකොඩියාන, මහගම ආශ්‍රිත ප්‍රදේශයන්හි යපස් වර්ගවල බහුල ව්‍යාප්තියක් පවතී. සිදු කර ඇති පූර්ව පර්යේෂණවලට අනුව මෙම ප්‍රදේශ තුළ මැග්නටයිට්, හෙමටයිට්, ලිමොනයිට් යන යපස් වර්ග පවතින බව තහවුරු වී ඇත.

ප්‍රදේශයේ හමුවන ප්‍රධාන වනාන්තරය වන්නේ පනිරෙන්ඩාව වනාන්තරයයි. ද්වීතික වනාන්තරයක් වන මෙහි අක්කර 300 ක පමණ ප්‍රදේශයක තේක්ක වගා කර තිබේ. ප්‍රදේශයේ ජල අවශ්‍යතා සපුරා ගැනීමට විශාල වැවක් වන කරවිටාගාර වැව ඇතුළු කුඩා ගම් වැව් පද්ධතිය මෙන් ම ක්ෂේත්‍රයට ආසන්නව උතුරු දෙසින් ගලා යන දැදුරු ඔය ද මනා පිටිවහලක් වේ.

පනිරෙන්ඩාව හා අවට ප්‍රදේශයේ ඓතිහාසික තොරතුරු විමර්ශනය කිරීමේ දී පුරාවිද්‍යාත්මක ඓතිහාසික හා ජනශ්‍රැති සාධක වැදගත් වේ. මෙම ප්‍රදේශය සම්බන්ධයෙන් මෙතෙක් අනාවරණය වී ඇති තොරතුරුවලට අනුව පැරණිතම සාධක හමු වන්නේ කුඩා බිංගිරිය ග්‍රාම නිලධාරි වසමට අයත් කොටකන්ද ප්‍රදේශයෙනි. එහි දී කාල රක්ත වර්ණ මැටි බඳුන් සහ රතු මැටි බඳුන් කැබලි විශාල වශයෙන් හමු වේ. කාල රක්ත වර්ණ මැටි බඳුන්වල කාල නිර්ණය සම්බන්ධයෙන් පුරාවිද්‍යාඥයින්ගේ අදහස වන්නේ ක්‍රි.පූ. යුගයේ සිට ක්‍රි.ව. 2 වන සියවස දක්වා පැවති බවයි. ඒ අනුව මෙම ස්ථානයේ ස්ථානගත වූ ජනාවාස ද එම කාල පරාසය තුළට ඇතුළත් කළ හැකි ය.

ක්ෂේත්‍රයට අයත් ආරියකර විහාර භූමියේ හමු වන උදුන් පැවැති ස්ථාන ආශ්‍රිතව අනුරාධපුර යුගයට දින නිර්ණය කළ හැකි සාධක හමු වේ. එමෙන් ම මහනුවර යුගයේ විමලධර්මසූරිය රජු ශ්‍රී ලංකාව පුරා අඩපණව පැවැති යකඩ නිෂ්පාදිත ස්ථාන 178 ක් පමණ යළි ස්ථාපනය කරවූ බව මන්දාරම්පුර පුවත නම් හටන් කාව්‍ය ග්‍රන්ථයේ සඳහන් වේ. එහි සඳහන් සත්කෝරළ ප්‍රදේශයට පනිරෙන්ඩාව හා අවට කලාපය අයත්වන බව කඩඉම් ග්‍රන්ථවල සඳහන් වේ. ඒ අනුව ක්‍රි.පූ. යුගයේ සිට පොළොන්නරු සහ මහනුවර යුගයන් ඔස්සේ මෙම කලාපයේ ඓතිහාසික සම්බන්ධතාවය බැඳී පවතී.

**ගවේෂණයෙන් අනාවරණය වන තොරතුරු**

ගවේෂණයේ දී පනිරෙන්ඩාව රක්ෂිතය මුල්කරගනිමින් ඒ අවට ප්‍රදේශවල යබොර වැටිවල ව්‍යාප්තිය පිළිබඳ ව මූලිකව සොයාබැලීමක් සිදුකරන ලදි. එහි දී මහගම වීරකොඩියාන, කුඩා බිංගිරිය, රත්මල් අගාර, කරවිටාගාර, ගලිසාපිටිය, මුගුණුවටවන, කෝන්ගස්යාය, පනිරෙන්ඩාව, නාන්කඩවර, දඹකැලේ යාය යන ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රිතව යකඩ නිෂ්පාදන ස්ථාන පිළිබිඹු

කරන යබොර වැටි හමුවිය. මෙම යබොර වැටි තුළ යබොර, අඟුරු මෙන් ම මැටි නළ කැබලි අන්තර්ගත ය. සාමාන්‍යයෙන් යබොර වැටියක් විශ්කම්භයෙන් මීටර් 10 - 15 ක් වන අතර කවාකාර වැටියේ එක් පසෙක උඳුන කරා පිවිසුමට මාර්ගයක් වේ.

ඒ අනුව යකඩ නිෂ්පාදනය සිදුවූ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 20ක් පමණ වන බවට තොරතුරු අනාවරණය විය. මෙහි දී බහුලව යබොර වැටිවල ව්‍යාප්තියක් හඳුනාගත හැක්කේ කෝන්ගස්යාය ග්‍රාම නිලධාරී වසමට අයත් කලාපයෙන් ය. එමෙන් ම ඉහතින් සඳහන් කළ අනෙකුත් ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රිතව හඳුනාගත හැකි වූයේ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් බොහෝ දුරට විනාශ වූ යබොර වැටි හා නළ කොටස් ය.

ගවේෂණයෙන් හඳුනාගත් කරුණුවලට අනුව මෙම ප්‍රදේශය ආශ්‍රිතව අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකිවීම, අමුද්‍රව්‍ය බහුලතාවය යන සාධක මත පදනම් වී යකඩ කර්මාන්තය මෙහි ස්ථාපිත වීමට හේතු වී ඇත.

මෙම ප්‍රදේශයේ පැවති යකඩ කර්මාන්තය වර්තමානය වනවිට අභාවයට ගොස් පවතී. යටත් විජිත ආක්‍රමණ මෙන් ම කුලක්‍රමය සම්බන්ධයෙන් පැවති සමාජමය ආකල්ප හේතුවෙන් පසුකාලීනව මෙම කාර්මාන්තයේ නියැලුණු පිරිස් ඉන් බැහැර වන්නට ඇත. නමුත් වැල්ලරාව, විලත්තව, මුගුණුවටවන වැනි ප්‍රදේශවල පාරම්පරික කර්මාන්තයේ ශේෂිතයන් තවමත් පවතින බව හඳුනාගත හැකි ය. යකඩ කර්මාන්තය වූ කලී හුදකලා කර්මාන්තයක් නොවේ. ඒ සඳහා කුඹල් කර්මාන්තය, හම් කර්මාන්තය වැනි වෘත්තිකයන්ගේ සහාය ද අවශ්‍යව පැවති බව යකඩ කර්මාන්තයේ ව්‍යුහය දෙස බැලීමේ දී පැහැදිලි විය. පණිරෙන්ඩාව ගවේෂිත කලාපය තුළ මැටි කළ කැබලි, අඟුරු කැබලි, යබොර කැබලි සහ වළං කැබලිති හමුවන ප්‍රධාන පුරාවිද්‍යාත්මක සාධක අතර වේ. මෙම ගවේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ යකඩ නිෂ්පාදනය කරන ලද භූමියේ ව්‍යාප්තිය හඳුනාගැනීමයි. ඒ අනුව පණිරෙන්ඩාව මූලික කරගත් ඒ අවට ග්‍රාම නිලධාරී වසම් 15ක් ආශ්‍රිතව (දළ වශයෙන් වර්ග කිලෝමීටර් 20ක පමණ භූමි ප්‍රමාණයකි) මෙහි ව්‍යාප්තිය හඳුනාගත හැකි ය.

## මධ්‍යම පළාත

මධ්‍යම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ල ආවරණය වන පරිදි ස්ථාන පරීක්ෂා කිරීම හා ක්ෂේත්‍ර කටයුතු වර්ෂය පුරා සිදු කරන ලදි. මධ්‍යම පළාත් කාර්යාලය වෙත යොමුවන ඉල්ලීම් අනුව ස්ථාන පරීක්ෂා කර එම ලිපිවලට පිළිතුරු සැපයීම හා එහි දී හමුවන පුරාවස්තු ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම මේ යටතේ සිදු විය. 2010 වසර සඳහා ගල් බිදුම් ස්ථාන 144 ක් ඇස්තමේන්තු ගත කර තිබූ අතර ගල් බිදුම් ස්ථාන අයදුම්පත් 160ක් මෙම කාර්යාලය වෙත යොමු වී තිබුණි. තව ද ස්ථාන පරීක්ෂා කිරීම් 96ක් ඇස්තමේන්තු ගත කර තිබූ අතර 2010 වසරේ ස්ථාන 134ක් පරීක්ෂා කර ඇත. මෙම ඇස්තමේන්තුව යටතේ මී මුරේ පැරණි ගම්මානය ආශ්‍රිතව මූලික ගවේෂණයක් සිදු කර ඇත.





මීමුරේ උඩ වලව්ව

# කැණීම් අංශය

## නැගෙනහිර පළාත

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### වෙල්ගම් වෙහෙර නටබුන් වැව අසල දාගැබ කැණීම


ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පිහිටි මෙම දාගැබේ ධාතු ගර්භය අනවසර කැණීම් හේතුවෙන් විනාශ කොට තිබූ අතර ඒ පිළිබඳ හානිය වාර්තා කිරීමටත් ස්තූපය සංරක්ෂණය කිරීමත් මෙම කැණීම් ව්‍යාපෘතියේ අරමුණ විය. කැණීම 2010-06-29 දින ආරම්භ කර 2010-07-19 දින අවසන් කරන ලදි.

දාගැබ් ගොඩැල්ල මීටර් 5 ක පමණ උසකින් යුක්ත වූ අතර විෂ්කම්භය මීටර් 25 ක් විය. මෙහි සිදු කර තිබූ අනවසර කැණීමෙන් ගොඩැල්ල මීටර් 2ක් පමණ ගැඹුරට හාරා අභ්‍යන්තරයේ තිබූ පුරාවස්තු ඉවතට ගෙන තිබී ඇති අතර පසුව පොලීසිය විසින් අදාළ පුරාවස්තු උසාවියට ඉදිරිපත් කර ඇත. එසේ සොයා ගත් පුරාවස්තු අතර ගල් කරඬුවක් තුළ තිබූ ලෝහ පාත්‍ර කොටස් සහ කුඩා රන් පතක් විය. "නක මහා රජහ පුත මලිතිස මහ රජහ චෙති" යනුවෙන් ලියා ඇත. එහි අර්ථය - නාග මහ රජතුමාගේ (මහල්ලක නාග) පුත්‍ර මළිතිස (කණිට්ඨ තිස්ස) මහ රජතුමාගේ චෛත්‍යය යන්නයි.

පොලීසිය භාරයට ගැණුන පුරාවස්තු අතර හුණුගලින් නිම කරන ලද කරඬුව සහ එහි ඇතුළත තිබූ මැටි කරඬුව රන් පැහැ පතුරුවලින් කරන ලද ස්තූප ආකෘතිය හා වෙනත් අවශේෂ, වීදුරු වළලු හතක්, මැටි පාත්‍ර දෙකක්, වීදුරුවලින් නිම කළ ඡත්‍රාවලියක කොටස් ද විය. කැණීමේ දී හමුවූ අනෙකුත් ද්‍රව්‍ය අතර කුඩා ලෝහ හා වීදුරු කැබලි විය. මෙහි දී දාගැබේ ඉදිකිරීම් අවධි පිළිබඳ අදහස් ගත නො හැකි විය. මෙම ස්ථානය ආශ්‍රිතව ක්‍රි.පූ. 3 - ක්‍රි.ව. 1 සියවස්වලට අයත් බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියූ සෙල්ලිපි හතරක් ඇත.



රන් පත




කැණීමෙන් හමු වු කුඩා වීදුරු භාජනයක කොටස්

## වයඹ පළාත

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**කුඹුක්කඩවල නිල්ගිරිය ස්තූපය කැණීම (II අදියර)**

නිල්ගිරිය ස්ථූපය පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුක්කඩවල ග්‍රාමයෙහි (උ $7^{\circ}$ 57. / නැ $80^{\circ}$ 22. 25,) පිහිටා ඇත. 2009 වසරේ ස්තූපයේ I අදියර කැණීම් නිම කළ අතර ගඩොල් ස්ථර ඉවත් කරන අවස්ථාවේ වෙනත් ගර්භයක සළකුණු මතුවීම හේතුවෙන් නැවත ඇතුළත පරීක්‍ෂා කරමින් කැණීම් සිදු කරන ලදි. ස්ථූපය ගිනිකොණ දෙසට වන්නට ධාතු ගර්භයක් තිබු අතර එහි දිග හා පළල පිළිවෙළින් සෙ.මී 90 x 50 විය. මෙම ගර්භ කොටස සෙ.මී 15 වන රළු ගල් ආවරණයකින් වසා තිබුන මුත් එම පුවරුව කැබලිවලට කැඩී ගොස් තිබිණි.

ස්තූප ගර්භය ඇතුළත හුණු වැලි බදාමවලින් කපරාරු කර තිබුණි. එම බදාම ද දිරාපත්ව තිබුණි. ගර්භය ඇතුළත හතර පැත්තේ වූ බිත්ති ද ඇතුළට කඩා හැලී තිබුණ අතර එම සුන්බුන් යට යකඩ ලෝහයෙන් නිම කළ පාත්‍ර හා මැටි භාජන, වීදුරු වළලු, ජ්‍යාමිතික හැඩතල සහිත වීදුරුමය වස්තු ද ධාතු තැන්පත් කරන්නට ඇතැයි අනුමාන කළ හැකි වීදුරුවෙන් කළ ධාතු කරඬු ද සහ තිරුවානා ගල් පතුරු ද හමුවිය.






ස්ථූප ගොඩැල්ල කැණීමේ අතරතුර අවස්ථාවක් සහ කැණීමෙන් පසු




ස්ථූප ගර්භයේ මධ්‍ය හරහා කැණීම් සිදු කර ඇති ආකාරය



මතු කරගත් යූපගල



ස්ථානීය සැලැස්ම සිතියම




ධාතු ගර්භය ඇතුළත සැලැසුමක්

## දකුණ පළාත

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

**තිස්සමහාරාම සර්වෝදය වත්ත**

තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සඳගිරි පුර 10 ග්‍රාම නිලධාරී වසමට අයත් සර්වෝදය වත්ත නම් ස්ථානයේ වූ කැණීම් පරිශ්‍රය.

මෙම කැණීම් ව්‍යාපෘතිය 1992 වසරේ සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් ජර්මනියේ කාවා ආයතනයත් එක්ව වාර්ෂිකව සිදු කරයි. 1992 වසරේ දී තිස්සමහාරාමය වැව ආසන්නයේ වූ ගොඩැල්ලත් 1999 දී තිස්සමහාරාම අෂ්ඨාශ්‍රාකාර සෙල්ලිපිය ඇති ස්ථානයත්, තිස්සමහාරාම III අදියර උසාවිය වත්ත කැණීම් 1995 සිට 1996 දක්වාත්, (*Ancient Ruhuna* 1) සර්වෝදය වත්ත කැණීම් කිරීම 1998 - 2008 දක්වා කාලය තුළ ක්‍රියාත්මක විය. මෙයට අමතර ව අම්බලන්තොට ගොඩවාය පැරණි වරාය ආශ්‍රිත කැණීම් ද වරින් වර සිදු විය. ගොඩවාය කැණීම් ව්‍යාපෘතියට අදාළ වාර්තා *Ancient Ruhuna* II අදියරේ දී ප්‍රකාශයට පත් කෙරේ.

# උතුරු මැද පළාත

## අනුරාධපුර දිස්ත්‍රික්කය

### පුරාණ දෙමටමල් විහාරය

නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අඩම්පනෙ 340 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙමටමල් විහාරයේ විහාරාධිපති හිමියන්ගේ ඉල්ලීම පරිදි ස්තූපය නැවත කැණීම් කර සංරක්‍ෂණය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. 2010 අගොස්තු 30 දින සිට 2010 සැප්තැම්බර් 20 වන දින දක්වා කාලය තුළ දී සිදු කළහ.

ගල් තලාව මත ගොඩැල්ලක් වශයෙන් ශේෂව තිබූ ස්තූපය පාදා ගැනීම සඳහා කාර්තු ක්‍රමය යොදා ගන්නා ලදි. මෙම ස්තූපය ගල් තලාව මත මීටර් 8 සෙ.මී 40 ක් හා මීටර් 8 සෙ.මී 15 ක් දිග පළල (8.40×8.15) ඇති වේදිකාවක් මත ඉදිකර ඇත. ස්තූපය ඉදිකිරීම සඳහා යොදාගත් ගඩොල් සෙ.මී 22 × සෙ.මී 42 ප්‍රමාණයන් ය. මෙම ස්තූපය බුබ්බුලාකාර හැඩයෙන් යුක්ත වන්නට ඇති බව අනුමාන කළ හැකි අතර පාදා ගැනීමෙන් පසු ගල් වරි 25ක් උසක් දක්වා මට්ටමකට ස්තූපය ශේෂ වී ඇත. ස්තූපය ඉදිකිරීමේ දී පේසා වළලු යොදා නැත. එහෙත් ස්තූපයට මෝල්ඩින් ගල් වරියක් පමණක් යොදාගනිමින් ගර්භය නිමවා ඇත. ස්තූපයට උතුරු දෙසින් වූ බිම් ප්‍රදේශයේ යූප ගලට අයත් කොටස් විසිරී තිබේ.



කැණීමට පෙර දාගැබ

# බස්නාහිර පළාත


## කොළඹ දිස්ත්‍රික්කය

### කෝට්ටේ කොටු බැම්ම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇතුල් කෝට්ටේ 521 ග්‍රාම නිළධාරී වසම 31/14 පළමු පටුමගෙහි පිහිටි කේ.පී. සිල්වා මහතා පදිංචි නිවසට ප්‍රවේශ වන මාර්ගය අසල පිහිටි පැරණි කොටු බැම්මට අයත් කොටස 2010 වර්ෂයේ කැණීම් කරන ලදි. මෙම බැම්ම ආරක්ෂිත ස්මාරකයක් වශයෙන් ගැසට් කර ඇති අතර කොටු බැම්මට ඇතුලු පසින් අඩි 5ක් සහ පිට පැත්තෙන් අඩි 10ක් වෙන් කළ යුතු වුවත් නිවැසියන් එම නියමයන්ට අනුව කටයුතු නොකර ඇති හෙයින් ඒ පිළිබඳ සොයා බැලීම සඳහා මෙම කැණීම සිදු කරන ලදි.

පැරණි කොටු බැම්ම අයත් කොටස මීටර 21.70 ද විය. දැනට දක්නට ලැබෙන බැම්මෙහි උපරිම උස මීටර 2.30 හා උපරිම පළල මීටර 2.20ක් ද අවම පළල සෙ.මී. 30 ක් ද වේ.

කැණීම් පරිශ්‍රයේ දිග මීටර 1.80 × සෙ.මී. 80 විය. කැණීමේ දී විවිධ ප්‍රමාණයේ කබොක් ගල් හමු විය. ඒවා සෙ.මී. 45×40×14 ප්‍රමාණයේ යුතු විය. බැම්ම පාදා ගැනීමෙන් අනතුරුව සංරක්ෂණය සඳහා යොමු කරන ලදි.




කෝට්ටේ පැරණි නගරය දක්වන සැලැස්මක්

(මුලාශ්‍රය: ශ්‍රී ලංකාවේ නව අගනුවර ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ).

# වාස්තුවිද්‍යා සංරක්ෂණ අංශය

## බස්නාහිර පළාත

### කොළඹ දිස්ත්‍රික්කය

#### ලෙනවර රජමහා විහාරයේ ආවාසගෙය සංරක්ෂණය

කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම ඉපැරණි විහාරස්ථානය ස්ථානගතව ඇත. සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේ මෙම පැරණි ආවාසයේ මුල් ඉදිකිරීම් ලක්ෂණ නැවත තහවුරු කිරීමේ අරමුණ මුල් කොට ගෙන ය.

සංරක්ෂණ කටයුතු ආරම්භයේ දී ප්‍රථමයෙන් ගොඩනැගිල්ලේ පැරණි බොල් වූ කපරාරු කොටස් ඉවත් කරන ලදී. එහි දි හඳුනාගත් පිපිරුම් සඳහා වානේ පට්ටම් බිත්තියට ඇතුල්කර බදාම යොදා බිත්ති ශක්තිමත් කළ අතර මැද පිහිටි ආරුක්කුව ද පැරණි ආකාරයෙන් සංරක්ෂණය කිරීමට ක්‍රියාකරන ලදී. පිටුපස පැරණි බිත්ති කොටස සක්ක ගල් ආධාරයෙන් තනා සංරක්ෂණය කළ අතර දිරා යාමට ලක්වූ දැව කණු වෙනුවට කබොක් කණු යොදා බිත්ති සංරක්ෂණ කටයුතු නිමාකරන ලදුව වට කයිරු සංරක්ෂණයට ද පියවර ගන්නා ලදී.

ගෙබිම සංරක්ෂණය කිරීමේ කාර්යයේ දී ගෙබිම කොන්ක්‍රීට් කර මැටි බිම් ගල් ඇල්ලීමට පියවර ගන්නා ලදී. මැද හා පිටුපස ගෙබිම කොටස් ද ගොම මැටි මිශ්‍රණයෙන් නැවත සකස් කරන ලදුව පිටුපස ඇති කාමර කොටසෙහි ගෙබිම ද සිමෙන්ති යොදා ගෙබිම සංරක්ෂණ කටයුතු නිම කරන ලදී. විහාර වහලය සංරක්ෂණය කිරීමේ දී වහලය සඳහා අමතර රීප්ප පේලියක් යොදා පැරණි කොකු උළු සෙවිලි කර අළුත් පලය සඳහා සිංහල කොකු උළු සෙවිලි කරන ලදී. පැරණි මුදුන් උළු භාවිතයෙන් කුමේර බැඳීම කළ අතර අළුත් උළු කැට 20ක් යොදා කුඩා පලය සඳහා ද කුමේර බැඳීමෙන් අනතුරුව ඉදිරි පලය සඳහා වඩිම්බු හා පීලි යොදා වහලයේ වැඩ නිම කරන ලදී. මීට සමගාමීව නව දැව විශේෂයක් භාවිතයෙන් සොල්දර තට්ටුව ද සංරක්ෂණය කළ අතර එයට පිවිසීම සඳහා දැව තරප්පුවක් ද ඉදි කරන ලදී. මෙම සංරක්ෂණ කාර්යයේ දී විහාරයේ ඉදිරි ගල් පඩිපෙළ ද සංරක්ෂණයට යොමු කළ අතර ඉදිරි සඳකඩ පහණ ද නියමිත පරිදි නැවත ස්ථානගත කරන ලදී.

### කළුතර දිස්ත්‍රික්කය

#### උග්ගල්බඩ මල්අස්නේ විහාරයේ ධර්ම ශාලාව සංරක්ෂණය

මෙම විහාරස්ථානය කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත. 2010 වසරේ සැප්තැම්බර් මස 28 වන දින සිට ක්‍රියාත්මක වූ මෙම සංරක්ෂණ ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ උග්ගල්බඩ මල්අස්නේ පිහිටි ධර්ම ශාලාව සංරක්ෂණය කිරීමයි.

ධර්මශාලා වහලයේ සංරක්ෂණ කටයුතු සිදු කිරීමේ දි පැරණි උළු හා කෘමි උවදුරට ලක්ව තිබූ දැව රාමුව සම්පූර්ණයෙන් ගලවා ඉවත් කරන ලදී. අනතුරුව පරාල හා රීප්ප භාවිතයෙන් වහලයේ රාමුව නැවත සැකසූ අතර කැඩී බිඳී ගිය පැරණි සිංහල උළු ඉවත්කර නව රට උළු සෙවිලි කර කුමේර බැඳීම ද සිදු කරන ලදී. පැරණි ආකාරයට වහලයේ සවි කර තිබූ අලංකාර

කැටයම හා වඩිම්බුවේ ප්‍රයෝජනයට ගත හැකි කොටස් එලෙසම යොදා කොස් ලෑලි භාවිතයෙන් නැවත සාදා පැරණි ආකාරයට ම වහලයට සවි කිරීමෙන් පසු වහල සංරක්ෂණ කටයුතු නිම කරන ලදී.



වහලයේ සංරක්ෂණ කටයුතු සිදුකරමින් සංරක්ෂණය කරන ලද වහලයේ දර්ශනයක්

පෙර පැවති ආකාරයට පැරණි ජනේල යෙදූ අතර, ඉදිරිපස ජනේල දෙක කොස් දැවයෙන් නැවත සාදා පැරණි ආකාරයට ම දැව රාමුවෙන් වැසෙන සේ තනන ලදී. කබොක් කණුවල කණු හිස් ගැලවී කැඩී ගිය ස්ථාන සැකසූ අතර, බිත්ති හා කණුවල කපරාරුව බොල්වී ගිය කොටස් ඉවත් කර කපරාරුව නැවත යොදා සුදු හුණු ආලේප කරන ලදී. අස්ථානගතව තිබූ ගේට්ටු පියන් දෙකෙහි පැරණි කණු ද උපයෝගී කර ගෙන නව කණු හා පියන් භාවිතයෙන් නැවත සවි කළ අතර පොළොවේ බොල්ව ඉරිතලා ගිය කොටස් සකසා ගැළවීගිය කයිරුව හා පඩිය සංරක්ෂණය කිරීමට ද පියවර ගන්නා ලදී.

### වාද්දුව මහීගර්ජනාරාමය පිළිමගෙය හා දේවාලය සංරක්ෂණය

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පෝහද්දරමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම තුළ මෙම ඉපැරණි විහාරස්ථානය ස්ථානගත වී ඇත. 2010 වසරේ ක්‍රියාත්මක වූ මෙම සංරක්ෂණ ව්‍යාපෘතියේ අරමුණ වූයේ විහාරස්ථානයේ පිහිටි පැරණි පිළිමගෙය සහ සූනියම් දේවාලය යන අංග අළුත්වැඩියා කිරීම සහ නව දේවාල මණ්ඩපයක් ඉදි කිරීමයි.

පෞරාණික ස්වරූපය ආරක්ෂා වන අයුරින් දේවාලයෙහි සංරක්ෂණය කටයුතු සිදු කිරීමේ දි, ප්‍රථමයෙන් දේවාලයෙහි ඉහලින් යොදා තිබූ කොන්ක්‍රීට් වහලය මත ගඩොල් බැම්මක් බැඳ සැලැස්මේ පරිදි වහලය තැනීමට කටයුතු කරන ලදී. පල හතරට නිර්මාණය කළ වහලයේ නව මාළිගා උළු සෙවිලි කර කුමේර බැඳීමෙන් අනතුරුව කොත පළදවා වහලයේ සංරක්ෂණ කටයුතු නිම කරන ලදී.

ගඩොල් භාවිතයෙන් දේවාලය වටා වූ වේදිකාව සකසා, බිත්තියෙහි වූ වේ හුඹස් කඩා ඉවත් කර, කෘමිනාශක යොදා නැවත බිත්ති කපරාරු කර සුදු හුණු ආලේප කිරීමට පියවර ගත් අතර නියමිත සැලසුම්වලට අනුව දේවාලයට ඉදිරියෙන් නව මණ්ඩපයක් ඉදි කිරීමට ක්‍රියා කරන ලදී. පිළිමගෙය තුළ සංරක්ෂණ කටයුතු සිදු කිරීමේ දි ප්‍රමුඛ අවධානය යොමු කරනු ලැබුවේ දිරාපත් වූ හා ඇතැම් කොටස් අස්ථානගතව තිබූ පැරණි සිතුවම් සහිත සිවිලිම ප්‍රතිසංස්කරණය කිරීමේ

කටයුතු සඳහා ය. මෙහි දී කොස් ලෑලි භාවිතයෙන් සිවිලිම නැවත ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලදී.

## දකුණු පළාත


### හම්බන්තොට දිස්ත්‍රික්කය

**සිතුල්පව්ව චෛත්‍යය මළුව හා ප්‍රාකාර බැම්ම විශාල කිරීම සඳහා පලංචි යෙදීම.**

මෙම ඉපැරණි ඓතිහාසික විහාර භූමිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රණකෙළිය ග්‍රාමයේ පිහිටා ඇත. 2010 වසරේ මාර්තු මස 27,28,29 යන තෙදින පුරා ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද්දේ ස්තූප මළුව විශාල කිරීම සඳහා කොන්ක්‍රීට් යෙදීමට අවශ්‍ය ආධාරක ජී.අයි. බට ආධාරයෙන් සකස් කිරීමයි.

**අම්බලන්තොට රජ මහා විහාරයේ විහාරගෙයි වහල සංරක්ෂණය**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉපැරණි විහාරස්ථානයකි. මෙහි වූ පැරණි බුද්ධ ප්‍රතිමා ගෘහයෙහි දිරාගිය වහල සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ විය. මේ අනුව 2010 ජූනි මස 23 වැනි දින ආරම්භ කළ සංරක්ෂණ කටයුතු එම වසරේ අගෝස්තු 13 දින දක්වා කාල සීමාව තුළ ක්‍රියාත්මක කරන ලදී. විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් සපයාදෙන ලද ද්‍රව්‍ය භාවිතයෙන් සංරක්ෂණ කටයුතු සිදුකළ අතර, එහි දී විශේෂයෙන් පහත මාලයේ සෙවිලිකොට තිබූ පැරණි පෙති උළු සම්පූර්ණයෙන් ඉවත් කොට නව රට උළු විශේෂයක් සෙවිලිකරන ලදී. ඊට අමතර ව ඉහල මාලයේ වහලයේ පැවති අක්‍රමවත් බව ඉවත්කොට පෙති උළු ක්‍රමානුකූල රටාවකට අතුරා කුමේර බැඳීමට ක්‍රියා මාර්ග ගන්නා ලදී.



සංරක්ෂණය කරන ලද විහාරයේ දර්ශන කිහිපයක්

## මාතර දිස්ත්‍රික්කය

### වලස්ගල ජයවර්ධන මුදලින්දාරාම විහාරයේ ආවාසගෙයි වහළ සංරක්ෂණය

මෙම විහාරස්ථානය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වලස්ගල ග්‍රාමයේ පිහිටා ඇත. යථෝක්ත සංරක්ෂණ ව්‍යාපෘතිය 2010 වසරේ ජූලි මස 01 වැනි දින ආරම්භ කරන ලදුව එම වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින දක්වා ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව සංරක්ෂණ කටයුතු වශයෙන් දිරාගිය සියලු රීප්ප ඉවත් කොට 1''x 2'' ප්‍රමාණයේ රීප්ප යෙදීමට කටයුතු කළ අතර දිරායාමට ලක්වූ පරාල 20 ද ඉවත් කොට අළුතින් යෙදීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඊට සමගාමීව සිංහල උළු සියල්ල ඉවත් කොට ඒ වෙනුවට අළුතින් සිංහල උළු සෙවිලි කළ අතර, ඉදිරිපස ආලින්දය කොටසේ පරාලවල හා රීප්පවල සුදු තීන්ත ආලේප කිරීමට ද ක්‍රියා කරන ලදී.

## ඌව පළාත

### මොණරාගල දිස්ත්‍රික්කය

### නාගල රජමහා විහාරයේ ධර්ම ශාලාව සංරක්ෂණය

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම ඉපැරණි විහාරස්ථානය පිහිටා ඇත. 2010 වසරේ මැයි මස 01 දින සිට මැයි 31 දින දක්වා මෙම සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක විය.

ධර්ම ශාලාවේ පරාල, බාල්ක, බිත්ති යට ලී ඇතුළු දැව සියල්ල පවිත්‍ර කිරීමෙන් අනතුරුව වහලයට අළුතින් 2'' x 1'' රීප්ප යොදන ලදී. වහලය සඳහා අළුත් සිංහල කොකු උළු සෙවිලි කළ අතර, 1:1:4 මිශ්‍රණයෙන් වහලයේ කුමේර බැඳීමද සිදුකරන ලදී. අනතුරුව ධර්ම ශාලාවේ පොළොව සිමෙන්ති කපරාරු කර සුදු මැදීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලදී.

### විලැතිගොඩ ආවාසය සංරක්ෂණය

ඓතිහාසික වටිනාකම්වලින් සමන්විත මෙම පුරාවිද්‍යා ස්ථානය මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථානගත වී ඇත. විලැතිගොඩ ආවාසය සංරක්ෂණය කිරීමේ අරමුණින් දියත් කරන ලද මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය 2010 වසරේ මැයි මස 01 වන දින සිට එම වසරේ දෙසැම්බර් 01 වැනි දින දක්වා ක්‍රියාත්මක විය.

සංරක්ෂණ කටයුතු ආරම්භයේ දී ගොඩනැගිල්ලේ ආරක්ෂාව උදෙසා පුරගෙයක් ඉදි කරන ලදී. වහලයේ උළු, රීප්ප, පරාල ඉවත් කළ අතර අළුතින් ලබාගත් සිංහල කොකු උළු හා දැව භාවිතයෙන් ආවාසයේ වහලය සංරක්ෂණය කරන ලදී. බිත්ති යට ලී කොටස් සංරක්ෂණය කිරීමට ද පියවර ගන්නා ලදී. පොළවේ බොල් වූ ස්ථාන සඳහා සිමෙන්ති යෙදීම, ඇතුළත හා පිටත බිත්තීන්හි පළුදු වූ කොටස් පිළිසකර කිරීම, පොකුණ ඇතුළත වට බැම්ම සංරක්ෂණය කිරීම යන සංරක්ෂණ කාර්යන් ද නිම කරන ලදී.

**යටියල්ලාතොට පධානසරය සංරක්‍ෂණය**

මෙම පධානසරය මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථානගත ව ඇත. මෙම සංරක්‍ෂණ ව්‍යාපෘතිය 2010 වසරේ පෙබරවාරි මස 01 වන දින ආරම්භ වී එම වසරේ අප්‍රේල් මස 10 දින දක්වා ක්‍රියාත්මක විය.

සංරක්‍ෂණ කාර්යයේ දී ප්‍රථමයෙන් මතුපිට විසිරී ඇති හා ගොඩනැගිල්ලේ ඉතිරි ගල් අංක ගත කිරීම සිදු විය. අනතුරුව අංක කරන ලද ගොඩනැගිල්ලේ මතුපිට විසිරී ඇති ගල්, අත්තිවාරම් ගල් හා බැම් මත ඇති ගල් ගලවා ඉවත් කිරීම් කළ අතර නැවත නියමිත පරිදි අංක අනුව ස්ථානගත කිරීම කරන ලදී. ගොඩනැගිල්ලේ ගිලාබැස ඇති ස්ථාන 6" x 9" සක්කගල් යොදා 1:5 මිශ්‍රණයෙන් මට්ටම් කිරීම යන කාර්යයන් ද ඉටු කරමින් සංරක්‍ෂණ කටයුතු නිම කර ඇත.

**යුධගනාව දාගැබ සංරක්‍ෂණය**

මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම ඉපැරණි දාගැබ ස්ථානගත ව ඇත. 2010 වසරේ පෙබරවාරි මස 01 වන දින ඇරඹුණු මෙම සංරක්‍ෂණ ව්‍යාපෘතිය එම වසරේ ජූනි මස 30 දක්වා ක්‍රියාත්මක විය. දාගැබේ සංරක්‍ෂණය කරන ලද කොටසේ නැවත පිළිසකර කිරීම් උදෙසා මෙම සංරක්‍ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, එම කොටසෙහි වල් පැළෑටි වර්ධනය වීම හේතුවෙන් කුස්තුර විනාශයට ලක්ව තිබුණි. කුස්තුර මත වල් පැළෑටි වර්ධනය වීම වැළැක්වීම සඳහා වල් පැළෑටි ගලවා ඉවත් කර පොයින්ට් කිරිම කර ඇත.

**බදුල්ල දිස්ත්‍රික්කය**

**පෝටාව අම්බලමෙහි වහල සංරක්‍ෂණය**

බදුල්ල දිස්ත්‍රික්කයට අයත් රිදීමාලියද්ද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ පෝටාව අම්බලම ස්ථානගතව ඇත. 2010 වසරේ සැප්තැම්බර් මස 15 වන දින සිට එම වසරේ ඔක්තෝබර් මස 15 වන දින දක්වා දියත් කරන ලද මෙම සංරක්‍ෂණ ව්‍යාපෘතියේ අරමුණ වූයේ පෝටාව අම්බලමෙහි වහලයේ සංරක්‍ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමයි.

අනුමත ඇස්තමේන්තුවට අනුව පෝටාව අම්බලමෙහි වහල සංරක්‍ෂණය සඳහා අවශ්‍ය සිංහල කොකු උළු, දැව, සිමෙන්ති, වැලි, යකඩ ඇණ, හැරිස් බ්‍රෂ් ආදී ද්‍රව්‍ය ප්‍රසම්පාදන කමිටුව මගින් සපයා ගන්නා ලදී. සංරක්‍ෂණය සඳහා අවශ්‍ය වන්නා වූ ද්‍රව්‍ය සපයා ගත් නමුත් සංරක්‍ෂණ කාර්යය ඉටු කිරීමට සේවකයන් ලබා ගැනීම සඳහා අනුමැතිය නො ලැබුණු හෙයින් සංරක්‍ෂණ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට නො හැකි විය.

### වෙලේකඩේ පැරණි වෙළඳපොල ආරක්ෂක බැම්ම සංරක්ෂණය

පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන්නා වූ මෙම ස්ථානය බදුල්ල දිස්ත්‍රික්කය තුළ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ව පිහිටා ඇත. 2010 වසරේ ක්‍රියාත්මක කරන ලද සංරක්ෂණ ව්‍යාපෘතියේ විශේෂ අවධානය යොමු කරනු ලැබුවේ මෙම වෙලේකඩේ වෙළඳ සංකීර්ණයේ ආරක්ෂක බැම්ම සංරක්ෂණය කිරීමේ කටයුතු පිළිබඳව යි.

ප්‍රසම්පාදන ක්‍රමයට අනුව කොන්ත්‍රාත් පදනම යටතේ මෙහි සංරක්ෂණ කටයුතු සිදු කර ඇත. මෙහි අලංකාරය සඳහා යොදා ඇති සිමෙන්ති බෝල භාග සෑදීමට නො හැකි බව දන්වා ඇති අතර එය මෙම ඇස්තමේන්තුවට ඉදිරිපත් කර ඇති හෙයින් සිමෙන්ති බෝල සඳහා අච්චු සැකසීම සිමෙන්ති බෝල භාග සෑදීම යන කටයුතු ඉටු කර ඇත.

## වයඹ පළාත

### කුරුණෑගල දිස්ත්‍රික්කය

### නිල්ගිරි විහාර පුරාණ ස්තූප සංරක්ෂණය

මොරගොල්ලාගම - කුඹුක්කවල නිල්ගිරි විහාරයේ පුරාණ ස්තූප සංරක්ෂණය කිරීමේ අරමුණින් ස්තූපයේ අත්තිවාරම, ගඩොල් වේදිකාව, ස්තූප ගර්භය යන ශේෂිත අංග පිළිබඳ ව අවධානය යොමු කරමින් මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය

අත්තිවාරමේ සංරක්ෂණ කටයුතු ආරම්භයේ දී මතුපිට පැති හතර මිනුම් ගෙන නිවැරදි ලෙස තහවුරු කිරීමේ කටයුතු සිදු කරන ලද අතර ගිලා බැස්මක් සිදු නොවූ නිවැරදි ම ස්ථානය හඳුනාගෙන එයට අනුව සියලු ම පැති තහවුරු කිරීමට පියවර ගන්නා ලදී. ගඩොල් වේදිකාවේ උතුරු පැත්තේ සාධක පැරණි අයුරින් ම තහවුරු කර තැබූ අතර, සෙසු පැතිවල පැරණි ආකාරයට ගඩොල් ඇතිරීම හා කුස්තුර තැබීම ද කරන ලදි. ස්තූප ගර්භයේ ශේෂයන් තහවුරු කිරීමේ දී විශ්කම්භය 28’ වන පරිදි කවය සකස් කළ අතර නව ගඩොල් යොදා ගනිමින් ගර්භයේ ගඩොල් තහවුරු කිරිම සිදු කරන ලදි. උතුරු පැත්තේ මීටර් 01 ක පමණ පළල කොටසක් පැරණි අයුරින් තහවුරු කර තැබීමට ද පියවර ගත් අතර, ස්තූප ගර්භය 13’’ පමණ උස් වන පරිදි කවාකාරව නිර්මාණය කර සංරක්ෂණ කාර්යය නිමාවට පත් කරන ලදි.

### මහවැව ශ්‍රී නාගරාම විහාරයේ ටැම්පිට විහාරය සංරක්ෂණය

මෙම ඓතිහාසික ටැම්පිට විහාරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 521 ඉහල මහවැව ග්‍රාම නිළධාරී වසමෙහි පිහිටා ඇත. මෙම ටැම්පිට විහාරයේ මුල් ඉදිකිරීම් ලක්ෂණ නැවත තහවුරු කොට අනාගත පැවැත්ම යාවත්කාලින කිරීම උක්ත සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ විය.

සංරක්ෂණ කටයුතු ආරම්භයේ පුරගෙය ඉදිකර පැරණි පාදම් ලෙස පැවති ස්ථාන හඳුනාගන්නා ලදී. අනතුරුව මී, හොර ආදි දැව වර්ග භාවිතයෙන් නව දැව කුලුණු 09ක් පාදම් මත ස්ථාපනය කරන ලදී. මීට සමගාමීව ප්‍රතිමාගෘහයෙහි ගිලා බැසීම යථා තත්වයට පත් කළ අතර, පසු කාලයේ දී එක් කරන ලද ගඩොල් කුලුණු තුනක් හැර ඉතිරි සියල්ල ද ඉවත් කරන ලදී.

ප්‍රතිමාගෘහයේ හා ප්‍රදක්ෂිණාපථයේ දිරාගිය දැව කොටස් ඉවත්කොට යථා තත්වයට පත් කිරීමට කටයුතු කළ අතර ප්‍රතිමාලය සඳහා අඟල් 01 ක ඝණත්වයක් සහිත නව ලෑලි තට්ටුවක් එළීමට ක්‍රියා කරන ලදී.

අනතුරුව ප්‍රදක්ෂිණාපථය සංරක්ෂණය කිරීම විෂයෙහි අවධානය යොමු කළ අතර නව දාරුමය කුලුණු සියල්ල ගලවා ඊට සමගාමීව පැරණි කුලුණු ආකෘතිය ආදර්ශයට ගනිමින් නව කුලුණු 08 ක් ස්ථාන ගත කරන ලදී. අනතුරුව යටලී රාමුව දිරාගිය කොටස් යථාතත්වයට පත්කොට සිවිලිම සංරක්ෂණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත් අතර කැණිමඬල යථාවත්කොට පල හතරේ වහලයක් ලෙස නැවත සකස් කෙරිණි. වහලයට යොදා තිබූ රට උළු ඉවත් කොට සිංහල උළු සෙවිලි කර කුමේර බැඳීම ද සිදු කරන ලදී. බිත්ති සංරක්ෂණය කිරීමේ දී සිතුවම් සහිත බිත්තිවල දිරාගිය කපරාරු කොටස් ඉවත් කර සංරක්ෂණය කරන ලදී. ප්‍රදක්ෂිණාපථයේ පසු කාලීන ගඩොල් බිත්ති ඉවත්කර පැරණි සාධක ප්‍රකාරව නැවත ගොඩනගන ලද අතර ප්‍රතිමාගෘහයට පිවිසීම සඳහා පසු කාලීනව එක්කර තිබූ දැව සෝපානය ඉවත්කොට සෘජුව ගොඩනැගිල්ලට සම්බන්ධ නොවන පරිදි සක්ක ගල් භාවිතයෙන් නව පියගැට පෙළක් නිර්මාණය කරන ලදී. ගෙබිම කොන්ක්‍රීට් ඇතිරුමක් යොදා ගොම මැටි ආලේපය යොදන ලදුව මෙම සංරක්ෂණ කටයුතු අවසානයේ ඉදිරි ප්‍රවේශය සඳහා නව ගේට්ටු පියන් දෙකක් සවි කිරීමට ද පියවර ගන්නා ලදී.

## උතුරු මැද පළාත

### අනුරාධපුර දිස්ත්‍රික්කය

#### කුළුම්මාකඩ පුරාවිද්‍යා ස්ථානයේ පැරණි දාගැබ සහ වේදිකා බැම්ම සංරක්ෂණය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 117 තුලාන අගුනච්චිය කුළුම්මාගොඩ ග්‍රාමයේ මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. පැරණි දාගැබ සහ වේදිකා බැම්ම සංරක්ෂණය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතියේ සංරක්ෂණ කටයුතු 2010 ජූනි මස 30 වන දින අවසන් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය මඟින් මෙහි වේදිකාවේ ප්‍රධාන බැම් හතරම සංරක්ෂණයට යොමු කරන ලදී. දකුණු දිශානුගත බැම්ම සංරක්ෂණය කිරීමේ කාර්යයේ දී බස්නාහිර දිශාවට අඩි 2යි අඟල් 6 ක් උසට බැම්ම නිර්මාණය කර නැගෙනහිර දිශාවට අඩි 2යි අඟල් 6 ක් පළලට ද අඩි 5 උසින් ද යුතුව තැනූ අතර දකුණු පස පඩිපෙළ ද සංරක්ෂණය කර දෙපස වූ කොරවක් ගල් ද සංරක්ෂණය කරන ලදී. බටහිර දිශානුගත බැම්ම අඩි 2යි අඟල් 6 ක් පළලට හා අඩි 6 ක් උසින් යුතුව ද උතුරු දිශානුගත බැම්ම අඩි 5 ක් උසින් ද නිර්මාණය කර නැගෙනහිර දිශානුගත බැම්ම සංරක්ෂණයේ දී අඩි 4ක් හා අඟල් 3 ක් උසින් යුතුව ද තැනු අතර මෙම බැම් සඳහා ඉංජිනේරු ගඩොල් හා පැරණි ගඩොල් යොදාගන්නා ලදී. වේදිකා බැම්මෙහි සංරක්ෂණ කටයුතු නිම කිරීමෙන් අනතුරුව අඩු ස්ථානයන්හි පස් පිරවීමට පියවර ගන්නා ලදී. බැම්ම වටා අඩි 10 ක් පරතරයට පස් කපා ඉවත් කරනු ලැබූ අතර එම පස් චෛත්‍යය ආසන්නයේ සිට ප්‍රධාන පාර දක්වා වැටී ඇති පෙත් මග පිරවීම සඳහා යොදා ගන්නා ලදී.

# රසායන සංරක්ෂණ අංශය

## බිතුසිතුවම් සංරක්ෂණය

## බස්නාහිර පළාත

**ගම්පහ දිස්ත්‍රික්කය**

**ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරය**

ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරය 1800 වර්ෂයේ දී පමණ ආරම්භ කරන ලද විහාරස්ථානයක් ලෙස සැලකේ. මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් සහ මූර්තිවලින් සමන්විත මෙහි විහාර මන්දිරය ඇතුළු මාලය සහ පිටත මාලය යන කොටස් දෙකකින් සමන්විත ගොඩනැගිල්ලකි. පිටත මාලය විවෘත ආලින්දයකින් යුතුය. ඇතුළු මාලයේ පැරණි සිතුවම්, හිඳි බුදු පිළිමයක්, කතරගම දෙවියන්ගේ සහ නාථ දෙවියන්ගේ පිළිරුවකින් යුක්ත වෙයි. සිතුවම් පනේලවලට බෙදා නිර්මාණය කර ඇති අතර සිතුවම් සහිත දැව සිවිලිමක් ද වෙයි.

මෙහි සිතුවම් සහිත බිත්තිවල ආධාරකය දක්වා ම බදාමයේ පිපිරීම් සහ ගිලිහී යාම දක්නට ලැබිණ. එම ස්ථාන තහවුරු කිරීම සඳහා වැලි 3: හුඹස් මැටි 1: හුණු $^{1}/_{2}$ අනුපාතයට සකස් කර ගත් බදාමයක් යොදාගනු ලැබිණ. බදාම ස්ථර අතර බොල් වූ ස්ථාන තහවුරු කිරීම සඳහා වැලි සහ හුඹස් මැටි 3:1 අනුපාතයෙන් මෘදුව සකසා ගත් ජලීය ද්‍රාවණය සිරින්ජර් භාවිතයෙන් එන්නත් කරන ලදී. වර්ණ ස්ථරයේ වූ පතුරු ගිලිහී ගිය ස්ථාන තහවුරු කිරීම සඳහා භාවිත කරන ලද්දේ පොලිවීනයිල් ඇසිටේට් සහ ජලය 2% ප්‍රතිශතයට සකස් කරගත් ද්‍රාවණයකි. මෙම විහාරස්ථානයෙහි කලාකෘතිවලට වේයන්ගෙන් අධික ලෙස හානි පැමිණ තිබුණි. වේයන් මර්දනය සඳහා බයිෆ්ලෙක්ස් රසායනිකය හා ජලය 2% ප්‍රතිශතයට මිශ්‍ර කර විහාර මන්දිරයෙහි ඇතුළතින් හා පිටතින් පාදමෙහි අඩි 1 ක් පමණ ගැඹුරට සාදාගත් සිදුරු තුළට යොදනු ලැබිණ. එසේ ම හිඳි බුද්ධ ප්‍රතිමාවේ සහ කතරගම දේව ප්‍රතිමාවේ වර්ණ ස්ථරයේ පතුරු ගිලිහී ගිය ස්ථාන ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබීය. සිතුවම්වල මතුපිට ස්ථරයෙහි වූ කෘමි ගෙවල්, දූහුවිලි ආදී අපද්‍රව්‍ය යාන්ත්‍රිකව ඉවත් කොට පිරිසිදු කරන ලදී.

**වාරණ පුරාණ රජමහා විහාරය**

ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය කොට්ඨාසය තුළ පිහිටි වාරණ පුරාණ රජමහා විහාරය අනුරාධපුර යුගය දක්වා දිවෙන දීර්ඝ ඉතිහාසයක් සහිත ගල්ලෙන් විහාරයකි. මෙහි මහනුවර අවධියේ දී නිර්මාණය කරන ලද සිතුවම් කොටසක් (වෙස්සන්තර ජාතකය) කඳු පාමුල වූ එක් ලෙනක ශේෂව පවතී. කඳු මුදුනෙහි වූ ලෙන් විහාර තුනෙහි ම දක්නට ඇති සිතුවම් පසුකාලීනව නවීකරණය කර ඇත. මේ අතරින් දෙවන ලෙනෙහි වූ සිතුවම් මෙම වසර තුළ දි සංරක්ෂණය කරනු ලැබීය.

මෙහි වූ සිතුවම් සහ මූර්ති මත පසුකාලීනව වර්ණාලේප කර ඇත. ලෙන් වියනෙහි වූ සිතුවම්වල පතුරු ගිලිහී යාම, බදාම ස්ථරය ඇතුළතින් බොල්වීම, කෘමි හානි සහ අපද්‍රව්‍ය තැන්පත්වීම යන හායන තත්වයන් හඳුනාගත හැකි විය. එමෙන් ම මූර්ති හා බිත්තිවල කැඩී බිඳී

ගිය ස්ථානවලට පසුකාලීනව සිමෙන්ති පිරවුමක් යොදා තිබීම මෙහි සෞන්දර්යාත්මක අගය හීන කරවන්නකි. මෙහි සිදු කරන ලද සංරක්ෂණ කටයුතුවල දී එම සිමෙන්ති පිරවුම ඉවත්කොට සුදුසු නව බදාමයකින් එම ස්ථාන නැවත පුරවා තහවුරු කරන ලදී. මෙම විහාරයේ සංරක්ෂණ කටයුතුවලින් 50% ක පමණ ප්‍රමාණයක් නිම කිරීමට මෙම වසර තුළ දී හැකි විය.

**ගෝඨාභය රජමහා විහාරය**

ගෝඨාභය රජමහා විහාරය ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. මෙහි මුලින් පැවතුණු විහාරගෙය ටැම්පිට විහාරයක් වූ බවට සාධක ඇත. වර්තමානයේ ඇති විහාර ගෙය ඇතුළු මාලය සහ පිටත මාලය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. එම කොටස් දෙකෙහි ම සිතුවම් නිර්මාණය කර ඇත. ලිඛිත මූලාශ්‍රවලට අනුව මෙම සිතුවම් 1930 වර්ෂයට පෙර අඳින ලද සිතුවම් වේ. සිතුවම්වලට අමතරව හිඳි බුදු පිළිම දෙකක්, සැතපෙන පිළිමයක්, අටවිසි බුදු පිළිම, ගෝඨාභය රජුගේ යැයි ජන ප්‍රවාදයේ කියවෙන පිළිමයක් හා විෂ්ණු දේව ප්‍රතිමාවක් ද මකර තොරණක් ද දක්නට ලැබෙයි. මෙම සිතුවම් සහ මූර්ති මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියට අයත් වේ.

මෙහි සිතුවම් සඳහා ආධාරක වූ බිත්තියේ ගැඹුරු පිපිරීම් කිහිපයක් දැකිය හැකි විය. බදාම ස්ථරය, වර්ණ දරනු ලබන ස්ථරය සහ වර්ණ ස්ථරය අතර බන්ධන මාධ්‍ය දුර්වලවීමෙන් හටගත් බොල්වීම් ද මෙහි දක්නට හැකි වූ තවත් හායන තත්වයකි. විහාරගෙයි දකුණුපස බිත්තිය විශාල බෝ මුලක් ගමන් කිරීම හේතුවෙන් පිපිරීමට ලක්ව ඇත. වර්ණ ස්ථරය මත කෘමි ගෙවල්, කෘමි බිත්තර, දුහුවිලි වැනි අපද්‍රව්‍ය තැන්පත්වීම හා පතුරු වශයෙන් ගිලිහී යාම යන හායන තත්වයන් දැකිය හැකි විය. පූර්ව සංරක්ෂණවල දී සිදු කර ඇති අවිධිමත් මැදිහත්වීම් ද මෙහි කලා නිර්මාණවල පෞරාණික වටිනාකමට හානිකර වේ. සිතුවම් මත ආරක්ෂිත ආලේපයක් ගල්වා තිබීම ද, රජුගේ යැයි සැලකෙන ප්‍රතිමාවේ දකුණු අත වැලමිටෙන් පහළ කොටස සහ කඩුව අවිධිමත් ලෙස සකස් කර තිබීම එයට හේතු වී ඇත.

2010 වසරෙහි සංරක්ෂණ සඳහා තෝරා ගනු ලැබුයේ විහාරයේ ඉදිරිපස මකර තොරණ සහිත බිත්තියේ පිටත සහ ඇතුළත නිර්මාණයන් ය. බදාමය ගිලිහී ගිය ස්ථාන හා පිපිරී ගිය ස්ථාන වැලි 3: හුඹස් මැටි 1: හුණු $^{1}/_{2}$ අනුපාතයට සකස් කර ගත් බදාමයක් මගින් පුරවා තහවුරු කිරීම, බදාම ස්ථර අතර බොල් වූ ස්ථානවලට ඉහත බදාමය මෘදු ලෙස අඹරා ජලය සමග මිශ්‍ර කර සිරින්ජයක් ආධාරයෙන් එන්නත් කිරීම, පොලිවීනයිල් ඇසිටේට් සහ ජලය 2% ප්‍රතිශතයට මිශ්‍ර කොට සකස් කරගත් ද්‍රාවණයකින් වර්ණ ස්ථරයේ පතුරු ගිලිහී ගිය ස්ථාන ඇලවීම, පූර්ව සංරක්ෂණවල දී ගල්වන ලද ආරක්ෂිත ආලේපය ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් 2% ජලීය ද්‍රාවණයෙන් ඉවත් කිරීම, මතුපිට ස්ථරයේ වූ අපද්‍රව්‍ය යාන්ත්‍රිකව පිරිසිදු කිරීම, මූර්තිවල කැඩී බිඳී ගිය ස්ථාන සකස් කිරීම, ගෝඨාභය රජුගේ ප්‍රතිමාවෙහි පූර්ව සංරක්ෂණවල දී එක්කර ඇති කොටස් ඉවත් කර නැවත නිවැරදි ආකාරයෙන් සකස් කිරීම යන සංරක්ෂණ කාර්යයන් මෙම වසර තුළ දී සිදු කරන ලදී.

**බටුවිට ගිරිසිරිදර්ශනාරාම පුරාණ ටැම්පිට විහාරය**

මෙය ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි විහාරස්ථානයකි. මෙහි ඇති ටැම්පිට විහාරගෙය අඩි 3 ක් පමණ උස ගල්කණු 8 ක් මත යොදන ලද දැව තට්ටුවක් මත වරිච්චි බිත්තියෙන් ඉදිකළ ගොඩනැගිල්ලකි. මෙහි ඇතුළු මාලයේ මහනුවර අවධියට අයත් සිතුවම් කොටසක් ශේෂ වී ඇත. සෙසු සිතුවම් නවීකරණය කර ඇත.

මීයන් විසින් බිත්ති සිදුරු කිරීම මෙම විහාරගෙයි සිතුවම්වල පැවැත්මට ඇති ප්‍රධානතම තර්ජනයයි. ඒ හේතු කොට බදාම ස්ථරය මුළුමනින් ම බොල් වී ඇත. එසේම බිත්තිවල ආධාරකය දක්වා පිපිරීම හා බදාම කොටස් ගිලිහී යාම, වර්ණ ස්ථරය පතුරු වශයෙන් ගිලිහී යාම, කෘමිගෙවල්, කෘමි බිත්තර හා අපද්‍රව්‍ය තැන්පත්වීම යන හායන තත්වයන් ද මෙහි හඳුනාගත හැකි ය.

මෙහි ආධාරකයේ පිපිරීම් හා බදාමය ගිලිහී ගිය ස්ථාන තහවුරු කිරීම සඳහා හුඹස් මැටි හා වැලි 1:3 අනුපාතයට සකස් කරගත් බදාමයක් යොදාගනු ලැබිණ. බදාම ස්ථරයේ බොල් වූ ස්ථාන ශක්තිමත් කිරීම සඳහා වැලි සහ මැටි 3:1 අනුපාතයෙන් මිශ්‍ර කොට සිහින්ව අඹරා ජලීය ද්‍රාවණයක් සකස් කර බිත්ති තුළට එන්නත් කරන ලදී. කෘමි හානි මර්දනය සඳහා යොදා ගනු ලැබූයේ පයිරිනෙක්ස් නමැති රසායනිකයේ 8% ජලීය මිශ්‍රණයයි. පොලිවීනයිල් ඇසිටේට් සහ ජලය 2% ප්‍රතිශතයට මිශ්‍ර කොට සකස් කරගත් ද්‍රාවණයකින් වර්ණ ස්ථරයේ පතුරු ගිලිහී ගිය ස්ථාන අලවා තහවුරු කරන ලදි.

**කොළඹ දිස්ත්‍රික්කය**

**කෝට්ටේ රජමහා විහාරය**

කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි කෝට්ටේ රජමහා විහාරය හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකරවන ලද්දක් ලෙස සැලකේ. මහනුවර සම්ප්‍රදායට සමානවන ලෙස නිර්මාණය කරන ලද සිතුවම් සහ මූර්ති මත සමහර ස්ථානවල පසුකාලීනව නැවත වර්ණාලේප කර තිබේ. එමෙන් ම පසුකාලීනව නිර්මාණය කරන ලද සිතුවම් සහ මූර්ති ද මෙම විහාරයෙහි දැකිය හැකි ය. මෙම විහාරගෙය දිගින් අඩි 128 ක් සහ පළලින් අඩි 108 ක් පමණ වූ මාල තුනකින් යුතු එකකි. ගඩොල් සහ මැටි ආධාරයෙන් මෙහි සිතුවම් සඳහා ආධාරක වූ බිත්ති නිර්මාණය කර ඇත.

මෙම විහාරගෙයි සිතුවම් සහ ප්‍රතිමාවල වර්ණ ස්ථරය පතුරු වශයෙන් ගිලිහෙමින් පැවතිණ. එසේ ම ප්‍රතිමා, ආසන සහ බිත්තිවල බදාමය බොල්වීම හා ගිලිහී යාම ද, සිතුවම් සහ මූර්ති මත අපද්‍රව්‍ය තැන්පත්වීම ද යන හායන තත්වයන් මෙහි දැකිය හැකි විය. මෙම හායන තත්වයන් සඳහා 20%-30% ක අතර ප්‍රමාණයක් ප්‍රතිකර්ම යෙදීමට මෙම වසර තුළ දී හැකි විය.

**සුනේත්‍රාදේවි රජමහා විහාරය**

කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සුනේත්‍රාදේවි රජමහා විහාරය පිහිටා ඇත. මෙය ද හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් සිය මෑණියන් උදෙසා

කරවන ලද විහාරස්ථානයකි. පසුකාලීනව යම් නවීකරණයන් සිදුකර ඇත ද මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ සිතුවම් මහ මූර්තිවලින් මෙහි විහාර මන්දිරය අලංකාර කර ඇත.

සක්කගලින් හා වැලි, මැටි මිශ්‍ර බදාමයකින් ආධාරක බිත්ති ඉදිකොට ඝන වැලි සහ මැටි මිශ්‍ර බදාමයකින් සහ එය මතුපිටින් සියුම් වැලි, මැටි, හුණු මිශ්‍ර බදාමයකින් පිරියම් කොට නිමවා තිබේ. සිතුවම් නිර්මාණය කර ඇත්තේ එය මත ය. දැවයෙන් කරන ලද වියන මත ද සිතුවම් නිර්මාණය කර තිබේ.

මෙම විහාරයේ සිතුවම් හා මූර්තිවලට වැඩි ම හානියක් සිදු වී ඇත්තේ වහළයෙන් වැසි දිය කාන්දු වීම හේතුකොටගෙන ය. මේ නිසා මකර තොරණ හා දේව ප්‍රතිමා දෙකකට විශාල වශයෙන් හානි වී තිබිණ. සිතුවම් හා මූර්තිවල වර්ණ ස්ථරයේ පතුරු ගිලිහී යාම, මතුපිට ආගන්තුක ද්‍රව්‍ය තැන්පත්වීම, බදාමය බොල්වීම හා ගිලිහී යාම, මූර්ති හා ආසන කැඩී බිඳී යාම වැනි හායන තත්වයන් සඳහා ප්‍රතිකර්ම යෙදීම මෙම වසර තුළ දී සිදු කරනු ලැබී ය.

**කරගම්පිටිය සුබෝධාරාමය**

මෙය කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි විහාරස්ථානයකි. මෙහි විහාර මන්දිරයෙහි ඇති බුද්ධ ප්‍රතිමා 1780 වර්ෂයේ දී නිම කර ඇති අතර 1795 රාජාධිරාජසිංහ රජ දවස සෙසු විහාර කර්මාන්ත කරවා ඇත. පිටත මාලයේ සිවිලිම හා බිත්තිවල සිතුවම්කරණය කර ඇත්තේ 1897 වර්ෂයේ දී ය. පිටත මාලයේ සිතුවම් මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියට අයත් වෙයි. ඇතුළු මාලයේ සිතුවම් මෑත කාලීන ය.

මෙම විහාරයෙහි සිතුවම්වල හායනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සමුද්‍රාසන්නයේ පැවතීම හේතුවෙන් ලවණ තැන්පත් වීමයි. එමෙන් ම ආධාරකය දක්වා ගමන් කරන ගැඹුරු පිපිරීම් හා බදාම ගිලිහී යාම, සිතුවම් පතුරු වශයෙන් හා කුඩු වශයෙන් ගිලිහීයාම, වර්ණ අවපැහැවීම, වර්ණ ස්ථරය මත කෘමි ගෙවල්, කෘමි බිත්තර, දූහුවිලි වැනි අපද්‍රව්‍ය තැන්පත්වීම, දැව සිවිලිම තැනින් තැන දිරාපත්වීම සහ පොළොව ගිලා බැසීම හේතුවෙන් ප්‍රධාන බිත්ති සම්බන්ධ වන ස්ථානවල පිපිරීම් ඇතිවීම යන හායන තත්වයන් හඳුනාගත හැකි විය.

2010 වසර තුළ දී මෙම විහාර මන්දිරයෙහි ඇතුළු මාලයේ පිටත බිත්තිවල බිම සිට ඉහළට සිතුවම් පනේල දෙක බැගින් සංරක්ෂණය කිරීමට හැකි විය. මෙහි සෙසු සංරක්ෂණ කටයුතු ඉදිරි වසර තුළ දී නිම කිරීමට අපේක්ෂිත ය. බදාමය ගිලිහී ගිය ස්ථාන හා පිපිරී ගිය ස්ථාන වැලි 3: හුඹස් මැටි 1: හුණු $^{1}/_{2}$ අනුපාතයට සකස් කර ගත් බදාමයක් මගින් පුරවා තහවුරු කිරීම, බදාම ස්ථර අතර බොල් වූ ස්ථානවලට ඉහත බදාමය මෘදු ලෙස අඹරා ජලය සමග මිශ්‍ර කර සිරින්ජයක් ආධාරයෙන් එන්නත් කිරීම, පොලිවීනයිල් ඇසිටේට් සහ ජලය 2% අනුපාතයට මිශ්‍ර කොට සකස් කරගත් ද්‍රාවණයකින් වර්ණ ස්ථරයේ පතුරු ගිලිහී ගිය ස්ථාන ඇලවීම, එතිල් ඇල්කොහොල් 2% ජලීය ද්‍රාවණයක් මගින් කෘමිගෙවල් හා කෘමි බිත්තර ඉවත් කිරීම යන සංරක්ෂණ කාර්යයන් මෙහි දී සිදු කරන ලදී. නමුත් සිතුවම් මත වූ ලවණ ඉවත් කිරීමේ කටයුතු

මෙම වසර තුළ දී සිදු කළ නො හැකි වූයේ ඒ සඳහා අවශ්‍ය ජපන් ටිෂූ සපයා ගැනීමට වූ අපහසුතාවයයි.



සිතුවම් පතුරු වශයෙන් ගිලිහී ගොස් ඇති අයුරු



බදාම ගිලිහී ගිය ස්ථාන පුරවා තහවුරු කිරීම



බදාම ගිලිහී ගිය ස්ථාන පුරවා තහවුරු කිරීම



බොල් වූ ස්ථාන තහවුරු කොට ආධාරක යොදා ශක්තිමත් කිරීම

**කළුතර දිස්ත්‍රික්කය**

**උග්ගල්බඩ මල් අස්නේ දේවාලය**

මෙය කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි පැරණි දේවාලයකි. එහි කුලුණක සඳහන් කර ඇති පරිදි ශක වර්ෂ 1365 දී හයවන ශ්‍රී පරාක්‍රමබාහු රජ සමයේ මෙය ඉදි කර තිබේ.

මෙම දේවාලයේ බිත්ති කබොක්ගල් සහ වැලි, හුණු මිශ්‍ර බදාමයකින් ශක්තිමත්ව ඉදිකර ඇති බැවින් එයට හානි වී නො තිබුණු නමුත් වැලි හුණු මිශ්‍ර බදාම ස්ථරයේ ඇතැම් ස්ථාන බොල් වී බදාමය ගිලිහී යමින් පැවතිණ. මෙහි වූ පත්තිනි මෑණියන්ගේ ප්‍රතිමාවත්, කතරගම, දැඩිමුණ්ඩ, වාහල සහ දෙවොල් දෙවිවරුන්ගේ ප්‍රතිමාත් ඇතැම් ස්ථානවල කැඩී බිඳී ගොස් තිබිණ. තවත් ප්‍රධාන හායන තත්වයක් වූයේ බැතිමතුන් විසින් පහන්, හඳුන්කූරු ආදිය දැල්වීම නිසා මූර්තිවල මතුපිට ස්ථරය මත කාබන් අංශු තැන්පත් වීමෙන් දුර්වර්ණ වීමයි.


මල් අස්න දේවාලය මින් පෙර කිසිදු සංරක්ෂණයකට ලක් වී නො තිබුණු අතර 2010 වසරෙහි දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒ සඳහා ප්‍රථම වරට මැදිහත් විය. මෙහි සැලකිය යුතු සංරක්ෂණ වැඩ කොටසක් මෙම වසරෙහි දී සිදු කරන ලද මුත් ඉදිරි වසර තුළ ද එහි කටයුතු සිදු කළ යුතුව ඇත.

**පානදුර රන්කොත් විහාරය**

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති පැරණි විහාරස්ථානයකි. ප්‍රදේශයේ දානපතියන් විසින් 1810 වසරෙහි දී ඉදිකරවන ලද මෙම විහාරයෙහි විහාර මන්දිරය කබොක්ගල් සහ මැටි වැලි මිශ්‍ර බදාමයකින් කපරාරු කර මාල දෙකකින් යුතුව නිර්මාණය කර තිබේ.

විහාරයේ බිත්ති මත නිර්මාණය කර ඇති සිතුවම්වලට විශාල වශයෙන් හානි පැමිණී ඇත්තේ ස්වාභාවික හේතූන්ට වඩා මිනිස් ක්‍රියාකාරකම් මගින් ඇති කරන ලද බලපෑම් මගිනි. බිත්තිවලට පිට දී වාඩිවීම හා සිතුවම් ස්පර්ශ කිරීම හේතුවෙන් සිතුවම් බොහෝ ප්‍රමාණයක් විනාශ වී ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුදැනුමකින් තොරව පෞද්ගලිකව සිදු කර ඇති අලුත්වැඩියා කටයුතු හේතුකොටගෙන සිතුවම්වල වර්ණයට ද හානි පැමිණී ඇත. එමෙන් ම බදාම ගිලිහී ගිය ස්ථාන නො ගැලපෙන බදාමයකින් පුරවා තිබීම ද සිතුවම් හා මූර්තිවල පෞරාණිකත්වයට හා සෞන්දර්යාත්මක අගය හීන කරවන්නකි. ඒ හැරුණු කොට සිතුවම් පතුරු වශයෙන් ගිලිහී යාම, කුඩු බවට පත්වීම, වර්ණ අවපැහැ වීම, බදාමය බොල්වීම, ඉරි තැලීම හා ගිලිහී යාම වැනි හායන තත්වයන් ද හඳුනාගත හැකි විය.


2010 වසර තුළ දි මෙම විහාරයේ සිතුවම් සහිත බිත්ති දෙකක සංරක්ෂණ කටයුතු නිම කිරීමට හැකි වූ අතර ඉතිරි සංරක්ෂණ කටයුතු 2011 වසරෙහි දි සිදු කිරීමට අපේක්ෂිත ය.



රංකොත් විහාරයේ සිතුවම් සංරක්ෂණය කිරීම

**වරකාගොඩ ගල්ලෙන් රජමහා විහාරය**

වරකාගොඩ ගල්ලෙන් රජමහා විහාරය කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි පැරණි විහාරස්ථානයකි. මෙහි ප්‍රධාන ලෙන් විහාරයෙහි පෞරාණික සිතුවම් හා මූර්ති පැවතී ඇති මුත් මේ වනවිට ශේෂව ඇත්තේ මූර්ති පමණි. පැරණි සිතුවම් මත වෙනත් සිතුවම් නිර්මාණය කර ඇත. දේවාල දෙකෙහි ඇති දේව ප්‍රතිමා ද පෞරාණික ප්‍රතිමා වේ. ඇතැම්විට මෙම නිර්මාණ දඹදෙණි අවධියේ දී නිර්මාණය කරන්නට ඇති බව සිතිය හැක්කේ මෙම විහාරස්ථානය වටා ඇති ප්‍රවාදයන් දඹදෙණි අවධියට සම්බන්ධ වන බැවිනි.



වරකාගොඩ ගල්ලෙන් රජමහා විහාරය

සිතුවම් මත ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම, බදාමය බොල් වූ සහ බදාමය ගිලිහී ගිය ස්ථාන සුදුසු නව බදාමයකින් පිරවීම යන සංරක්ෂණ කාර්යයන් මෙම වසර තුළ දී සිදු කරන ලදී.

## මධ්‍යම පළාත

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

**වෑගම පුරාණ රජමහාවිහාරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මැදගම පුරාණ රජමහා විහාරය ගම්පොළ අවධියේ ආරම්භ වූ ස්ථානයකි. නමුත් ශේෂ වී ඇති ශෛලමය පුරාවස්තු අනුව මෙය ඊට වඩා ඈත කාලීන ඉතිහාසයක් සහිත ස්ථානයක් බව පෙනේ. මෙහි ගම්පොළ යුගයේ සහ මහනුවර යුගයේ අඳියර කිහිපයක දී කරන ලද සිතුවම් හා මූර්ති දක්නට ඇති ලෙන් විහාර දෙකක් පවතී. නමුත් ඉන් සමහර ස්ථාන පසුකලෙක නවීකරණය කර ඇත.

මෙහි මකර තොරණ හා සමාධි බුද්ධ ප්‍රතිමාව හා බිසෝ බණ්ඩාර දේව ප්‍රතිමාව සම්පූර්ණයෙන් ම නිධන් සොරුන් විසින් විනාශ කරනු ලැබ තිබිණ. මෙම ප්‍රතිමා සංරක්ෂණයේ දී ප්‍රථමයෙන් ම විනාශ කර දමා තිබූ කොටස් එක්රැස්කර නව බදාමයක් මතට සම්බන්ධ කර තහවුරු කිරීම සිදු කරනු ලැබී ය. එසේ ම මින් පෙර එම ප්‍රතිමාවල හා සිතුවම් සහිත බිත්තිවල බදාමයේ අවිධිමත් ලෙස කරන ලද තහවුරු කිරීම්වල දී යොදා තිබුණු සිමෙන්ති පිරවුම් ඉවත් කර නව බදාමයෙන් පුරවා සකස් කරන ලදි. එමෙන් ම සිතුවම්වල පතුරු ගිලිහෙමින් පැවති ස්ථාන අලවා තහවුරු කිරීම ද කෘමිනාශක යෙදීම ද මෙම වසර තුළ දී සිදු කරන ලදී.

## දකුණු පළාත

**ගාල්ල දිස්ත්‍රික්කය**

**කතළුව පූර්වාරාමය**

ගාල්ල දිස්ත්‍රික්කයට අයත් හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. මෙම විහාරයේ ඇතුල්වන දොරටුවේ සිට වම් පස සිතුවම් සහිත බිත්තිය පමණක් මෙවර සංරක්ෂණ කටයුතු සඳහා තෝරා ගනු ලැබී ය. එම බිත්තිය පිරිසිදු ජලයෙන් පුළුන් දැවටූ ඉරටු ආධාරයෙන් පිරිසිදු කර වින්සන් ඇන්ඩ් නිවුටන් හා රීව්ස් යන දියසායම් මගින් ගර්ත ප්‍රතිඡ්කීයකරණය කරන ලදි. පතුරු ගැලවෙමින් පැවති සිතුවම් කොටස් පැරලොයිඩ් බී 72 සහ සයලීන් යන රසායන ද්‍රව්‍ය මගින් තහවුරු කරන ලද අතර අවිධිමත් ලෙස තීන්ත තවරා තිබූ සිතුවම් කොටස්වල තීන්ත ඉවත් කිරීම ද සිදු කෙරිණ.



සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

**තොටගමුව සුභද්‍රාරාමය**

ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විහාරස්ථානයක් වූ මෙහි මකර තොරණ සහිත බිත්තිය මෙම වසර තුළ සංරක්ෂණය කරනු ලැබී ය. එම බිත්තිය පිරිසිදු ජලයෙන් පුළුන් දැවටූ ඉරටු ආධාරයෙන් පිරිසිදු කර සිතුවම් කොටස් කිහිපයක ගර්ත වින්සන් ඇන් නිවුටන් හා රීව්ස් යන දියසායම් මගින් ප්‍රතිජ්කීයකරණය කරන ලදි. පතුරු ගැලවෙමින් පැවති සිතුවම් කොටස් තහවුරු කිරීම සඳහා යොදා ගත්තේ පැරලොයිඩ් බී 72 සහ සයලීන් යන රසායන ද්‍රව්‍යයන් ය. විශාල වශයෙන් කැඩී බිඳී කෘමි හානිවලින් විනාශ වී තිබූ මූර්ති කොටස් අඹරාගත් වැලි 3 : මැටි 4/1 : අළු හුණු 1 යන අනුපාතයට ගෙන සකසාගත් බදාම මගින් තහවුරු කරන ලදි. මෙම බදාමය සිතුවම් සහිත මුල් බදාමයට වඩා ශක්තියෙන් අඩු එකකි. සිතුවම් මත තැන්පත්ව තිබූ සුදු පැහැති පටලය එතනෝල් 25% සහ කඩදාසි පල්පයක් මගින් ඉවත් කොට පැරලොයිඩ් බී 72 සහ සයලීන් 2% ද්‍රාවණය ආලේප කරන ලදි.

**තෙල්වත්ත රජමහ විහාරය**

ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විහාරස්ථානයකි. මෙහි පැරණි විහාරගෙයි සිතුවම් සහ මූර්ති මෙම වසර තුළ දී සංරක්ෂණය කරනු ලැබීය. ප්‍රථමයෙන් එහි සිතුවම් සහිත බිත්ති පිරිසිදු ජලයෙන් පුළුන් දැවටූ ඉරටු ආධාරයෙන් පිරිසිදු කරන ලදි. පතුරු ගැලවෙමින් පැවති සිතුවම් කොටස් පැරලොයිඩ් බී 72 සහ සයලීන් යන රසායන ද්‍රව්‍ය මගින් තහවුරු කරන ලදි. විශාල වශයෙන් කැඩී බිඳී කෘමි හානිවලින් විනාශ වී තිබූ බුද්ධ ප්‍රතිමාවල කොටස් හා සිතුවම් සහිත බිත්තිවල විශාල හා කුඩා ප්‍රමාණයේ ගර්ත හා ඉරි තැළුම් අවශ්‍ය ප්‍රතිශතයන්ට අඹරාගත් වැලි, මැටි හා අළු හුණු මගින් සකසාගත් බදාම මගින් තහවුරු කරන ලදි.

**කුමාරකන්ද කුමාර විහාරය**

ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විහාරස්ථානයකි. මෙම විහාරයේ සැතපෙන බුද්ධ ප්‍රතිමාව සහිත කොටසේ පමණක් සිතුවම් හා මූර්ති සංරක්ෂණය මෙම වසරේ දී සිදු කරන ලදි. විශේෂ සංරක්ෂණ කාර්යයක් ලෙස පැරණි සිතුවම් මත අළුතින් ඇඳ තිබූ සිතුවම් කොටස් යාන්ත්‍රිකව ඉවත් කිරීම ද සිදු කරන ලදි. සැතපෙන බුද්ධ ප්‍රතිමාව හා හිඳි බුද්ධ ප්‍රතිමාව පිරිසිදු ජලයෙන් පුළුන් දැවටූ ඉරටු ආධාරයෙන් පිරිසිදු කරන ලදි. පතුරු ගැලවෙමින් පැවති සිතුවම් කොටස් පැරලොයිඩ් බී 72 සහ සයලීන් යන රසායන ද්‍රව්‍ය මගින් තහවුරු කරන ලදි. විශාල වශයෙන් කැඩී බිඳී කෘමි හානිවලින් විනාශ වී තිබූ බුද්ධ ප්‍රතිමාවල කොටස් හා සිතුවම් සහිත බිත්තිවල විශාල හා කුඩා ප්‍රමාණයේ ගර්ත හා ඉරි තැළුම් අවශ්‍ය ප්‍රතිශතයන්ට අඹරාගත් වැලි, මැටි හා අළු හුණු මගින් සකසාගත් මුල් බදාමයට වඩා ශක්තියෙන් අඩු බදාමයකින් තහවුරු කරන ලදි.

**අමුගොඩ සිරි විජයාරාමය**

මෙය ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විහාරස්ථානයකි. මෙම විහාරයේ සිතුවම් සහිත බිත්ති පිරිසිදු ජලයෙන් පුළුන් දැවටූ ඉරටු ආධාරයෙන් පිරිසිදු කරන ලද අතර තෙල් සහිත පහන් දැළි හා ජලයෙන් ඉවත් නොවන පැල්ලම් ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් 5% යොදා පිරිසිදු කරනු ලැබී ය. පසුව පතුරු ගැලවෙමින් පැවති සිතුවම් කොටස් පැරලොයිඩ් බී 72 සහ සයලීන් යන රසායන ද්‍රව්‍ය මගින් තහවුරු කරන ලදි. විශාල වශයෙන් කැඩී බිඳී කෘමි හානිවලින් විනාශ වී තිබූ බිත්තිවල විශාල හා කුඩා ප්‍රමාණයේ ගර්ත හා ඉරි තැළුම් සඳහා කෘමි නාශක (බයිෆ්ලෙක්ස්) එන්නත්කර අවශ්‍ය ප්‍රතිශතයන්ට අඹරාගත් වැලි, මැටි හා අළු හුණු මගින් සකසාගත් බදාම මගින් තහවුරු කරන ලදි (මෙහි දී සිතුවම් සහිත මුල් බදාමයට වඩා ශක්තියෙන් අඩු බදාමයක් භාවිත කරන ලදි).

**කච්චුවත්ත පුරාණ විහාරය**

ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විහාරස්ථානයක් වූ කච්චුවත්ත පුරාණ විහාරයේ මකර තොරණ සහිත බිත්තිය හා විහාරයේ ඇතුල් ගර්භයේ සිතුවම් හා විෂ්ණු කතරගම දේවාල මෙම වසරෙහි සංරක්ෂණ කටයුතු සඳහා තෝරා ගනු ලැබී

ය. පුළුන් දැවටූ ඉරටු ආධාරයෙන් පිරිසිදු ජලයෙන් සිතුවම් සහිත බිත්ති පිරිසිදු කර වින්සන් ඇන් නිවුටන් හා රීව්ස් යන දියසායම් මගින් සිතුවම් කොටස් කිහිපයක ගර්ත ප්‍රතිඒකීයකරණය කරන ලදි. පතුරු ගැලවෙමින් පැවති සිතුවම් කොටස් තහවුරු කරන ලද්දේ පැරලොයිඩ් බී 72 සහ සයලීන් යන රසායන ද්‍රව්‍ය මගිනි. විශාල වශයෙන් කැඩී බිඳී කෘමි හානිවලින් විනාශ වී තිබූ මූර්ති කොටස් අවශ්‍ය ප්‍රතිශතයන්ට අඹරාගත් වැලි, මැටි හා අළු හුණු මගින් සකසාගත් බදාම මගින් තහවුරු කරන ලදි. මෙහි දී භාවිත කරන ලද්දේ සිතුවම් සහිත මුල් බදාමයට වඩා ශක්තියෙන් අඩු බදාමයකි.

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

**කසාගල රජමහා විහාරය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි විහාරස්ථානයකි. මෙය කාවන්තිස්ස රජතුමා විසින් ප්‍රථම වරට ඉදිකරවන ලදැයි සැලකෙන අතර පසුව විවිධ අවස්ථාවල දී ප්‍රතිසංස්කරණ හා නවාංග එකතු කිරීම සිදු වී ඇත. මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ අනගි ප්‍රකාශනයන්ගෙන් යුතු සිතුවම් හොඳින් ආරක්‍ෂා වී පවතින ස්ථානයක් වශයෙන් මෙම රජමහා විහාරය හැඳින්විය හැකි ය. මෙහි විහාර මන්දිරය ප්‍රවේශ මණ්ඩපය, ගර්භ ගෘහය හා ගර්භ ගෘහය වටා ඇති ප්‍රදක්ෂිණා පථය යන කොටස් තුනකින් යුක්ත වේ. මහනුවර සම්ප්‍රදායේ දක්ෂිණ ශෛලිය හා එම ශෛලිය නූතන යුගයට සංක්‍රමණය වීමේ දී ඇති වූ සංක්‍රාන්තික අවධිය නිරූපණය කරන සිතුවම් ශෛලීන් දෙක මෙහි දැකගත හැකි ය. විහාරයෙහි ඇතුළු ගර්භයෙහි ඇති බුද්ධ ප්‍රතිමා හා සිතුවම් ද එහි පිට බිත්තියේ ඇති මකර තොරණ, දොරටුපාල රූප, ජාතක කථා සිත්තම් ද මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලිය නියෝජනය කරන අතර ප්‍රවේශ මණ්ඩපයේ ඇති බුදු සිරිත නිරූපණය කරන සිතුවම් දක්ෂිණ ශෛලියේ සංක්‍රාන්ති අවධිය නියෝජනය කරයි. මෙම විහාරයට අයත් ධර්ම ශාලාවේ ඇති පිරිත් මණ්ඩපයේ ද අලංකාර සිතුවම් දැකිය හැකි ය. මෙම පිරිත් මණ්ඩපයේ සිතුවම් 2006 වසරේ දි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්‍ෂණය කරන ලද අතර 2010 වසරේ දී විහාර මන්දිරයේ සිතුවම් හා මූර්ති සංරක්‍ෂණය කරන ලදි.

මෙහි දී සිතුවම් ස්ථරය මත වූ දූහුවිලි අංශු සහ කාබන් අංශු ඇතුළු ආගන්තුක ද්‍රව්‍ය සියුම් කෙඳි සහිත බුරුසු, පිරිසිදු ජලය හා 5% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් භාවිතයෙන් පිරිසිදු කරනු ලැබී ය. බදාම ස්ථරයේ වූ ගර්ත හා පිපිරීම් තහවුරු කරන ලද්දේ මැටි හා හුණු ජලය සමග මිශ්‍ර කර තනාගත් නව බදාමයකින් පිරවීමෙනි. බුදු පිළිමවල සහ මකර තොරණේ මුර රූපවල අවශ්‍ය ස්ථාන සඳහා පමණක් පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපයක් වශයෙන් ගල්වන ලද අතර එක් බිත්තියක සිතුවම් සඳහා ද ආරක්ෂිත ආලේපය ගල්වනු ලැබී ය. ඉහත බදාම මාධ්‍යය භාවිතයෙන් මකර තොරණේ කැඩී බිඳී ගිය ස්ථාන ද නැවත සකස් කරන ලදි.

කසාගල රජමහා විහාරයේ සිතුවම් ඵලක දෙකක් පිටපත් කොට අරලියගහ මන්දිරයේ තැබීම සඳහා අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වනු ලැබී ය.

**කටුවන ශ්‍රී විහාරය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම විහාරස්ථානය පිහිටා ඇත. මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ සංක්‍රාන්ති අවධියට අයත් බිතුසිතුවම් හා මූර්තිවලින් සමන්විත විහාරයකි. බු. ව. 2452 දි කටවුන ශ්‍රී සෝභිත උන්නාන්සේ විසින් කරවූ බව විහාරස්ථානයට ඇතුළුවන උළුවස්සේ සඳහන් කර ඇත.

සිතුවම් ස්ථරය මත තිබූ මකුළුදැල්, දූහුවිලි අංශු ආදිය සියුම් කෙඳි සහිත බුරුසුවකින් මූලික වශයෙන් පිරිසිදු කර තදින් බැඳී තිබූ කාබන් අංශු 5% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් මගින් ඉවත් කරන ලදි. පැරණි සිතුවම් ස්ථරය වසා ආලේප කර තිබුණු හුණු ස්ථරය ඉවත් කොට පැරණි සිතුවම් ස්ථරය මතුකිරීම මෙහි දී සිදු කරන ලද සුවිශේෂී කාර්යයකි. අවසාන වශයෙන් අවශ්‍ය ස්ථාන සඳහා පැරලොයිඩ් බී 72 ද්‍රාවනය 3% ආරක්ෂිත ආලේපයක් ලෙස ගල්වනු ලැබී ය.

**මුල්ගිරිගල රජමහා විහාරය**

මුල්ගිරිගල රජමහා විහාරය හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවාපත්තුවේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට තුළ පිහිටි ලෙන් විහාරයකි. මෙය සද්ධාතිස්ස රජතුමා (ක්‍රි. පූ. 137-119) විසින් කටාරම් සහිත ලෙන් විහාර ඉදිකරවා ඇති අතර පසුව විවිධ අවස්ථාවල දී ප්‍රතිසංස්කරණ සහ නවාංග එකතු කිරීම් සිදු වී ඇත. පසුව මහනුවර අවධියේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස (ක්‍රි. ව. 1747-1780) මෙහි වර්තමාන දියුණුව ආරම්භ වී ඇත. වර්තමානය වන විට සිතුවම් අඳින ලද ලෙන් හතක් මුල්ගිරි විහාරයේ ද දක්නට ඇත. එනම් මහානාග ලෙන් විහාරය, පදුම රහත් විහාරය, රජමහා විහාරය, අළුත් විහාරය, නාග විහාරය, මැද මළු විහාරය හා පිරිනිවන් විහාරයයි. මෙම ලෙන් තුළ ඇති සිතුවම් මහනුවර සම්ප්‍රදායේ දක්ෂිණ ශෛලියේ මුල් කාලීන සිතුවම් ලෙස සැලකේ.

2010 වසර තුළ මෙහි සිදු කරන ලද සංරක්ෂණ කටයුතු වනුයේ සියුම් කෙඳි සහිත බුරුසු, පිරිසිදු ජලය භාවිතයෙන් සිතුවම් ස්ථරය පිරිසිදු කිරීම, 5% කෙමික්‍රිල් ද්‍රාවණය මගින් සිතුවම් පතුරු ඇලවීම, සුදුසු බන්ධන මාධ්‍යය භාවිතයෙන් ගර්ත හා පිපිරීම් පුරවා තහවුරු කිරීම. වේ හානි මර්දනය සඳහා රසායන ද්‍රව්‍ය යෙදීම, අලුත් විහාරයේ කඩා වැටුණු සිතුවම් කොටස තහවුරු කිරීම හා පොයින්ට් කිරීම යන කාර්යයන් ය.

**මාතර දිස්ත්‍රික්කය**

**මිරිස්ස සමුද්‍රගිරි විහාරය**

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විහාරස්ථානයකි. 19 වන සියවසට අයත් පහතරට සිතුවම් ශෛලියේ උසස් චිත්‍ර සම්ප්‍රදායක් මෙම විහාරයේ ප්‍රතිමා මන්දිරයේ දක්නට ලැබේ. සිතුවම් ස්ථරය සියුම් කෙඳි සහිත බුරුසු, හා පිරිසිදු ජලය භාවිතයෙන් පිරිසිදු කිරීම, පැනසයිට් 1% ද්‍රාවණයෙන් සිතුවම් ස්ථරය මත වැඩී තිබුණු ඇල්ගී ඉවත් කිරීම, බදාම ස්ථරයේ ගර්ත හා පිපිරීම් නව බදාමයක් යොදා තහවුරු කිරීම යන සංරක්ෂණ කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලැබී ය. ඊට අමතරව ඉහත බදාම මාධ්‍යය

භාවිතයෙන් මකර තොරණේ කැඩී බිඳී ගිය ස්ථාන ද සකස් කරන ලදි. බදාම ස්ථරය හා ආධාරකය අතර බන්ධන මාධ්‍යය දුර්වල වීම නිසා බිත්තිවල ඇතැම් ස්ථාන බොල් වී තිබිණි. ඒ සඳහා සිතුවම් ස්ථරය කොටස්කර ඉවත් කොට බොල් සහිත ස්ථාන, බදාම මාධ්‍යයෙන් පුරවා නැවත එම කොටස් අලවා තහවුරු කරනු ලැබී ය.

**පොල්වත්ත ගංගාරාම පුරාණ විහාරය**

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්වත්ත ග්‍රාමසේවා වසමෙහි පිහිටි විහාරස්ථානයකි. මෙහි විශාල දෙමහල් විහාර මන්දිරයක් ඇත. එහි දොරටුවලට ඉහළින් මකර තොරණ යොදා ඇති අතර ඒවායේ විශේෂත්වය වනුයේ මකර තොරණ මැද යොදන කිඹිසි මුහුණ වෙනුවට සිංහ මුහුණු යොදා තිබීමයි. දොරටුව අසළ සිංහ පූට්ටුව, පිච්ච වැල් ආකාරයට යෙදූ ලියවැල් දක්නට ඇත. විහාරයේ ඇතුළු මාලය ද සිතුවම් සහිත ය. එහි ඇති සිතුවම් අතර සතරවරම් දෙවියන් හා පිරිවර දැක්වෙන සිතුවම, වන්දනාවේ යන රහතුන් වහන්සේලා වැනි සිතුවම් වැදගත් වේ. මෙහි සිතුවම් සඳහා සියුම් රේඛා භාවිත කර තිබීම විශේෂ ලක්‍ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය. ඇතුළු මාලයේ අඩි 44 ක් දිග සැතපෙන බුදු පිළිමයක් දැකගත හැකි අතර විෂ්ණු සහ කතරගම යන දෙවිවරුන්ගේ ප්‍රතිමාවන් ද ඇත.

මෙම විහාරස්ථානයේ සිතුවම්වල වර්ණ ස්ථරය මත වූ මකුළු දැල්, දූහුවිලි ආදී අපද්‍රව්‍ය සියුම් කෙඳි සහිත බුරුසුවකින් ඉවත් කොට පිරිසිදු ජලය ආධාරයෙන් තවදුරටත් පිරිසිදු කරන ලදි. පතුරු ගිලිහී යමින් පැවති සිතුවම් කොටස් 5% පොලිවීනයිල් ඇසිටේට් ද්‍රාවණයකින් අලවා තහවුරු කරනු ලැබී ය. බදාම ස්ථරයේ වූ ගර්ත හා පිපිරීම් සුදුසු බන්ධන මාධ්‍යයකින් පුරවන ලදි. සිතුවම් ස්ථරය මත වූ ඇල්ගී ඉවත් කරන ලද්දේ පැනසයිට් ද්‍රාවණයකිනි.

මකර තොරණේ කැඩී බිඳී ගිය ස්ථාන සුදුසු බදාමයකින් පුරවා තහවුරු කිරීමත්, ප්‍රධාන සැතපෙන ප්‍රතිමාව, අනෙකුත් බුද්ධ ප්‍රතිමා හා දේව ප්‍රතිමා පිරිසිදු කර ආරක්ෂිත ආලේපය ගැල්වීමත්, මූර්තිවල දක්නට ලැබුණු වේ හානි මර්දනය සඳහා රසායනික පිළියම් යෙදීමත් මෙම වසර තුළ දී සිදු කරන ලදි.

**වලස්ගල ජයවර්ධන මුදලින්දාරාම පුරාණ විහාරය**

මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වලස්ගල නැගෙනහිර ග්‍රාමසේවා වසමේ පිහිටි විහාරස්ථානයකි. මෙම විහාරස්ථානයේ විහාර මන්දිරයේ ඇති සිතුවම් සහ මූර්ති මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියට අයත් ඒවා වේ. මෙහි සංරක්‍ෂණ කටයුතුවල දී ප්‍රථමයෙන් ම සියුම් කෙඳි සහිත බුරුසු ආධාරයෙන් වර්ණ ස්ථරය මත ඇති මකුළු දැල්, දූහුවිලි අංශු ආදිය ඉවත් කොට මූලික වශයෙන් පිරිසිදු කරනු ලැබී ය. තදින් බැඳී තිබූ කාබන් අංශු, දූහුවිලි අංශු ආදිය ඉවත් කිරීම සඳහා භාවිත කරන ලද්දේ 5% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකි. 5% පොලිවීනයිල් ඇසිටේට් ද්‍රාවණය මගින් සිතුවම්වල ගිලිහෙමින් පැවති පතුරු අලවා තහවුරු කරන ලදි. එසේ ම සුදුසු බදාම මාධ්‍යයක් භාවිතයෙන් ගර්ත හා පිපිරී ගිය ස්ථාන පුරවා තහවුරු කරන ලදි. ඉහත බදාම මාධ්‍යය භාවිතයෙන් මකර තොරණේ කැඩී බිඳී ගිය ස්ථාන නැවත සකස් කරන ලද අතර මුර රූප, සිංහ රූප ඒ අතර ප්‍රධාන වේ.

## වයඹ පළාත

### කුරුණෑගල දිස්ත්‍රික්කය

### නුවර කන්ද පුරාණ විහාරය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙන් විහාරයකි. මෙහි මහනුවර අවධියේ ඉදිකරන ලදැයි සැලකිය හැකි සැතපෙන බුද්ධ ප්‍රතිමාවක්, සමාධි ප්‍රතිමා දෙකක් දැකිය හැකි වන අතර එම ප්‍රතිමා අවසන් බදාම ස්ථරය යොදා නොමැති වැඩ නිම නො කළ ප්‍රතිමා වීම විශේෂත්වයකි. එසේ ම පැරණි බිතුසිතුවම් ද මෙහි දැකිය නො හැකි ය.

මෙහි ප්‍රතිමා නිධන් සොරුන් විසින් විනාශ කරනු ලැබ තිබිණ. එසේ කැඩී ගිය කැබලි කොටස් එක්කර පැරණි බදාමයට සමාන බදාමයක් සකස් කර ඒ මත නැවත ඇලවීමේ කටයුතු මෙම වසර තුළ දී සිදු කරනු ලැබිය.

### දේවගිරි පුරණ විහාරය

දේවගිරි පුරාණ විහාරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ටැම්පිට විහාරයකි. අවට විසිරී ඇති ශෛලමය පුරාවස්තු අනුව මෙම ස්ථානය අනුරාධපුර අවධියේ ආරම්භ වූවක් බවට සැලකිය හැකි ය. මෙය දෙමහල් විහාරයක් වන අතර ඉහළ මාලය විහාරගෙය වශයෙන් ද පහත මාලය ධර්මශාලාව වශයෙන් ද භාවිත කරයි. ඉහළ මාලය ඇතුළු මාලය සහ පිටත මාලය වශයෙන් කොටස් දෙකකි. මින් පිටත මාලයේ පමණක් මහනුවර අවධියට සමාන සිතුවම් හා මූර්ති ශේෂ වී ඇත. ඇතුළු මාලයේ සියලු සිතුවම් හා මූර්ති නවීකරණය කර ඇත.

මෙය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මීට ඉහත දී ද සංරක්ෂණය කරන ලද ස්ථානයකි. එවැනි පූර්ව මැදිහත්වීම්වල දී අවිධිමත් ලෙස සකස් කරන ලද ස්ථාන හා සිමෙන්ති යොදා පුරවා තිබූ ස්ථාන ඉවත් කර පැරණි බදාමයට සරිලන ලෙස සකස් කරගත් නව බදාමයකින් පුරවා තහවුරු කිරීම මෙම වසර තුළ දී සිදු කරනු ලැබීය. එමෙන් ම සිතුවම් සහ මූර්ති මත වූ කුඹල් ගෙවල්, වේ දළු, මකුළුදැල් ඉවත් කොට පිරිසිදු කිරීමත්, සිතුවම් ස්ථරයේ පතුරු ගිලිහෙමින් තිබූ ස්ථාන පොලිවීනයිල් ඇසිටේට් හා ජලය මිශ්‍රකර තනාගත් බන්ධන මාධ්‍යයකින් කුඩා පින්සල් උපයෝගී කරගෙන ඇලවීමත්, බදාමයේ බොල් වූ ස්ථාන ශක්තිමත් කිරීමත් කරනු ලැබී ය. විශාල වශයෙන් පැවති කෘමිහානි මර්දනය සඳහා කෘමිනාශක යෙදීම මෙහි සංරක්ෂණ කාර්යාවලියේ අවසන් පියවර විය.

### යක්ගිරිලෙන පුරාණ විහාරය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙන් විහාරයකි. ගල්ලෙන් විහාර දෙකකින් සමන්විත විහාරයක් වූ මෙහි මහනුවර සම්ප්‍රදායට සමාන සිතුවම් හා මූර්ති නිර්මාණය කර ඇත. මෙහි ප්‍රධාන සැතපෙන ප්‍රතිමාවේ කොට්ටය, සිරස හා ළය ද මකර තොරණ ද සමාධි ප්‍රතිමාව ද නිධන් සොරුන් විසින් විනාශ කරනු ලැබ තිබිණ.

එම ප්‍රතිමාවල කැඩීගිය කොටස් එක්රැස් කර පැරණි බදාමයට සරිලන ලෙස සකස් කරගත් නව බදාමයක් මතට ගෙන සම්බන්ධ කිරීමෙන් තහවුරු කරනු ලැබී ය. එසේ ම වර්ණ ස්ථරයේ පතුරු ගිලිහෙමින් තිබූ ස්ථාන අලවා තහවුරු කිරීම, සිතුවම් හා මූර්ති මතුපිට ස්ථරයේ වූ අපද්‍රව්‍ය යාන්ත්‍රික ක්‍රම මගින් පිරිසිදු කිරීම ද සිදු කරනු ලැබූ අතර අවසාන වශයෙන් කෘමිනාශක යෙදීමෙන් කෘමි හානි මර්ධනය කරන ලදී.

**කලාඹු වෙහෙරගල පුරාණ විහාරය**

කලාඹු වෙහෙරගල පුරාණ විහාරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පැරණි සිද්ධස්ථානයකි. මෙය ද අවට විසිරී ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව අනුරාධපුර අවධිය දක්වා දිවෙන ඉතිහාසයක් සහිත ස්ථානයක් බවට අනුමාන කළ හැකි ය. නමුත් මෙහි වර්තමානය වනවිට දක්නට ඇති විහාර මන්දිරය ඇතුළු මාලය සහ පිටත මාලය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වූ මහනුවර අවධියට අයත් සිතුවම් හා මූර්තිවලින් අලංකාර කරන ලද ගොඩනැගිල්ලකි. සමහර සිතුවම් සහ මූර්ති නවීකරණය කර ඇත.

මෙහි ප්‍රධාන සමාධි ප්‍රතිමාවේ උදරය, ආසනය, හිටි බුද්ධ ප්‍රතිමාවේ දකුණු අත නිධන් සොරුන් විසින් විනාශ කර දමා තිබූ අතර එම ප්‍රතිමා තහවුරු කිරීමත් සිතුවම් හා මූර්ති මත බැඳී පැවති අපද්‍රව්‍ය රසායනික ප්‍රතිකර්ම මගින් පිරිසිදු කිරීමත් මෙම වසර තුළ දී සිදු කරනු ලැබූ සංරක්ෂණ කාර්යයන් වේ.

**රුස්වෙහෙර රජමහා විහාරය**

රුස්වෙහෙර රජමහා විහාරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. මෙහි ලෙන් දෙකක ඇති මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් සහ මූර්ති මෙම වසර තුළ දී සංරක්ෂණය කරනු ලැබී ය. ගල්වියනෙහි වූ සිතුවම් විශාල වශයෙන් බොල්වීම, පතුරු ගිලිහී යාම හා දිලීර වර්ධනය නිසා විනාශයට ලක්වෙමින් පැවතුණි. ප්‍රධාන සැතපෙන පිළිමයේ සිවුරු රැළි, ප්‍රතිමාවල ආසන ආදිය කැඩී බිඳී ගොස් තිබිණ. එසේ ම වේයන් විසින් ද හානි පමුණුවා ඇත. ඒ අනුව බදාමය සහ වර්ණ ස්ථරය තහවුරු කිරීම, කැඩී බිඳී ගිය කොටස් සුදුසු නව බදාමයකින් පිරවීම, කෘමිනාශක යෙදීම යන සංරක්ෂණ කටයුතු මෙහි දී සිදු කරන ලදී.

**මයිලෑව ශ්‍රී ශෛල බිම්බාරාම විහාරය**

මෙම විහාරස්ථානය පිහිටා ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ය. මෙය ද ලෙන් විහාරයක් වන අතර එය මාල දෙකකින් යුතු වේ. එහි එක් කොටසක මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් හා මූර්ති දක්නට ලැබෙන අතර සෙසු ප්‍රතිමා හා සිතුවම් මෑතකාලීන වේ.

සියලු ම මූර්තිවල, ආසනවල හා බිත්තිවල කැඩී බිඳී ගිය ස්ථාන පැරණි බදාමයට සරිලන නව බදාමයකින් පුරවා තහවුරු කිරීම, වර්ණ ස්ථරයේ පතුරු ගිලිහෙන ස්ථාන අලවා තහවුරු කිරීම,

බදාමය බොල් වූ ස්ථාන ශක්තිමත් කිරීම හා කෘමිනාශක යෙදීම යන සංරක්ෂණ කටයුතු මෙම වසර තුළ දී සිදු කරනු ලැබීය.

**කෝන්දුරුවාපොළ ටැම්පිට විහාරය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ටැම්පිට විහාරයකි. මෙය දිගින් මීටර් 5.75 ක් හා පළලින් මීටර් 4.25 ක් පමණ වන අතර ඇතුළු මාලය හා පිටත මාලය වශයෙන් කොටස් දෙකකි. මහනුවර අවධියේ දී මෙය ඉදිකර ඇත. එසේ ම සිතුවම් සහිත බිත්ති පුපුරා යාම, වර්ණ ස්ථරය පතුරු වශයෙන් ගිලිහී යාම හා කුඩු බවට පත්වීම, මතුපිට අපද්‍රව්‍ය තැන්පත්වීම වැනි හායන තත්වයන් සඳහා මූලික ප්‍රතිකර්ම යෙදීම සිදු කරනු ලැබීය. පිළිසකර කරන ලද ප්‍රතිමාවල අවසන් බදාම ස්ථරය යෙදීම හා සිතුවම් හා මූර්ති පිරිසිදු කිරීමේ කටයුතු ඉදිරි වසර තුළ දී සිදු කිරීමට අපේක්ෂිත ය.



කෝන්දුරුවාපොළ ටැම්පිට විහාරය



නිධන් සොරුන් විසින් විනාශ කර ඇති බුදු පිළිමයක්



එම බුදු පිළිමය සංරක්ෂණය අතරතුර

**පාදෙණිය රජමහා විහාරය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාදෙණිය රජමහා විහාරය පිහිටා ඇත. උස් ගල්තලාවක් මත මාල දෙකකින් යුතුව ඉදිකර ඇති විහාරයකි. එහි ඇතුළු මාලයේ පමණක් සිතුවම් හා මූර්ති දක්නට ඇති අතර පිටත මාලයේ දැකිය හැක්කේ මූර්ති පමණකි. මෙම නිර්මාණ මහනුවර සම්ප්‍රදායට සමානත්වයක් දක්වයි.

සිතුවම් හා මූර්ති මතුපිට පිරිසිදු කිරීම, වර්ණ ස්ථරයේ පතුරු ගිලිහී ගිය ස්ථාන ඇලවීම, බොල් වූ ස්ථාන ශක්තිමත් කිරීම, කැඩී බිඳී ගිය ස්ථාන නව බදාමයකින් පිරවීම හා කෘමිනාශක යෙදීම යන සංරක්ෂණ කාර්යයන් මෙහි දී සිදු කරනු ලැබීය.

## උතුරු මැද පළාත

### අනුරාධපුර දිස්ත්‍රික්කය

**වෙස්සගිරිය**

ආරක්ෂිත ස්මාරකයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති මෙම ස්ථානය අනුරාධපුර අවධියට අයත් පැරණි සිතුවම් ශේෂ වී ඇති ස්ථාන අතලොස්ස අතරින් එකකි. උස් ගල් පර්වත දෙකක් මැදින් ඇති විවරය තුළින් ගමන් කළ විට එම පර්වත දෙකෙහි පසුපසින් වම්පස හා දකුණුපස සිතුවම් සහිත ලෙන් දෙකක් දැකිය හැකි ය.

ඉන් වම්පස ලෙනෙහි සිතුවම් රේඛා දක්නට නැතත් වර්ණ ස්ථර කිහිපයක් එකක් මත එකක් වශයෙන් දක්නට ලැබේ. දුඹුරු පැහැයට හුරු රතු සහ කහ ද ඉතා සුළු වශයෙන් කොළ පැහැය ද ශේෂ වූ වර්ණ ස්ථර අතරින් දැකිය හැකි ය. දකුණු පස ලෙනෙහි ද ඉහත ආකාරයෙන් වර්ණ හා සියුම් සුදු පැහැ වර්ණ ස්ථර දක්නට ලැබේ. මෙහි ශේෂ වී ඇති සිතුවම් ස්ථර සහිත කොටස ප්‍රමාණයෙන් දිග අඩි 11 හා පළල අඩි 10 ක් පමණ වර්ග ප්‍රමාණයකින් යුතු වේ. මෙහි සිතුවම් රේඛා පරීක්ෂාකාරීව බැලීමේ දී අතක් ඉහළට ඔසවා සිටින කාන්තා රුවක සලකුණු දක්නට ලැබේ. කොණ්ඩය මල්වලින් සරසා ආභරණ පැළඳ සිටින අයුරු දක්නට ලැබේ. මෙහි තවත් ස්ථානයක කොළ පැහැයෙන් යුතු අතක් දක්නට ඇත. එම අතෙහි ද ආභරණ පැළඳ සිටිනු රේඛා මගින් පෙන්නුම් කරයි.

මෙම සිතුවම් කලින් කල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කොට තහවුරු කර ඇති මුත් සමහර ස්ථානවල නැවතත් වර්ණ සහිත තුනී බදාම ස්ථර කොටස් පතුරු වශයෙන් ගිලිහී යාම ආරම්භ වී පැවතිණ. එසේ ම සිතුවම් හා සියුම් බදාම ස්ථර මත කුඹල් ගෙවල් සහ වෙනත් කෘමි කෝෂ පැවතීම, මකුළුදැල් පැවතීම හා සිතුවම් මත දුහුවිලි ආදී ආගන්තුක ද්‍රව්‍ය තැන්පත්වීම ද මෙහි පැවැත්මට තර්ජනයක් වේ. ලෙන් දෙකෙහි ම ඉහළ කටාරමෙන් වැසි දිය කාන්දුවන තත්වයක් දක්නට ලැබුණු නමුත් සිතුවම්වලට ඉන් බලපෑමක් වී ඇති බව දක්නට නො ලැබුණි. නමුත් අවට පරිසරයෙන් උණුසුම් සුළං ලෙන් තුළට ගලා ඒම නිසා අධික උණුසුම් බවක් දිවා කාලය තුළ ඇතිවීම සිතුවම් ස්ථරයේ පැවැත්මට තර්ජනයකි.

සිතුවම් සහිත බදාම ස්ථරවල පතුරු ගිලිහී යාම ආසන්න ස්ථාන 1:6 පොලිවීනයිල් ඇසිටේට් සහ ජලය මිශ්‍රණයකින් කුඩා පින්සල් ආධාරයෙන් අලවා තහවුරු කරන ලදී. සියුම් බදාම ස්ථරයේ බොල් වූ ස්ථාන අතරට ඉහත මිශ්‍රණය එන්නත් කෙරිණ. එසේ ම සනකමින් යුතු බදාම ස්ථර පවතින ස්ථානවල බදාම ස්ථරය ආරක්ෂා කිරීම සඳහා සුදුසු බදාමයකින් පොයින්ට් කිරීම සිදු කරනු ලැබීය. සිතුවම් මත වූ අපද්‍රව්‍ය ඉවත් කොට පිරිසිදු කිරීමෙන් මෙහි සංරක්ෂණ කටයුතු නිම කරන ලදී.

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**තිවංක පිළිම ගෙය**

ක්‍රි.ව. 12 වන සියවසෙහි දී ඉදිකර ඇති මෙම පිළිම ගෙය පොළොන්නරු අවධියේ සිතුවම් සහ මූර්ති කලාව පිළිබඳ ඇති අද්විතීය නිදසුනයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ඉතිහාසය තුළ කිහිප වතාවක් ම සංරක්ෂණයට භාජනය කරන ලද මෙම සිතුවම් පසුකාලීනව මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ද සංරක්ෂණයට භාජනය කර ඇත. නමුත් නැවතත් මෙහි හායන තත්ත්වයන් ඉස්මතුව තිබූ බැවින් 2010 වසර තුළ දී ද නැවතත් සංරක්ෂණය කරන ලදී. විවිධ බලපෑම් හේතුවෙන් සිතුවම් මතුපිට සීරීම් සහ කුඩා පළුදුවීම් සෑම තැනම පාහේ දක්නට ලැබුණි. තිවංක පිළිමයේ ද ඇතැම් ස්ථානවල මෙවැනි පළුදුවීම් දක්නට ලැබේ. පිළිමය මතුපිට හා සිතුවම් මතුපිට අධික ලෙස දූහුවිලි බැඳීම, සතුන්ගේ වසුරු පතිතවීම, මකුළුදැල් සහ කුඹල් ගෙවල් බැඳීම නිසා අපවිත්‍රව පැවතිණ. එමෙන් ම බදාම ස්ථරයට කෘමීන්ගෙන් හානි පැමිණි ඇත. ඉහත හායන තත්වයන් සඳහා පිළියම් යෙදීම මෙම වසර තුළ දී සිදු කරනු ලැබීය.

**පුල්ලිගොඩ**

දිඹුලාගලට ආසන්නව පිහිටි කුඩා කඳුගැටයක් මත වූ ලෙනක් තුළ ශේෂ වී ඇති දේවරූප පෙළක් නිරූපිත සිතුවම් කොටස අනුරාධපුර අවධියේ අවසාන භාගයට හෝ පොළොන්නරුව අවධිය නියෝජනය කරන බව විද්වතුන්ගේ පිළිගැනීමයි. එරමිණියා ගොතාගෙන පද්මාසනය මත හිඳ සිටින මෙම දෙව්රූපවල මකුඨය තිවංක පිළිමගේ දෙව්රූපවල මකුඨයට බොහෝ දුරට සමාන ය. මෙම සිතුවම් ද කිහිප වරක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණයට භාජනය කර තිබේ. නමුත් නැවතත් බදාම ස්ථරයේ කොටස් ගිලිහී යාම, කෘමි හානි හා කුඹල් ගෙවල් හා මකුළු දැල් බැඳීම නිසා සංරක්ෂණය කළ යුතු තත්වයට පත්ව තිබිණ.

මේ අනුව 2010 වසර තුළ දී බදාම සහ සිතුවම් කොටස් රසායනිකව තහවුරු කොට කෘමි හානි වැළැක්වීම සඳහා කෘමිනාශක යෙදීම සිදු කරන ලදී.





පුල්ලිගොඩ සිතුවම් : රසායන ද්‍රව්‍ය එන්නත් කර තහවුරු කරමින්

## ඌව පළාත

### බදුල්ල දිස්ත්‍රික්කය

### මහගම පුරාණ විහාරය

බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියැද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මහගම පුරාණ විහාරයේ විහාර මන්දිරය ඇතුළත මාලය හා පිටත මාලය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එහි ඇතුළු මාලය සක්කගල්, වැලි හා මැටි උපයෝගී කරගෙන නිමකර ඇත. වට මාලය මෑත කාලීනව ගඩොලින් බඳින ලද්දකි. මහනුවර සම්ප්‍රදායට සමාන වූ සිතුවම් හා මූර්තිවලින් සමන්විත වේ.

ප්‍රථමයෙන් ම වර්ණ ස්ථරයෙහි පතුරු ගිලිහෙමින් තිබූ ස්ථාන අලවා තහවුරු කොට සිතුවම් සහ මූර්තිවල මතුපිට ස්ථරයෙහි වූ පහන් දැළි සහ වෙනත් අපද්‍රව්‍ය රසායනිකව ඉවත්කොට පවිත්‍ර කෙරිණ. අඩි 5 ක් පමණ උසැති හිටි පිළිම දෙකක් ආධාරකයෙන් ගැලවීමට ආසන්න තත්වයේ පැවතුණු අතර එය නැවත ආධාරකයට සවිකර ශක්තිමත් කරනු ලැබීය. එම පිළිම දෙක තව දුරටත් ශක්තිමත් වීම සඳහා ආධාරකයට සම්බන්ධ වන සේ පිළිමය තුළින් කුහරයක් විද දැව හෝ සුදු යකඩ යෙදීම ඉදිරියේ දී කළ යුතුව ඇත. ආධාරකයත් බදාමයත් අතර බොල් වූ ස්ථාන ශක්තිමත් කරන ලද්දේ රසායනික බන්ධන මාධ්‍යයක් එන්නත් කිරීමෙනි. එමෙන් ම මූර්තිවල කැඩී බිඳී ගිය කොටස් සුදුසු නව බදාමයකින් පුරවා තහවුරු කිරීම ද සිදු කෙරිණ.

### මොණරාගල දිස්ත්‍රික්කය

### වත්තේගම පුරාණ විහාරය (කොටියාගල පුරාණ විහාරය)

මෙම විහාරය මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය කොට්ඨාසය තුළ පිහිටා ඇත. මැටි, වැලි හා සක්කගල් උපයෝගී කරගෙන ඉදිකොට ඇති මෙහි විහාර මන්දිරය ඇතුළු මාලය හා පිටත මාලය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. මෙහි මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් හා මූර්ති නිර්මාණය කර ඇත.

මෙහි සියලු සිතුවම් හා මූර්ති මත බැඳී තිබුණු මකුළුදැල්, වේ දළු සහ වෙනත් අපද්‍රව්‍ය යාන්ත්‍රික ක්‍රම මගින් ඉවත් කිරීම ප්‍රථමයෙන් ම සිදු කරන ලදී. සියලු ම මූර්තිවල බදාමය කැඩී බිඳී ගිය ස්ථාන පැරණි බදාමයට සරිලන සේ හුඹස් මැටි සිහින් හුණු හා බන්ධන මාධ්‍යයක් මිශ්‍රකොට තනාගත් බදාමයක් මගින් පිරවීමෙන් තහවුරු කරන ලදී. බොල් වූ ස්ථාන ශක්තිමත් කිරීම සඳහා රසායන ද්‍රව්‍ය සිරින්ජර් මාර්ගයෙන් එන්නත් කිරීම ද වේයන් මර්දනය සඳහා කෘමිනාශක යෙදීම ද මෙහි සිදු කරන ලද සෙසු සංරක්ෂණ කාර්යයන් වේ.



සංරක්ෂණයට පෙර




සංරක්ෂණයට පසු

**බදුල්ලගම්මන පුරාණ විහාරය**

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි පැරණි විහාරස්ථානයකි. මෙහි විහාර මන්දිරය ඇතුළු මාලය හා පිටත වශයෙන් කොටස් දෙකකින් යුතු වේ. ඇතුළු මාලයේ බිත්ති වැලි, මැටි, සක්කගල් ආදිය උපයෝගී කරගෙන ගොඩනංවා ඇත. මෑත කාලීනව කළ කෙටි ගඩොල් බැම්මකින් වට මාලය සමන්විත වේ.

මෙම විහාරයේ මූර්ති නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසුවීම නිසා විනාශ කර දමා තිබිණ. ප්‍රථමයෙන් ම එම කැඩුණු බිඳුණු ස්ථාන සුදුසු බදාමයකින් පුරවා කැඩී ගිය කැබලි එක්රැස් කොට එම කැබලි මූර්ති මතට නැවත සම්බන්ධ කරනු ලැබී ය. එසේ ම ආධාරකයේ පිපිරීම් සිදුව තිබූ ස්ථානවලට රසායන ද්‍රව්‍ය එන්නත් කොට තහවුරු කරන ලදී. සිතුවම් ස්ථරය මත තිබූ අපද්‍රව්‍ය ඉවත් කිරීම ද වේයන් මර්දනය සඳහා කෘමිනාශක යෙදීම ද මෙහි සිදු කරන ලද සෙසු සංරක්ෂණ කාර්යයන් වේ.



නිධන් සොරුන්ගේ ග්‍රහණයට ලක් වූ සමාධි  බුදු පිළිමයක්





සංරක්ෂණය කරන අතරතුර

**මයුරගිරිය පුරාණ ලෙන් විහාරය**

කටාරම් කොටන ලද ලෙන් විශාල සංඛ්‍යාවකින් හෙබි මෙම ලෙන් විහාරය මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත.

මෙම ලෙන් විහාරයේ ඇති සියලු ම මූර්ති නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසුවීම නිසා විනාශයට පත්වී ඇත. මෙහි සිතුවම් අතරින් සුලබව දක්නට ඇත්තේ වියන් සිතුවම් වේ. මෙම සිතුවම් ස්ථරයේ කොටස් විශාල වශයෙන් ගැලවී ඉවත් වී ඇති අතර විශාල වශයෙන් අපද්‍රව්‍ය තැන්පත්වීම ද වර්ණ ස්ථරයේ පතුරු ගිලිහී යාම ද සිදු වෙමින් පවතී. එමෙන් ම කුඹල් ගෙවල් සහ වවුලන් ලැගීම මගින් ද සිතුවම්වලට හා මූර්තිවලට හානි පැමිණේ. වර්ෂාව සහිත කාලවල දී ආධාරකයට යටින් ජලය ගලායාම හා උල්පත් පැන නැගීම නිසා ආධාරකයේ විශාල කොටසකට හානි පැමිණී ඇති අතර වර්ණ ස්ථරය මත ඇල්ගී වර්ධනය ද සිදු වේ.

ප්‍රධාන සැතපෙන පිළිමය, ආසනය, ආධාරකය, දෙපස සිංහරූප, දොරටුපාල රූප සහ පිටත ආධාරකයේ බදාමයට පුරවා තහවුරු කිරීම මෙම වසර තුළ දී සිදු කරනු ලැබීය. 2009 වසරේ දී ප්‍රධාන සැතපෙන පිළිමය විනාශ වී ගිය විශාල කොටසක් තහවුරු කර තිබිණ. එසේ ම වර්ණ ස්ථරයේ තහවුරු කිරීමේ කටයුතු ද සිදු කරන ලදී. ලෙනට ඉහළින් වැසි ජලය ගලාගෙන ඒම වැළැක්වීම සඳහා ලෙනට ඉහළින් කොන්ක්‍රීට් බැම්මක් බැඳීම සිදු කරන ලදී. අවසාන වශයෙන් වේයන් මර්දනය සඳහා කෘමිනාශක යොදනු ලැබී ය. මෙහි සිතුවම් සහ මූර්ති සංරක්ෂණ කටයුතු තවමත් විශාල ප්‍රමාණයක් ඉදිරි වසර තුළ දී සිදු කිරීම අවශ්‍ය වේ.





සංරක්ෂණය කරන අතරතුර

**මුප්පනේ රජමහා විහාරය (විහාරමුල්ල විහාරය)**

මුප්පනේ රජමහා විහාරය මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි පැරණි රජමහා විහාරයකි. මෙහි ඇති විහාර මන්දිරය මහනුවර අවධියේ ඉදිකරන ලද්දක් වන අතර සිතුවම් හා මූර්ති ද මහනුවර සම්ප්‍රදායට අයත් වේ. ඇතුළත හා පිටත වශයෙන් මාල දෙකකින් යුතු වරිච්චි බිත්තියෙන් කරන ලද විහාරයකි.

මෙම විහාරයේ සිදු කළ සංරක්ෂණ කාර්යාවලියේ දී ප්‍රථමයෙන් ම සිතුවම් හා මූර්ති මතුපිට වූ මකුළුදැල්, වේ දළු හා අපද්‍රව්‍ය යාන්ත්‍රික ක්‍රම මගින් ඉවත් කිරීම සිදු කෙරිණ. නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසු වී තිබූ ප්‍රධාන සමාධි පිළිමයේ සිරස, ළය පෙදෙස අත් හා ආසනය යනාදී කොටස් ද, මකර තොරණේ කැඩුණු බිඳුණු කොටස් ද සුදුසු බදාමයකින් පුරවා තහවුරු කරන ලදී. අවසාන වශයෙන් වේයන් මර්දනය සඳහා කෘමි නාශක යොදනු ලැබීය.

## සබරගමුව පළාත

### කෑගල්ල දිස්ත්‍රික්කය

### කවුඩුගම රජමහා විහාරය

ගල්ලෙන් විහාරස්ථානයක් වූ කවුඩුගම රජමහා විහාරය කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත. කඳු මුදුණක් මත පිහිටි ගල්ලෙනක ඇතුළු මාලය සහ පිටත මාලය වශයෙන් කොටස් දෙකකින් යුතුව නිර්මාණය කර ඇති විහාරගෙයි ඇතුළු මාලයේ පමණක් මහනුවර සම්ප්‍රදායට සමාන සිතුවම් හා මූර්ති ශේෂව පවතී.

මෙහි බිත්තිවල පහළ කොටසේ ඇති සිතුවම්වලට විශාල වශයෙන් හානි පැමිණී තිබුණි. සිතුවම් සහිත  බදාමය බොල්වීම, පිපිරීම හා ගිලිහී යාම, වර්ණ ස්ථරය පතුරු ගිලිහී යාම, ප්‍රතිමාවල අත්, සිරස්පත, ආසන, සිවුරු රැළි කැඩී බිඳී යාම, සිතුවම් සහ මූර්ති මත අපද්‍රව්‍ය තැන්පත් වීම හා කෘමි හානි නිසා මෙහි සිතුවම් හා මූර්ති විනාශයට ලක් වෙමින් පැවතුණි. එම හායන තත්වයන් සඳහා  සුදුසු ප්‍රතිකර්ම යොදනු ලැබූ අතර ආරක්ෂිත ආලේපය ගැල්වීම හා කෘමිනාශක යෙදීම යන කාර්යයන් ඉදිරි වසර තුළ දී සිදු කිරීමට අපේක්ෂිත ය.

### අම්බුලුගල පුරාණ ටැම්පිට විහාරය

අම්බුලුගල පුරාණ ටැම්පිට විහාරය කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි දෙමහල් ටැම්පිට විහාරයකි. අඩි නවයක් පමණ උස වූ හතරැස් ගල් කණුවක් මත බාල්ක යොදා ඒ මත පිළිමගෙය ඉදිකර ඇති අතර පහළ මාලය ධර්මශාලාව වශයෙන් භාවිත කරයි. ඉහළ මාලයේ බිත්ති මැටියෙන් හා දැවයෙන් කළ වරිච්චි බිත්තිවලින් යුතුවන අතර එය ආධාර කරගෙන සිතුවම් හා මූර්ති නිම කර ඇත. එමෙන් ම දැව සිවිලිමෙහි ද සිතුවම් නිර්මාණය කර තිබේ. මෙම විහාරය කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජ අවධියේ දී ආරම්භ කර ඇති අතර පහත මාලයේ ගල් කණු එම අවධියට අයත්වන බව සැලකේ. ඉහළ මාලයේ ඇති සිතුවම් සහ මූර්ති මහනුවර අවධියට අයත් වෙයි.

මෙම විහාරයෙහි දක්නට ලැබුණු ප්‍රධානතම හායන තත්වය වූයේ වරිච්චි  බිත්තිවල ඇතුළත දැව කොටස දිරාපත්වීම හේතුකොට බදාමය බොල්බවට පැමිණීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස සිතුවම් සහිත බදාම ස්ථරය පිපිරී ඇතැම් ස්ථානවලින් ගිලිහී ගොස් ඇත. සිවිලිමෙහි වර්ණ ස්ථරයෙහි ද පතුරු වශයෙන් ගිලිහී යාම හා කුඩු බවට පත්වීම සිදු වී ඇත.

එසේම පසුකාලීනව කරන ලද අලුත්වැඩියා කටයුතුවල දී පිටත බිත්තිවල ඇති සිතුවම් හා මූර්ති වැසී යන පරිදි හුණු ආලේප කිරීම නිසා එහි පෞරාණික හා සෞන්දර්යාත්මක අගයට හානි පැමිණී ඇත.

මෙම සිතුවම් හා මූර්තිවල වර්ණ ස්ථරය හා බදාම ස්ථරයෙහි පතුරු ගිලිහී ගිය ස්ථාන ඇලවීමෙන් සහ බදාම ගිලිහී ගිය ස්ථාන සුදුසු බදාමයකින් පිරවීමෙන් තහවුරු කරන ලදී. එමෙන් ම සිතුවම් හා මූර්ති මත තැන්පත්ව තිබූ ආගන්තුක ද්‍රව්‍ය ඉවත් කොට පිරිසිදු කිරීම ද සිදු කෙරිණ.

**රත්නපුර දිස්ත්‍රික්කය**

**කොට්ටිඹුල්වල වළගම්බා පුරාණ විහාරය**

රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිගෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පිහිටි මෙම ලෙන් විහාරයෙහි ඉතිහාසය අනුරාධපුර අවධිය දක්වා දිවෙන අතර නව ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණවලට ලක්වී තිබේ. මෙහි වර්තමානය වනවිට ශේෂව ඇති සිතුවම් සහ මූර්ති 19 වන සියවසේ දී පමණ කරවන ලද බව සැලකේ. මෙම ලෙන තුළ ප්‍රධාන සැතපෙන පිළිමය සහිත ප්‍රධාන කොටස හැරුණුවිට තවත් කුඩා විහාර තුනක් දක්නට ලැබේ.

මෙම විහාරය නිධන් සොරුන් විසින් විනාශ කරනු ලදුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් කිහිප වරක් ම සංරක්ෂණයට භාජනය කර ඇත. නැවත වරක් නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසු වීම නිසා ප්‍රධාන සැතපෙන පිළිමයේ කොට්ටය විනාශ කර දමා තිබිණ. එමෙන් ම සිතුවම් සහිත බිත්තිවල බදාම කොටස් ගිලිහී යාම, ගල් තලයේ සහ දැව වියනේ සිතුවම් පතුරු ගිලිහී යාම, කුඩු බවට පත්වීම, අපද්‍රව්‍ය තැන්පත්වීම දක්නට ලැබුණු අතර දැව වියනේ සිතුවම් සහිත ලෑලි කොටස් දිරා යමින් පැවතිණ. විහාරය ඉදිරිපස දැව කොටසේ දැව සිවිලිම වර්ෂා ජලය කාන්දුවීම මීට හේතුවයි. වේයන්ගෙන් දැඩි හානි නො වුණ ද පරෙවියන් ලැගීම නිසා සිතුවම්වල පැවැත්මට තර්ජනයක්ව පවතී.

නිධන් සොරුන් විනාශ කරන ලද සැතපෙන පිළිමයේ සංරක්ෂණ කටයුතු මෙම වසර තුළ දී සිදු කරන ලදී. කඩා දමා තිබූ කොටස් එක්කොට නව බදාමයක් මත නැවත තිබූ ආකාරයට සම්බන්ධ කිරීමෙන් මෙහි තැහැවිරීමේ කටයුතු සිදු කෙරිණ. සෙසු සංරක්ෂණ කටයුතු ඉදිරි වසර තුළ දී සිදු කිරීමට අපේක්ෂිත ය.

**වළල්ගොඩ ටැම්පිට විහාරය**

රත්නපුර දිස්ත්‍රික්කයෙහි ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වළල්ගොඩ ටැම්පිට විහාරය පිහිටා ඇත. මෙහි ඇති සුවිශේෂත්වය වනුයේ අවධි දෙකකට අයත් සිතුවම් ස්ථර දෙකක් එකක් මතුපිට එකක් වශයෙන් පිහිටා තිබීමයි. මතුපිටින් ඇති සිතුවම් හා මූර්ති මහනුවර අවධියට අයත්වන අතර ඊට යටින් ඇති සිතුවම් ස්ථරය වඩා පැරණි ස්ථරයකි.

මීට පෙර කිහිප වතාවක් ම මෙහි සිතුවම් සහ මූර්ති සංරක්‍ෂණයට භාජනය කර තිබේ. 2010 වසරේ දී සංරක්‍ෂණය කරන අවස්ථාව වනවිට විහාරයේ ඇතුළත සමාධි පිළිමයේ ආසනය නිධන් සොරන් විසින් විනාශ කර දමා තිබිණ. එමෙන් ම බිත්තිවල බදාමය බොල්වීම සහ ඉරිතැලීම ද, ඉදිරිපස මකර තොරණේ හා දොරටුපාල රූපවල වූ කැඩුම් බිඳුම් ද, වර්ණක ස්ථරයේ පතුරු ගැලවීම හා අපද්‍රව්‍ය තැන්පත්වීම ද, කුඹල් ගෙවල් සෑදීම ද, වවුලන් ලැගීම ද නිසා මෙහි සිතුවම් හා මූර්තිවලට හානි පැමිණී තිබිණ. එම හායන තත්වයන් සඳහා ප්‍රතිකර්ම යොදමින් එහි සංරක්‍ෂණ කටයුතු මෙම වසර තුළ දී නිම කරනු ලැබිණ.

## පුරාවස්තු සංරක්‍ෂණය

## බස්නාහිර පළාත

### ගම්පහ දිස්ත්‍රික්කය

### අත්තනගල්ල පාරුව සංරක්‍ෂණය

අත්තනගල්ල ඔයෙන් 1998 වසරේ දී හමු වූ මෙම පාරුව ජාතික කෞතුකාගාරයේ ජල ටැංකියක් තුළ බහා තිබූ අතර 2008 වසරේ දී සංරක්‍ෂණ කටයුතු ආරම්භ කරන ලදී. මේ පිළිබඳ විස්තර 2008 වසර පාලන වාර්තාවෙහි සඳහන් වේ. මුල් සංරක්‍ෂණයෙන් පසු නිරතුරුව දැවයෙහි තෙතමනය හා වියළීමේ දී හැකිලෙන ප්‍රතිශතය මිණුම්ගත කරමින් පසුවිපරම් කටයුතු සිදු කරනු ලැබීය. මෙම පාරුව තාවකාලිකව තැන්පත් කර තිබූ ටැංකියට ඉහළින් වූ වහළයේ තහඩු අබලන්ව පැවතීම නිසා ටැංකිය තුළය ජලය කාන්දු වී තිබූ අතර සංරක්‍ෂණය සඳහා යොදා තිබුණු දැව කුඩු විසිරී යාම නිසා පාරුව තැනින් තැන නිරාවරණය වී පැවතිණ. මෙම වසරේ දී නැවතත් සම්පූර්ණයෙන් ම පාරුව වැසෙනතුරු වියළන ලද දැව කුඩු යොදා තවදුරටත් වියළීමට ලක් කෙරිණ.




අත්තනගල්ල පාරුව බහා ඇති ටැංකියේ වහළ අබලන්ව තිබූ අයුරු



අත්තනගල්ල පාරුව සහ එය බහා ඇති ටැංකිය



දැව කුඩු විසිරී පාරුව නිරාවරණය වී ඇති අයුරු




දැවයට උරාගෙන ඇති තෙතමනයේ ප්‍රතිශතය පරික්ෂා කරමින්



දැව කුඩු යෙදීමෙන් අනතුරුව

**කොළඹ දිස්ත්‍රික්කය**

**කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාරය**

කෝට්ටේ ඒ. ඩබ්. පෙරේරා අනුස්මරණ පුරාවිද්‍යා කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණ කටයුතු 2010 ජූලි මස 10 වන දින සිට 2010 අගෝස්තු 13 වන දින දක්වා සිදු කරන ලදී. මෙම වසර තුළ දී මෘත්තිකාමය කෞතුක භාණ්ඩ 21 ක් සහ රෙදිපිළි කෞතුක භාණ්ඩ සංරක්ෂණයට භාජනය කෙරිණ.




ඒ. ඩබ්. පෙරේරා මහතාගේ උපාධි ලෝගුව

සංරක්ෂණයට භාජනය කරන ලද මෘත්තිකාමය පුරාවස්තූන් එකතුවට මැටි භාජන, මැටි පහන්, පහන් ආධාරක, කෙණ්ඩි, කොත් කැරලි, ගඩොල්, බිම් ගඩොල් සහ උළු කැට ලිඳක මැටි වළලු 4 ක් ඇතුළත් විය. මෙම මැටි භාණ්ඩ පිරිසිදු කිරීම, කැඩුණු කොටස් රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් ඇලවීම, ගිලිහී ගිය කොටස් ප්ලාස්ටර් ඔෆ් පැරිස් භාවිතයෙන් නැවත ගොඩනැගීම සහ එම ස්ථාන වර්ණ මගින් ප්‍රතිජීකීයකරණය කිරීම යන සංරක්ෂණ කාර්යයන් සිදු කරනු ලැබීය.

මීට අමතර ව මෙරට ජාතික නිදහස් සටනේ පුරෝගාමියකු වූ ඒ. ඩබ්. පෙරේරා මහතාගේ උපාධි ලෝගුව මෙම ව්‍යාපෘතිය යටතේ සංරක්ෂණය කරන ලද විශේෂ කෞතුක භාණ්ඩයකි.

**කළුතර දිස්ත්‍රික්කය**

**ලත්පඳුර පාරුව සංරක්ෂණය**

1992 වසරේ දී කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර ලත්පඳුර ප්‍රදේශයේ ඇළකින් හමු වූ පැරණි දැව පාරුවෙහි සංරක්ෂණ කටයුතු 2008 වසරෙහි දී ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව මෙහි තත්වය පසුවිපරම් කරමින් පවත්වාගෙන එනු ලැබීය. 2010 වසරෙහි ඔක්තෝබර් මස මෙය නිරීක්ෂණය කිරීමේ දී පාරුවට යොදා තිබූ ආවරණය අතරින් එක්රැස්ව තිබූ වැසි ජලය ඉවත් කිරීමට සිදු විය. ස්පොන්ජ් භාවිතයෙන් වැසි ජලය ඉවත් කොට එක්රැස් වී තිබුණු වියළි ශාකපත්‍ර ආදිය ද ඉවත් කොට පිරිසිදු කරන ලදී. ප්‍රදර්ශන කුටියක් සකස් කර එම පාරුව මහජන ප්‍රදර්ශනය සඳහා යොමු කරනතුරු එයට නව ආවරණයක් යොදනු ලැබී ය. මෙම පාරුව කුකුළේගඟ යුධහමුදා සාමසාධක නිවාඩු නිකේතනයේ (Laya Leisure - Kukuleganga) තැන්පත් කර ඇත.




පාරුවට යොදා තිබූ ආවරණය ලිහිල් වී ඇති ආකාරය




පාරුවට එක්රැස් වී තිබූ ජලය ඉවත් කරමින්




නව ආවරණයක් යෙදීමෙන් අනතුරුව

## මධ්‍යම පළාත

**මහනුවර දිස්ත්‍රික්කය**

**මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරය**

මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ සිදු කරන ලද පුරාවස්තු සංරක්ෂණ කටයුතුවල දී ප්‍රමුඛතාවය ලබා දෙන ලද්දේ තඹ මිශ්‍ර ලෝහ පුරාකෘති සඳහා ය. මෙහි දී පහත සඳහන් පුරාකෘති සංරක්ෂණයට භාජනය කරන ලදී.

1. කරඬුවක් - ගලගෙදර ප්‍රදේශයෙන් හමු වී ඇත
2. සමාධි බුදු පිළිමයක් - ගලගෙදර ප්‍රදේශයෙන් හමු වී ඇත
3. තඹ තැටි 2 ක් - ගලගෙදර ප්‍රදේශයෙන් හමු වී ඇත
4. හිටි බෝධිසත්ව පිළිමයක් - නාථ දේවාල කැණීමෙන් හමු වී ඇත
5. හිටි බුදු පිළිමයක් - නාථ දේවාල කැණීමෙන් හමු වී ඇත
6. සමාධි බුදු පිළිමයක් - නාථ දේවාල කැණීමෙන් හමු වී ඇත
7. බුද්ධ ශීර්ෂයක් - නාථ දේවාල කැණීමෙන් හමු වී ඇත
8. හිඳි බුදු පිළිමයක් - නාථ දේවාල කැණීමෙන් හමු වී ඇත
9. හිඳි බුදු පිළිමයක් - නාථ දේවාල කැණීමෙන් හමු වී ඇත
10. හිඳි බුදු පිළිමය (ආසනය සහිත)- නාථ දේවාල කැණීමෙන් හමු වී ඇත
11. මූර්ති

කෞතුකාගාරයේ දොරටුව අසළ බිත්තියේ අර්ධ උන්නතව නිම කර ඇති මූර්තිවල මතුපිට බදාමය ගිලිහී ගොස් ඇත. එසේ බදාමය ගිලිහී ගිය ස්ථාන මැටි හා අඹරාගත් වැලි මිශ්‍රණයකින් පුරවනු ලැබී ය. මෙම වසර තුළ දී නිම කරනු ලැබූයේ දකුණුපස බිත්තියේ වූ මූර්තීන් පමණි.

## වයඹ පළාත

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**පඬුවස්නුවර පුරාවිද්‍යා කෞතුකාගාරය**

පඬුවස්නුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ පහත සඳහන් පුරාවස්තු මෙම වසර තුළ දී සංරක්ෂණයට භාජනය කරන ලදී.

1. තඹ මිශ්‍ර ලෝහ පුරාවස්තු
    - කුඩා සමාධි බුදු පිළිම 5
    - හඳුනා නොගත් කුඩා ප්‍රතිමාවක්
    - රෝම කාසි 9
    - චීන කාසි 11
    - තඹ සන්නසක්, පත්ඉරු
    - පක්ෂි රුවක්
    - නිල්ගිරිය ස්තූප කැණීමෙන් හමු වූ භාජනයක කැඩී ගිය කැබලි
    - තඹ වළලු
    - මුදුවක්

2. යකඩ පුරාවස්තු

නිල්ගිරිය ස්තූප කැණීමෙන් හමු වූ යකඩ පාත්‍රයක්

3. කිරිගරුඬ

කිරිගරුඬ කැටයම් පුවරුවක්




කැබලිවලට වෙන් වී තිබුණු යකඩ පාත්‍රය



සංරක්ෂණයෙන් අනතුරුව

## සබරගමු පළාත

### කෑගල්ල දිස්ත්‍රික්කය

### දැදිගම පුරාවිද්‍යා කෞතුකාගාරය

මෙම වසර සඳහා දැදිගම පුරාවිද්‍යා කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණ ව්‍යාපෘතිය 2010 නොවැම්බර් මාසය තුළ දී ක්‍රියාත්මක කරනු ලැබී ය. තඹ මිශ්‍ර ලෝහ, යකඩ හා මෘත්තිකාමය පුරාකෘති 20 ක් පමණ සංරක්ෂණයට භාජනය කෙරිණ. මීට අමතර ව මෙම කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබූ රඹුක්කන මුද්දනාව විහාරයේ දැව උළුවස්සට වේයන්ගෙන් හානි පැමිණී තිබුණි. එමෙන් ම කෞතුකාගාර ගොඩනැගිල්ලේ ද වේයන්ගෙන් හානි පැමිණී තිබූ ස්ථාන සඳහා වේ නාශක යොදනු ලැබී ය.

## ස්මාරක රසායනික සංරක්ෂණය

## ඌව පළාත

### මොණරාගල දිස්ත්‍රික්කය

### බුදුරුවගල ශෛලමය පිළිම

මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි අඩි 60 ක් පමණ උස් වූ ගල්පරයක අර්ධ උන්නතාකාර ශෛලමය ප්‍රතිමා 7 ක් සංරක්ෂණයට භාජනය කරනු ලැබී ය. මැද අඩි 51 ක් පමණ උසැති හිටි බුද්ධ ප්‍රතිමාවකි. මෙහි ආසනයේ උස අඩි 6 ක් පමණ වේ. මෙම පිළිමය ගලෙන් අර්ධ උන්නතව නෙළීමෙන් අනතුරුව මි. මී. 5 ක් පමණ ඝනකමින් යුතු බදාම ස්ථරයක් යොදා මතුපිට වර්ණ ගන්වා තිබූ බව දැනට ශේෂව ඇති බදාම සහ වර්ණ කොටස් සාක්ෂි දරයි. බුද්ධ ප්‍රතිමාවට දෙපසින් තවත් අර්ධ උන්නත ප්‍රතිමා තුන බැගින් නෙළා ඇත. මේ අතරින් දකුණුපසින් ඇති අවලෝකිතේශ්වර බෝධිසත්ව රූපයේ බදාම ස්ථරයේ කොටස් විශාල වශයෙන් ශේෂ වී පවතී.



බුදුරුවගල බෝධිසත්ව ප්‍රතිමා



බුදුරුවගල බෝධිසත්ව ප්‍රතිමා

මැද ඇති ප්‍රධාන හිටි බුද්ධ ප්‍රතිමාවේ ඉහළ අත්වල හා දෙපස විශාල වශයෙන් ඇල්ගි, කුඹල් ගෙවල් හා වෙනත් අපද්‍රව්‍ය දැකිය හැකි විය. හිටි බුද්ධ ප්‍රතිමාවේ දැනට ඉතිරිව ඇති බදාම ස්ථරයේ කොටස් ද තැනින් තැන ගිලිහී යමින් පැවතුණි. වම්පස ඇති පිළිමවලින් මංජු ශ්‍රී බෝසතුන්ගේ යැයි සැලකෙන පිළිමයේ විශාල වශයෙන් ඇල්ගි වර්ධනය වී තිබිණ. බුද්ධ ප්‍රතිමාවට දකුණුපසින් ඇති සුධන කුමරුගේ යැයි සලකන පිළිමයේ ද මතුපිට හරි අඩක් පමණ ඇල්ගි වැඩී ඇත.



බුදුරුවගල බුද්ධ ප්‍රතිමාව

මෙම පිළිම සංරක්ෂණ කාර්යාවලියේ ප්‍රථම අදියර වශයෙන් පිළිම මතුපිට වූ මකුළු දැල්, කුඹල් ගෙවල් කුඩා ශල්‍ය උපකරණ මාර්ගයෙන් ඉවත් කිරීම සිදු කරන ලදී. පිළිම මත වැඩී තිබූ ඇල්ගී හා වෙනත් අපද්‍රව්‍යයන් ද රසායන ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කෙරිණ. අනතුරුව බදාම ස්ථරයේ ගිලිහී යමින් පැවති කොටස් පොයින්ට් කිරීම හා සුදුසු බදාමයෙන් පිරවීම ද සිදු කෙරිණ. අවසාන වශයෙන් දුර්වල වෙමින් පැවති බදාම ස්ථරය සඳහා ආරක්ෂිත ආලේපයක් ගල්වනු ලැබීය.

## උතුරු පළාත

**යාපනය දිස්ත්‍රික්කය**

**යාපනය ලන්දේසි බලකොටුවෙහි කොටු පවුර**

යාපනය ලන්දේසි බලකොටුවෙහි කොටු පවුර මත වැඩී තිබූ ශාක මර්දනය කිරීමේ කටයුතු මෙම වසර තුළ දී සිදු කරනු ලැබීය.

## රසායන සංරක්ෂණ වැඩමුළු

## උතුරු මැද පළාත

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**අනුරාධපුර ඇතුළු නුවර කැණීම් ව්‍යාපෘතියෙහි පුරාවස්තු සංරක්ෂණ පුහුණු වැඩමුළුව**

අනුරාධපුර ඇතුළු නුවර කැණීම් ව්‍යාපෘතියට සමගාමීව පුරාවස්තු සංරක්ෂණ වැඩමුළුවක් 2010 වසරෙහි පෙබරවාරි මස සිට අප්‍රේල් මස දක්වා අනුරාධපුර පුරාවිද්‍යා දත්ත විශ්ලේෂණාගාරයේ දී පවත්වන ලදී. මෙය ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ජර්මනියෙහි ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලය ඒකාබද්ධව සංවිධානය කරන ලද ව්‍යාපෘතියක දෙවන අදියරයි.

සංරක්ෂණ පුහුණු වැඩමුළුව මෙහෙයවන ලද්දේ ජර්මනියෙහි ව්‍යවහාරිකවිද්‍යා විශ්වවිද්‍යාලයෙහි මෝස්තර, සංරක්ෂණ හා කැණීම් පීඨයෙහි පීඨාධිපති මහාචාර්ය මැතියාස් ක්නොට් විසිනි. ජර්මානු සිසුවියන් තිදෙනෙකු සහ ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි රසායන සංරක්ෂණ අංශයෙහි නිලධාරිනියන් තිදෙනෙකු මෙහි දී පුහුණුව ලැබූහ. ඊට අමතර ව පුරාවස්තු අනුකෘති නිර්මාණය පිළිබඳ වැඩමුළුවක් ද පවත්වනු ලැබූ අතර එය ප්‍රධාන කාර්යාලයේ දී පවත්වන ලදී.

# අභිලේඛන හා නාණක විද්‍යා අංශය

අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් 2010 වර්ෂයේ දී ව්‍යාපෘති පහක් ක්‍රියාත්මක කරන ලදී. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

I. ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය
II. ශිලාලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය
III. ශිලාලේඛන පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය
IV. කාසි සුචිගත කිරීමේ ව්‍යාපෘතිය
V. අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය

**I. ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය**

2010 වර්ෂයේ දී උක්ත ව්‍යාපෘතිය යටතේ ශිලාලේඛන 19 ක් පිටපත් කර ඇත. ලංකාවේ විවිධ ප්‍රදේශවලින් පිටපත් කර ඇති මේ ශිලා ලිපි පිළිබඳ විස්තර පහත පරිදි වේ.

බස්නාහිර පළාත - 2010 වර්ෂයේ දී අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් ශිලා ලේඛන තුනක් බස්නාහිර පළාතින් සොයා ගෙන පිටපත් කර ඇත. මේ ලිපි තුන ම කළුතර දිස්ත්‍රික්කයට අයත් වේ.

කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගැලණිගම හන්දිය අසලින් පුවරු ලිපියක් පිටපත් කර ඇත. පේළි අටකින් යුතු මේ ලිපියේ අක්ෂර හා භාෂාව නූතන සිංහල වන අතර, ක්‍රිස්තු වර්ෂ 19 වන සියවසට අයත් වේ. ඉඩම් ප්‍රදානයක් පිළිබඳ ප්‍රස්තුත ලිපියේ සඳහන් ය.

කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොඹගොඩ ග්‍රාම නිලධාරී වසමේ, ගනේකන්ද පුරාණ විහාර භූමියෙන් පිටපත් කර ඇති ගිරි ලිපිය ක්‍රිස්තු වර්ෂ 19 සියවසට අයත් අතර අක්ෂර හා භාෂාව නූතන සිංහල වේ.

කළුතර මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉළඹුගොඩ ග්‍රාමසේවා නිලධාරී වසමේ කෙසෙල්හේනාවෙන් පිටපත් කළ පුවරු ලිපිය ද ක්‍රිස්තු වර්ෂ 19 සියවසට අයත් වූවකි. අක්ෂර හා භාෂාව නූතන සිංහල වන අතර, අක්ෂර පේළි පහකින් යුක්ත වේ.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2010. 07.27 | පුවරු | කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ගැලණිගම ග්‍රාම නිලධාරී වසමේ ගැලණිගම හන්දිය අසල පැරණි අම්බලම | නූතන සිංහල | නූතන සිංහල | ක්‍රිස්තු වර්ෂ 19 සියවස | 1851<br>1. 6 මාසේ 18<br>2. ගැලණිගම පදිංචි හේ<br>3. වාගේ කොරනේ<br>4. ලිස් අප්පු විසිං මෙ<br>5. ඉඩම නිවං පිණි<br>6. ස පිනට ඇරියාය<br>7. ........ අයටත්<br>8. නිවං සිදුවෙව |
| 2010. 07.28 | ගිරි | කළුතර දිස්ත්‍රික්කයේ, වැල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොඹගොඩ ග්‍රාම සේවා නිලධාරී වසමේ ගණේකන්ද පුරාණ විහාරයේ ලෙන් විහාරය අසල වම් පැත්තේ පිහිටි ගල් තලාවේ | නූතන සිංහල | නූතන සිංහල | ක්‍රිස්තු වර්ෂ 19 සියවස | 1. ................<br>2. සග ..........<br>3. ................<br><br>අක්ෂර බෙහෙවින් ගෙවී ගොස් ඇත. |
| 2010. 07.30 | පුවරු | කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉලඹුගොඩ ග්‍රාම නිලධාරී වසමේ කෙසෙල්හේනාව විහාරස්ථානයට හැරෙන හන්දියේ වම් පැත්තේ .... | නූතන සිංහල | නූතන සිංහල | ක්‍රිස්තු වර්ෂ 19 සියවස | 1. කෙසෙල් ලෙ<br>2. නාවේ විහා<br>3. ර ස්ථානයට<br>4. යන පාර මෙ<br>5. ශ්‍රී බුධ වර්ෂ<br>2411<br>1868 |

## මධ්‍යම පළාත

2010 වර්ෂයේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් මධ්‍යම පළාතින් එක් ශිලා ලේඛනයක් පිටපත් කර ඇත.

නුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කසාවත්ත ග්‍රාම සේවා නිලධාරී වසමේ පූජාපිටිය මල්වත්ත නැමැති ගමේ පුද්ගලික ඉඩමේ ඇති ප්‍රස්තුත ශිලාලිපිය ගිරිලිපියකි. පේළි හතරකින් යුත් මේ ලිපිය ක්‍රිස්තු වර්ෂ 3 - 4 සියවස්වලට අයත් ය. අක්ෂර අපර බ්‍රාහ්මී වන අතර, භාෂාව පැරණි සිංහල වේ. භික්ෂු සංඝයා උදෙසා සිදු කළ කුඹුරු ප්‍රදානයක් පිළිබඳ උක්ත ශිලාලේඛනයේ සඳහන් ය.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2010. 11.20 | ගිරි | නුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ කසාවත්ත ග්‍රාම සේවා වසමේ පූජාපිටිය මල්වත්ත නැමැති ගමේ පුද්ගලික ඉඩමක | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 3 - 4 සියවස් | 1. සිධම සියම දතස ගොට හලය .......... 2. සයරතර අපයහට බමණ ගම්ඩදවය කරවය 3. මහමජදළන කුබර මෙ දෙ හවය හි බිකු සග හි ච 4. තජ පචයට දිනි සවසතහට පත්නි |

## වයඹ පළාත

2010 වර්ෂයේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් වයඹ පළාතෙන් ශිලා ලේඛන දෙකක් පිටපත් කර ඇත. මින් එක් ශිලාලේඛනයක් කුරුණෑගල දිස්ත්‍රික්කයට ද, අනෙක් ලිපිය පුත්තලම දිස්ත්‍රික්කයට ද අයත් වේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 427 සෙල්ලිපිය ග්‍රාම සේවා නිලධාරී වසමේ පිහිටි ගිරි ලිපිය ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස්වලට අයත් වූවකි. අක්ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ. පේළි දහයකින් සමන්විත මේ ලිපියේ ''අභා සල මෙවන්''නම් අභිධානයෙන් යුත් රජ කෙනෙකු විසින් සිදු කළ ප්‍රදානයක් පිළිබඳ සඳහන් ය.

පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත වැල්ලවීදිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණ පිටිපන ග්‍රාම නිලධාරී වසමේ ඇති පුවරු ලිපිය ක්‍රිස්තු වර්ෂ 3 - 4 සියවස්වලට අයත් වූවකි. අක්ෂර අපර බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. පේළි තුනකින් සමන්විත ප්‍රස්තුත ශිලා ලේඛනයේ කහවනු පිදීමක් පිළිබඳ සඳහන් වේ.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2010. 06.05 | ගිරි | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 427, නෙල්ලිය ග්‍රාම නිලධාරී වසමේ, නෙල්ලිය ශ්‍රී පුෂ්පාරාමය විහාරය අසල වැවේ වානේ ගල් තලාවේ | මධ්‍යකාලීන සිංහල | මධ්‍ය කාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස් | 1. ස්වස්ති<br>2. අබා සළ<br>3. මෙවන් ම......<br>4. මුකා සත් වන් ......<br>5. නවයෑ අවගුල්<br>6. පොහොදා දුන්<br>7. දල හ පි දෙ වේ<br>8. ...... කාමිය ......<br>9. ...... පිසබුරුවන් ....<br>10. මෙදෙන මීස ......<br>පැමිණොත් ඉසා ...... |
| 2010. 11.20 | පුවරු | පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණ පිටිපන වැල්ලවීදිය අංක 46 දරණ නිවසේ මිදුල | පුරාණ සිංහල | අපර බ්‍රාහ්මී | ක්‍රිස්තු වර්ෂ 3 - 4 සියවස් | 1. ණ (හ) මක<br>2. ති කහවන දිනි<br>3. (ම) ග බන කුබරති |

## උතුරු මැද පළාත

2010 වර්ෂයේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් උතුරු මැද පළාතේ ශිලාලේඛන පහක් පිටපත් කර ඇත. මේ ශිලාලිපි පහ ම අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ 310 - පුවරසන්කුලම ග්‍රාම නිලධාරී වසමේ රකිනාගල පුවරු ලිපිය ක්‍රිස්තු වර්ෂ 2 - 3 සියවස්වලට අයත් වූවකි. අක්ෂර අපර බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. අක්ෂර පේළි තුනකින් යුක්ත වන පැහැදිලි අර්ථයක් ගැනීමට නො හැකි ලිපියකි.


එහෙත් නක නම් රජුගේ පුත් ගාමිණී අබය විසින් කුඹුරු පිදීමක් පිළිබඳ තොරතුරු ද, තොටුපලක් පිළිබඳ තොරතුරු ද ලිපියේ සඳහන් කරුණු අතර වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 09 - තුලාන අලිවංගුව ග්‍රාම නිලධාරී වසමේ ජන උදාන ගම්මානය වැව ඉස්මත්තෙන් පිටපත් කළ ලෙන් ලිපිය ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් වූවකි. අක්ෂර බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. ලෙන් පූජා කිරීමක් පිළිබඳ ප්‍රස්තුත ශිලාලේඛනයේ සඳහන් ය.

ඉහත ස්ථානයේ ම ලෙනේ ඇති ගිරි ලිපියේ අක්ෂර හා භාෂාව දෙමළ වේ. අක්ෂර පේළි අටකින් යුක්ත ය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 296 - වෙස්සගිරිය ග්‍රාම නිලධාරී වසමෙන් පිටපත් කළ එක් ගිරි ලිපියක් ක්‍රිස්තු වර්ෂ 2 - 4 සියවස්වලට අයත් වූවකි. මෙහි අක්ෂර අපර බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. එය අක්ෂර පේළි දෙකක් දැකගත හැකි ගෙවී ගිය ලිපියකි. මේ ස්ථානයෙන් පිටපත් කළ චිත්‍ර ගුහාවට දකුණින් වූ අනෙක් ගිරි ලිපිය අක්ෂර පේළි හතරකින් සමන්විත අපැහැදිලි ලේඛනයකි.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2010. 01.29 | පුවරු | අනුරාධපුර දිස්ත්‍රික්කයේ 310 - පුවරසන්කුලම ග්‍රාම නිලධාරී වසමේ රකිනාගල | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 2 - 4 සියවස් | නක නම් රජ කෙනෙකුගේ පුත් වූ ගාමිණී අබය විසින් කුඹුරු පූජා කිරීමක් පිළිබඳ සඳහන් වේ. තොටුපළක් ගැන ද සඳහන් ය. |
| 2010. 01.20 | ගිරි | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 09 - තුලාන අලිවංගුව ග්‍රාම නිලධාරී වසමේ ජන උදාන ගම්මානය වැව් ඉස්මත්තේ ලෙනේ ඇති ගිරි ලිපිය | දෙමළ | දෙමළ | | දෙමළ ලිපියකි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2010. 08.22 | ලෙන් | ඉහත ස්ථානයේ ඇති ලෙනේ | බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | 1. ගුත තෙරහ පරුමක ....මපහ<br>2. චතප බතිකන ලෙනේ ශගශ<br> හැඩයට ලිපිය කොටා ඇත. ලෙන් පූජා කිරීමක් සඳහන් වේ. |
| 2010. 10.23 | ගිරි | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත 296 - වෙස්සගිරිය<br><br>වෙස්සගිරිය ගල් උළුවස්ස සහිත ලෙනට ඉදිරියෙන් ඇති පර්වතය මත | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 2 - 4 සියවස් | අක්ෂර ගෙවී ගිය ලිපියකි. |
| 2010. 10.23 | ගිරි | ඉහත ස්ථානයේ ම වෙස්සගිරිය B කොටසේ ගුහාවට දකුණින් (ගිණිකොණ දෙසට මුහුණ ලා ඇති ලෙනේ) පිහිටා ඇති ලෙනේ බිත්තියේ | - | - | - | අක්ෂර අපැහැදිලි ලිපියකි. |

## සබරගමුව පළාත

2010 වර්ෂයේ සබරගමුව පළාතෙන් ශිලාලේඛන තුනක් පිටපත් කර ඇත. මින් එක් ලිපියක් කෑගල්ල දිස්ත්‍රික්කයට ද, අනෙක් ලිපි දෙක රත්නපුර දිස්ත්‍රික්කයට ද අයත් වේ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කොළොම්බුව C - 47 ග්‍රාම නිලධාරී වසමෙන් පිටපත් කළ ලිපිය ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් වූවකි. අක්ෂර බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. පේළි තුනකින් සමන්විත මේ ලිපියේ ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් ය.

රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජවක ග්‍රාම නිලධාරී වසමේ දෙහිපිටිය රක්ෂිතයෙන් පිටපත් කළ ලෙන් ලිපියක් ද, ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1

සියවස්වලට අයත් වූවකි. මෙහි අක්ෂර පූර්ව බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. දීර්ඝ ලිපියක් වන මේ ලිපියේ ගමිකවරුන් විසින් සංඝයාට කළ ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් ය.

ඉහත ස්ථානයේ ම පිටපත් කළ අනෙක් ලෙන් ලිපිය ද ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් වූවකි. පූර්ව බ්‍රාහ්මී අක්ෂරයෙන් යුත් මෙහි භාෂාව පුරාණ සිංහල වේ. අක්ෂර පේළි එකකින් සමන්විත මේ ලිපියේ ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් ය.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2010. 10.08 | ලෙන් | කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළොම්බුව C - 47 ග්‍රාම නිලධාරී වසමේ කොළොම්බුව ගල්කොටුව ලෙන් කටාරමට යටින් | බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | ....... බුතක ලෙණෙ ..... මක ....... <br><br> ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් අක්ෂර ගෙවී ගිය ලිපියකි. |
| 2010. 10.15 | ලෙන් | රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජවක දෙහිපිරිය රක්ෂිතයේ කටාරම් කෙටූ ලෙනේ. | බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | ගමිකවරුන් විසින් සංඝයාට සිදු කළ ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් දීර්ඝ ලිපියකි. |
| 2010. 10.17 | ලෙන් | රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉහත ස්ථානයේ ම. | බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | 1. ........යහබ තිශ ...... - රකිය ලෙනො <br> ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් වේ. |

## නැගෙනහිර පළාත

2010 වර්ෂයේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් ශිලාලේඛන පහක් පිටපත් කර ඇත. මෙයින් එක් ලිපියක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් වන අතර, අනෙක් ලිපි හතර අම්පාර දිස්ත්‍රික්කයට අයත් වේ.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගල්මැටියාව ග්‍රාම නිලධාරී වසමෙන් පිටපත් කළ ලෙන් ලිපිය ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් වූවකි. මෙහි අක්ෂර පූර්ව බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. ප්‍රස්තුත ලිපියේ අකුරු තුනක් සහිත පේළි එකක් පමණක් දක්නට ඇත. පැහැදිලි අරුතක් ගැනීමට නො හැකි ලිපියකි.

අම්පාර දිස්ත්‍රික්කයේ, දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැරණිගම ග්‍රාම නිලධාරී වසමේ ඉලුක්පිටිය රජමහා විහාරයේ ලෙන් ලිපිය ක්‍රිස්තු පූර්ව 2 - 1 සියවස්වලට අයත් වූවකි. එහි අක්ෂර පූර්ව බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. උපාසක සුමනගේ ලෙන සංඝයාට ප්‍රදානය කළ බැව් ප්‍රස්තුත ලිපියේ සඳහන් වේ.

එම ස්ථානයේ ම පිටපත් කළ අනෙක් ලෙන් ලිපි හතර ද ක්‍රිස්තු පූර්ව 2 - 1 සියවස්වලට අයත් වේ. ඒවායේ අක්ෂර පූර්ව බ්‍රාහ්මී වන අතර, භාෂාව පුරාණ සිංහල වේ. සංඝයා වහන්සේලාට ලෙන් ප්‍රදානය කිරීම පිළිබඳ ප්‍රස්තුත ශිලාලේඛන හතරෙහි ම අන්තර්ගත වේ.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2010. 09.30 | ලෙන් | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගල්මැටියාව ග්‍රාම නිලධාරී වසමේ තඹලගමුව උල්පත්වල ලෙන් ලිපිය | පූර්ව බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | අක්ෂර තුනක් පමණක් ඇත. පැහැදිලි අර්ථයක් ගැනීමට නො හැකි ලිපියකි. |
| 2010. 11.11 | ලෙන් | අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැරණිගම ග්‍රාම නිලධාරී වසමේ ඉලුක්පිරිය රජමහා විහාරයේ | පූර්ව බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 2 - 1 සියවස් | 1. ගමික උතිය ධත ද යනුවෙන් සඳහන් ය. |
| 2010. 11.12 | ලෙන් | ඉහත ස්ථානයේ ම. | පූර්ව බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 2 - 1 සියවස් | උපශක ශුමන ලෙනේ උපාසක සුමනගේ ලෙන යනුවෙන් සඳහන් ය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2010.<br>11.12 | ලෙන් | ඉහත ස්ථානයේ ම. | පූර්ව බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 2 - 1 සියවස් | 1. පරුමක ගොටක ශුමනව බරිය උපශක අනු<br>2. දිය ලෙනේ ශගශ |
| 2010.<br>11.13 | ලෙන් | ඉහත ස්ථානයේ ම. | පූර්ව බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 2 - 1 සියවස් | 1. ගපති වශලි පුත ගණක ති(ශ)<br><br>ගහපති (ගෘහපති) වසලිගේ පුත් ගණකාධිකාරී තිස්ස |

**ශිලාලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය**

ශිලාලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පලාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශිලාලේඛන සුචිගත කිරීම සිදු කරන ලදී. සුචිගත කිරීමේ දී ශිලාලේඛනය පිළිබඳ සියලු ම තොරතුරු එයට ඇතුළත් කර ඇත. මේ ව්‍යාපෘතියේ පළමු අදියර 2009 වසරේ දී උක්ත පලාතෙන් ආරම්භ කළ අතර, එහි දී ශිලාලිපි 243 ක් සුචිගත කරන ලදි. 2010 වර්ෂයේ දෙවන අදියරේ දී ශිලාලේඛන 168 ක් සුචිගත කර මධ්‍යම නුවරගම් පලාතේ ශිලාලේඛන සුචිගත කිරීමේ කටයුතු අවසන් කෙරිණි. ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය**

උතුරු මැද පලාතේ නොයෙක් ප්‍රදේශවලින් හමු වූ ශිලාලේඛන මේ කෞතුකාගාරය තළ තැන්පත් කර ඇත. වෙන ම මැදිරියක් තුළ ප්‍රදර්ශන මට්ටමින් උක්ත ශිලාලිපි තබා ඇති අතර, ඒවා ටැම් ලිපි හා පුවරු ලිපි වශයෙන් හඳුනාගත හැකි ය. මින් සමහර ලිපි ප්‍රකාශයට පත් කර ඇති අතර, ඇතැම් ලිපි ප්‍රකාශයට පත් කර නොමැත.

කෞතුකාගාරයේ ඇති සියලු ම ශිලාලේඛන ප්‍රමාණය 117 ක් වන අතර, ඉන් ප්‍රකාශයට පත් කර ඇති ලිපි ගණන 02 කි. ප්‍රකාශයට පත් කර නොමැති ලිපි ගණන 55 කි. ඊට අමතර ව කෞතුකාගාර ගබඩාවේ ද ශිලාලේඛන 32 ක් හමු වේ.

**ජේතවන කෞතුකාගාරයේ ශිලාලිපි**

මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් ජේතවන කෞතුකාගාරයේ ශිලාලේඛන මැදිරියේ ශිලාලිපි දෙකක් ප්‍රදර්ශනය කර ඇත.

**ජේතවන අවට භූමියේ ශිලාලිපිය**

ජේතවන ගල් ගරාදි වැට (බෝධිසරය) ඉදිරිපිට භූමියෙන් හමු වී ඇති පුවරු ලිපිය සම්පූර්ණයෙන් ම මැකී ගිය ලේඛනයකි.

**අභයගිරිය කෞතුකාගාරය හා ගබඩාවේ ශිලාලිපිය**

මධ්‍යම සංස්කෘතික අරමුදල අයත් අභයගිරිය කෞතුකාගාරයේ ශිලාලේඛන මැදිරිය තුළ ශිලාලේඛන හයක් සුචිගත කර ඇත. මේ ශිලාලේඛන මැදිරියේ ප්‍රදර්ශන මට්ටමින් තබා තිබේ. ගබඩා සංකීර්ණය තුළින් ශිලාලේඛන අටක් සුචිගත කර ඇත.

**රකිනාගල පුවරු ලිපිය**

රකිනාගලින් එක් ලිපියක් හමු වී සුචිගත කළ අතර, එය මෙතෙක් ප්‍රකාශිත නොවූ අලුත් ලිපියකි.

**බසවක්කුලම වැව ගිරි ලිපිය**

බසවක්කුලම වැව සමීපයේ පිහිටි පෞද්ගලික ඉඩමක ගල්තලාවේ ඇති ලිපියකි.

**ශිලාලේඛන පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය**

මේ ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂයේ දී ශිලාලේඛන 60 ක් සඳහා පරිවර්තන නාම පුවරු යෙදීමේ කටයුතු සිදු කර ඇත. එසේ පරිවර්තන නාම පුවරු යෙදූ ශිලාලේඛන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**පරිවර්තන නාම පුවරු යෙදූ ස්ථාන**

| අනු අංකය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ස්ථානය |
|---|---|---|---|---|
| 1. | උතුර | වව්නියාව | වව්නියාව | 1. තුනුක්කායි ටැම් ලිපිය |
| | | වව්නියාව | වව්නියාව | 2. ඉරට්ටපෙරියම් කුළම |
| | | වව්නියාව | වව්නියාව | 3. කන්තරෝදය ටැම් ලිපිය |
| | | වව්නියාව | වව්නියාව | 4. මහකච්චකොඩි ලෙන් ලිපිය |
| 2. | උතුරු මැද | අනුරාධපුරය | මිහින්තලය | 5. මිහින්තලය කණ්ඨක චෛත්‍ය ගිරි ලිපිය |
| | | අනුරාධපුරය | මිහින්තලය | 6. මිහින්තලය කණ්ඨක චෛත්‍ය ලෙන් ලිපිය |
| | | අනුරාධපුරය | මිහින්තලය | 7. මිහින්තලය 4 වන මිහිඳු රජුගේ පුවරු ලිපිය |
| | | අනුරාධපුරය | මිහින්තලය | 8. මිහින්තලය 4 වන මිහිඳු රජුගේ පුවරු ලිපිය |
| | | අනුරාධපුරය | මිහින්තලය | 9. මිහින්තලය ගිරි ලිපිය |
| | | අනුරාධපුරය | මිහින්තලය | 10. මිහින්තලය ගිරි ලිපිය (මහාදාඨික මහානාග) |
| | | අනුරාධපුරය | මිහින්තලය | 11. මිහින්තලය කළුදිය පොකුණ ගිරි ලිපිය |
| | | අනුරාධපුරය | නොච්චියාගම | 12. නොච්චියාගම හල්මිල්ලගල ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 13. පොළොන්නරුව උතුරු දොරටුව ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 14. රන්කොත් දාගැබ ගල් ආසන ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 15. රන්කොත් දාගැබ ටැම් ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 16. සුන්දර මහා දේවියගේ පුවරු ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 17. රාජ වෛශ්‍ය භුජංග මණ්ඩපයේ ටැම්ලිපි |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 18. හැටදාගේ ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 19. ශිව දේවාල අංක 1 ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 20. ලංකාතිලක පිළිමගෙයි ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 21. කලා ක්‍රීඩා විනෝද මණ්ඩප ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 22. කිරිවෙහෙර පුවරු ලිපිය |
| | | පොළොන්නරුව | තමන්කඩුව | 23. පොත්ගුල් විහාර පුවරු ලිපිය |
| 3. | ඌව | මොණරාගල | බුත්තල | 24. යටියල්ලාතොට ගිරි ලිපිය |
| | | මොණරාගල | බුත්තල | 25. කතරගම කිරිවෙහෙර පුවරු ලිපිය |
| | | බදුල්ල | රිදීමාලියද්ද | 26. රඹකැන් විහාර ලිපිය/ රිදීමාලියැද්ද |
| | | මොණරාගල | සියඹලාණ්ඩුව | 27. බුද්ධම රජමහා විහාර ලිපිය |
| | | බදුල්ල | රිදීමාලියද්ද | 28. ඕලගංගල ලිපිය |
| | | මොණරාගල | බුත්තල | 29. යුධගනාව රජමහා විහාර ලිපිය |

| | | | | |
|---|---|---|---|---|
| 4. | දකුණ | හම්බන්තොට | තිස්සමහාරාමය | 30. කිරින්ද ලිපිය |
| | | හම්බන්තොට | තිස්සමහාරාමය | 31. අකුරුගොඩ ටැම් ලිපිය |
| | | මාතර | අකුරැස්ස | 32. කහවිල්ගොඩ ටැම් ලිපිය |
| | | මාතර | දෙවිනුවර | 33. දෙවිනුවර ටැම් ලිපිය |
| 5. | නැගෙනහිර | ත්‍රිකුණාමලය | කඩවත් සතර | 34. වෙල්ගම් වෙහෙර දෙමළ ලිපිය |
| | | ත්‍රිකුණාමලය | ගොමරන්කඩවල | 35. රිදීකන්ද ලෙන් ලිපිය |
| | | ත්‍රිකුණාමලය | සේරුවිල | 36. සේරුවිල ලෙන් ලිපිය |
| | | ත්‍රිකුණාමලය | කඩවත් සතර | 37. තිරියාය අංක 2 ලිපිය |
| | | අම්පාර | උහන | 38. රජගල ගිරි ලිපිය |
| | | අම්පාර | උහන | 39. රජගල ලෙන් ලිපිය |
| | | අම්පාර | උහන | 40. රජගල ලෙන් ලිපිය |
| | | අම්පාර | උහන | 41. රජගල ලෙන් ලිපිය |
| 6. | බස්නාහිර | කළුතර | කළුතර | 42. දියගම ගිරි ලිපිය |
| | | ගම්පහ | අත්තනගල්ල | 43. අලවල ලෙන් ලිපිය |
| 7. | මධ්‍යම | මාතලේ | දඹුල්ල | 44. මැණික්දෙන ලිපිය |
| | | මාතලේ | දඹුල්ල | 45. මැණික්දෙන ලිපිය |
| | | මාතලේ | ගලේවෙල | 46. නිලගම ලිපිය |
| | | මාතලේ | දඹුල්ල | 47. කළුදිය පොකුණ |
| | | මහනුවර | උඩුනුවර | 48. ගඩලාදෙණිය විහාර ලිපිය |
| | | මාතලේ | දඹුල්ල | 49. දඹුල්ල ගිරි ලිපිය |
| | | මාතලේ | දඹුල්ල | 50. සීගිරි කැටපත් පවුර |
| 8. | වයඹ | කුරුණෑගල | මහව | 51. කයිකාවල ගිරි ලිපිය අංක 1 |
| | | පුත්තලම | ආනමඩුව | 52. කෙත්තාරාම ලිපිය |
| | | පුත්තලම | ආනමඩුව | 53. ලබුගම ගිරි ලිපිය |
| | | කුරුණෑගල | පඬුවස්නුවර | 54. පඬුවස්නුවර රජමහා විහාර ලිපිය |
| | | කුරුණෑගල | නාරම්මල | 55. මැටියගනේ රජමහා විහාර ලිපිය |
| | | කුරුණෑගල | පොල්පිතිගම | 56. වෙලන්ගොල්ල රජමහා විහාර ලිපිය |
| | | කුරුණෑගල | වාරියපොළ | 57. ගල්වැව සුගතාරාමය |
| 9. | සබරගමුව | කෑගල්ල | වරකාපොළ | 58. දැදිගම රජමහා විහාර ලිපිය |
| | | කෑගල්ල | මාවනැල්ල | 59. අලුත්නුවර දේවාල පුවරු ලිපිය |
| | | රත්නපුර | ඇඹිලිපිටිය | 60. බෝධිරාජාරාම ධර්මායතන පුවරු ලිපිය |

**කාසි සුචිගත කිරීමේ ව්‍යාපෘතිය**

2010 වර්ෂයේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් අනුරාධපුර කෞතුකාගාරයේ කාසි 1069 ක් සුචිගත කරන ලදී. විවිධ වර්ගවලට අයත් වූ මේ කාසි පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | කාසි වර්ගය | කාලය | සුචිගත කළ කාසි ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | රන් කහවනුව | ක්‍රිස්තු වර්ෂ 4 - 9 සියවස් | 95 |
| 2. | අක කාසිය | ක්‍රිස්තු වර්ෂ 4 - 9 සියවස් | 01 |
| 3. | තඹ මස්ස කාසිය | | |
| | • I වන විජයබාහු | ක්‍රිස්තු වර්ෂ 1055 - 1111 | 06 |
| | • I වන පරාක්‍රමබාහු | ක්‍රිස්තු වර්ෂ 1153 - 1186 | 12 |
| | • සහස්සමල්ල | ක්‍රිස්තු වර්ෂ 1200 - 1202 | 912 |
| | • ධර්මාශෝකදේව | ක්‍රිස්තු වර්ෂ 1208 - 1209 | 01 |
| 4. | රන් පනම | ක්‍රිස්තු වර්ෂ 14 - 15 සියවස් | 40 |
| 5. | පගෝඩි කාසි | ක්‍රිස්තු වර්ෂ 14 - 15 සියවස් | 01 |
| 6. | සැරපින් කාසි | ක්‍රිස්තු වර්ෂ 14 - 15 සියවස් | 01 |
| **එකතුව** | | | **1069** |

**අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය**

අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් 2010 වර්ෂයේ දී උක්ත ව්‍යාපෘතිය යටතේ ශිලාලේඛන 19 ක් ප්‍රකාශයට පත් කර ඇත. මේ ශිලාලේඛන ප්‍රකාශයට පත් කිරීමේ දී ඒවා කියවා අර්ථ නිරූපණය කර ඒ පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයන් ද සිදු කරන ලදි. එසේ පර්යේෂණ සිදු කර අභිලේඛන පර්යේෂණ සංග්‍රහය නමින් ග්‍රන්ථයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. අධ්‍යයනයට භාජනය වූ ශිලාලේඛන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ශිලාලේඛනයේ නම | ස්ථානය |
|---|---|---|
| 1. | බුංගිරිය ගිරි ලිපිය | සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාබුළුව ග්‍රාම නිලධාරී වසමේ ගල්හේනේ පත්තිනි දේවාලය අසල |
| 2. | ඇල්ලුවත්ත වැදි අප්පුලාගේ හේන ලෙන් ලිපිය | සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙලිගොඩපිටිය ග්‍රාමසේවා වසමේ වැදි අප්පුලාගේ හේන නම් ස්ථානයේ. |

| | | |
|---|---|---|
| 3. | යහලවෙල පුවරු ලිපිය | සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, යහලවෙල ග්‍රාම නිලධාරී වසමේ ශ්‍රී මෙත්තාරාම නිශ්ශංක විහාරයේ |
| 4. | පොත්ගුල්ගල ආරණ්‍ය ලෙන් ලිපිය | සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දෙගෙදර ග්‍රාම සේවක වසමේ පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසන භූමියේ |
| 5. | වට්ටාරම්තැන්න ශ්‍රී පූර්වාරාම පුවරු ලිපිය | නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ වට්ටාරම්තැන්න ශ්‍රී පූර්වාරාම විහාරස්ථානයේ. |
| 6. | ගිනිකරාව රජමහා විහාරයේ ගිරි ලිපි හතර | කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිනිකරාව ගමේ. |
| 7. | ඇඹලව රහත්ගල් විහාර ගිරි ලිපිය | කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙමටළුව ග්‍රාමසේවා වසමේ ඇඹලව රහත්ගල් විහාරයේ |
| 8. | හඳමාගම විහාර ලිපි දෙක | කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 771 හඳමාගම ග්‍රාම නිලධාරී වසමේ ඇති හඳමාගම විහාරයේ |
| 9. | පන්කුලිය අශෝකාරාම ලිපිය | අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පලාතේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 301 අශෝකාරාම ග්‍රාමසේවා වසමට අයත් පන්කුලිය ගමේ |
| 10. | කුළුමීමාකඩ පුවරු ලිපිය | උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 117 - වලහාවිද්ද වැව ග්‍රාම සේවා වසමේ |
| 11. | රත්නගිරි අබා රජමහා විහාර ගිරි ලිපිය | දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විගමුව ග්‍රාම නිලධාරී වසමේ රන්න ග්‍රාමයේ, රන්න ගිරි අබා රජමහා විහාරයේ |

# නවතත්තු අංශය

## බස්නාහිර පළාත

**කළුතර දිස්ත්‍රික්කය**

**වාද්දුව මහිගර්ජනාරාමය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය වසර 200 ක් පමණ පැරණි ස්ථානයකි. මෙහි සූනියම් දේවාලයත්, සිතුවම් සහිත පැරණි පිළිම ගෙයත්, දාගැබත් පැරණි ස්මාරක වේ.

මෙම සූනියම් දේවාලය මත තිබූ කොන්ක්‍රීට් වහලය මත ගඩොල් බැම්ම බැද අඳින ලද නව සැලසුමට අනුව පල 04 කට සිටින සේ වහලය ඉදි කරන ලදි. මාළිගා උළු සෙවිලි කර කුමේර බැඳ කොත ද ස්ථාපනය කරන ලදි.

දේවාලය ඉදිරියේ වූ මණ්ඩපයේ සෙවිල්ල සකස් කළ අතර ගෙබිම ද ගඩොල් අතුරා සිමෙන්ති බඳින ලදි. දැව කණු වාර්නිෂ් ආලේප කිරීම ද සිදු කරන ලදී. පැරණි පිළිමගෙයි සිතුවම් සහිත සිවිලිම වැහි ජලය කාන්දු විම නිසා දිරාපත් වූ කොටස් සකස් කළ අතර වහලයේ උළු ද නැවත සකසන ලදී.

විහාරස්ථානයට හැරෙන ස්ථානයේ මාර්ග සංඥා පුවරුවක් ද සවි කරන ලදී.



වාද්දුව මහීගර්ජනාරාමය පිළිසකර කිරීමට පෙර

**ගනේඋඩ පැරණි නටබුන්**

කළුතර දිස්ත්‍රික්කයේ මදුරාවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ගනේඋඩ පැරණි නටබුන් වල වැවී තිබූ කැලය ඉවත් කරන ලදි.

දේවාල ගොඩනැගිල්ල, මාළිගා ගොඩනැගිල්ල පැරණි ගල්වැට ආදී ස්ථානවල ද මතු වූ කැලය ගලවා ඉවත් කරන ලදි. මාළිගාවට පිවිසුම් මාර්ගයේ අධික ලෙස වැවී තිබූ කැලය ඉවත් කරන ලදි.



ගනේඋඩ පැරණි නටබුන් ගොඩනැගිල්ල

**වෙහෙරගොඩ දාගැබ**

කළුතර දිස්ත්‍රික්කයේ මදුරාවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් වෙහෙරගොඩ දාගැබ ගොඩනැගිල්ල හා පොකුණ සහිත භූමිය කැලය සුද්ධ කරන ලදි.

**කුඩලිගම දේවාල නටබුන්**

කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් කුඩලිකන්ද බුලත්වතුකන්ද නැමැති කඳුවැටියේ ගල්නැව පිහිටි දේවාල නටබුන් සහිත භූමිය සහ පිවිසුම් මාර්ගය කැලය සුද්ධ කරන ලදි.

**පතිරාජ පිරිවෙන**

කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම පුරාවිද්‍යා ස්ථානයේ විහාරස්ථානයෙන් ලබා දුන් ද්‍රව්‍ය යොදා වඩිම්බු ලෑලි සවි කිරීම සිදු කරන ලදි.

**ලබුගම ධම්මරක්ඛිතාරාමය**

කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම විහාරස්ථානයේ පිහිටා ඇති ලෙන් විහාරය අවට වූ කැළය සුද්ධ කරන ලදි. පිවිසුම් මාර්ගය ද අඩි 60 ක් පමණ දිගට සහ අඩි 5 ක් පළලට වන සේ කැළය එලි කිරීම සිදු කරන ලදි. මෙහි දී චෛත්‍ය ඝරයේ වහලයේ තිබූ දිරාපත් වූ රීප්ප ඉවත් කර අළුත් පරාල හා රීප්ප යොදන ලදි. වහලයේ තිබූ උළු ඉවත් කර කොකු උළු සෙවිලි කර කුමේර බැඳීම සිදු කරන ලදි.

**දෙමටදෙනිකන්ද ජයසුන්දරාරාම විහාරයේ ටැම්පිට විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය නුවර යුගයේ සිතුවම් හා මූර්ති සහිත ටැම්පිට විහාරයකි.

මෙහි වහලයේ අලුතින් උලු යොදා කුමේර බැඳීම සිදු කළ අතර ටැම්පිට විහාරයේ පලුදු වී තිබූ බිත්ති කොටස් ගලවා ඉවත් කොට පිළිසකර කිරීම හුණු ආලේප කිරීම ද සිදු කරන ලදි. සියලු ම දැව කොටස් විද දැව ආරක්ෂණ ආලේප කර නඩත්තු කරන ලදි.

**වැලිපිල්ලෑව ශ්‍රී මහා පුරාණ විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ පිටත පිටුපස බිත්තිය හා පඩිපෙල දුර්වලව තිබූ හෙයින් කපරාදුව ඉවත් කර අලුතින් සකස් කරන ලදි. බිත්ති හුණු පිරියම් කිරිම ද සිදු කරන ලදි. වහලයේ උළු සකස් කිරිම ද සිදු කරන ලදි.

**හැවනිවල විවේකාරාමය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය වළගම්බා රාජ්‍ය කාලයට අයත් වේ. මෙහි බොල් වී ගැලවී ඇති බිත්ති කොටස් ඉවත් කර නැවත සකස් කිරීම ද ඇතුළත සහ පිටත බිත්ති මත හුණු ආලේප කරන ලදි. අක්‍රමවත්ව තිබූ උළු සකස් කර විහාර ගෘහය අවට භූමිය පිරිසිදු කරන ලදි.

**ඇවරියවල අම්බලම**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය වළගම්බා රාජ සමයට අයත් බව ප්‍රකාශ වේ.
මෙහි දිරා ගිය දැව කඳන් වල පලුදු වු ස්ථාන කෙම්පික්ස් ගා ලී කුඩු මිශ්‍රණය යොදා සකස් කල අතර දැව ආරක්ෂිත ආලේපනය කරන ලදි.

**බටුවිට ටැම්පිට විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය මහනුවර යුගයට අයත් ප්‍රතිමා සහිත බැම්මක ඉදි කර ඇති විහාර ගෙයකි.මෙහි බිත්ති වල බොල් වී ගැල වී ඇති කොටස් සකස් කර වහලයේ තෙමෙන තැන් සකස් කිරීම ද

බිත්ති මත හුණු ආලේප කිරීම ද සිදු කරන ලදී. දැව මත දැව ආරක්ෂක ආලේප කිරීම ද සිදු කර නඩත්තු කටයුතු ඉටු කරන ලදී.

**පහළ නාගොඩ කෝට්ටේගොඩ සිරිවර්ධනාරාමය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය නුවර යුගයට අයත් රිදී පිළිමයක් ද චිත්‍ර සහිත සිවිලිමක් ද ඇත. විහාර ගෘහයේ බිත්ති ඇතුළත සහ පිටත සිතුවම් ද ඇත.

මෙහි බිත්තිවල බැඳ තිබූ වේ හුඹස් ඉවත් කර බොල් වූ කොටස් සඳහා අලුතින් බදාම යොදා පිළිසකර කරන ලදි.

**මහල්ලොලුව ශ්‍රී සද්ධර්මාරාම පුරාණ විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වැකේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය මහල් දෙකකින් යුක්ත නුවර යුගයට අයත් ටැම්පිට විහාරයකි. මෙහි පලුදු වූ බිත්ති සකස් කර බිත්ති මත හුණු ආලේප කරන ලදි. කෘමීන්ගෙන් හානි වූ දැව මත දැව ආරක්ෂක ආලේප කර ගොඩනැගිල්ලේ පිරිසිදු කිරීම් ඉටු කරන ලදි.

**උඩුගොඩ මංකඩ**

බස්නාහිර පළාතේ අත්තනගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය ඉපැරණි මං කඩක් සේ සැලකේ.

දීමනා රැකවල්කරුවකු යොදවා ඇති මෙම ස්ථානයේ බැමි පොයින්ට් කිරීම සිදු කරන ලදි. සවිකර ඇති ගේට්ටුවේ මල ඉවත් කර තින්ත ආලේප කිරීම හා වල් ගලවා ඉවත් කිරීම ඉටු කර ප්‍රදර්ශන මට්ටමින් තබන ලදි.

**අලවල රජමහා විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය ක්‍රි.පූ. යුගයේ සංඝාවාසයක් ලෙස භාවිතා කළ බවට සාධක හමු වී ඇත. 19 වන සියවසට අයත් චිත්‍ර හා මූර්ති සහිත ලෙන් විහාරයක් ද ඇත.

මෙම ලෙන් විහාරයේ වම්පස පිටත බිත්තිය දිය සෙවල බැඳි බොල් වී තිබූ අතර ඒවා ඉවත් කර අලුතින් කපරාදු යොදා බිත්ති හුණු ආලේප කරන ලදි. වැසි ජලය කාන්දු වන ස්ථානයන් සකස් කර සිමෙන්ති ආලේප කර පිළිසකර කරන ලදි.

**කෝට්ටේ පැරණි ගල් අම්බලම අලුත් වැඩියා කිරිම.**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් කෝට්ටේ පැරණි ගල් අම්බලම වහල සහ බිත්ති අධික ලෙස හානි පැමිණ ඇති බැවින් අලුත් වැඩියා කිරීම් ඉටු කරන ලදි.

මෙහි දී වහලයේ උළු කැඩී තිබූ අතර එම උළු වෙනුවට අලුතින් කුමේර යොදවන ලදි.වඩිම්බු පිරිසිදු කර වඩිම්බු වල එනමල් තීන්ත ආලේප කරන ලදි. ඉන්පසුව සම්පූර්ණ ගොඩනැගිල්ල සහ ගෙබිම පිරිසිදු කර ප්‍රදර්ශන මට්ටමට ගෙන එන ලදි.

**රදල්ගොඩ ශ්‍රී ජිනේන්ද්‍රාරාම ටැම්පිට විහාරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ ටැම්පිට විහාරයට පිවිසීම සඳහා වූ තරප්පු පෙළ දිරා පත් වී අබලන් තත්වයේ පැවතුණ බැවින් එය නැවත කුඹුක් දැවයෙන් සකස් කර සවිකරන ලදි.

**පොකුණුවිට රජමහා විහාරය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පොකුණුවිට රජමහා විහාරයේ සීමා මාලකයේ කැඩී ගිය කපරාදුව නැවත කපරාදු කර හුණු ආලේප කරන ලදි. බිඳිගිය සහ පහලට ලිස්සා ගිය කොකු උළු කැට සැකසීම සිදු කරන ලදි. පැරණි පිළිමගෙයි සෙල් ලිපිය අවට කැලය ඉවත් කිරීම ද ගේට්ටු පියන් දෙක නැවත සකස් කිරිම සිදු කරන ලදි. පිටත බිත්ති කපරාදුව ගැලවී ගිය කොටස නැවත සකස් කරන ලදි.

**ගැලණිගම අම්බලම**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය අවට කැලය පිරිසිදු කිරීමත් මසකට වරක් අම්බලම පිරිසිදු කිරීමත් සිදු කරන ලදි.

**පතහවත්ත රජමහා විහාරය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය වටා ප්‍රාකාරය මතුපිට දෙපස සහ බැම්මේ ඇතුළත භූමිය අඩි 06ක් පළලට සුද්ධ කරන ලදි. ඊට අමතර ව ප්‍රාකාරය වටා කැලය විසි ගසා ඇතුළත බැම්මේ කැලය පිරිසුදු කරන ලදි.




පතහවත්ත ප්‍රාකාර බැම්ම

**කෝට්ටේ පුරාවිද්‍යා රක්ෂිතය**

කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධන පුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පුරාවිද්‍යා රක්ෂිත සහ ස්මාරක සංකීර්ණය පවත්වා ගෙන යන ලදි. එහි දී කෝට්ටේ බැද්දගාන පුරාවිද්‍යා රක්ෂිතයේ ගේට්ටුව සකස් කිරීම, සුද්ධ කිරීම සහ පවත්වා ගෙන යාම සිදු කරන ලදි.

2010 පුරාවිද්‍යා සතිය අරමුණු කොට ගෙන ද බැද්දගාන රක්ෂිතයේ පෙත් මං සැකසීම සිදු කරන ලදි. පළමුව පෙත් මං සකස් කිරිමට යෝජිත මාර්ගය සුද්ධ පවිත්‍ර කරන ලදි. උඩ පස් තට්ටුව ඉවත් කර බොරලු සහ සිමෙන්ති මිශ්‍රණය අඟල් 03ක් ඝණ කමට දමා තලා පෙත් මං සකස් කරන ලදි. අලකේශ්වර රක්ෂිතයට ද යන පෙත් මගෙහි මතුපිට පස් තට්ටුව ඉවත් කර බොරළු හා සිමෙන්ති මිශ්‍රණය අඟල් 03ක් ඝණකමට යොදා පෙත් මඟ සකස් කරන ලදි.

**උතුරු කළුතර පුලිනතලාරාමය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි උතුරු කළුතර පුලිනතලාරාමය නුවර යුගයේ සිතුවම් සහිත සහ එම යුගයට අයත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ උපයෝගී කරගෙන ගොඩ නගන ලද ගෘහයකි.

මෙහි දී වට බරාඳය සඳහා යොදා තිබූ කණුවලින් දෙවන, තෙවන සහ සිව්වන වශයෙන් ඇති කැටයම් සහිත කණු දිරාපත්ව තිබුණි. එම ස්ථානවලට දැව කොටස් සහ කෙමිෆික්ස් ගම් ආධාර කරගෙන නැවත පුරවන ලදි. මෙහි දී කණුවල තිබූ සියලු ම අඩුපාඩු සකස් කළ අතර වාර්නිෂ් කිරීම ද සිදු කරන ලදි.

විහාර ගෘහයෙහි තිබූ පැරණි දොර වෙනුවට පියන් දෙකේ දොරක් සවි කරන ලදි. කොස් දැවයෙන් මෙය නිම වූ අතර පිත්තල සරනේරු යොදා පැරණි උළුවස්සට සවි කරන ලදි. පෙර දී යොදා තිබූ වැහි පිහිල්ල ඉවත් කර ගිනිසපු ලෑලි ආදිය යොදා වැහි පිහිලි රඳවනය සකස් කරන ලදි. ඒ මත අමානෝ තහඩුවලින් නිමවූ වැහි පිහිල්ල යොදන ලදි. වහලයේ අක්‍රමත්ව තිබූ උළු සකසා බිඳුණු උළු වෙනුවෙන් අලුත් උළු යොදා වහලය නිමවන ලදි.



පුලිනතලාරාමයේ විහාරගෙය අලුත්වැඩියා කිරීම

**ගොරකාන කන්දේ විහාරය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි මෙම ස්ථානය 1848 දී පමණ ඉදිවූවක් ලෙස මෙය සැලකේ. මෙහි ආවාස ගෘහය මැටි බිත්තිවලින් නිමවා වැලි කපරාදු කර හුණු ආලේප සහිත වන අතර සිංහල උළු සෙවිලි කර ඉදිරි වට බරාඳය සහිත ව ඉදිකර ඇත.

මෙම විහාර ගෘහයෙහි දකුණු පස බිත්තියෙහි කඩා වැටීම නිසා වහලය පහත් වී කොටසක් කඩා වැටී තිබුණි. මෙහි දී වහලයට ආධාරක මුක්කු ගසා කැඩීගිය බිත්ති කොටස ඉවත් කර මැටි බදාමය සකසා ගෙන බිත්තිය පැවති ආකාරයට සකස් කරන ලදි. බිඳුණු උළු මාරු කිරීම වර්ග අඩි 400ක පමණ සිදු කළ අතර කැඩුණු ජනෙල් නැවත සවි කර බිත්ති සකස් කරන ලදි. තවද කැඩුණු මැටි කපරාදුව සිදු කර හුණු ආලේප කර නඩත්තු වැඩ නිමවන ලදි.



ගොරකාන කන්දේ විහාරයෙහි ආවාස ගෙය

**බලගල්ල පැරණි වලව්ව සංරක්ෂණය**

ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය 1892 දී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. හිටපු සංස්කෘතික අමාත්‍ය ගරු ලක්ෂ්මන් ජයකොඩි මහතාගේ පියා මෙහි මුල් පදිංචිකරුවන් වේ.

මෙහි බිත්ති සම්පූර්ණයෙන් ම මැටිටෙන් බැඳ හුණු වැලි කපරාදු කර ඇත. මෙම ගොඩනැගිල්ල පිටුපස වහලය ගලවා දැව රාමුව ද උළු ද අලුතින් යොදන ලදි. ඉන් පසුව ඉතිරි වහල කොටස් ද අබලන්ව තිබූ බැවින් නැවත සකස් කර උළු යොදන ලදි. මේ සඳහා හල්මිල්ල දැව යොදා ගන්නා ලදි. වහලයේ අග කෙලවර උළු රඳවුම් ලෑලි ද යොදා වැහි පිහිලි පද්ධතිය ද නැවත යොදන ලදි. පෝටිකෝව සහිත කොටස සඳහා පමණක් රයිනෝ ෂීට් යෙදූ අතර වඩිම්බු ද සකස් කරන ලදි.

දිරා තිබූ බිත්ති කොටසක් ගඩොලින් බඳින ලදි. පිටුපස දික් බරාඳයේ රවුම් කණු 02ක් අලුතින් බැඳ කණු හිස්වල මෝල්ඩින් සකස් කරන ලදි.

බිත්තිවල කපරාදුව ද විශාල ලෙස බොල් වී තිබූ අතර ඒවා ඉවත් කර ඒ සඳහා අවශ්‍ය පිළිසකර කිරීම් ඉටු කරන ලදි. සියලුම බිත්තිවල පලුදු වූ ස්ථාන සකස් කර මුළු ගොඩනැගිල්ලෙහි ම බිත්ති හුණු ආලේප කරන ලදි.

## මධ්‍යම පළාත

### මාදන්වල රජමහා විහාරය

මධ්‍යම පළාතේ නුවර එළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය කලාප අංක 08 ට අයත් පුරාවිද්‍යා ස්ථානයකි.

පැරණි පිළිමගෙයි චිත්‍ර තෙතමනයෙන් විනාශ වන ප්‍රමාණය අවම කර ගැනීම සඳහා 1:2 සිමෙන්ති වැලි මිශ්‍රණය 3/4" ඝනකමට අතුරා බිම් ගල් අල්ලා කුස්තුර පොයින්ට් කරන ලදි.

### දිඹුලාගල අම්බලමේ පැති බැම්ම සැකසීම

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ පැති බැම්ම සකස් කරන ලදි. පැවැති බැම්ම හා කැඩීබිඳී යාම නිසා, අක්‍රමවත්ව තිබූ හෙයින් පතුල සඳහා කොන්ක්‍රීට් යොදා සක්ක ගල් භාවිත කොට නව බැම්මක් ඉදිකරන ලදි. බැම්මෙහි වූ කුස්තුර පොයින්ට් කිරීම ද අවට පරිශ්‍රයේ සේදීයාම වැලැක්වීමට පස් පිරවීම ද සිදුකර අම්බලමේ නඩත්තු කාර්යන් නිම කරන ලදි.

### හේන්දෙණිය විහාරයේ පිළිමගෙයි සඳහා පුරගෙය ඉදිකිරීම

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ පිළිම ගේ වහළයේ උළු අක්‍රමවත්වීම නිසා එම නඩත්තු කටයුතු සිදුකිරීමට පෙර සැකසිය යුතු පුරගෙය ඉදිකරන ලදි. G.I. බට හා පුවක්ගස් රීප්ප ද ආධාර කරගෙන පොල් අතු භාවිතකොට පුරගෙය ඉදිකිරීමේ කටයුතු නිම කරන ලදි.

### දෙහදු කඩුල්ල පුරාවිද්‍යා ස්ථානයේ පියගැටපෙල සැකසීම

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත. මෙහි පියගැටපෙල ආශ්‍රිත භූමිය සුද්ධකර සක්ක ගල් භාවිත කොට තහවුරු කර ගැටි බැම් බැඳ, පසුව සක්ක බැම් පොයින්ට් කරන ලදි. මෙහි දී සක්ක ගල් තහවුරු කිරීම සඳහා 1:8 සිමෙන්ති වැලි මිශ්‍රණය උපයෝගි කර ගන්නා ලදි.

### ගොඩමුන්න ඇල්ල කඩේ අම්බලම

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ වහල අබලන්ව පැවතුණි.

ඒ අනුව වහලයට යොදා තිබූ දිරාපත් දැව ඉවත් කර ඒ වෙනුවට අලුතින් දැව යොදා පැවති ටකරන් ද ඉවත් කර ඒ වෙනුවට කොකු උළු යොදා කුමේර ද බැඳ නඩත්තු කටයුතු නිම කරන ලදි.

**අරත්ත ටැම්පිට විහාරයේ පුරගෙය සැකසීම**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය අයත් මෙම ස්ථානයේ පිහිටි ටැම්පිට විහාරය අබලන්ව පැවතීම නිසා එය නඩත්තු කිරීමට අත්‍යවශ්‍ය විය. එබැවින් එයට පූර්වයෙන් ඉදිකළ යුතු පුරගෙය සකසන ලදි. ජී.අයි බට, පුවක් ගස්, රීප්ප සහ තහඩු භාවිත කර මෙම පුරගෙය සකසන ලදි.

**දියතිලක මණ්ඩපය නඩත්තු කර පවත්වාගෙන යාම**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරලයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් ය. මෙය නඩත්තු කර පවත්වා ගෙන යාම සඳහා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමත්, පවතින භූ දර්ශන ශාක විධිමත් කිරීමත් සිදු කර මෙය ප්‍රදර්ශන මට්ටමින් පවත්වා ගෙන යන ලදි.

## දකුණු පළාත

**පුංචි අකුරුගොඩ ඉඟිනියාගහවත්ත**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අයත් පුංචි අකුරුගොඩ ඉඟිනියාගහවත්ත නැමැති මෙම ස්ථානය පැරණි ටැම් ලිපියක් සහිත භූමියකි.

මෙහි කැඩී තිබූ මායිම් කණු ඉවත් කර භූමිය සුද්ධ පවිත්‍ර කරන ලදී. ස්ථානයේ ඉතිරිව තිබූ කණු සහ අලුතින් සකස් කරන ලද කණු යොදා ගනිමින් මායිම් කණු සිටුවන ලදි. ස්ථානය සුද්ධ පවිත්‍ර කොට ප්‍රදර්ශන මට්ටමින් පවත්වා ගෙන යන ලදී.

**කිරින්ද දළදා වෙහෙර**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිරින්ද දළදා වෙහෙර ශ්‍රී දළදා වහන්සේ තැන්පත් කර පුද පූජා පැවැත්වූ බවට මතයක් පවතින අතර භූමිය පුරා ස්මාරක කොටස් විසිරි පවතින අතර ශෛලමය කොටස් ද භූමිය පුරා පවති.

මෙම චෛත්‍යයේ හටගෙන තිබූ ශාක මුල් ඉවත් කර එම කුස්තුර පුරවන ලදී. බොරදම් කැඩී තිබුණ කොටස් නැවත පිළිසකර කරන ලදී. කඩතොළු වී ගොස් තිබූ ගඩොල් වරි සියල්ල පිළිසකර කර ස්මාරකයේ පැවැත්ම තහවුරු කරන ලදී.

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි යටාල වෙහෙර අනුරාධපුර යුගය දක්වා දිව යයි. දේවානම් පියතිස්ස රජුගේ සොහොයුරු වූ මහානාග යුව රජතුමා මෙම ප්‍රදේශයේ රාජකීය ගොඩනැගිලි ඉදිකළ බව වංශකථාවේ සඳහන් ය.

ජලජ පැලෑටිවලින් ගහණව තිබූ දාගැබෙහි වැලි මළුව පිරිසිදු කරන ලදි. සියලු ම ජලජ පැළෑටි ඉවත් කර දාගැබ් මළුව ප්‍රදර්ශන මට්ටමට ගෙන එන ලදී. මේ සඳහා පෞද්ගලික සංවිධානයක පූර්ණ සහය ලැබුණි.

**යටාල කෞතුකාගාර වහල අලුත්වැඩියාව හා විදුලි පද්ධතිය අලුත්වැඩියාව කිරීම.**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් යටාල කෞතුකාගාරයේ ඉහළ මහලෙහි කැඩී ඇති කොටස සකස් කර පරාල හා රීප්ප යොදා වහලය නිම වූ අතර කුමේර ද සකස් කරන ලදී.

කෞතුකාගාරය තුළ ඇති විදුලි පද්ධතිය අක්‍රියව පැවතුණ බැවින් එය ද යථාවත් කරන ලදී. මෙම ස්ථානය යටාල තිස්ස රජ සමයේ ඉදිකරන ලද පුරාවිද්‍යා ස්ථානයක් වන අතර මෙම ස්ථානයෙන් හමු වූ පුරාවස්තු මෙම කෞතුකාගාරයේ තැන්පත් කර ප්‍රදර්ශනයට තබා ඇත.

**මාදුව සුධර්මාරාම විහාරයේ චෛත්‍ය ඝරයේ වහල නඩත්තු කිරීම.**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මාදුව සුධර්මාරාම විහාරය දකුණු පළාතේ චෛත්‍ය ඝරයක් සහිත චෛත්‍යයකි. මෙය ප්‍රමාණයෙන් කුඩා වුවත් වසර 150 ක් පමණ පැරණි වේ. මෙම විහාරස්ථානයේ පිහිටි පිළිමගෙය සිතුවම් ද මහනුවර යුගයට අයත් ය.

මෙම චෛත්‍ය ඝරයේ වහලයේ දිරාපත්ව තිබූ හා රීප්ප ඉවත් කර අලුතින් එම දැව කොටස් යොදා සම්පූර්ණ වහලයේ තිබූ උළු ඉවත් කර කොකු උළුසෙවිලි කර කුමේර බඳින ලදි.

**දකුණ 01 කලාපය පවත්වාගෙන යාම**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර බලපිටිය අම්බලංතොට, හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්ට අයත් මෙම කලාපයේ පහත සඳහන් කාර්යන් ඉටු කරන ලදි.

දකුණ 01 කලාපයේ ගොඩනැගිල්ල හා අවට පරිශ්‍රය පවත්වාගෙන යාම.

- අම්බලන්තොට ඕලන්ද ස්තාලය දෛනිකව සුද්ධ පවිත්‍ර කිරීම බිත්ති හුණු ආලේප කිරීම, දැව කොටස්වල දැව ආරක්ෂක ආලේප කිරීම.
- කාර්යාලයේ භූමියේ ඉදිරිපස ගේට්ටුව සුද්ධ පවිත්‍ර කර තීන්ත ආලේප කිරීම.
- කලාප කාර්යාලයේ ගොඩනැගිලි ඉදිරිපස වහලෙහි නඩත්තු කිරීම.

**බූස්ස සුදර්ශනාරාමයේ ආධාරක බැම්ම සකස් කිරීම.**

බූස්ස සුදර්ශනාරාමයේ පැරණි විහාර ගෘහයෙහි බිත්ති පුපුරා තිබූ හෙයින් උපදේශක කමිටු තීරණය අනුව පිටතින් ආධාරක බැම්මක් බැදීමට යෝජනා විය. ඒ අනුව පතුල කොන්ක්‍රිට් යොදා ඒ මත 6''× 9'' සක්ක ගල් භාවිත කොට මෙම ආධාරක බැම්ම බඳින ලදි.

**දකුණ 04 කලාපය පවත්වාගෙන යාම.**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර, මාතර හා දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට මෙම කලාපය අයත් වේ.

මෙම කලාපය යටතේ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදි.

- නූපේ ඕලන්ද ගොඩනැගිල්ල සහ භූමිය දෛනිකව සුද්ධ පවිත්‍ර කර පවත්වා ගෙන යන ලදි.
- මාතර ඕලන්ද කොටුව දෛනිකව පවත්වාගෙන යාම සහ පිළිසකර කිරීම් සිදු කරන ලදී.
- කුෂ්ඨ රාජගල පුරාවිද්‍යා ස්ථානයේ ගැලවී තිබූ කැරකෙන ගේට්ටුව අලුත්වැඩියා කර සවි කරන ලදි. එම ස්ථානයේ තිබූ යකඩ වැට තීන්ත ආලේප කරන ලදි.
- දෙවිනුවර සෙල්ලිපි ආවරණ වැට තීන්ත ආලේප කිරීමත්,
- පරවාහැර අම්බලම හුණු ආලේප කිරීමත් සිදු කර ඇත.

**දකුණ 06 කලාපය පවත්වාගෙන යාම**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත, කටුවන, තංගල්ල, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් මෙම කලාපය තුළ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදි.

- මාර්ග සංඥා පුවරු යෙදීම.
- කඳවල පුරාණ විහාරය
- කටුවන ශ්‍රී විහාරය
- වනුකන්ද පුරාණ විහාරය
- කෙසෙල්වත්ත පුරාණ විහාරය

මීට අමතර ව කලාපයේ සියලුම ස්ථාන සුද්ධ පවිත්‍ර කර පවත්වා ගෙන යන ලදි.

**දකුණ 08 කලාපය පවත්වාගෙන යාම**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම, ලුණුගම් වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් මෙම කලාපයේ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදි.

- සිතුල්පව්ව, අංජලීගල, දෙව්රම් වෙහෙර, කැබලියපොල යන ස්ථාන සඳහා වල් නාශක යෙදීම.
- කලාප කාර්යාලය අලුත්වැඩියා කිරීම.
- රක්ෂිත ඉඩම්වල මායිම් වැටවල් යාවත්කාලීන කිරීම.
- සියලුම පුරාවිද්‍යා ස්ථාන ප්‍රදර්ශන මට්ටමින් නඩත්තු කර පවත්වාගෙන යාම සිදු කරන ලදි.

## වයඹ පළාත

**තෝනිගල පුරාවිද්‍යා කලාප කාර්යාලය හා පුරාවිද්‍යා රක්ෂිතය පවත්වා ගෙන යාම**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම ස්ථානය අක්කර 20 ක් පමණ වන රක්ෂිතයකි. මෙය ශිලාලේඛන 02 ක් සහ ඉපැරණි පිළිරුවක් ද සහිත භූමියක් වන අතර අනුරාධපුර යුගයට අයත් ගල් කටු සිදුරු සහිත ස්ථානයක් හා අනුරාධපුර යුගයේ වළංකටු තැන්පතුවක් ද සහිත ස්ථානයකි.

කලාප කාර්යාල මිදුල සහ පුරාවිද්‍යා රක්ෂිතයට යන පිවිසුම් මාර්ගය ද රක්ෂිත මායිම් ද සුද්ධ පවිත්‍ර කොට පවත්වා ගෙන යාම සිදු කරන ලදි. ස්ථානයට පැමිණෙන නරඹන්නන් සඳහා සමර් හට් 02 ක් ඉදිකරන ලදී.



තෝනිගල ශිලාලිපිය

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි පිච්චින්දියාව, එරබදුගස් වැව, කොට්ටගම, අන්දර වැව යන ස්ථානවල නඩත්තු කටයුතු පහත පරිදි ඉටු කරන ලදී.

- **පිච්චන්දියව** - යටි කැලය කපා ස්මාරක වටා සුද්ධ කොට මායිම් කණු යොදන ලදී.
- **කොට්ටගම ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** - රක්‍ෂිතය වටා අඩි 02 පළලට යටි කැලය කපා සුද්ධ කොට මායිම් කණු 25 යොදන ලදී.
- **අන්දර වැව** - මායිම් සුද්ධ කර මායිම් කණු යොදන ලදී.

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ලබුගල පුරාවිද්‍යා ස්ථානයේ යටි කැලය කපා සුද්ධ කර ප්‍රදර්ශන මට්ටමින් පවත්වා ගෙන යන ලදී.

**මාණික් කන්ද පුරාවිද්‍යා ස්ථානය.**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම පුරාවිද්‍යා ස්ථානය ක්‍රි.ව. 04-06 සියවස්වලට අයත් වු ගිරි ලිපි 02 ක් හා දාගැබ් ගොඩනැගිල්ලක් සහ වෙනත් නටබුන් දක්නට ඇති ස්ථානයකි.

මෙම ස්මාරකය අවට යටි කැලය කපා මුල් ගලවා සුද්ධ කිරීම සිදු කර නඩත්තු වැඩ නිම කරන ලදී.

**පඬුවස්නුවර පුරාවිද්‍යා වැඩබිම පවත්වා ගෙන යාම**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය අක්කර 62ක් පුරා විසිරුණු පුරාවිද්‍යා ස්මාරක සහිත භූමි ප්‍රදේශයකි. මාළිගා සංකීර්ණය වට ප්‍රාකාරය, දිය අගල, පංචායතන ගොඩනැගිලි චක්‍රාවාලය, ටැම්පිට විහාරය, බෝධිඝරය, දළදා මාළිගාව, නිශ්ශංකමල්ල සෙල්ලිපිය, දෙමළ සෙල්ලිපිය සහ හඳුනා නොගත් ගොඩනැගිලි ආදිය මෙහි දක්නට ලැබේ. අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ලක්ෂණ ඇතුළත් පුරාවිද්‍යාත්මක සාධක මෙහි දැකිය හැකි වීම විශේෂ ලක්ෂණයකි.

මෙම පුරාවිද්‍යා භූමිය ප්‍රමාණයෙන් විශාල වූ බැවින් දෛනික වැඩ බෙදීමේ ක්‍රම යටතේ එක් අයෙකුට අක්කර 02 බැගින් දෛනික පවත්වා ගෙන යාමට සහ සුද්ධ පවිත්‍ර කිරීමට භාර දෙන ලදි. ඒ යටතේ සුද්ධ පවිත්‍ර කිරීම් වසර පුරා සිදු කරන ලදි. මීට අමතරව මුර සේවයේ යෙදවීම, දිමනා රැකවල්කරුවන් යෙදවීම, රාත්‍රි මුර සේවය සඳහා මුරකරුවන් යෙදවීම, තණකොළ කපන යන්ත්‍රය අලුත්වැඩියා කිරිම, රැකවල්කරුගේ පාපැදිය අලුත්වැඩියා කර ගැනීම, සේවක වැසිකිළිය අලුත්වැඩියා කිරීම, මාළිගා පරිශ්‍රය තුළ ඇති පැරණි වැසිකිලිය සඳහා ආරක්ෂිත වැටක් ඉදි කිරීම ද සිදු කරන ලදි.

සංචාරක බංගලාව අවට පරිශ්‍රය දෛනිකව පිරිසිදු කිරීම සිදු කරන ලදි. ඇතුළත නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ප්‍රාදේශීය ගබඩාවෙන් මිල දී ගෙන එම කටයුතු ද පවත්වා ගෙන යන ලදි.

**වයඹ 02 කලාපය පවත්වාගෙන යාම**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි තෝනිගල පුරාවිද්‍යා රක්ෂිතය මෙහි ඇති ශිලා ලිපියට අනුව ක්‍රි.පූ. 01 වන සියවසට අයත් පුරාවිද්‍යා ස්ථානයකි. කාර්යාලය හා අවට භූමිය ප්‍රදර්ශන මට්ටමින් පවත්වා ගෙන යන ලදි. මෙම පුරාවිද්‍යා රක්ෂිතයේ පිවිසුම මාර්ගය ද දෛනිකව පිරිසිදු කිරීම සහ මායිම සුද්ධ කිරීම සිදු කරන ලදි.

**ලබුගල පුරාවිද්‍යා ස්ථානය**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ ක්‍රි.ව. 1 වන සියවසට අයත් ගිරි ලිපියක් හා කටාරම් සහිත ලෙන් 08ක්, ගොඩනැගිලි නටබුන් ස්ථාන 2ක් සහ ගලෙහි තනන ලද පියගැට සහිත ස්ථාන දෙකකින් ද ලෙන් ලිපියකින් ද යුක්ත ස්ථානයකි.

මෙම පුරාවිද්‍යා ස්මාරකය අවට යටි කැලය කැපීම, මුල් ගලවා සුද්ධ කිරීම සිදු කරන ලදි. හඳුනාගන්නා ලද මායිම වටා මායිම් කණු යෙදීම මාර්ග සංඥා පුවරුවක් යෙදීම සිදු කරන ලදි.

මීට අමතර ව පරමාකන්ද, ලබුගල, කෙත්තකාරාම, එරුනුක්කුලිය, එරමුදුගස්වැව යන පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා මාර්ග සංඥා පුවරු සවිකිරීම ද සිදු කරන ලදි.

**නාථගනේ පුරාවිද්‍යා ස්ථානය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය බමුණාකොටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය අක්කර 08ක පමණ පුරා සාධක විසිරී ඇති ස්ථානයකි.

ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.පූ. 1 සියවස දක්වා කාලයට අයත් පූර්ව බ්‍රාහ්මීය අක්ෂර සහිත ගිරි ලිපියක් මෙහි දක්නට ඇත. ලෙන් විහාර මෙහි දක්නට ලැබෙන අතර ලෙන් විහාර දෙකක මහනුවර යුගයට අයත් ප්‍රතිමා සහ සිතුවම් දැකිය හැකි ය.

මෙම පුරාවිද්‍යා ස්ථානයේ අක්කර 03 ක පමණ භූමි ප්‍රමාණයක් කැලය කැපීම සහ ස්මාරකවල වැවී තිබුණ තණ කොළ ඉවත් කිරීම සිදුකරන ලදි. පියගැටපෙලෙහි ද වල් පැල ඉවත් කර සුද්ධ පවිත්‍ර කරන ලදි.

**ඇත්කඳ විහාරය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඇත්කඳ විහාරය ඉතා ඈත ඉතිහාසයකට උරුමකම් කියන සාධක ඇත. ජාතක කථා පොත් වහන්සේ සිංහලයට පරිවර්තනය කළ ස්ථානය මෙය බව කියැවේ. මෙම ස්ථානයේ කටාරම් කොටන ලද ලෙන් දෙකක් සහ මහනුවර යුගයේ නිර්මිත සිතුවම් හා ප්‍රතිමා දක්නට ඇත. පැරණි ප්‍රාකාර බැමි ද පියගැටපෙළ සහ මුරගල් හා ගල්කණු ද මෙම ස්ථානයේ දක්නට ඇත.

2005 වසරේ දී සංරක්ෂණය කරන ලද ලෙන් විහාර උළු කැට ගැලවී බිඳී තිබුණ අතර නැවත යෙදීමට අවශ්‍ය විය. එබැවින් එම උළු කැට ඉවත් කර වහල පිරිසිදු කර එහි උළු 413 ක් නැවත අලුතින් යොදා සෙවිලි කිරීම සිදු කරන ලදි.

**රත්කරව්ව පුරාවිද්‍යා නටබුන් සහිත භූමිය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ දළඳ වහන්සේ සුළු වේලාවක් තැන්පත් කළ බවට මතයක් වේ. දැනට දක්නට ලැබෙන සාධක අතුරින් සෙල් ලිපියක් ද පාදම් කිහිපයක් ද ගල් පඩි කිහිපයක් ද දක්නට ඇත.

නිධන් හොරුන් විසින් හාරන ලද චෛත්‍යය ගොඩනැගිල්ල ද ගොඩනැගිලි සාධක ලෙස හඳුනාගත හැකි ගල් කණු 02 ක් ද මෙහි දක්නට ඇත.

අක්කර 02 ක පමණ භූමියෙහි යටි කැලය කපා මායිම පෑදීම සිදු කළ අතර චෛත්‍ය ගොඩනැගිල්ල අවට අක්කර 1/4 ක් පමණ භූමි ප්‍රමාණයක් ද ගල් කණු අවට අක්කර 1/4 ක් පමණ භූමි ප්‍රමාණයක් ද කැලය කපා සුද්ධ පවිත්‍ර කරන ලදි.

**නැටිය නුවර කන්ද පුරාණ ලෙන් විහාරය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ ලෙන් 23ක් පිහිටා ඇත. මෙය වළගම්බා රජතුමා සැඟවී සිටි ස්ථානයක් ලෙස ප්‍රකට ය. ක්‍රි.පූ. 03 වන සියවසේ සිට ම මෙම ස්ථානය ආගමික ස්ථානයක් ලෙස පැවතුණ බව ලෙන්වල ඇති සෙල් ලිපිවලින් අනාවරණය වේ.

පූර්ව බ්‍රාහ්මීය අක්ෂර සහිත කටාරම් කොටන ලද ගල්ලෙන් 18ක් පමණ මෙහි ඇති පුරා සාධක වන අතර නටබුන් ගොඩනැගිල්ලක් ආසන ගලක්, පැරණි බොරදම් සහිත ගඩොල්, දක්නට ඇති අතර ප්‍රතිමා ශේෂයන් ද මෙම භූමියේ දක්නට ඇත.

ලෙන් විහාරයේ වහලයේ කැඩී ඇති උළු නැවත යෙදීම හා බොල් වී ඇති බිත්ති අලුතින් සකස් කිරීම ද සිදු කරන ලදි.

**නිකපිටිය පුරාවිද්‍යා රක්ෂිතය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම පුරාණ ස්ථානය අක්කර 1/2 ක පමණ පුද්ගලික ඉඩමක දෙමහල් ප්‍රාසාදයකට අයත් ගලක් සහ දාගැබක අවශේෂ දක්නට ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ගැසට් කර මායිම් දමා ඇත.

මෙහි ප්‍රවේශ මාර්ගය පිරිසිදු කර පුරාවස්තු විසිරි ඇති සමස්ත භූමිය වල් පැළ ඉවත් කර අතුගා පිරිසිදු කර දෛනිකව පවත්වා ගෙන යන ලදි.

**රිදීකන්ද පුරාවිද්‍යා රක්ෂිතය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය අක්කර 06ක් පුරා පුරාසාධක විසිරී ඇති ස්ථානයකි. ශෛලමය පිළිමය, චෛත්‍ය ගොඩනැගිල්ල, පොකුණ හඳුනා නොගත් ගොඩැලි 2ක් හා පෙත් මං යන ස්ථාන මෙහි ප්‍රධාන අංග වන අතර අනුරාධපුර යුගයේ ලක්ෂණ පෙන්නුම් කරන හිටි පිළිමයක් ද තැන්පත් කර ඇත. මෙය ආගමික සංකීර්ණයක් ලෙස පැවතුණ බව නටබුන්වලින් විද්‍යමාන වේ.

මෙහි අඩි 03ක් පමණ මායිම වටා මායිම් කෙටීම සිදු කළ අතර චෛත්‍ය ගොඩනැගිල්ලේ තිබූ කැළෑව සුද්ධ කරන ලදි. පෙත් මගෙහි කැලෑව ඉවත් කළ අතර පොකුණ පිහිටි අවට භූමිය යටි කැලය කපා සුද්ධ පවිත්‍ර කරන ලදි.

**තිස්සව රජමහා විහාරය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර /නැගෙනහිර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම රජමහා විහාරය යුග කිහිපයකට අයත් නටබුන් විසිරී ඇති

ස්ථානයකි. කටාරම් කෙටූ ලෙන් විහාරයක් ඇති අතර මෙහි සැතපෙන පිළිමයක් ද ඇත. තවත් කටාරම් කෙටූ ගල්ලෙන් 02ක් මෙම සංකීර්ණයට කි.මී. 02 ක් පමණ දුරින් පිහිටා ඇත.

මෙහි ඇති ගල මුදුනේ ආගමික සංකිර්ණය අසල සහ ඒ සඳහා වූ ප්‍රවේශ මාර්ගය එලි පෙහෙලි කර පවත්වා ගෙන යන ලදි.

**රංචා වැව සොරොව්ව ශුද්ධ පවිත්‍ර කිරීම.**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම වැව පිහිටි භූමියේ පුරා සාධක ලෙස දැනට කි.මී. 04 ක පමණ දුරට දෘශ්‍යමාන වන වැව් බැම්ම දක්නට ඇති අතර එහි ශෛලමය අවශේෂ හා සෙල් ලිපියක් ද ඇත.

මෙම වැව් බැම්මෙන් කි.මී. 40 ක් පමණ දුරට යටි කැලය කපා සුද්ධ පවිත්‍ර කරන ලදි. සොරොව්ව ආශ්‍රිත කොටසේ ද යටි කැලය කපා විසි  ගසා සුද්ධ පවිත්‍ර කරන ලදි. තවද තෝරගල්ල මාර්ගයෙන් ඇතුලුවන ප්‍රදේශයෙන් වූ චෛත්‍ය ගොඩැල්ල හා දේවාලය ආශ්‍රිත භූමිය ද යටි කැලය කපන ලදි.

**දෙටියමුල්ල රජ මහා විහාරය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර බටහිර ප්‍රාදේශිය කොට්ඨාසයේ පිහිටි මෙම ස්ථානය ජෙට්ඨතිස්ස රජුන්ගේ උප රාජධානියක් ලෙස ගොඩ නගා එහි වෙහෙර විහාර සංඝාවාස ආදිය කරන්නට ඇති බව ජනප්‍රවාදයේ එයි.

අනුරාධපුර යුගය දක්වා විහිදෙන පුරා සාධක ඇති විසිරී ඇති මෙම භූමියේ යන්ත්‍ර ගල,පැරණි උළුවහු කණු, ඇඹරුම් ගල් ද්‍රවිඩ අක්ෂර සහිත ශිලා ලිපියක්, පිළිමගෙයක් හා සංඝාවාස ගොඩනැගිලි 02ක් මෙහි ප්‍රධාන පුරා සාධක ලෙස දැකිය හැකි ය. මෙහි ඇති විහාර ගෙයක නටබුන් සහිත භූමිය සහ ආරාම ගොඩනැගිලි දෙකක් අවට ඇති භූමිය සුද්ධ පවිත්‍ර කර නඩත්තු කරන ලදි. පෙත් මං වල වල් පැළෑටි ඉවත් කිරීම, බැම්වල තිබූ කැළෑව ද ඉවත් කිරීම යනාදී කාර්යන් ඉටු කර මෙම භූමිය ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙන යාම සිදු කරන ලදි.

**මැදගමකන්ද නිකසලා නුවර ආරණ්‍ය සේනාසනයේ පොකුණ සංරක්ෂණය කිරීම.**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම පුරාවිද්‍යා ස්ථානයේ දැනට ආරණ්‍යවාසි භික්ෂූන් වහන්සේලා වැඩ සිටින ස්ථානයකි. කටාරම් කොටන ලද ලෙන් කිහිපයක්, මෙහි ඇත. මෙහි ලෙන් ලිපි සහිත ගල් ලෙනක් ද ගල් පතුරුවලින් සකස් කරන ලද පොකුණක් ද, කඳු මුදුනෙහි ඉදි කරන ලද දාගැබක් ද මෙහි පුරා සාධක ලෙස දැක්විය හැකි ය.

මෙහි ද ගල් පොකුණ ඇතැම් බැම් කොටස් අවිධිමත්ව තිබූ අතර තැනින් තැන පස් කඩා වැටී තිබුණි. මෙම පොකුණෙහි ඉදිරිපස ගල් ඇතුළට තල්ලු වී අක්‍රමවත්ව තිබූ බැවින් නැවත ඒවා සකස් කර ක්‍රමවත්ව සිමෙන්ති බදාමෙන් බඳින ලදි. සක්ක ගල් බැම්ම ද නැවත ශක්තිමත් කරන

ලදි. අඩි 04ක් පමණ උස් වූ මෙම සක්ක ගල් බැම්ම නැවත සකස් කිරීමෙන් පසු පොයින්ට් කිරීම ද කරන ලදි. මේ අනුව මෙම ස්ථානය නඩත්තු කර පවත්වාගෙන යන ලදි.

**මැදගම කන්ද පුරාවිද්‍යා රක්ෂිතයේ නඩත්තු කටයුතු**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත.

මෙහි පුරාවිද්‍යාත්මක සාධක ලෙස කැණීම් කර සංරක්ෂණට කරන ලද ගොඩනැගිලි 02 ක් ඇත. ප්‍රධාන ලෙන් විහාරයක් හා තවත් දේවාලයක් සහිත ලෙනක සහ කටාරම් කොටන ලද ලෙන් ගණනාවක් ඇත. මිට අමතරව පුරාවිද්‍යා නටබුන් සහ සංරක්ෂණය කරන ලද චෛත්‍යයක් ද ඇත.

මෙහි දී දේවාලයට වූ ප්‍රවේශ මාර්ගයේ පඩි පෙළෙහි ගල් ක්‍රමානුකූලව සකස් කර ගන්නා ලදි. ඉන් පඩි 12 ක් සකස් කරන ලදි. මළුවෙහි බැම්ම සැකසීම ද සිදු කරන ලදි. දිග අඩි 15 ක්ද උස අඩි 01ක්ද පළල අඩි 02ක් ද වූ ලෙන ආසන්නයේ ම වූ එවැනි බැම්මේ ද අඩි 25ක් පමණ දුරට නැවත සකසා පොයින්ට් කරන ලදි. හුඹස් මැටි යොදාගෙන දේවාල ලෙනෙහි බිත්ති කඩතොළු ස්ථාන නැවත සකසන ලදි. වට පිලට ගල් යොදා නැවත සකස් කරන ලදි. විජය සොහොන දක්වා වූ මාර්ගය දෙපස කැලෑව කපා වල් නාශක යෙදිම ද සිදු කරන ලදි.

**පබලුගල පුරාවිද්‍යා ස්ථානය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය වීදුරු නිපදවීමට යොදා ගන්නා ලද ස්ථානයකි. ඒවා උණු කිරීමට යොදා ගන්නා ලද ස්ථානයක් බවට සාක්ෂි දරන උඳුන් 03 ක් මෙහි ඇත. මෙහි ඇති උඳුන් 03හි ගැඹුර අඩි 5 1/2 ක් පමණ වේ.

මෙම ස්ථානයේ යටි කැලය කැපීම හා සුද්ධ පවිත්‍ර කර පවත්වාගෙන යාම සිදුකරන ලදි. මේ යටතේ අක්. 1 1/2 ක පමණ රක්ෂිතයේ යටි කැලය කැපීමත් එම භූමිය මුල් ගලවා පොළොව පිරිසිදු කිරීමත්, හතර වට මායිම් අඩි 04ක් පළල කැලය කපා පිරිසිදු කිරීමත් සිදු කරන ලදි.

**පුඩුපුලංවිය පුරාවිද්‍යා රක්ෂිතය**

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල් ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම පුරාවිද්‍යා ස්ථානය ක්‍රි.ව. 3,4 සියවස්වලට අයත් බව පැවසේ. එම කැලයට අයත් කටාරම් කොටන ලද ලෙන් 03ක් ද කුඩා ප්‍රමාණයේ බෝධිඝරයක් ද, පහන් ගලක් ද, ගල්කණු සහිත විශාල ගොඩනැගිල්ලක් ද විසිරි ඇති පුරාසාධකවලින් ද යුක්ත ස්ථානයකි.

යොදන ලද දීමනා රැකවල්කරුගේ සේවයට අමතරව රක්ෂිතයේ යටි කැලය කපා මුල් ගැලවීම අඩි 04ක් පළලට ඉටු කරන ලදි. අක්කර 03ක ප්‍රමාණයේ යටි කැලය කපන ලද අතර මුල්

ගලවා පොළොව පිරිසිදු කරන ලදි. වට මායිම අඩි 04ක් පළලට සුද්ධ කර නඩත්තු කර පවත්වා ගෙන යන ලදි.

**නිල්ලග්ගම පුරාවිද්‍යා රක්ෂිතය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල් ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ය. ඉපැරණි බෝධිසරයක් ද ඊට අමතරව මෙම ස්ථානය ගැන කියවෙන සෙල් ලිපියක් ද ඇත. යොදවා ඇති දීමනා රැකවල්කරුගේ සේවාවන්ට අමතරව අක්කර 03ක පමණ ලඳු කැලය කපා අක්කර 1 1/2 ක පමණ මුල් ගලවා පිරිසිදු කර බෝධිසරය වටා තිබූ කටු කම්බි වැට පිළිසකර කරන ලදි. වට මායිම් අඩි 04ක් පළලට සුද්ධ කරන ලදි.

**මහඅන්දර වැව පුරාවිද්‍යා රක්ෂිතයේ නටබුන් සහිත භූමිය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම පුරාවිද්‍යා ස්ථානයේ ඇති නටබුන් අනුරාධපුර අවධියට අයත් බවට විශ්වාස කෙරේ. පැරණි චෛත්‍ය නටබුන්, ටැම්පිට විහාරයක නටබුන් ද ගල් කණු සහිත ගොඩනැගිලි තුනක් ද විතැන් වූ ගල් කණු කිහිපයක් ද මෙහි දැකිය හැකි පුරා සාධක වේ. මෙම ස්ථානයේ රක්ෂිතය අක්කර 03ක පමණ සුද්ධ පවිත්‍ර කළ අතර මෙහි මාර්ග සංඥා පුවරුව යෙදීම සහ මායිම් සුද්ධ කිරීම සිදු කරන ලදි.

**අරන්කැලේ පුරාවිද්‍යා ස්ථානය**

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම පුරාවිද්‍යාත්මක ස්ථානය වනවාසී භික්ෂු ආරාමයක ලක්ෂණ පෙන්වයි. පධානසර, චංකමණසර, පෙත් මං, පොකුණු සහ විශාල ජන්තාඝරයක් ද මෙහි ඇත. අක්කර 65 කින් පමණ යුක්ත භූමි ප්‍රමාණයක් මෙහි ඇත. මෙය මලියදේව මහරහතන් වහන්සේ වැඩ සිටි බවත්, ක්‍රි.ව. 06 සහ 08 වන සියවස්වලට අයත් බවත්, දෙටු තිස් රජ දවසට අයත් ස්ථානයක් බවත් ජනප්‍රවාදයේ ප්‍රකාශ වේ.

ස්ථානයේ මුරසේවය පවත්වා ගෙන යාම, දෛනික නඩත්තු කටයුතු පවත්වා ගෙන යාම් ඉටු කිරීම, බැම්වල ඇති සුළු නඩත්තු කටයුතු ඉටු කිරීම, වට මායිම් සුද්ධ කර කම්බි වැට සැකසීම, පෙත් මං පිරිසිදු කිරීම, යෝජිත වැසිකිලි ගොඩනැගිල්ල සඳහා භූමිය සැකසීම සිදු කර මෙම ස්ථානය පවත්වා ගෙන යන ලදි.

**කල්පිටිය ඕලන්ද පල්ලිය පවත්වාගෙන යාම.**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම පල්ලිය ඕලන්ද වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙන්නුම් කරයි. රවුම් කණු මගින් දරා සිටින ඉදිරිපස මණ්ඩපයක් සහ විශාල ශාලාවක් සහිත පල්ලි ගෘහයකින් සමන්විත මෙම පල්ලිය දෙපස රවුම් කණු සහිත ආලින්ද දෙකක් ද වේ. බිත්තියක පළල අඩි 03ක් පමණ වන අතර හුණුගල් ඇසුරින් බිත්ති සකස් කර ඇත.

මෙම ගොඩනැගිල්ල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම මත ක්‍රිස්තියානි රෙපරමාදු සභාවට භාර දී ඇති අතර දෛනිකව සුද්ධ පවිත්‍ර කරමින් වසර පුරා පවත්වා ගෙන යාම සිදු කරන ලදි.



කල්පිටිය ඕලන්ද පල්ලිය

**රාජාංගනය පුරාවිද්‍යා ස්ථානය (2010)**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ පහත සඳහන් නඩත්තු කටයුතු ඉටු කරන ලදි.

- මීටර් 400 මායිම් කැපීම සහ මායිම් ගල් දැමීම.
- නටබුන් ප්‍රදේශයේ ඇති ගඩොල් බැම් හා ගැලවී ඇති ගඩොල් කැට සවි කිරීම හා සෝදා පාලුවට ලක් වී ඇති ස්ථානවල පඩි බැඳීම හා කොන්ක්‍රීට් යෙදීම කරන ලදි.
- රාජාංගනය පුරාවිද්‍යා ස්ථානයේ සිට ප්‍රධාන පිවිසුම් සිට පොකුණ දක්වා පෙත් මග අඩි 04ක් පළලට අගල් 04ක් උසට සිටින සේ අඩි 300 ප්‍රමාණයක් බොරළු අතුරන ලදි.
- කෞතුකාගාරයේ සිවිලිම ගැසීම සිදු කරන ලදි.
- නිල නිවසේ පිටුපස පේමන්ට් එක අඩි 43 ක ප්‍රමාණයක් දමන ලදි.
- පුරාවිද්‍යා භූමියේ ජලනල එලීම ද සිදු කරන ලදි.

## උතුරු මැද පළාත

### අනුරාධපුර දිස්ත්‍රික්කය

### තොලුවිල පුරාවිද්‍යා ස්ථානය

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාතෙහි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය වාස්තු විද්‍යාත්මක විහාර වර්ගීකරණයට අනුව පබ්බත විහාර සංකිර්ණයකි.

මෙහි විසි ගැසීම, කැලය කැපීම, ස්මාරක මත පැළෑටි ඉවත් කිරීම සහ අපද්‍රව්‍ය ඉවත් කිරීම සිදුකරන ලදි.



තොලුවිල පුරාවිද්‍යා ස්ථානයෙහි විසි ගැසීම

### ප්‍රාචීන තිස්ස පුරාවිද්‍යා ස්ථානය

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි මෙම ස්ථානය ක්‍රි.ව. 4 වන සියවසෙහි රජකළ ලජ්ජතිස්ස රජුගේ කාලයට අයත් ස්ථානයකි.

මෙම ස්ථානයේ ස්මාරක බැමි කිහිපයක් තහවුරු කර කුස්තුර පිරවීම සිදු කරන ලදි. ප්‍රධාන මාර්ගයට බොරළු ඇතිරිම දෛනිකව සුද්ධ පවිත්‍ර කිරීම ද ඉටු කරන ලදි. මීට අමතර ව පුබ්බාරාමය හා මුල්ලේගල පුරාවිද්‍යා රක්ෂිතවල යටි කැලය කපා සුද්ධ කරන ලදි.

**කලාප අංක 1 පවත්වාගෙන යාම**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පදවිය පුරාවිද්‍යා ස්ථානයේ පහත සඳහන් නඩත්තු කටයුතු ඉටු කරන ලදි.

- දිවා රාත්‍රි මුර සේවය පවත්වා ගෙන යාම.
- දෛනික සුද්ධ පවිත්‍ර කිරීම.
- ස්මාරක සුද්ධ පවිත්‍ර කිරීම.
- ගැලවී ඇති බැමි කොටස් පිළිසකර කිරීම සිදු කරන ලදි.

**කලාප අංක 06 පවත්වාගෙන යාම.**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් මෙම කලාපයේ නාවෙහෙර, දිවුල් වැව, කොක්එබේ, තිඹිරිවැව යන පුරාවිද්‍යා ස්ථානවලට අදාළව බොරළු ඇතිරීම, පුරාවිද්‍යා ස්ථාන දෛනික සුද්ධ පවිත්‍ර කොට පවත්වා ගෙන ලදි.

**කලාප අංක 07 පවත්වාගෙන යාම.**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම්පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයට අදාළව පහත සඳහන් කාර්යන් ඉටු කරන ලදි.

- කලාපය සතු සුද්ධ පවිත්‍ර කිරීම.
- තොලුවිල පුරාවිද්‍යා ස්ථානයේ කුඩා ස්තූපයේ සලපතල මළුව තහවුරු කිරීම.
- ප්‍රාචීනතිස්ස පුරාවිද්‍යා ස්ථානයේ ස්මාරක බැමි කුස්තුර පිරවීම.
- කලාපයට අයත් රක්ෂිත නඩත්තු කිරීම.
- ස්මාරකවලට වේ නාශක යෙදීම.

**රිටිගල පුරාවිද්‍යා ස්ථානය**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රිටිගල පුරාවිද්‍යා ස්ථානය පහත සඳහන් කාර්යන් ඉටු කරන ලදි.

- දෛනික මුරසේවය පවත්වාගෙන යාම,
- ස්ථානය සුද්ධ පවිත්‍ර කිරීම.
- අංක 16 ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.
- පෙරළී තිබූ වට බැම්ම අලුත්වැඩියා කිරීම.
- කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සිදු කරන ලදි.

## ඌව පළාත

**තිඹිරිය පුරාණ විහාරයේ අවාසගෙය බැම්ම බැඳීම හා කුස්තුර පිරවීම**

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා දිවෙන ඉතිහාසයක් සහිත ස්ථානයකි.

මෙහිදී නඩත්තු කාර්යයක් ලෙස සෝදා පාලුවී දුර්වලව පැවති බැම්ම නැවත සකස් කොට සිරස්ව සහ තිරස්ව කුස්තුර පිරවීම සිදු කරන ලදි.

සංඝවාසයේ ඉදිරිපස බැම්ම ස්ථාන කිහිපයක් ගරා වැටීමට ලක්ව ඇති නිසා අත්තිවාරම දක්වා පස් පුරවා ශේෂ වී ඇති බැම්මට සමපාත වන අයුරින් කුස්තුර පුරවා බැම්ම සකස් කරන ලදි. මෙම සියලුම කුස්තුර පිරවීම සිදු කරන ලද්දේ සිමෙන්ති, වැලි, හුණු, මැටි, බදාම යන මිශ්‍රණයෙනි. මේ ආකාරය කුස්තුර පුරවා බැම් කොටස් තහවුරු කරන ලදි.

**ඌව 07 කලාපය පවත්වාගෙන යාම**

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙම කලාපයට විලැතිගොඩ පුරාවිද්‍යා ස්ථානය, තිඹිරිය පුරාවිද්‍යා ස්ථානය, මාළිගාතැන්න පුරාවිද්‍යා ස්ථානය කොටසර පියංගල පුරාවිද්‍යා ස්ථානය කරාඩුගල පුරාවිද්‍යා ස්ථානය ඇතුළත් ය.

මෙම සියලුම ස්ථානවල යටි කැළය කැපීම සුද්ධ පවිත්‍ර කිරීම යනාදි කටයුතු ඉටු කර පවත්වා ගෙන යන ලදි.

**කොටසර පියංගල ටැම්පිට විහාරයේ වහල නඩත්තුව**

ඌව පළාතට අයත් මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම ස්ථානය අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය මෙන් ම මහනුවර යුගය යන යුගයන් නියෝජනය කරන ස්ථානයකි.

මෙම ටැම්පිට විහාරයේ වහලයේ ඉදිරිපස කොටසෙහි රීප්ප හා උළු මාරු කිරීම සිදුකර දැව ආරක්ෂිත ආලේප කර වහලය සෙවිලි කර යථාවත් කරන ලදි. ටැම්පිට විහාරයේ බිත්ති සියල්ලෙහි දෙවරක් සුදුහුණු ආලේප කරන ලදි. ප්‍රතිමා ගෘහයේ පිවිසුම් දොරටුවෙහි ප්‍රධාන අගල නිසි පරිදි සකසා නඩත්තු වැඩ නිම කරන ලදි.

**මුතියංගණ රජමහා විහාරයේ සළපතල මළුව සකස් කිරීම.**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම විහාරස්ථානයේ සලපතල මළුව සකස් කර තිබූ ආකාරය මේ වන විට එහි පෞරාණිකත්වයට හානියක්ව පැවතුනි. එය නැවත ක්‍රමවත් පරිදි සකස් කිරීම සිදු කරන ලදි. ඒ අනුව අක්‍රමවත් පරිදි සහ නුසුදුසු ලෙස යොදා තිබූ ඉංජිනේරු ගඩොල් සහ පිඟන් ගඩොල් ඉවත් කර ග්‍රැනයිට් ගල් අතුරා පෞරාණික ආකාරයට සකස් කරන ලදි. මේ සඳහා ප්‍රතිපාදන විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් සපයන ලදි.

**ඌව 03 කලාපය පවත්වාගෙන යාම.**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව 03 කලාපයට අයත් බණ්ඩාරවෙල, හපුතලේ, ගල්ලෑටිමුල්ල, වැලිමඩ, ඌවපරණගම වශයෙන් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් පුරාවිද්‍යා ස්ථාන සඳහා දීමනා රැකවල්කරුවන් යෙදවීම, කලාපයේ වැඩබිම්වල මායිම් තහවුරු කිරීම සහ ආරක්ෂා කර පවත්වාගෙන යාම සිදු කරන ලදි.

**දියතලාව ක්ෂෙත්‍ර නිවාසය පවත්වාගෙන යාම හා අලුත් වැඩියාව**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දියතලාව ක්ෂෙත්‍ර නිවාසය පවත්වාගෙන යාම සහ අළුත්වැඩියාව සිදු කරන ලදි.

**කොටසර පියංගල ආවාසයෙහි වහල නඩත්තුව**

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම පුරාවිද්‍යා ස්ථානයේ ආවාසයෙහි වහල අලුත්වැඩියා කරන ලදි. මෙහි දිරාපත් වූ දැව රාමු සහ රීප්ප ඉවත් කර අලුතින් දැව යොදා වහල සකස් කිරීම ද කුමේර බැඳීම ද සිදු කරන ලදි.

කඩතොළු වූ බිත්ති කපරාරු කිරීමත් ගෙබිමෙහි කඩතොළු ස්ථාන සකසා ගෙබිම සකස් කිරීමත් ටෙරාකොටා ගල් අතුරා ඇති ස්ථානවල කුමේර පිරවීමත් සිදු කරන ලදි.

**යහල බැද්ද සියවස් දාගැබ තීන්ත ආලේප කිරීම.**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. මෙම ස්ථානයේ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදි.

- දාගැබේ හතරැස් කොටුව - කොත්කැරැල්ලේ සහ ගර්භයේ පිලර් ආලේප කිරීමෙන් පසුව වෙදර්සීල් ආලේප කරන ලදි.
- සමාධි පිළිමය පිහිටි බිමෙහි හා පඩි පෙලේ දෙවරක් බිම් ආලේපන ගල්වන ලදි.
- පිත්තල කොත බ්‍රාසෝ දමා පිස දැමීම සහ ආරක්ෂක ආලේප ගැල්වීම.

**මාළිගාවිල බුදු පිළිමය අසල මුරගල ප්‍රතිසංස්කරණය කිරීම.**

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය ඌව 5 කලාපයට අයත් ය.

මෙම ස්ථානයේ බුදු පිළිමය අසල ආවරණ බැම්ම යථාවත් කිරීමත් අසල පිහිටි නුග ගසෙහි අත්තක් වැටීම නිසා හානියට පත්ව තිබූ මුරගල නැවත ප්‍රතිසංස්කරණය කිරීමත් සිදු කරන ලදි.

## සබරගමුව පළාත

**දෙවනගල පුරාවිද්‍යා ස්ථානය.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම ස්ථානය ප්‍රාග් ඓතිහාසික ස්ථානයකි. පැරණි විහාර, දාගැබ්, ටැම්පිට විහාරය, පොකුණ, ශිලා ලිපි, සිරිපතුල් ගල් මෙහි ප්‍රධාන පෞරාණික අංග වේ.

- ටැම්පිට විහාරය බිම මැටි හා ගොම ගා සකස් කිරීම හා වේ නාශක යෙදීම සිදු කරන ලදී. දේවාල ගොඩනැගිලිල්ල කැඩී ඇති තැන් සකස් කිරීම සංඝවාසයේ සුදුහුණු ගෑම හා දැව ආරක්ෂක යෙදීම සිදුකරන ලදී.
- විදුලිය ලබා ගැනීම සඳහා වූ විදුලි මීටරය සකස් කරන ලදී. පෙත් මං සැකසීම, වැසිකිළි පවත්වා ගෙන යාම. ගිමන් නිවා ගැනීම සඳහා ආසන සැකසීම සිදුකරන ලදී.
- ඔසු උයන සඳහා වූ පැළ රෝපණය සිදු කරන ලදී.

**දැදිගම පුරාවිද්‍යා කෞතුකාගාරය පවත්වා ගෙනයෑම.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දැදිගම පුරාවිද්‍යා කෞතුකාගාරය පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත පුරාවස්තු බොහෝමයක් තැන්පත් කොට ඇති ස්ථානයකි.

මෙහි පුරාවස්තු හායනයන්ට ගොදුරුවන ප්‍රධාන හේතුන් වලක්වා ගැනීමට පියවර ගත් අතර දෛනික පිරිසිදු කිරීම් සහ කෞතුකාගාරය අවට පරිසරය පවත්වා ගෙන යාම ද මුර සේවයක් පවත්වා ගෙන යාම ඇතුළු ප්‍රදර්ශන මට්ටමට අදාල සියලුම නඩත්තු කාර්යයන් ඉටු කරන ලදී.

**කඩිගමුව නාගවනාරාම විහාරය නඩත්තුව.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කඩිගමුව නාගවනාරාම විහාරය මහනුවර යුගයට අයත් ක්‍රි. ව. 1758 දී පමණ ඉදිකළ විහාරයක් බව ප්‍රකට වේ. ටැම්පිට විහාරය මෙහි ප්‍රධාන ස්මාරකය වේ.

මෙහි වහලය දිරා ඇති ස්ථාන සඳහා පමණක් රීප්ප යොදා වහලෙහි පෙති උළුවලින් සෙවිලි කරන ලදී. වහලයේ පල 03 ක් සඳහා උළු රැඳවුම් ලෑල්ල යොදන ලදී. කුමේර උළු සම්පූර්ණ වහලයට ම යොදන ලදී.

බීරළු වැටෙහි රාමු 04 ක් සහ බීරළු 18 දිරාපත්ව තිබු බැවින් අලුතින් යොදන ලදී. මේ ලෙස ටැම්පිට විහාරයේ නඩත්තු කටයුතු ද ඉටු කරන ලදී.

**සබරගමුව 07 කලාපය සහ කලාප කාර්යාලය පවත්වා ගෙන යාම.**

**මඩුවන්වෙල වලව්ව.**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි මඩුවන්වෙල වලව්ව ක්‍රි.ව. 1700 ☛☛ වන විමලධර්ම සූරිය රජු යටතේ ඉදි වූ බව සැලකේ. කාමර 121 ක් මැද මිදුල් 21 ක් වට ප්‍රාකාර 03 ක් අධිකරණ ශාලාවක් සහ උද්‍යාන නටබුන් මෙහි විශේෂතා වේ. මෙම ගොඩනැගිල්ලෙහි ඇති වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ හේතු කොට ගෙන ස්මාරකයක් සේ ප්‍රකාශයට පත් කර ඇත.

මෙහි දෛනික මුර සේවය පවත්වාගෙන යාම, ගොඩනැගිල්ල හා අවට භූමිය ප්‍රදර්ශන මට්ටමෙන් පවත්වා ගෙන යාම, ගොඩනැගිල්ල ඇතුළත වේයන්ගෙන් හායනය වු ස්ථාන සඳහා වේ නාශක යෙදීම ආදී නඩත්තු කටයුතු සිදුකරමින් මඩුවන්වෙල වලව්ව නඩත්තු කර පවත්වා ගෙන යන ලදී.

මීට අමතර ව පුරාවිද්‍යා කලාප කාර්යාලය පවත්වා ගෙන යාම ද සිදු කරන ලදී.

සබරගමුව 07 කලාපය අයත් අඹගහවෙහෙර, ටැංකැටිය, තෙරුන්නාන්සේගම, පුස්සදේව සොහොන, සංඛපාල, වලල්ගොඩ, පැපොල්වත්ත සහ කුඹුස්ස සොහොන් භූමිය යන ස්ථාන එළි පෙහෙළි කර වර්ෂය පුරා පවත්වා ගෙන යන ලදී.



මඩුවන්වෙල වලව්ව

**දොරවක්කන්ද ගල්ලෙන.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය 1991 දී කැණීම් කරන ලද ස්ථානයකි. මැටි බඳුන් කැබලි, තිරිවානා ගල්පතුරු, කහඳගල් පතුරු, ධාන්‍යය වර්ගවල පොතු හා අවශේෂ ද මෙම ස්ථානයේ පුරා සාධක ලෙස හමු වි ඇත. මෙම ලෙනෙහි ආදි මානවයන් විසින් කුරුටු ගාන ලද හඳුනාගත් සහ හඳුනානොගත් චිත්‍ර ද ඇත. මධ්‍යශිලා යුගය බෙහෙවින් පෙන්නුම් කරන සාධක මෙහි දි හමු වී ඇත.

මෙහි වර්ෂය පුරා ම දිමනා රැකවල්කරුවෙකු යොදවා රැකවල් යෙදූ අතර පවත්වා ගෙන යාම සිදු කරන ලදී.

**බෙලිගල පුරාණ විහාරය, පුරාණ ධර්ම ශාලාව සහ රක්ෂිතය.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ නුවර යුගයේ ලක්ෂණ පෙන්නුම් කරන පිළිම සහ සිතුවම් දක්නට ලැබෙන ස්ථානයකි.

ධර්ම ශාලාව ක්‍රි. ව. 1890 දී කළ බව සඳහන් වේ. මෙහි පුරාණ විහාරයෙහි වහලයෙහි කුමේර බැඳීම, පහත් වූ උළු සකස් කිරීම ආදි නඩත්තු වැඩ ඉටු කරන ලදි. බෙලිගල රක්ෂිතය ත්‍රෛමාසිකව සුද්ධ පවිත්‍ර කිරීම් ඉටුකරන ස්ථානයක් වන අතර මැයි මස සිට ඒ අවට සුද්ධ පවිත්‍ර කිරීම් සිදුකර පවත්වා ගෙන යන ලදී.

- සබරගමුව 03 කලාපය අයත් දැදිගම පුරාණ විහාරයේ පහත් වූ උළු නැවත සකසා බිඳීගිය කුමේර උළු යෙදීම සිදුකර ඇත.
- මැණික් කඩවර පෘතුගිසි බලකොටුව වීසි ගසා සුද්ධ පවිත්‍ර කර පවත්වා ගෙන යන ලදී.

**සබරගමුව 07 කලාපයට පහත සඳහන් ස්ථාන සඳහා මාර්ග සංඥා පුවරු යොදන ලදී.**

- **වට්ටාරම පුරාණ විහාරය** - රංවල මංසන්ධිය සඳහා
- **දැදිගම සූතිඝර චෛත්‍යය** - නෙළුන්දෙණිය මංසන්ධියෙන්
- **කඩිගමුව පුරාණ ආරණ්‍ය සේනාසනයේ** - කෝට්ටපොළ හන්දියෙන් ද මාර්ග සංඥා පුවරු යොදන ලදී.
- **තහනම් ඉඩම් පුවරු** - බෙලිගල රක්ෂිතය සඳහා.
- **සෙල්ලිපි පුවරු** - වට්ටාරම පුරාණ විහාරයේ පැරණි විහාරය අසල පුවරු ලිපිය යොදන ලදී.

**මංගෙදර ටැම්පිට විහාරය.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැදිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම විහාරස්ථානය මහනුවර යුගයේ ඉදිකරන්නක් බව ප්‍රකාශ වේ.

මෙම ටැම්පිට විහාරයේ පඩිපෙළ දික් අතට ඇති දැව බාල්ක දෙකේ ඉදිරිපස දැඩි ලෙස දිරාපත්ව ඇති බැවින් පඩිපෙළ කඩා ඉවත් කර දැව බාල්කවලින් වෙන්වන සේ ඉදිරිපස පඩිපෙළ නැවත බඳින ලදි. යට ම ලී රාමුව මත හරස් අතට වූ යට ලෑලි තට්ටුව දිරාගොස් ඇති ලෑලි වෙනුවට අලුතින් ලෑලි යොදන ලදි.

ටැම්පිට විහාරය ගොඩ නගා තිබුණේ වරිච්චි බිත්ති මගිනි. පිටත බිත්තිවල තිබූ සිහින් පිපිරුම් සහිත ස්ථානවල හුණුමැටි බදාම යොදා පිරියම් කර හුණු අලේප කරන ලදි. මෙහි වට පිළෙහි වූ දැව කණු 02 ක් දිරාගොස් තිබූ අතර ඒ සඳහා අලුතින් වූ දැව කණු 02 යොදන ලදි.

බිත්ති මත වූ දැව රාමුවේ දික් අතට යොදා තිබූ බාල්ක හතරම දැඩි ලෙස දිරාගොස් තිබූ බැවින් ඒවා නැවත යෙදීම ද කෙටි පැත්තට යොදා තිබූ බාල්ක 04 ද දිරා ගොස් තිබුණු බැවින්

එය ද මුදුන් යට ලීය, මුල්පරාල  හා පරාල, රීප්ප ද වහලෙහි අඩරවුම් උළු සියල්ල ද අලුතින් යොදන ලදී. මේ ආකාරයට බිත්ති සහ වහලය නැවත ප්‍රතිසංස්කරණය කරන ලදී.

**කුරගල මුර කුටිය ඉදි කිරීම**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. මෙහි ලෙන් සංකීර්ණයක් මෙන් ම ඉපැරණි බෞද්ධ සංඝාවාසයක නටබුන් මෙහි පුරාවිද්‍යාත්මක සාධක ලෙස හඳුනා ගෙන ඇත.

මෙහි පිහිටි මුරකුටියෙහි ජනෙල් දෙකක සහ උළුවහු දෙකක් නිම කර සවි කරන ලදි. ඊට අවශ්‍ය දොරගුළු සහ අනෙකුත් උපාංග සකසා නඩත්තු වැඩ නිම කරන ලදි.

**සබරගමුව 05 කලාපය පවත්වාගෙන යාම**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ, කුරුවිට, අයගම, ඇල්ල, ඇලපාත, රත්නපුර, නිවිතිගල, කලවාන, පැල්මඩුල්ල, කහවත්ත, යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවලට අයත් මෙම කලාපය තුළ ස්මාරක, බෞද්ධ විහාර සහ දේවාල ගොඩනැගිලි අයත් වේ. මහ සමන් දෙවොලෙහි බුදු මැදුරෙහි වේ නාශක යොදා දැව සංරක්ෂණය සිදුකරන ලදි.

**සබරගමුව 01 කලාපය පවත්වා ගෙන යාම**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ අරණායක-මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් මෙම කලාපයේ ප්‍රධාන වැඩබිම වන දෙවනගල උද්‍යාන මට්ටමින් සකස් කරන ලදි.

අවට පරිසරය දෛනික සුද්ධ පවිත්‍ර කිරීම් ඉටු කළ අතර අවට පරිසරයෙන් ලබා ගත් ලී දඬු උපයෝගි කරගෙන ආසන සකස් කරන ලදි. මෙහි පිහිටි පර්වත මස්තකයෙහි රුක්රෝපන කටයුතු ඉටුකරන ලදි.මීට අමතරව සංරක්ෂිත බැමි වල ගැලවී ඇති ගල් යෙදීමත් කටුගහවත්ත මාර්ගය කැඩුණු කොටස් පිළිසකර කිරීමත් සිදු කරන ලදි. තවද සැලව ලෙන් විහාරය, ලෙව්කේ ටැම්පිට විහාරය බුළු ලෙනගල ලෙන් විහාරය, එරමිණි ගම්මන දෙනියතැන්න ටැම්පිට විහාරය, දනගිරිගල ලෙන් විහාරය යනාදී ස්ථාන සඳහා වේ නාශක යොදන ලදි. ලෙනගල ලෙන් විහාරය, එරමිණි ගම්මත දෙනිගහතැන්න ටැම්පිට විහාරය, දනගිරිගල ලෙන් විහාරය යනාදී ස්ථාන සඳහා වේ නාශක යොදන ලදි. ලෙව්කේ ටැම්පිට විහාරය, එරමිණි ගම්මන ටැම්පිට විහාරය දෙනිය තැන්න ටැම්පිට විහාරය දනගිරිගල ලෙන් විහාරය හා ධර්ම ශාලාව සඳහා දැව ආරක්ෂක යෙදීම ද, සිදුකරන ලදි.

**ඇහැළියගොඩ මදරසිංහාරාමය**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙය පිහිටා ඇත. මෙය මහනුවර යුගය නියෝජනය කරන සිතුවම් සහිත ස්ථානයකි.

මෙම ස්ථානයේ පෙර වසරේ කර ඉතිරිව ඇති කාර්යන් වන කුමේර බැඳීම සිදු කරන ලදි. අඩරවුම් කුමේර උළු කැට යෙදූ අතර එහි අඩුපාඩුව පැවති මැටි කොත් 02 ක් ද සවි කරන ලදි. මීට අමතරව මෙම පැරණි විහාර ගෘහයෙහි බිත්ති සියල්ලම දුර්වර්ණ වී සහ කඩතොළු සහිත විය. එබැවින් සපයාගෙන තිබූ අමුද්‍රව්‍ය භාවිතා කරමින් විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ විසින් සපයන ලද ශ්‍රමය භාවිතා කරමින් බිත්ති කඩතොළු පිරියම් කර සුදුහුණු ආලේප කරන ලදි.

විහාර ගෘහයෙහි පිවිසුම් දොරටුව සහ උළුවහු වල තීන්ත ආලේප කළ අතර පැරණි බිතු සිතුවම් සහිත අභ්‍යන්තර බිත්ති පෘෂ්ඨය පලුදුවීම් තිබූ බැවින් එහි රසායන සංරක්ෂණ කටයුතු ඉටුකරන ලදි. මීට අමතරව නඩත්තු කරන ලද විහාර මන්දිර වහලයේ වැසි ජලය බැහැර කරන වැහි පිහිලි පද්ධතිය සකස් කරන ලදි.

**බලංගොඩ, එළුගාල ටැම්පිට විහාරය වහල නඩත්තු කිරීම.**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ ටැම්පිට විහාරය මහනුවර යුගයට අයත් වූවකි. එහි වහල සංරක්ෂණය කරන ලදි. වහල සඳහා සිංහල හා කොකු උළු සෙවිලි කර කුමේර බැඳ කොත් ස්ථාපනය කිරීම සිදු කරන ලදි. විහාරගෙයි වටපිල සකස් කිරීම ද ඉටු කරන ලදි.

**රත්නපුර ගිලීමලේ රන්කොත් රජමහා විහාරයේ පැරණි විහාරගෙයි වහල නඩත්තුව**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුරාවිද්‍යා ස්ථානයකි. මෙහි ආලින්දය කොටසේ දිරාපත් වහල අලුත්වැඩියා කරන ලදි. එහිදී වහලය තිබූ මී දැව බොහොමයක් දිරාපත්ව තිබූ බැවින් දිරූ දැව ඉවත් කර අලුතින් මී දැව යොදන ලදි. පැවති උළුම (අඩරවුම් සිංහල උළු) යොදා ගෙන වහලයේ වැඩ අවසන් කරන ලදි. කුමේර බැඳ බිත්ති මත සුදුහුණු ආලේප කර, දිරාපත් උළුවස්ස අලුත්වැඩියා කර කුඩා ගේට්ටු ද අලුත්වැඩියා කිරීම ද සිදු කරන ලදි.

**අම්බුලුගල ශ්‍රී දන්තපාය රජමහා විහාරය**

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අම්බුලුගල ශ්‍රී දක්ෂිණාරාම රජමහා විහාරය කෝට්ටේ සමයේ රජකල VI වන පැරකුම්බා රජු විසින් කරවන ලද්දක් බව විශ්වාස කෙරේ. කෝට්ටේ යුගයේ ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ කෙටි කලක් වැඩ සිටි බව ද කියවේ.

මෙහි තිබෙන ටැම්පිට විහාරයේ වහලය සකස් කර කැඩී තිබූ බිත්ති සකසා හුණු පිරියම් කර පිළිසකර කරන ලදි.

**කිරිහේන පුරාණ විහාරය**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරනියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ විහාර ගෘහයේ වහල අබලන්ව තිබිණි. එබැවින් මෙහි උළු ඉවත් කර දැව රාමුව ගලවා දිරාපත්ව තිබූ යට ලී සහ රීප්ප වෙනුවට කොස් දැව නැවත යොදන ලදී.

**සබරගමුව 05 කලාපය පවත්වාගෙන යාම**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්යේ පිහිටි මෙම කලාපය පවත්වාගෙන යන ලදි. මෙයට අයත් ගලිමලේ විහාරයේ සුලු අලුත්වැඩියා කටයුතු ඉටු කිරීම, මීගහගොඩ විහාරයේ බිත්ති සහ ගෙබිම පිපිරුම් ඇති ස්ථාන තහවුරු කිරීමත් සිදු කරන ලදි.

**දොරවක්කන්ද ගල්ලෙනහි ආරක්ෂාවට වැට ඉදි කිරීම.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුරාවිද්‍යා ස්ථානයකි. 1 1/2" විශ්කම්භය සහිත වූ ජී.අයි බට කොන්ක්‍රිට් කර පැස්සුම් කිරීමෙන් දොරවක්කන්ද ගල් ලෙනෙහි චිත්‍ර ඇති බිත්තියෙහි ආරක්ෂාව සඳහා ආරක්ෂක වැටක් ඉදිකරන ලදි.

**මඩුවන්වල වලව්ව හා රක්ෂිතය නඩත්තු කිරිම.**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත.

- මඩුවන්වෙල වලව්වේ පිවිසුම් මාර්ගය සකස් කර දෙපස කාණු යෙදිම.
- පිවිසුම් දොරටුවේ සිට අඩි 2ක් පළලට බොරළු, සිමෙන්ති සහ හුණු මිශ්‍රණය යොදා සකස් කරන ලදි.
- වලව්වේ ගොඩනැගිල්ලේ පිට වහල සීමාව තෙක් ගොඩනැගිල්ලේ පොළොව සකස් කරන ලදි.
- වලව් ගොඩනැගිල්ලේ බිත්තිවල පලුදු සකස් කර හුණු සමර ආලේප කරන ලදි.
- දොර ජනෙල් උළුවහු සහ දැව යොදා ඇති වෙනත් ස්ථාන සඳහා වාර්නිෂ් කිරීම, තින්ත ආලේප කිරීම සිදු කරන ලදි.
- ගල් උළුවස්සේ නෙළුම් පොහොට්ටු 02ක් නැවත සවි කරන ලදි.
- ගොඩනැගිල්ලේ ගෙබිම පලුදු වූ ස්ථාන සකස් කරන ලදි.
- මීට අමතරව දෛනික මුර සේවය සහ පවත්වා ගෙන යාම සිදු කරන ලදි.

# කෞතුකාගාර අංශය

## උතුරු මැද පළාත

අනුරාධපුර ඓතිහාසික පුරවරයේ නානුමිල්ලෑව ග්‍රාමයේ ඓතිහාසික වටිනාකමකින් යුත් ශ්‍රී ප්‍රියදර්ශනාරාමය නම් විහාරස්ථානයේ මීට වසර 16 ට පමණ පෙර වගා කටයුතු සිදු කිරීමේ දී බුද්ධ ප්‍රතිමා දහනමක් හමු වී ඇත. එම විහාරයේ විහාරාධිපති හිමියන්ගේ ඉල්ලීම පරිදි එම ස්ථානයෙන් හමු වී ඇති දැනට අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති මෙම බුද්ධ ප්‍රතිමා වහන්සේලා දහනම 2010 ජුලි මස 24, 25, 26 දින එම විහාරස්ථානයෙහි පැවැත් වූ ප්‍රදර්ශනය සඳහා තාවකාලිකව ලබාදෙන ලදි.

කහටගස්දිගිලිය, ඇල්ලවැව වෙහෙරගල රජමහා විහාරයෙන් සොයාගන්නා ලද දැනට ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කරනු ලබන ලෝකඩින් නිමවා රන් ආලේප කරන ලද අවලෝකිතේෂ්වර බෝධිසත්ව පිළිමය, හිටි බුදු පිළිමය, සමාධි මුද්‍රාව නිරූපිත හිඳි බුදු පිළිමය, සිරස්පත, මිරිවැඩිසඟල සහ දොර අල්ලුව 2010 මැයි 25 දින සිට 31 දක්වා විහාරස්ථානයේ තාවකාලික ප්‍රදර්ශනය සඳහා තැන්පත් කරන ලදි.

අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර තිබූ ඉපැරණි රන් කාසි 10 ක් 2010 - 12 - 23 වන දින සොරාගෙන මේ පිළිබඳව පොලිස් පරීක්ෂණ සිදුවෙමින් පවතී.

## ඌව පළාත

මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාලිගාවිල ග්‍රාමසේවා වසමට අයත්ව පිහිටා ඇති ක්‍රි. ව. 7 වන සියවසට අයත් යැයි සැලකිය හැකි පුරාවිද්‍යා හා ඓතිහාසික සාධකවලින් යුත් බුදු පිළිමය හා බෝධිසත්ව පිළිමය සහිත ස්ථානය පිළිබඳ මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයක් සඳහා ගොඩනැගිල්ල ඉදිකර කෞතුකාගාරයේ ප්‍රදර්ශන මැදිරි සැලසුම් කරන ලදි.

## සබරගමු පළාත

දැදිගම පුරාවිද්‍යා කෞතුකාගාරයේ මෙහෙවර වී ඇත්තේ දැදිගම සූතිඝර චෛත්‍යයේ කැණීමෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අත්පත් කර ගත් පුරාවස්තු ප්‍රදර්ශනය කිරීමයි. නමුත් පසුකාලීන වනවිට කෑගල්ල දිස්ත්‍රික්කයේ හමුවන පුරාවස්තු ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රාදේශීය කෞතුකාගාරයක් බවට ක්‍රමවත්ව වර්ධනය විය. එහි ප්‍රතිපලයක් වශයෙන් කෞතුකාගාරය ප්‍රතිසංවිධානය කිරීමේ එක් පියවරක් ලෙස ප්‍රදර්ශන පුවරු නිර්මාණය කිරීම සිදු කරන ලදි.

සබරගමු පළාත, කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන දැලිවල පුරාණ විහාරස්ථානය දිගුකාලීන ඉතිහාසයක් සහිත ස්ථානයක් බව තහවුරු වී ඇති අතර මෙහි සිදු කරන ලද පුරාවිද්‍යාත්මක ක්‍රියාකාරකම් මගින් ක්‍රි. පූ. 1 සියවස තරම් ඈත කාලය දක්වා දිව යන ඓතිහාසික පදනම

සනාථ කරන සාධක සමූහයක් සපයාගෙන ඇත. 1957 පෙබරවාරි මස 04 දින දායක සභාව විසින් සිදු කළ ශ්‍රමදානයක දී සහ 2000 සහ 2001 වර්ෂවල දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් දාගැබ මත සිදුකළ කැණීමෙන් සොයා ගන්නා ලද විවිධ වර්ගවලට අයත් කෞතුක භාණ්ඩ මතු පරපුර උදෙසා ආරක්ෂා කර ගැනීම සඳහා විධිමත් පරිදි ලේඛනගත කිරීමේ කාර්යය ආරම්භ කරන ලදි. 2010 පුරාවිද්‍යා සති වැඩසටහන යටතේ මඩුවන්වල වලව්ව පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයේ ඇතුළත ප්‍රදර්ශනය සඳහා අක්ෂර පරිනාමය දැක්වෙන පුවරුවක් නිර්මාණය කිරීම.

## දකුණු පළාත

මුල්ගිරිගල නව පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයේ සැළසුම් සකස් කිරීම සිදු කරන ලදි. විස්තර පුවරු සැකසීම, ප්‍රදර්ශන අල්මාරි නිර්මාණය, කෞතුකාගාරය නඩත්තු කර පවත්වාගෙන යාම, කෞතුකාගාරයේ ආරක්ෂාව සඳහා ලැටිස් පටි යෙදීම හා යකඩ කූරු වෙනුවට ග්‍රිල් වැටක් යෙදීම මෙම වසරේ දී සිදු කරන ලදි.





මුල්ගිරිගල පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානය

කසාගල නව පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයේ සැළසුම් සකස් කිරීම සහ කෞතුකාගාරයේ ප්‍රදර්ශන පුවරු මුද්‍රණය, පරිවර්තන කටයුතු සහ ප්‍රදර්ශනයේ ඉතිරි වැඩ අවසන් කරන ලදි.

මාතර තාරකා කොටුව කෞතුකාගාරයේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ නව කෞතුකාගාරයක් වශයෙන් ප්‍රදර්ශන සැලසුම් සකස් කිරීම.




තාරකා කොටුව කෞතුකාගාරය

## වයඹ පළාත

පඬුවස්නුවර කෞතුකාගාරයේ දිරාපත්ව තිබූ සිවිලිම නවීකරණය කිරීම.
යාපහුව හා පුත්තලම කෞතුකාගාරයේ විස්තර පුවරු සකස් කර මුද්‍රණය කිරීම, පාදස්ථල නිර්මාණය හා ප්‍රදර්ශන මට්ටමට සකස් කිරීම.

## මධ්‍යම පළාත

මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර තිබූ පැරණි කාලතුවක්කු උණ්ඩයක් පුරාවිද්‍යා සංරක්ෂණය සඳහා කොරියාවේ National research institute of cultural heritage ආයතනය වෙත යවනලදි.

## නැගෙනහිර පළාත

සේරුවිල කෞතුකාගාරයේ දොරවල් සඳහා දොරගුළු දැමීම හා ඡායාරූප පුවරු සකස් කර මුද්‍රණය කරන ලදි.



සේරුවිල කෞතුකාගාරයේ වහළය අළුත්වැඩියා කිරීම.

## බස්නාහිර පළාත

කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ ලේඛනගත කිරීම සහ තිර රෙදි යෙදීම.

ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය මඟින් ඉදිකිරීමට අපේක්ෂා කරනු ලබන කර්මාන්ත සඳහා භාවිතා කරන ලද පැරණි උපකරණ ප්‍රදර්ශනය සඳහා සූදානම් කිරීමට අවශ්‍ය ප්‍රදර්ශන සැළසුම සකස් කරන ලදි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ කෞතුකාගාර අංශය මඟින් දෙපාර්තමේන්තුවට අයත් සියළුම කෞතුකාගාරවල තැන්පත් කොට ඇති කෞතුක භාණ්ඩ ලේඛනගත කිරීමට අවශ්‍ය භෞතික සම්පත් සම්පාදනය කර ගැනිණි.

**කෞතුකාගාර පවත්වාගෙන යාම**

තන්තිරිමලය, වෙහෙරගල, වව්නියාව, යාපනය, පිඳුරංගල, නාලන්ද, මහනුවර, පඬුවස්නුවර, පුත්තලම, යාපහුව, රාජාංගනය, මාතර තාරකාකොටුව ආදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් සියළුම කෞතුකාගාර පවත්වාගෙන යන ලදි.

# ප්‍රවර්ධන අංශය

මෙම වර්ෂයේ දී ප්‍රවර්ධන අංශය මගින් ව්‍යාපෘති 57 ක් ක්‍රියාත්මක කරන ලදි.

### ජාතික පුරාවිද්‍යා සමුළුව

පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්, පර්යේෂකයන් මෙන්ම නවක, ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යාඥයින් එකම පියසකට කැන්දන ජාතික පුරාවිද්‍යා සමුළුව 2010 වර්ෂයේ ජූලි මස හත්වන දින සිට නවවන දින දක්වා දින තුනක් සාර්ථකව පවත්වන ලදි. ඉකුත් වසරේ විද්වතුන් විසින් පුරාවිද්‍යා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණවල හා මෑත කාලීනව සිදු කරන ලද පර්යේෂණවල සහ විශේෂ අනාවරණයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර සාකච්ඡා කිරීම මෙම සමුළුවේ ප්‍රධාන අරමුණයි.

මෙම සමුළුව ජූලි මස 07 වෙනිදාට යෙදෙන පුරාවිද්‍යා දිනය පදනම් කරගෙන සංවිධානය කරනු ලැබේ. ලංකාවේ ජ්‍යෙෂ්ඨ හා නවක පුරාවිද්‍යාඥයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන, මෙහි දී ඔවුන්ගේ නවතම පර්යේෂණ ආරාධිතයින්ට ඉදිරිපත් කෙරේ. ඊට අමතරව මෙවර ජාතික පුරාවිද්‍යා සමුළුවේ දී පහත සඳහන් කටයුතු සිදු කෙරිණි.

### ප්‍රකාශන එළිදැක්වීම

දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ එළිදැක්වීම මෙහි දී සිදු කරන ලද ප්‍රධාන කාර්යයකි. සමුළුව වෙත ඉදිරිපත් කෙරුණු පර්යේෂණ පත්‍රිකා ඇතුළත් සමුළු ප්‍රකාශනය මෙවර වෙළුම් දෙකකින් නිකුත් කෙරිණි. එයට පර්යේෂණ පත්‍රිකා 69 ක් ඇතුළත් විය.

මීට අමතරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ තොරතුරුවලින් සමන්විත "දායාද" සඟරාව, සඟරාවේ සිව් වන කලාපය මෙම අවස්ථාවේ දී එළිදක්වන ලදි.

එසේම දෙපාර්තමේන්තුවේ කාර්යයන් සම්බන්ධයෙන් රචිත වාර්තා සාර්ථක ලෙස සකස් කළ නිළධාරීන් අගය කරමින් ඔවුන් වෙත ත්‍යාග ප්‍රදානය ද පුරාවිද්‍යා ක්ෂේත්‍රය වෙනුවෙන් කළ මෙහෙය වෙනුවෙන් විවිධ පුද්ගලයන්ට උපහාර පිදීම ද සිදු විය.

ක්ෂේත්‍රගත විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ හා නවමු තොරතුරු ඇසුරින් පැවැත් වූ දේශන ඉතා වැදගත් ඒවා වූ අතර ප්‍රාග් ඉතිහාසය, ඓතිහාසික, ක්ෂේත්‍ර පුරාවිද්‍යාව, උරුම කළමණාකරණය, පුරාණ තාක්ෂණය, පුරාණ වාස්තුවිද්‍යාව හා පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් විෂයන්ට අදාළ දේශන සැසිවාර 26 ක් දින 03 ක් පුරා පැවැත්විණි.

සමුළුවේ තෙවන දිනයේ බිතුසිතුවම් සංරක්ෂණය සම්බන්ධ විශේෂ දේශන මාලාවක් ද පැවැත්විණි. මහාචාර්ය රාජ් සෝමදේව මහතාගේ විශේෂ පර්යේෂණ කටයුත්තක් ඇසුරින් "උඩවලව නිම්නයේ පුරාවිද්‍යාව නව දිශානතියක්" මැයෙන් දේශනයක් පවත්වන ලදි.

**ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ**

ප්‍රවර්ධන අංශය මගින් පුරාවිද්‍යා දැනුම මහජනයා වෙත ලබා දෙමින් මෙරට පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගැනීමට ජනතා සහභාගිත්වය ලබා ගැනීමේ අරමුණින් පහත සඳහන් ස්ථානවල දී ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ පවත්වන ලදි.

01. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ දෙවන පදවි ප්‍රාප්තියට සමගාමීව මුල්කිරිගල රජමහා විහාරය ආශ්‍රිතව පුරාවිද්‍යා ප්‍රදර්ශනයක් පැවැත්වුණි.
02. දිඹුලාගල පහළ යක්කුරේ ප්‍රදර්ශනය
03. අනුරාධපුරය දුටුගැමුණු - හෂ්මාවශේෂ දැක්ම
04. කිරිවෙහෙර ශ්‍රී ධර්මාලෝක පිරිවෙන, කන්දකැටිය ප්‍රදර්ශනය
05. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උහන ප්‍රදර්ශනය
06. බණ්ඩාරගම මහා විද්‍යාලය ප්‍රදර්ශනය
07. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොබෙයිගනේ ප්‍රදර්ශනය
08. බදුල්ල බුදුගේකන්ද ප්‍රදර්ශනය
09. විශාඛා විද්‍යාලය, බියගම ප්‍රදර්ශනය
10. නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලය, ප්‍රදර්ශනය
11. ඔක්කම්පිටිය ගැමුණු විද්‍යාලය, ප්‍රදර්ශනය
12. මොරටුව වේල්ස් කුමාර විද්‍යාලය ප්‍රදර්ශනය
13. අනුරාධපුර ලෝවාමහාපාය පරිශ්‍රය ප්‍රදර්ශනය
14. හෝමාගම යුධ හමුදා කඳවුරු පරිශ්‍රය ප්‍රදර්ශනය
15. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ප්‍රදර්ශනය
16. කැළණිය විශ්වවිද්‍යාලය ප්‍රදර්ශනය හා පොත් අලෙවිසැළ
17. බේරුවල ශ්‍රී රමණීයාරාමය ප්‍රදර්ශනය
18. මහරගම බුවනෙකබා විද්‍යාලය, ප්‍රදර්ශනය
19. කොස්ගම ආටිගල පිරිවෙන, ප්‍රදර්ශනය
20. අතුරුගිරිය මහා විහාරය, ප්‍රදර්ශනය
21. අලව්ව ජාතික පාසල, තුන්කල්දැක්ම ප්‍රදර්ශනය
22. කුඩලිගම මහා විද්‍යාලය ප්‍රදර්ශනය
23. කුරුණෑගල මලියදේව විද්‍යාලය ප්‍රදර්ශනය
24. මාතලේ අකුරම්බොඩ ජාතික පාසල ප්‍රදර්ශනය
25. ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වුණු අතර, එහි දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රකාශන රැසක් අලෙවි කරන ලදි.

**වැඩමුළු/පුහුණු (දේශීය)**

01. දකුණු පළාතේ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදි. දේශන පැවැත්වූයේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරින්ය.
02. සාමුද්‍රික පුරාවිද්‍යා කටයුතු පුහුණුව
03. කළමනාකරණ පුහුණු දෙදින වැඩමුළුව - කෞතුකාගාර කාර්ය මණ්ඩලය
04. i. වෙබ් අඩවි පිළිබඳ පුහුණු පාඨමාලාව

    ii. GIS භාවිතය පිළිබඳ වැඩමුළුව, කැළණිය විශ්වවිද්‍යාලය
05. පරිගණක ආශ්‍රයෙන් සැළසුම් පිළියෙල කිරීම - වාස්තුවිද්‍යා අංශය
06. පරිගණක පාඨමාලාව (යතුරු ලියනය සහ පිටු සැළසුම්)
07. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා එහි කාර්යභාරය පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීම සඳහා අදියර දෙකකින් වැඩමුළු කොළඹ දී පවත්වන ලදි (පෙබරවාරි 23 සහ මැයි 05 යන දෙදින)
08. දෙමළ භාෂා ප්‍රවීණතා පාඨමාලා (2009 - 2010) කොළඹ
09. අම්පාර රජගල පුරාවිද්‍යා පරිශ්‍රය පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන
10. ගිණුම් අංශයේ නිලධාරීන් සඳහා වර්ෂය පුරා ක්‍රියාත්මක වූ පුහුණු පාඨමාලාව
11. පුරාවිද්‍යා නීතිය හා ආඥා පනත් මෙන්ම පුරාවස්තු විනාශය වැලැක්වීම පිළිබඳ දකුණු පළාත් පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් ගාල්ලේ දී පැවැත්විණි.
12. ඌව පළාතේ බදුල්ල කාර්යාලයේ නිලධාරීන් සඳහා කළමනාකරණ පුහුණු පාඨමාලාවක් පැවැත්වීම.
13. පාලන අංශයේ හැකියා වර්ධන වැඩසටහන.
14. අස්ථි අධ්‍යයනය සම්බන්ධ වැඩසටහන, අනුග්‍රාහක මුදල් ත්‍යාගය පිරිනැමීම (ජූලි 12 - ජූලි 27), කොළඹ
15. The National Workshop on the second cycle of the periodic Reporting for World Heritage Sites in Sri Lanka වැඩමුළුව කොළඹ ගලදාරි හෝටලයේ දී පවත්වන්නට යෙදුණි.

**වැඩමුළු පුහුණු (විදේශ)**

1. ඉන්දියාවේ, නවදිල්ලි නුවර Conservation of Management of Historic Buildings පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරියෙකුට අවස්ථාව ලබා දෙන ලදි.
2. කොරියාවේ National Research of Cultural Heritage ආයතනය මඟින් පවත්වනු ලැබූ පාඨමාලාව සඳහා නිලධාරියෙකු සහභාගී කරවීය.
3. ඉන්දියාවේ ඩෙකෑන් විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති පාඨමාලාව හදාරන නිලධාරීන්ට මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.
4. තායිලන්තයේ මුහුදු පුරාවිද්‍යාව පිළිබඳ යුනෙස්කෝ පදනම් පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරිනියක් සහභාගී කරවන ලදි.
5. මුහුදු පුරාවිද්‍යාව - UNESCO - GIS පාඨමාලාව සඳහා නිලධාරියෙකු සහභාගී විය.
6. ඉන්දියාවේ ඩෙකෑන් විශ්ව විද්‍යාලයේ අස්ථි අධ්‍යයන පුහුණු පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථාව ලබා දෙන ලදි.
7. කැණීම් කටයුතු ආශ්‍රිතව හමු වූ තොරතුරු විශ්ලේෂණය හා වැඩිදුර අධ්‍යයන කටයුතු පිණිස ජර්මනියේ නිලධාරීන් දෙදෙනෙකු සහභාගී විය.
8. ජපානයේ ACCU (NARA) ආයතනයේ පුහුණු පාඨමාලාව සඳහා නිලධාරියෙකු සහභාගී විය.
9. කොරියාවේ පිහිටි අස්පර්ශිත උරුමය පිළිබඳ ආයතනයේ පාඨමාලාවක් සඳහා නිලධාරිනියකට අවස්ථාව ලබා දෙන ලදි.
10. ජර්මනියේ එච්.ටී.ඩබ්. විශ්ව විද්‍යාලයේ පවත්වනු ලැබූ සංරක්ෂණ, කෞතුකාගාර අධ්‍යයනය, ක්ෂේත්‍රගත කැණීම් කටයුතු, පුරාවිද්‍යා ස්ථාන කළමනාකරණය පුහුණු පාඨමාලාව සඳහා නිලධාරියෙකුට සහභාගීවීම සඳහා අවස්ථාව ලබාදෙන ලදි.
11. UNESCO යුක්රේනයේ දී යුනෙස්කෝ ආයතනය මඟින් පැවැත් වූ සම්මන්ත්‍රණය සඳහා අධ්‍යක්ෂ ජනරාල් හා නිලධාරියෙකු සහභාගී විය.
12. ජර්මනියේ එච්.ටී.ඩබ්. ආයතනයේ පුරාවිද්‍යා පුහුණු පාඨමාලාව සඳහා නිලධාරියෙකු සහභාගී විය.
13. ඇමෙරිකාවේ නිව්යෝර්ක් විශ්වවිද්‍යාලයේ ලියෝන් ලිව් ආයතනය මඟින් පිරිනමන ලද Archaeological Material Science විෂය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සඳහා යාමට රසායන සංරක්ෂණ අංශයේ නිලධාරිණියකට අවස්ථාව ලබා දෙන ලදි.

**විශේෂ උත්සව/සැමරුම්**

1. ආචාර්ය නාගරාජ් රාඕ මහත්මා පිළිගැනීමේ උත්සවය, කොළඹ
2. වීර කැප්පෙටිපොල දින සැමරුම, බදුල්ල
3. ආචාර්ය බෙනිල් ප්‍රියංක මහතා විසින් සීගිරි ගී පිළිබඳ පර්යේෂණයන් ඇසුරෙන් රචනය කරන ලද Recently Deciphered Records From the Mirror Wall at Sigiriya ($7^{th}$ to $13^{th}$ Centuries) නම් ග්‍රන්ථයේ එළිදැක්වීමේ උත්සවය.